

කොළඹ විශ්වවිද්‍යාලය
ශ්‍රී ලංකාව

වාර්ෂික වාර්තාව
2023

අපගේ දැක්ම

සමාජයේ අභිවෘද්ධිය උදෙසා මානව හැකියාවන් සුපෝෂණය කිරීම සඳහා අධ්‍යාපනය, පර්යේෂණ හා සිය පාර්ශ්වකරුවන්ගේ සහභාගිත්වය යන අංශයන්ගෙන් ගෝලීයව විශිෂ්ට මධ්‍යස්ථානයක් වීම.

අපගේ මෙහෙවර

දැනුම සොයා ගැනීම සහ බෙදා හැරීම; නවෝත්පාදන වැඩි දියුණු කිරීම; කර්මාන්තය හා ප්‍රජාව සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම තුළින් විශ්වවිද්‍යාලය පුරා සහ ඉන් ඔබ්බට පුළුල් විමර්ශන සංස්කෘතියක් ප්‍රවර්ධනය කිරීම

උපකුලපතිතුමාගේ පණිවිඩය



2023 වර්ෂය සඳහා කොළඹ විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කිරීමට අවස්ථාව උදාවීම පිළිබඳව මම අතිශය ප්‍රීතියට පත් වෙමි.

2023 වර්ෂය පුරා අප විශ්වවිද්‍යාලය වෙබ්මිතික ශ්‍රේණිගත කිරීම්වලදී ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල අතර ප්‍රථම ස්ථානයෙහි රැඳී පැවතිණි. ටයිම්ස් උසස් අධ්‍යාපන ලෝක විශ්වවිද්‍යාල ශ්‍රේණිගත කිරීම් මඟින් කොළඹ විශ්වවිද්‍යාලය රටවල් 104 ක විශ්වවිද්‍යාල 1799 ක් අතරින් ඉහළම විශ්වවිද්‍යාල 601 – 800 කාණ්ඩයට ඇතුල් කර තිබේ. ඊට අතිරේකව අප විශ්වවිද්‍යාලය ඝායනික, පූර්ව ඝායනික සහ සෞඛ්‍ය විෂය කාණ්ඩයේ විශ්වවිද්‍යාල අතර 301 – 400 කාණ්ඩයටත් භෞතික විද්‍යා ක්ෂේත්‍රයෙහි 1001+ කාණ්ඩයටත් සමාජ විද්‍යා ක්ෂේත්‍රයෙහි 801+ කාණ්ඩයටත් අයත් වන සේ ශ්‍රේණිගත කරනු ලැබ ඇත. ටයිම්ස් උසස් අධ්‍යාපන ලෝක ශ්‍රේණිගත කිරීම, QS ලෝක ශ්‍රේණිගත කිරීම් සහ වෙබ්මිතික ශ්‍රේණිගත කිරීම්වල ඉහළම ස්ථානය ලබා ගනිමින් කොළඹ විශ්වවිද්‍යාලය ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම අධ්‍යයන ආයතනය ලෙස ස්ථාපිත වෙමින් පෙර නොවූ විරූ ඝන්ධිස්ථානයක් ඝනිටුහන් කර ඇත.

Covid-19 සෞඛ්‍ය අර්බුදයේ ආරම්භයේ සිටම ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපන ක්ෂේත්‍රය පෙර නොවූ විරූ අභියෝග රැසකට මුහුණ දී සිටී. මෙම කාල පරිච්ඡේදය තුළ අවම අඛණ්ඩතාව පවත්වා ගැනීම සඳහා උසස් අධ්‍යාපන අංශයේ ජීවනාලිය බවට මාර්ගගත අධ්‍යාපනය පත් විය. පැවති තත්ත්වය තුළ සිය කැමැත්ත, හැකියාවන්, ස්ථානය සහ සම්පත් කවරාකාර වුවද සෑම කෙනෙකුටම තම භාවිතයන් වෙනස් කිරීමට සිදු විය. මාර්ගගත අන්තර්ක්‍රියාවල නිරත වීමේ නව අත්දැකීම විසින් පරිපාලනය යඇතුළු උසස් අධ්‍යාපන අංශයේ සියලුම අංශවලට නව සංස්කෘතියක් හඳුන්වා දෙන ලදී.

ඉස්මතු වූ සියලු අභියෝග මධ්‍යයේ වුවද, විශ්වවිද්‍යාල ක්‍රියාකාරකම් එහි අරමුණු සමඟ සමපාත කිරීම සඳහා ජාත්‍යන්තර සම්මන්ත්‍රණ තිස්නවයක් (39) සංවිධානය කර සාර්ථකව පවත්වන ලද අතර 2023 වර්ෂය තුළ විශ්වවිද්‍යාලයීය මණ්ඩපය/පීඨ/ආයතන මගින් විශ්වවිද්‍යාලයේ පර්යේෂණ සොයාගැනීම් බෙදා හැරීම සඳහා නව පර්යේෂණ පත්‍රිකා 1,717 ක් ප්‍රකාශයට පත් කරන ලදී. 2023 වර්ෂයේදී විශ්වවිද්‍යාලය විසින් ප්‍රථම උපාධි හා පශ්චාත් උපාධි ප්‍රදානෝත්සව දෙකම පවත්වන ලදී. ප්‍රථම උපාධි ප්‍රදානෝත්සවයට උපාධිධාරීන් 2,593 දෙනෙකු සහභාගී වූ අතර, පශ්චාත් උපාධි උපාධි ප්‍රදානෝත්සවයේදී උපාධිධාරීන් 2,434 දෙනෙකුගේ ජයග්‍රහණ සමරනු ලැබීය. මේ අතරින් 74 දෙනෙකුට බාහිර උපාධි පිරිනමන ලදී.

අපගේ ශිෂ්‍ය ප්‍රජාව තමන් ඩිජිටල්කරණය හා අතථ්‍ය ඉගෙනීම සඳහා සුමට ලෙස අනුවර්තනය වී ඇති බව පෙන්වා දී ඇති අතර අප සැවොම බලාපොරොත්තු වන අන්දමින්ම ඔවුහු කොළඹ විශ්වවිද්‍යාලයීය අනන්‍යතාවයෙහි අනර්ඝ මුද්‍රාව මුලුමනින්ම උරුම කරගෙන සිටිති. විද්‍යා පීඨය කාන්තා සමස්ත ශූරතාවලියේ ජයග්‍රාහකයා බවට පත් වූ අතර කළමණාකරණ සහ මූල්‍ය පීඨය පිරිමි සමස්ත ශූරතාව දිනා ගනිමින් අන්තර් පීඨ මස්ත ශූරතාව හිමි කර ගන්නා ලදී. අධ්‍යාපනය, ක්‍රීඩා, ප්‍රාසංගික කලා සහ ප්‍රජා සේවය යන අංශවලින් සිසුන් විනයානුකූලව හා ගෞරවාන්විතව ලබා ඇති ජයග්‍රහණ පිළිබඳව මම සැබවින්ම ආඩම්බර වෙමි.

කොළඹ විශ්වවිද්‍යාලය 2023 වර්ෂයේදී තිරසාර සංවර්ධන ඉලක්ක සම්මත කර ප්‍රවර්ධනය කළේය. 17 වැනි ධරණීය සංවර්ධන ඉලක්කයේ සඳහන් පරිදි, විශ්වවිද්‍යාලය දේශීය හා ජාත්‍යන්තර විශ්වවිද්‍යාල, ආයතන සහ බහුපාර්ශ්වික සංවිධාන සමඟ හවුල්කාරිත්වය ප්‍රවර්ධනය කළේය.

පර්යේෂණ ප්‍රවර්ධනය කිරීමෙන්, පර්යේෂණ පැතිකඩ වැඩිදියුණු කිරීමෙන් සහ කර්මාන්ත සහයෝගිතාවය හා ප්‍රජා සේවා මගින් විශ්වවිද්‍යාලයේ තත්ත්වය ඉහළ නැංවීමට අපට හැකි වී තිබේ. ඒ සඳහා ආචාර්යවරුන්, පරිපාලන කාර්ය මණ්ඩලය හා ශිෂ්‍යයන්ද ඇතුලුව සමස්ත විශ්වවිද්‍යාල ප්‍රජාවම සක්‍රීයව සිය උපරිම දායකත්වය දැක්වූ බව නොරහසකි. 2023 ඉතා ඵලදායී වසරක් බවට පත් කිරීම සඳහා දායක වූ පාලක භාවට, නාතන මණ්ඩලයට,ලේඛකාධිකාරීතුමාට හා මූල්‍යාධිකාරීතුමිය ඇතුළු කොළඹ විශ්වවිද්‍යාලයේ සමස්ත කාර්ය මණ්ඩලයටද මගේ කෘතඥතාවය පළ කිරීමට මෙය අවස්ථාවක් කර ගනිමි.

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය එච්. ඩී. කරුණාරත්න
උපකුලපති
කොළඹ විශ්වවිද්‍යාලය

විශේෂ සිදුවීම් - 2023

- ටයිම්ස් උසස් අධ්‍යාපන ලෝක ශ්‍රේණිගත කිරීම්, QS ලෝක ශ්‍රේණිගත කිරීම් සහ වෙබ්මිතික ශ්‍රේණිගත කිරීම්වල ඉහළම ස්ථානය ලබා ගනිමින් කොළඹ විශ්වවිද්‍යාලය ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම අධ්‍යයන ආයතනය ලෙස ස්ථාපිත විය.

- 2023 සැප්තැම්බර් 27 වන දින නිකුත් කරන ලද ටයිම් ් උසස් අධ්‍යාපන ලෝක ශ්‍රේණිගත කිරීම් (THE) 2023හි, කොළඹ විශ්වවිද්‍යාලය ලොව පුරා විශ්වවිද්‍යාල1904 අතුරින් 1001 - 1200 ශ්‍රේණියට ඇතුළත් කර ඇත.

- කොළඹ විශ්වවිද්‍යාලය 2023 දී නිකුත් කරන ලද 'QS' ලෝක විශ්වවිද්‍යාල ශ්‍රේණිගත කිරීම් 2023 හි ශ්‍රී ලංකාවේ ඉහළම ශ්‍රේණිගත විශ්වවිද්‍යාලය ලෙස කැපී පෙනුනි. මෙය එහි ශ්‍රේණිගත කිරීම්වල සැලකිය යුතු පිම්මක් වන අතර, එය ලොව පුරා ස්ථාන 104 ක වන උසස් අධ්‍යාපන ආයතන 1,500 අතරින් පෙර පැවති 1201-1400 වැනි ශ්‍රේණියේ සිට 1001-1200 වැනි ශ්‍රේණිය දක්වා ඉහළ නැගීමකි.

- ටයිම්ස් උසස් අධ්‍යාපන ලෝක ශ්‍රේණිගත කිරීම් (THE) වල පස්වන සංස්කරණයේ ශ්‍රේණිගත කිරීම්වල සැලකිය යුතු ප්‍රගතියක් සනිටුහන් කළ විශ්වවිද්‍යාලය, පෙර පැවති 601 - 800 ශ්‍රේණියේ සිට දැන් ලෝක ව්‍යාප්ත විශ්ව විද්‍යාල අතර 401 - 600 අතර ස්ථානයක් ලබා ගෙන ඇත. සමස්ත ශ්‍රේණිගත කිරීම්වලට රටවල්/කලාප 112ක විශ්වවිද්‍යාල 1591ක් ඇතුළත් විය.

- කොළඹ විශ්වවිද්‍යාලය එහි ශ්‍රේණිගත කිරීම්වල කැපී පෙනෙන දියුණුවක් අත්කර ගෙන ඇති අතර, කලාප 31ක් නියෝජනය කරන ආසියානු විශ්වවිද්‍යාල 669ක් අතරින් 201-250 වැනි ස්ථානයේ සිට 170 වැනි ස්ථානය දක්වා ඉහළ නැඟී ඇත.

- 2023 වෙබ්මිතික ශ්‍රේණිගත කිරීමේ පළමු සංස්කරණයේදී, කොළඹ විශ්වවිද්‍යාලය ශ්‍රී ලංකාවේ ඉහළම විශ්වවිද්‍යාලය ලෙස එහි තත්ත්වය පවත්වා ගෙන ගිය අතර සිය පෙර ස්ථානය වූ 1531 අභිබවා යමින් 1470 ස්ථානය ලබා ගත්තේය. එම ශ්‍රේණිගත කිරීම්වල 2 වැනි සංස්කරණයේදී දකුණු ආසියාවේ 46 වැනි ස්ථානය සහ ගෝලීය මට්ටමින් 1487 වැනි ස්ථානය ලබා ගැනීමට විශ්වවිද්‍යාලයට හැකි විය.

- දෙසැම්බර් 5 වැනිදා කොළඹ විශ්වවිද්‍යාලය QS 579 වැනි ලෝක විශ්වවිද්‍යාල ශ්‍රේණිගත කිරීම්: තිරසාරත්වය 2024 හි ශ්‍රී ලංකාවේ ඉහළම ශ්‍රේණිගත විශ්වවිද්‍යාලය ලෙස හඳුනා ගන්නා ලදී.

- කොළඹ විශ්වවිද්‍යාලය ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයෙහි (CA Sri Lanka) රාජ්‍ය අංශයේ කොට වන APFASL විසින් සංවිධානය කරන ලදුව 2023 දෙසැම්බර් 4 වැනිදා කොළඹ BMICH හිදී 2022 රාජ්‍ය අංශයේ හොඳම වාර්ෂික වාර්තා සහ ගිණුම් සම්මාන තරඟාවලියේදී විශ්වවිද්‍යාල අංශයේ රජත සම්මානයට සහ සමස්ත රාජ්‍ය අංශයේ ආයතන සඳහා වන රජත සම්මානයට හිමිකම් කීවේය.

- මෙවර යූ අයි හරිත ප්‍රමිතික ශ්‍රේණිගත කිරීම්වලදී එම සම්මානය සඳහා ඉල්ලුම් කළ විශ්වවිද්‍යාල 1183 න් 263 වන ස්ථානය දිනා ගැනීමට කොළඹ විශ්වවිද්‍යාලය සමත් වී ඇත.

- 2023 දෙසැම්බර් 12 වන දින ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් සංවිධානය කරන ලද TAGS සම්මාන උළෙලේදී අධ්‍යාපන අංශයේ රජත සම්මානය දිනා ගනිමින් කොළඹ විශ්වවිද්‍යාලය ගෞරවයට පාත්‍ර විය.

- ජාල මෙහෙයුම් මධ්‍යස්ථානය (NOC) විසින් ආරම්භ කරන ලද 'Find UoC' නම් ප්‍රධාන ව්‍යාපෘතියේ කොටසක් ලෙස නව වසර සැමරුම් උත්සවයේ අංගයක් ලෙස 2023 ජනවාරි 2 වන දින සිට ශාක 1038 කට QR කේතය භාවිතා කරමින් විශ්වවිද්‍යාලය ඩිජිටල් ස්වරූපී ශාක ඉන්වෙන්ට්‍රියක් නඩත්තු කිරීම ආරම්භ කළේය.

- කොළඹ විශ්වවිද්‍යාලයේ සේවක සේවිකාවන් 80 දෙනෙකුට උපහාර පිරිනැමීම සඳහා වූ දීර්ඝ සේවා සම්මාන ප්‍රදානෝත්සවය 2023 ජනවාරි මස 2 වන දින FGS ශ්‍රවණාගාරයේදී උපකුලපති ජ්‍යෙෂ්ඨ මහාචාර්ය (මූලාසන) එච්.ඩී.කරුණාරත්න මහතාගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණි.

- දකුණු ආසියානු විශිෂ්ටතා මධ්‍යස්ථානයේ සමාරම්භක රැස්වීම 2023 ජනවාරි 11 වැනි දින කොළඹ විශ්වවිද්‍යාලයීය විද්‍යාල මන්දිරයේ සෙනෙට් ශාලාවේදී පැවැත්විණි.

- ජයිකා මූලාසන වැඩසටහනේ පස්වන සැසිය ආර්ථික වර්ධනය සහ ජපන් කළමනාකරණය යන මැයෙන් 2023 ජනවාරි 12 වැනි දින මාර්ගගත ක්‍රමය ඔස්සේ සාර්ථකව පැවැත්විණි.

- "විද්‍යා හා තාක්ෂණයෙන් පිරිපුන් ජාතියකට මාවත" යන මාතෘකාව යටතේ ජපන් නවීකරණ ක්‍රියාවලි අත්දැකීම් බෙදාගැනීමේ මූලපිරීමක් ලෙ ජයිකා මූලාසන වැඩසටහනේ හයවන සැසිය 2023 ජනවාරි 18 වන දින උපාධි අධ්‍යයන පීඨයේ (FGS) ශ්‍රවණාගාරයේදී පැවැත්විණි.

- කොළඹ විශ්වවිද්‍යාලයේ විනෝද සහ සුභසාධක සංගමය, ශාරීරික අධ්‍යාපන අංශය සමඟ එක්ව 2023 ආරාධිත විශ්වවිද්‍යාල මාණ්ඩලික බැඩ්මින්ටන් ශූරතාවලිය ජනවාරි 13 සහ 14 යන දිනවල ගෘහස්ථ ව්‍යායාම ශාලාවේදී පැවැත්විය.

- ශල්‍ය වෛද්‍ය විද්‍යා අධ්‍යයන අංශයේ භාජති සහ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය නන්දදේව සමරසේකර මහතා ශ්‍රී ලංකා ශල්‍ය වෛද්‍ය විද්‍යාලයේ 41 වැනි භාජතිවරයා ලෙස 2023 ජනවාරි මස 14 වැනි දින වෛද්‍ය පීඨ කුලුණු (UCFM) ශ්‍රවනාගාරයේ පැවති උත්සවයකදී රාජකාරී ආරම්භ කළේය.

- කර්මාන්ත ක්ෂේත්‍රය සමඟ ආයතනික බැඳීම ශක්තිමත් කිරීම සඳහා ජෛව රසායන විද්‍යා, අණුක ජෛවවේදය සහ ජෛව තාක්ෂණ ආයතනය (IBMBB) සහ Fadna Tea (Pvt) Ltd අතර අවබෝධතා ගිවිසුමක් 2023 ජනවාරි 17 වන දින අත්සන් කරන ලදී.

- "කොළඹ විශ්වවිද්‍යාලයේ AIESEC සාමාජිකයින්ගේ කාර්ය සාධනය සහ ජයග්‍රහණ සැමරීම සඳහා වූ "EXCELLENTIA" 2023 වාර්ෂික සම්මාන ප්‍රදානෝත්සවය ජනවාරි 29 වන දින නව කලාගාරයේදී පැවැත්විණි.

- කොළඹ විශ්වවිද්‍යාලයේ කෘෂි තාක්ෂණ හා ග්‍රාමීය විද්‍යා ආයතනය (UCIARS) සිය නව ආහාර තාක්ෂණ අධ්‍යයන අංශය 2023 ජනවාරි 31 දින ස්ථාපිත කළේය. මෙම ආයතනය විශ්වවිද්‍යාලයේ 70 වැනි අධ්‍යයන අංශය සනිටුහන් කළේය.

- ශ්‍රී ලංකාවේ 75 වන නිදහස් සංවත්සරය සනිටුහන් කරමින් ජාත්‍යන්තර සබඳතා අධ්‍යයන අංශය විසින් Awarelogue Initiative සමඟ එක්ව සංවිධානය කරන ලද ප්‍රදර්ශනයක් 2023 පෙබරවාරි 01 වන දින ශාස්ත්‍ර පීඨයේ මාණ්ඩලික රැස්වීම් ශාලාවේදී පැවැත්විණි.

- මාලදිවයින් විදේශ කටයුතු අමාත්‍ය අබ්දුල්ලා ෂාහිඩ් (O.D.RI.), විදේශ කටයුතු පිළිබඳ රාජ්‍ය අමාත්‍ය ගරු අහමඩ් බලීල් සහ ශ්‍රී ලංකාවේ මාලදිවයින් මහ කොමසාරිස් අලි ෆයිස් යන මහත්වරුන් ප්‍රමුඛ මාලදිවයින් දූත පිරිසක් 2023 පෙබරවාරි 03 වැනි දින විද්‍යාල මන්දිරයේදී උපකුලපති ජ්‍යෙෂ්ඨ මහාචාර්ය (මූලාසන) එච්.ඩී. කරුණාරත්න සහ වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයෙහි (PGIM) අධ්‍යක්ෂ මහාචාර්ය සේනක රාජපක්ෂ යන මහත්වරුන් හමුවූහ. තවද, මෙම ඉහළ පෙළේ මාලදිවයින් දූත පිරිස සමඟ ද්වීපාර්ශ්වික ලේකම් ආව හලා හමීඩ්, නියෝජ්‍ය මහ කොමසාරිස් ෆාතිමත් ගිනා මහත්මිය සහ මාලදිවයින් ජනරජයේ විදේශ කටයුතු අමාත්‍යාංශයේ සහකාර අධ්‍යක්ෂ අයිෂාත් ෆරීනා මහත්මිය ද සහභාගි වූහ.

- භූතාන රාජකීය රජයේ අධ්‍යාපන හා නිපුණතා සංවර්ධන අමාත්‍ය ගෞරවනීය ජායි බීර් රායි මහතා, බංග්ලාදේශයේ රාජකීය භූතාන තානාපති කාර්යාලයේ තානාපති රින්චෙන් ක්චෙන්ට්සිල් මහතා සහ අධ්‍යාපන හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශයේ නියෝජ්‍ය ප්‍රධාන වැඩසටහන් නිලධාරී කර්මා පුන්ට්සො මහතා සිය ශ්‍රී ලංකාවේ නිල සංචාරය අතරතුර 2023 පෙබරවාරි 6 වැනි දින විද්‍යාලීය මන්දිරයේදී කොළඹ විශ්වවිද්‍යාලයේ උපකුලපති ජ්‍යෙෂ්ඨ මහාචාර්ය (සභාපති) එච්.ඩී. කරුණාරත්න මහතා හමුවූහ.

- ප්‍රදාන යෝජනා ලිවීම පිළිබඳ වැඩමුළුවක් 2023 පෙබරවාරි 8 වන දින විශ්වවිද්‍යාලයේ කාර්ය මණ්ඩලය සඳහා උපාධි අධ්‍යයන පීඨයේදී පැවැත්විණි.

- 2023 පෙබරවාරි 9 වන දින පාරිසරික යුක්තිය පිළිබඳ මධ්‍යස්ථානය සහ පාරිසරික නීතිය සහ ප්‍රතිපත්ති පිළිබඳ මධ්‍යස්ථානය (CELP), 2022 පාරිසරික නීතිය සහ ප්‍රතිපත්ති පිළිබඳ දකුණු ආසියානු වාර සඟරාවෙහි (SAJELP) දෙවන වෙළුම සහ දකුණු ආසියානු පාරිසරික නීති වාර්තාව (SAELR) නිල වශයෙන් කොළඹ විශ්වවිද්‍යාලයේදී එලි දැක්වීය.

- 2023 පෙබරවාරි 9 සහ 10 යන දෙදින තුළ උපාධි අධ්‍යයන පීඨයේ ප්‍රධාන ශ්‍රවණාගාරයේදී පැවති හෙද පීඨය විසින් සංවිධානය කරන ලද ස්නායු විකෘතිතා ආබාධ පිළිබඳ ජාත්‍යන්තර සම්මන්ත්‍රණයට 400 කට අධික පිරිසක් සහභාගී වූහ.

- AHEAD ව්‍යාපෘතිය/ලෝක බැංකුවේ සහාය ඇතිව කළමනාකරණ සහ මූල්‍ය පීඨය 2023 පෙබරවාරි 14 වන දින සිය නව මාණ්ඩලික රැස්වීම් ශාලාව නිල වශයෙන් විවෘත කරන ලදී.

- කොළඹ විශ්වවිද්‍යාලයේ 2022/2023 ජයිකා මූලාසන වැඩසටහනේ සමාප්ති උත්සවය 2023 පෙබරවාරි 21 වැනි දින උපාධි අධ්‍යයන පීඨ ශ්‍රවණාගාරයේදී සාර්ථකව පැවැත්විණි.

- ශ්‍රී පාලී මණ්ඩපයෙහි ජනමාධ්‍ය අධ්‍යයන අංශය 2023 පෙබරවාරි 22 වැනි දින ප්‍රථම උපාධි විද්‍යාර්ථී පර්යේෂණ සමුළුවක් සංවිධානය කළේය. සමුළුවේ තේමාව වූයේ ''මාධ්‍ය සහ ලිබරල් කලාවේ ව්‍යුහය සහ ගතිකත්වය'' යන්නයි.

- මහාචාර්ය ප්‍රීති උඩගම ප්‍රමුඛ විද්‍යා පීඨයේ පර්යේෂණ කණ්ඩායමක් විසින් වර්ම ප්‍රතිජනන ප්‍රතිකාරය සඳහා නිර්විෂ බහු ඔසු ආසවනයකින් සමන්විත කාර්යක්ෂම උත්තේජකයක් නිපදවා ඇත.

- විශ්වවිද්‍යාලයේ අධ්‍යයන මාර්ගෝපදේශන වැඩසටහන (AMP) 2023 පෙබරවාරි 28 වන දින වෛද්‍ය පීඨයේ ප්‍රධාන ශ්‍රවණාගාරයේදී මුල් වෘත්තීය අධ්‍යයන කාර්ය මණ්ඩලය (ECAs) සඳහා ප්‍රේරක වැඩසටහනක් පවත්වන ලදී.

- විශ්ව විද්‍යාලයේ 10 වන පීඨය වන දේශීය වෛද්‍ය පීඨය 2023 පෙබරවාරි 13 වැනි බදාදා දින අංක 2319/22 අති විශේෂ ගැසට් පත්‍රය හරහා ස්ථාපිත කරන ලදී.

- 2021 වසර සඳහා වන කොළඹ විශ්වවිද්‍යාලයීය පශ්චාත් උපාධි උපාධි ප්‍රදානෝත්සවය 2023 මාර්තු 01 සහ 02 යන දිනවල බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී පවත්වන ලදී. 2023 මාර්තු 02 වැනි දින පැවති උපාධි ප්‍රදානෝත්සවයේදී විශ්වවිද්‍යාලයේ ආචාර්යවරුන් නව දෙනෙකුට පර්යේෂණ විශිෂ්ටතා සඳහා උපකුලපති සම්මාන පිරිනමන ලදී.

- නීති පීඨය සිය දියමන්ති ජුබිලි සංවත්සරය සමරමින් නව දර්ශනපති සහ දර්ශනසූරී උපාධි සඳහා බඳවා ගැනීමේ සමාරම්භක උත්සවයක් 2023 මාර්තු 9 වන දින විද්‍යාල මන්දිර ශ්‍රවණාගාරයේදී පැවැත්විය.

- කළමනාකරණ හා මූල්‍ය පීඨයේ ජාත්‍යන්තර ව්‍යාපාර අධ්‍යයන අංශය 2023 මාර්තු 31 වනදා 'අතීත ගෝලීය නායකත්වය බලගැන්වීම' යන තේමාව යටතේ එහි ප්‍රමුඛතම වාර්ෂික උත්සවය 'AUBRIANNA 1.0' සංවිධානය කළේය.

- ශාස්ත්‍ර පීඨයේ තරුණ සුවතා මධ්‍යස්ථානය (YWC) විවෘත කිරීම 2023 අප්‍රේල් මස 3 වන දින පීඨ පරිශ්‍රයේදී පැවැත්විණ.

- කොළඹ විශ්වවිද්‍යාලය ප්‍රමුඛ පෙළේ ආසියානු විශ්ව විද්‍යාල පහළොවක එකමුතුවක් වන AUA සඳහා හභාගී වූ අතර අතර එහි හයවන සමුළුව 2023 මැයි 11-13 දක්වා කසකස්තානයේ අස්තානා හි නසර්බයෙව් විශ්වවිද්‍යාලයේදී පැවැත්විණි.

- 2023 මැයි 18 වන දින සත්ව විද්‍යා හා පරිසර විද්‍යා අධ්‍යයන අංශය විසින් සත්වෝද්‍යාන කෞතුකාගාරය විවෘත කිරීම සනිටුහන් කරන ලදී.

- මහාචාර්ය වන්දන ජයරත්න සහ ආචාර්ය චතුරංග රණසිංහ, 2023 වර්ෂයෙහි කීර්තිමත් ආසියානු විද්‍යාඥ සියදෙනා අතර ලැයිස්තුගතව සිටිති.

- 2023 ජූලි 19 සිට 22 දක්වා ජර්මනියේ නියුරම්බර්ග් හි යුක්තියේ මාලිගයේ පැවති නියුරම්බර්ග් අධිකරණ සමාකරණ තරඟයට අප නීති පීඨය නියෝජනය කරමින් ඉදිරිපත් වූ කණ්ඩායම විශිෂ්ට සාර්ථකත්වයක් අත්කර ගත්තේය.

- 2023 අගෝස්තු 24: පාරිසරික මුලපිරීම් සඳහා වූ මධ්‍යස්ථානය (CEI) විද්‍යා පීඨයේ තොරතුරු සහ ඉගෙනුම් මධ්‍යස්ථානයේ 5 වන මහලේ "Green Talk" හි කථාංගයක් පැවැත්වීය. ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (DSM) හර්ෂ වික්‍රමසිංහ මහතා ආරාධිත කථිකයා ලෙස මෙම අවස්ථාවට සහභාගී විය.

- 2023 අගෝස්තු 25: නීති පීඨයේ පාරිසරික නීතිය සහ ප්‍රතිපත්ති මධ්‍යස්ථානයේ (CELP) සාමාජිකයින් 2023 පාරිසරික යුක්තිය පිළිබඳ ජාත්‍යන්තර සමුළුවේ පළමු දිනය (ICEJ'23) සාර්ථකව අවසන් කරන ලදී.

- ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් භාවේ තත්ත්ව සහතික කවුන්සිලය විසින් 2023 ජූනි - ජූලි ම පවත්වන ලද ආයතනික සමාලෝචනයේදී කොළඹ විශ්වවිද්‍යාලය A ශ්‍රේණියේ සාමාර්ථයක් ලබා ගත්තේය.

- කොළඹ විශ්වවිද්‍යාලයේ වාර්ෂික පර්යේෂණ සම්භාෂණය - 2023 [ARS-UoC 2023] 2023 නොවැම්බර් 2 වැනි දින "පර්යේෂණ විශිෂ්ටත්වය සහ ඉන් ඔබ්බට" යන තේමාව යටතේ පැවැත්විණි.

- 2023 දී, කොළඹ විශ්වවිද්‍යාලය 2022 සිය සාමාන්‍ය උපාධි ප්‍රදානෝත්සවය සැප්තැම්බර් 5 සහ 6 යන දිනවල බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ දී පැවැත්වීය. විවිධ විෂයයන් ඔස්සේ සිසුන් 3153 කට උපාධි ප්‍රදානය කරන ලදී. 2022 වර්ෂය සඳහා විවෘත සම්මාන 04 ක් සහ කොළඹ විශ්වවිද්‍යාලයේ අධ්‍යයන විශිෂ්ටතා සම්මාන 52 ක් ද මෙහිදී ප්‍රදානය කෙරිණි.

- 2023 දී, කොළඹ විශ්වවිද්‍යාලය සිය පශ්චාත් උපාධි උපාධි ප්‍රදානෝත්සවය 2021 මාර්තු 1 සහ 2 යන දිනවල බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී පැවැත්වූ අතර එහිදී පශ්චාත් උපාධි ඩිප්ලෝමා, ශාස්ත්‍රපති උපාධි සහ පර්යේෂණ උපාධි ඇතුළුව උපාධි 3621 ක් ප්‍රදානය කරන ලදී. පර්යේෂණ විශිෂ්ටතා සඳහා උපකුලපති සම්මාන නවයක් ද ප්‍රදානය කෙරිණි.

මෙම පිටුව හිස්ව තබනු ලැබේ.

කොළඹ විශ්වවිද්‍යාලය

ශක්‍යතා විශ්ලේෂණය



ශක්තීන්

ඓතිහාසික වටිනාකම
අන්තර්ජාතික කීර්තිය
පිහිටීමෙන් ලැබෙන වාසිය
ඉහළ සුදුසුකම් ලත් ආචාර්ය මණ්ඩලය
ශක්‍යතා පූර්ණ පරිපාලන කාර්ය මණ්ඩලය
පර්යේෂණ හා නවෝත්පාදන විශිෂ්ටත්වය
මිශ්‍ර ඉගෙනුම් පරිසරය
පූර්ණ යහපාලනය හා වගවීම
පහසුකම් සහිත පුස්තකාලය
සුවිශේෂ ඉගනුම් මධ්‍යස්ථාන / අධ්‍යාපන ආයතන
විශ්වාසනීය සිසුන්
විදේශීය සහයෝගිතා
තෘතීයික ඉගෙනුම් උපදෙස්
විදේශීය විශ්වවිද්‍යාල සමඟ සම්බන්ධතා ඇති කර ගැනීමේ හැකියාව
ගෝලීය ප්‍රමිතීන් අනුව යාවත්කාලීන වූ විෂයමාලා
සිසුන් සහ ප්‍රජාව සමඟ මනා සම්බන්ධතාවය
ශක්තිමත් ආදි විද්‍යාර්ථී සංගම්
ශක්තිමත් තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම්



දුර්වලතා

ප්‍රශස්ථ නොවූ යටිතල පහසුකම්
ව්‍යාප්තිය සඳහා ඉඩකඩ සීමිත වීම
නේවාසිකාගාර පහසුකම් ප්‍රමාණවත් නොවීම
ඉගෙනුම් ඉගැන්වීම් පරිසරයක් සඳහා දුර්වල ගොඩනැගිලි සැලසුම්කරණය
අවම චිත්තාකර්ෂණීය හරිත පරිසරය
ප්‍රමාණවත් නොවන කාර්ය මණ්ඩල නවාතැන්
සිසුන්ට ප්‍රමාණවත් නොවන තොරතුරු තාක්ෂණ පහසුකම්



අවස්ථා

කර්මාන්ත සමඟ හවුල්කාරිත්වය කෙරෙහි ඉල්ලුම

විශ්වවිද්‍යාලයේ ධනාත්මක ප්‍රතිරූපය
යාවජීව අධ්‍යාපනය කෙරෙහි ඇති උනන්දුව ඉහළ යාම
හිතකර අධ්‍යාපන ප්‍රතිපත්ති
ලෝක මට්ටමේ විශ්ව විද්‍යාල සමඟ සහයෝගිතාව පුළුල් කිරීම
ඊ-ඉගෙනුම් දිශානතිය කෙරෙහි වර්ධනය වන ප්‍රවණතාවය
විදේශීය සිසුන්ගේ ආකර්ෂණය
අක්වෙරළ විශ්වවිද්‍යාල සඳහා ඉල්ලුම
ව්‍යාප්ත පාඨමාලා මගින් ලැබෙන අරමුදල් අවස්ථා



තර්ජන

දක්ෂ කාර්ය මණ්ඩලය ආකර්ශනය කර ගැනීමේ අපහසුතාව
විදේශීය විශ්ව විද්‍යාල වලින් එල්ල වන තරහය
කල්ගතවන අනුමත කිරීමේ ක්‍රියාවලීන්
පරිපාලනමය සංකීර්ණතා
ගැටුම්
උපාධිධාරී විරැකියාව
විශ්ව විද්‍යාලය සඳහා සීමිත අරමුදල්


අරමුණු		ඉලක්ක	උපායමාර්ග
1 අරමුණ	ඉගැන්වීමේ හා ඉගෙනීමේ විශිෂ්ටත්වය ළඟා කර ගැනීම *[දැනුම් සම්ප්‍රේෂණය]*	1.1 ගෝලීය වශයෙන් තරඟකාරී උපාධිධාරීන් බිහි කිරීම	*1.1.1* ස්වාධීන ඉගෙනුම, විචාරාත්මක චින්තනය සහ යාවජීව ඉගෙනුම පරිපෝෂණය කිරීම තුළින් උපාධිධාරී ගුණාංග වැඩි දියුණු කිරීම
			1.1.2 පෞරුෂ සංවර්ධනය, උපදේශනය සහ වෘත්තීය මාර්ගෝපදේශනය සැපයීම තුළින් ශිෂ්‍ය සංවර්ධනයට පහසුකම් සැලසීම
		1.2 ඉගෙනුම් ප්‍රවර්ධනය සඳහා නවීන වැඩිහිටි අධ්‍යාපන විද්‍යාත්මක ප්‍රවේශයන් අනුගමනය කිරීම	*1.2.1* කාර්ය මණ්ඩලයේ අඛණ්ඩ වෘත්තීය සංවර්ධන කටයුතුවල *(CPD)* නිරත වීම *1.2.2* තත්ත්ව සහතිකකරණය සවිබල ගැන්වීම *1.2.3* ඩිජිටල් ඉගෙනුම් පරිවර්තනය මඟින් බලගන්වන ලද උසස් ඉගෙනුම් ප්‍රවේශයන් ප්‍රවර්ධනය කිරීම.
		1.3 කලාපීය හා ගෝලීය ජාලයන් ව්‍යාප්ත කිරීම	*1.3.1* ජාත්‍යන්තර සහයෝගිතා ප්‍රවර්ධන කිරීම 1.3.2 කලාපීය සහ ගෝලීය අධ්‍යයන/වෘත්තීය සංවිධාන සමඟ සම්බන්ධතා ඇති කර ගැනීම දිරිමත් කිරීම 1.3.3 ජාත්‍යන්තර උත්සව සහ විෂය බාහිර ක්‍රියාකාරකම් සඳහා සහභාගී වීම දිරිමත් කිරීම 1.3.4 ගෝලීය ශ්‍රේණිගත කිරීම ඉහළ නංවා ගැනීම
		1.4 ඉගෙනුම් ශික්ෂණයන් පෘථුල කිරීම	1.4.1 ඉගෙනුම් වර්ධනයන්හි නව ක්ෂේත්‍ර අඛණ්ඩව හඳුනා ගැනීම 1.4.2 වෙළඳපල අවශ්‍යතා, පර්යේෂණ සොයාගැනීම් සහ අත්දැකීම් මත පදනම්ව නව ක්ෂේත්‍ර සංවර්ධනය කිරීම
2 අරමුණ	පර්යේෂණ, නවෝත්පාදන සහ කර්මාන්ත/සමාජ සහයෝගිතාවයේ විශිෂ්ටත්වය [දැනුම නිර්මාණය]	2.1 පර්යේෂණ කටයුතුවල නියැලීම ඉහළ නැංවීම	2.1.1 ශක්තිමත් පර්යේෂණ සංස්කෘතියක් බිහි කිරීම 2.1.2 උපරිම මට්ටමින් පර්යේෂණ ආචාර ධර්ම සහ අවංකත්වය සහතික කිරීම 2.1.3 පර්යේෂණයේ ගෝලීය දෘශ්‍යතාව සවිබල ගැන්වීම
		2.2 විශ්ව විද්‍යාලයෙන් කර්මාන්ත ක්ෂේත්‍රය වෙත නවෝත්පාදන සහ දැනුම හුවමාරු කිරීම ප්‍රවර්ධනය කිරීම	2.2.1 විශ්වවිද්‍යාල ව්‍යාපාර සම්බන්ධීකාරකයේ ක්‍රියාකාරිත්වය ප්‍රශස්ත කිරීම 2.2.2 නවීන විද්‍යාගාර පහසුකම් සහ ඒ ආශ්‍රිත පර්යේෂණ සහාය වැඩිදියුණු කිරීම/ ස්ථාපිත කිරීම
3 අරමුණ	විශිෂ්ට ප්‍රාග්ධනය සහ ඉගෙනුම් ආධාරක පද්ධතීන්	3.1 උපාය මාර්ගික අවශ්‍යතා සමඟ සමපාත වෙමින් මානව ප්‍රාග්ධනය වැඩිදියුණු කිරීම	3.1.1 කාර්ය මණ්ඩලයේ ධාරිතාව වැඩි දියුණු කිරීම 3.1.2 මානව ප්‍රාග්ධනයේ නියුක්තිය වැඩි දියුණු කිරීම

		3.2 ගෝලීය ප්‍රමිතීන්ට උචිත වන සේ භෞතික ප්‍රාග්ධනය වැඩිදියුණු කිරීම	3.2.1 ඵලදායී නඩත්තු පද්ධතියක් අනුගමනය කිරීම 3.2.2 භෞතික පහසුකම් සමාලෝචනය කිරීම සහ වැඩිදියුණු කිරීම
		3.3 ඩිජිටල් පරිවර්තනයට පහසුකම් සැලසීම සහ අතථ්‍ය ප්‍රාග්ධනය වැඩිදියුණු කිරීම	3.3.1 නවතම ඩිජිටල් යටිතල පහසුකම් සහ සම්පත් ලබා ගැනීමේ හැකියාව සහ ප්‍රවේශය වැඩි දියුණු කිරීම 3.3.2 ඩිජිටල් කාර්යාල භාවිතයන් ප්‍රවර්ධනය කිරීම
4 අරමුණ	වගකීම්සහගත විශිෂ්ට කළමනාකරණය	4.1 තිරසාර භාවිතයන් වැඩි දියුණු කිරීම	4.1.1 තිරසාර සංවර්ධන ඉලක්ක (SDGs) සමඟ ක්‍රියාකාරකම් සම්පාත කිරීම 4.1.2 තිරසාර වාර්තාකරණ සහ ඇගයීම් පද්ධතියක් ප්‍රවර්ධනය කිරීම 4.1.3 හරිත භාවිතයන් තහවුරු කිරීම 4.1.4 මූල්‍ය කළමනාකරණ පද්ධතිය ශක්තිමත් කිරීම
		4.2 වෘත්තීයමය සහ සදාචාරාත්මක හැසිරීම් ශක්තිමත් කිරීම	4.2.1 ක්‍රියාකාරකම්වල වෘත්තීයභාවය වැඩි දියුණු කිරීම 4.2.2 එකඟ වූ ආචාර ධර්ම සහ වැඩ සම්මතයන් තුළ ක්‍රියාත්මක වීම
		4.3 වගකීම්සහගත භාවිතයන් ප්‍රවර්ධනය කිරීම	4.3.1 විනිවිදභාවය, අවංකත්වය, සාධාරණත්වය, විශ්වාසය සහ යහපාලනය ප්‍රවර්ධනය කිරීම 4.3.2 පැමිණිලි සම්බන්ධ පියවර ගැනීම සහ ප්‍රතිපෝෂණ පද්ධතියක් වැඩිදියුණු කිරීම 4.3.3 ආදි විද්‍යාර්ථී සංගම් සමඟ ජාලකරණය ශක්තිමත් කිරීම

කොළඹ විශ්වවිද්‍යාලය

ඇමුණුම V(I)

ආයතනික ව්‍යුහය



D/CQA- අධ්‍යක්ෂ/තත්ත්ව සහතිකකරණය සඳහා වූ මධ්‍යස්ථානය
D/CRD – අධ්‍යක්ෂ/ පර්යේෂණ හා සංවර්ධනය සඳහා වූ මධ්‍යස්ථානය
D/CGU – අධ්‍යක්ෂ/ ධෘත්තීය මාර්ගෝපදේශන ඒකකය
D/IOUC – අධ්‍යක්ෂ/ කොළඹ විශ්වවිද්‍යාලයීය ජාත්‍යන්තර කාර්යාලය
D/SDC – අධ්‍යක්ෂ/ කෙරිය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය
D/NOC – ජාල මෙහෙයුම් මධ්‍යස්ථානය
D/CEI – අධ්‍යක්ෂ/ පාරිසරික මුලපිරීම් සඳහා වූ මධ්‍යස්ථානය
D/NEREC – අධ්‍යක්ෂ/ ජාතික අධ්‍යාපන පර්යේෂණ සහ ඇගයුම් මධ්‍යස්ථානය
D/ SPARC- අධ්‍යක්ෂ/ සමාජ ප්‍රතිපත්ති විශ්ලේෂණ සහ පර්යේෂණ මධ්‍යස්ථානය
D/PE – අධ්‍යක්ෂ/ ශාරීරික අධ්‍යාපනය
SSC – ජ්‍යෙෂ්ඨ ශිෂ්‍ය අනුශාසක
DIA – නියෝජ්‍ය අභ්‍යන්තර විගණක
DR – නියෝජ්‍ය ලේඛකාධිකාරී
DB – නියෝජ්‍ය මූල්‍යාධිකාරී
SIA – ජ්‍යෙෂ්ඨ අභ්‍යන්තර විගණක
SAR – ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී
SAB – ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී
SALB- ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපති
WE – වැඩ ඉංජිනේරු
AR – සහකාර ලේඛකාධිකාරී
AB – සහකාර මූල්‍යාධිකාරී
ALB – සහකාර පස්තකාලයාධිපති

	අන්තර්ගතය		පිටු අංකය
1	**දළ විශ්ලේෂණය**		**13**
	1.1	පාලක භාව	16
	1.2	සනාතන භාව	17
	1.3	රැස්වීම්	23
	1.4	විශ්වවිද්‍යාලයේ දළ විශ්ලේෂණය	24
	1.5	සමස්ත කාර්ය සාධනය	42
2	**පීඨ, මණ්ඩප, මධ්‍යස්ථාන හා ඒකක**		**43**
	2.1	ශාස්ත්‍ර පීඨය	43
	2.2	අධ්‍යාපන පීඨය	47
	2.3	පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය	49
	2.4	නීති පීඨය	55
	2.5	කළමනාකරණ හා මූල්‍ය පීඨය	57
	2.6	වෛද්‍ය පීඨය	60
	2.7	විද්‍යා පීඨය	64
	2.8	තාක්ෂණ පීඨය	71
	2.9	භෙද පීඨය	73
	2.10	දේශීය වෛද්‍ය විද්‍යා පීඨය	75
	2.11	කොළඹ විශ්වවිද්‍යාලයීය ශිෂ්‍ය සංගම් පිළිබඳ විස්තර	77
	2.12	ජාල මෙහෙයුම් මධ්‍යස්ථානය (NOC)	79
	2.12	සයිබර් මණ්ඩපය- විවෘත හා දුරස්ථ අධ්‍යාපන මධ්‍යස්ථානය	79
	2.13	ශ්‍රීපාලි මණ්ඩපය	82
	2.14	මකාලීන ඉන්දියානු අධ්‍යයන මධ්‍යස්ථානය (CCIS)	88
	2.15	මානව හිමිකම් අධ්‍යයන කේන්ද්‍රය (CSHR)	91
	2.16	සෞඛ්‍ය මධ්‍යස්ථානය	96
	2.17	ජාතික අධ්‍යාපන පර්යේෂණ සහ ඇගයීම් මධ්‍යස්ථානය (NEREC)	96
	2.18	කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය (SDC)	98
	2.19	මාජ ප්‍රතිපත්ති විශ්ලේෂණ සහ පර්යේෂණ මධ්‍යස්ථානය (SPARC)	101
	2.20	ජාත්‍යන්තර කාර්යාලය (IOUC)	102
	2.21	කොන්ෆියුසියස් ආයතනය	104
	2.22	පුස්තකාලය	105
	2.23	අභ්‍යන්තර තත්ත්ව භතික මධ්‍යස්ථානය (CQA)	109
	2.24	ශාරීරික අධ්‍යාපන අංශය	112
	2.25	පාරිසරික මුලපිරීම් සඳහා වූ මධ්‍යස්ථානය (CEI)	112
	2.26	විශ්වවිද්‍යාල ව්‍යාපාර සංධාරක කුටිය (UBL Cell)	114
	2.27	වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය (CGU)	115
	2.28	ස්ත්‍රීපුරුෂ සමාජභාව මානත්වය සඳහා වූ මධ්‍යස්ථානය (CFGE)	115
	2.29	දුම්කොළ විරෝධී මධ්‍යස්ථානය (CCT)	116
	2.31	අරාබි සහ ඉස්ලාමීය ශිෂ්ටාචාර ඒකකය	117
	2.32	දත්ත විද්‍යාව සඳහා වූ මධ්‍යස්ථානය (CDS)	119
	2.33	කොළඹ විද්‍යා හා තාක්ෂණ කුටිය	120
	2.34	ආබාධිකත්ව පර්යේෂණ, අධ්‍යාපනය හා භාවිතය සඳහා වූ මධ්‍යස්ථානය (CEDREP)	120
3	**පත්වීම් හා කාර්ය මණ්ඩල තොරතුරු**		**122**
4	**පර්යේෂණ හා පර්යේෂණ ප්‍රවර්ධන ක්‍රියාකාරකම්**		**126**
5	**විභාග අංශය**		**130**
6	**ශිෂ්‍ය සහ සේවක කටයුතු අංශය**		**130**
7	**ප්‍රාග්ධන හා කාර්‍ය සැලසුම් අංශය**		**136**
8	**නීති හා ප්‍රලේඛන ඒකකය**		**139**
9	**අභ්‍යන්තර විගණන අංශය**		**146**
10	**කොළඹ විශ්වවිද්‍යාලය විසින් විශ්වවිද්‍යාලයේ කාර්ය සාධනය වැඩි දියුණු කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ගවල සාරාංශය**		**149**
11	**ධරණීය සංවර්ධනය මත පදනම් වූ අනාගත ප්‍රක්ෂේපන වාර්තාවක්**		**151**

1. දළ විශ්ලේෂණය

1921 දී ස්ථාපිත කොළඹ විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාවේ පැරණිතම උසස් අධ්‍යාපන ආයතනය වන අතර අධ්‍යයන විශිෂ්ටත්වයේ ප්‍රතිමූර්තියකි. "බුද්ධි සර්වත්‍ර භ්‍රාජතේ" (බුද්ධිය ඥානාලෝක කරයි) යන ආදර්ශ පාඨය අනුව යන විශ්වවිද්‍යාලය, සිය වසර *150* ක ඉතිහාසය පුරා අධ්‍යාපනය, පර්යේෂණ සහ ප්‍රජා සහභාගිත්වය යන සියලු අංශවල ඉහළම ප්‍රමිතීන් පවත්වා ගෙන ගොස් ඇත. මෙමගින් පිරිනැමෙන විවිධාකාර වරණයන් සහ පහසුකම්වලින් වර්ධනය උදෙසා එහි කැපවීම පිළිබිඹු වේ. *1921* දී පිහිටුවන ලද ලංකා විශ්වවිද්‍යාලයෙන් සහ *1870* දී පිහිටුවන ලද ලංකා වෛද්‍ය විද්‍යාලයෙන් ස්ථාපනය වූ අප විශ්වවිද්‍යාලය සාරගර්භ උරුමයකට හිමිකම් කියයි.

කොළඹ නගර මධ්‍යයේ පිහිටා ඇති අක්කර 50 ක වපසරියකින් යුතු විශ්වවිද්‍යාල පරිශ්‍රය, යටත් විජිත ගෘහ නිර්මාණ ශිල්පයෙහි සහ නවීන පහසුකම්වල සංකලනයකින් සමන්විත වන අතර, එමඟින් සිසුන්ට පුස්තකාල, රංග ශාලා සහ ක්‍රීඩා සංකීර්ණ වැනි විවිධ සංස්කෘතික, අධ්‍යයන සහ විනෝදාත්මක අත්දැකීම් ලැබීමේ සම්පත් ස්ථාන වෙත ප්‍රවේශය ලබා දේ. මෙම නාගරික පසුබිම අධ්‍යයන හා විෂය බාහිර අත්දැකීම් සඳහා ඇති අවස්ථා පෘථුල කරයි. ශක්තිමත් හවුල්කාරිත්වයන්, ශිෂ්‍ය හුවමාරු ප්‍රවර්ධනය, ඒකාබද්ධ පර්යේෂණ සහ වැඩසටහන් ජාත්‍යන්තරකරණය හරහා විශ්වවිද්‍යාලය ගෝලීය වශයෙන් කීර්තිමත් ආයතන සමග සම්බන්ධතා පවත්වා ගනී. ජාත්‍යන්තර සිසුන් සඳහා පිරිනැමෙන ශිෂ්‍යත්ව මගින් විශ්වවිද්‍යාලය තුළ ප්‍රවේශ්‍යතාව සහ අන්තර්ග්‍රහණය කෙරෙහි වන කැපවීම අවධාරණය කෙරේ.

කාර්ය මණ්ඩලය සහ විද්‍යාර්ථීන් උදෙසා අන්තර්ග්‍රාහී වටපිටාවක් නිර්මාණය කරමින් සමාජ සංහිඳියාව සහ සැමට සමාන අවස්ථා ප්‍රවර්ධනය කරන බහු සංස්කෘතික, බහු වාර්ගික සහ බහු ආගමික විවිධත්වයකින් හෙබි විශ්වවිද්‍යාල ප්‍රජාව කොළඹ විශ්වවිද්‍යාලයේ ප්‍රමුඛතම අංගයකි. උපාධිධාරීන්ගේ රැකියා නියුක්ති ශක්‍යතාවය ඉහළ නංවන පර්යේෂණ, නවෝත්පාදන සහ කර්මාන්ත හවුල්කාරිත්වයන් ඔස්සේ ජාතික සංවර්ධනයට දායක වන විශ්වවිද්‍යාලය, සිය ප්‍රජාවෙහි විවිධත්වය ගෞරවාන්විතව සමරන අතරම එහි එකමුතුකම තරයේ අවධාරණය කරයි. විශ්වවිද්‍යාලය තුළ සිය විද්‍යාර්ථීන්ගේ සමස්ත සංවර්ධනය කෙරෙහි වන කැපවීම පිළිබිඹු කරන සුවිශේෂී ක්‍රීඩා වැඩසටහන් ඇගයීමට ලක්ව ඇත. "පෙරදැක්ම සහ ගුණාංග අතින් නවීන හා ජාත්‍යන්තර පුරවර සරසවියක්" ලෙස තම අනන්‍යතාවය පවත්වා ගනිමින් සමකාලීන අභියෝගවලට මුහුණ දීම සඳහා කාර්ය සාධන වැඩිදියුණු කිරීමේ උපායමාර්ගික සැලැස්ම (*PISP)* මගින් මාර්ග දර්ශනය ලබන විශ්වවිද්‍යාලය නවීන අධ්‍යාපනික සහ පර්යේෂණ ප්‍රවේශයන් අනුගමනය කරයි.

කොළඹ විශ්වවිද්‍යාලය 19 වන සියවසේ සිය උරුමය තුළ මුල් බැසගත් ඔරොත්තු දීමේ හැකියාව, නවෝත්පාදනය සහ අධ්‍යයන විශිෂ්ටත්වය වර්තමානය දක්වා අභිමානයෙන් යුතුව ප්‍රදර්ශනය කරයි. අනාගතවාදී දෘෂ්ටියකින් බලන විට, විශ්වවිද්‍යාලය ශාස්ත්‍රාභිලාෂී මනස් දැනුමෙන් සන්නද්ධ කිරීම, විජිගීෂාවන් පෝෂණය කිරීම සහ බුද්ධිමය හා සංස්කෘතික වර්ධනයෙන් ශ්‍රී ලංකාව පමණක් නොව සමස්ත ගෝලීය ප්‍රජාව ද පොහොසත් කිරීමේ මෙහෙවරට කැපවී සිටී.

කොළඹ විශ්වවිද්‍යාලය පීඨ දහයකින් (10) සහ එක් මණ්ඩපයකින් සමන්විත වෙයි, ඒවා මෙසේය:


- ශාස්ත්‍ර පීඨය
- අධ්‍යාපන පීඨය
- පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය
- නීති පීඨය
- කළමනාකරණ හා මූල්‍ය පීඨය
- වෛද්‍ය පීඨය
- හෙද පීඨය
- විද්‍යා පීඨය
- තාක්ෂණ පීඨය
- දේශීය වෛද්‍ය විද්‍යා පීඨය
- ශ්‍රීපාලි මණ්ඩපය

විශ්වවිද්‍යාලය සතුව අනුබද්ධ ආයතන හතක් (7) හා එක් පාසලක් පවතී. ඒවා මෙසේය.

- මානව මිපත් අභිවර්ධන ආයතනය (IHRA)
- වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය (PGIM)
- ජාතික පුස්තකාල සහ විඥාපන සේවා ආයතනය (NILIS)
- ජෛව රසායන විද්‍යා, අණුක ජීවවිද්‍යා සහ ජීවතාක්ෂණවේද ආයතනය (IBMBB)
- කොළඹ විශ්වවිද්‍යාලයිය කෘෂි තාක්ෂණ සහ ග්‍රාමීය විද්‍යා ආයතනය (IARS)
- දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය (PGIIM)
- කොළඹ විශ්වවිද්‍යාලයිය පරිගණක පාසල (UCSC)

විශ්වවිද්‍යාලය සතුව මධ්‍යස්ථාන සහ ඒකක කීපයක් පවතින අතර ඒවා මෙසේය.

- වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය (CGU)
- දන්ත විද්‍යාව දහා වූ මධ්‍යස්ථානය (CDS)
- දුම්කොළ විරෝධී මධ්‍යස්ථානය (CCT)
- මකාලීන ඉන්දියානු අධ්‍යයන මධ්‍යස්ථානය (CCIS)
- පාරිසරික මුලපිරීම් සඳහා වූ මධ්‍යස්ථානය(CEI)
- ්‍රස්ත්‍රීපුරුෂ සමාජභාව සමානත්වය සඳහා වූ මධ්‍යස්ථානය (CFGE)
- තත්ත්ව හතික මධ්‍යස්ථානය (CQA)
- මානව හිමිකම් අධ්‍යයන කේන්ද්‍රය (CSHR)
- කොළඹ විද්‍යා හා තාක්ෂණ කුටිය
- කොන්ෆියුසියස් ආයතනය
- සෞඛ්‍ය මධ්‍යස්ථානය
- ජාත්‍යන්තර කාර්යාලය (IOUC)
- ජාතික අධ්‍යාපන පර්යේෂණ හා ඇගයුම් මධ්‍යස්ථානය (NEREC)
- ශාරීරික අධ්‍යාපන අංශය
- මාජ ප්‍රතිපත්ති විශ්ලේෂණ හා පර්යේෂණ මධ්‍යස්ථානය (SPARC)
- කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය (SDC)
- ආබාධිකත්ව පර්යේෂණ, අධ්‍යාපනය හා භාවිතය සඳහා වූ මධ්‍යස්ථානය (CEDREP)
- විශ්වවිද්‍යාල ව්‍යාපාර සම්බන්ධීකාරක කුටිය (UBL Cell)



මණ්ඩප, පීඨ සහ ආයතන

1. ශාස්ත්‍ර පීඨය
2. අධ්‍යාපන පීඨය
3. නීති පීඨය
4. කළමනාකරණ හා මූල්‍ය පීඨය
5. වෛද්‍ය පීඨය
6. භෙද පීඨය
7. විද්‍යා පීඨය
8. තාක්ෂණ පීඨය
9. දේශීය වෛද්‍ය විද්‍යා පීඨය
10. පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය
11. ශ්‍රීපාලි මණ්ඩපය
12. කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක පාසල (UCSC)
13. මානව සම්පත් අභිවර්ධන ආයතනය (IHRA)
14. වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය (PGIM)
15. දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය (PGIIM)
16. ජාතික පුස්තකාල හා විඥාපන සේවා ආයතනය (NILIS)
17. ජෛව රසායන විද්‍යා, අණුක ජීවවිද්‍යා හා ජීවතාක්ෂණවේද ආයතනය (IBMBB)
18. කොළඹ විශ්වවිද්‍යාලයීය කෘෂි තාක්ෂණ හා ග්‍රාමීය විද්‍යා ආයතනය (UCIARS)

1.1 පාලක සභාව

නිලබලයෙන් පත්	
භාපති : උපකුලපති	මහාචාර්ය එච්. ඩී. කරුණාරත්න
මණ්ඩපාධිපති , ශ්‍රීපාලි මණ්ඩපය	ආචාර්ය එස් ඩබ් පී මහානාමහේවා
පීයාධිපතිවරු	
• ශාස්ත්‍ර	මහාචාර්ය ලසන්ත මානවඩු
• අධ්‍යාපන	ආචාර්ය එල්.එම්. කපිල බණ්ඩාර
• පශ්චාත් උපාධි අධ්‍යයන	මහාචාර්ය ඒ.ඒ. අසීස්
• දේශීය වෛද්‍ය විද්‍යා	මහාචාර්ය පී. කමල් පෙරේරා
• නීති	මහාචාර්ය එන්. එස්. පුංචිහේවා
• කළමනාකරණ සහ මූල්‍ය	මහාචාර්ය නිහාල් පද්මසිරි
• වෛද්‍ය	මහාචාර්ය වජිර එච්. ඩබ්. දිසානායක
• භෙද	මහාචාර්ය එස්. එස්. පී. වර්ණකුලසූරිය
• විද්‍යා	මහාචාර්ය ඩී. යූ. ජේ. සොන්නදර
• තාක්ෂණ	මහාචාර්ය ආර්. යූ. කේ. පියදාස
වෙනත්	
සනාතන භාවෙන් තෝරා පත්කළ	
• මහාචාර්ය කේ. පී. හේවාගමගේ • මහාචාර්ය වන්දන අලුත්ගේ	
විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසමෙන් පත්කළ	
• ගරු ක්වින්ටස් ප්‍රනාන්දු පියතුමා (2022 සැප්තැම්බර් සිට) • මහාචාර්ය එස් කරුණාරත්න (2022 මාර්තු දක්වා) • මහින්ද මඩිහහේවා මහතා • පද්මිණි රණවීර මහත්මිය • ඉන්ද්‍රානි වීරතුංග මහත්මිය • ජනාධිපති උපදේශක සංජීව ජයවර්ධන මහතා • නන්දික බුද්ධිපාල මහතා (2022 සැප්තැම්බර් සිට) • වන්න ද සිල්වා මහතා (2022 ඔක්තෝබර් සිට) • අශාන් ජෝශප් වාස් ජයසේකර මහතා • රජීව් අමරසූරිය මහතා • ජයවිලාල් මීගොඩ මහතා • ගිමානිත මහාචාර්ය එස් එම් ඒ නානායක්කාර • අශෝක හෙට්ටිගොඩ මහතා • කුසල් ද සිල්වා මහතා • ආචාර්ය සංජයදේව ද සිල්වා මුණසිංහ	
ලේකම්: වැඩ බලන ලේඛකාධිකාරී	
• වජිරා හපුහින්න ජයරත්න මිය	

1.2 සනාතන සභාව

1985 අංක 7 දරන පණත මගින් සංශෝධිත 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතෙහි 46(2) වගන්තිය මගින් විශ්වවිද්‍යාල සනාතන භාව පිහිටුවා ඇත. 2022 වර්ෂයේ එය පහත සාමාජිකයන්ගෙන් සමන්විත විය;

නිලබලයෙන් පත්වූ	
භාපති: උපකුලපති	මහාචාර්ය එච්. ඩී. කරුණාරත්න
මණ්ඩපාධිපති - ශ්‍රීපාලි මණ්ඩපය	ආචාර්ය එස්.ඩබ්. පී. මහානාමහේවා
පීඨාධිපතිවරුන්	
ශාස්ත්‍ර	මහාචාර්ය ලසන්ත මානවඩු
අධ්‍යාපන	ආචාර්ය එල්.එම්. කපිල බණ්ඩාර
දේශීය වෛද්‍ය විද්‍යා	මහාචාර්ය පී.කේ. පෙරේරා
නීති	මහාචාර්ය එන්**.** එස්**.** පුංචිහේවා
කළමනාකරණ සහ මූල්‍ය	මහාචාර්ය එම්**.** පී**.** පී**.** ධර්මදාස (30.11.2023 දක්වා) සහාය මහාචාර්ය එච්.එම්.එන්. පද්මසිරි (01.12.2023 සිට)
වෛද්‍ය	මහාචාර්ය වජිර එච්**.** ඩබ්**.** දිසානායක
විද්‍යා	මහාචාර්ය ඩී. යූ. ජේ. සොන්නාදර
පශ්චාත් උපාධි අධ්‍යයන	මහාචාර්ය ඒ.ඒ. අසිස්
භෙද	මහාචාර්ය එස්**.** එස්.පී. වර්ණකුලසූරිය
තාක්ෂණ	මහාචාර්ය ජේ.කේ.ඩී.ඒස්. ජයනෙත්ති (12.04.2023 සිට) මහාචාර්ය ආර්.යූ.කේ. පියදාස (13.04.2023 දක්වා)
ආයතන සහ පරිගණක පාසලේ අධ්‍යක්ෂවරු	
කෘෂි තාක්ෂණ සහ ග්‍රාමීය විද්‍යා ආයතනය	ආචාර්ය ඒ.ඩී. අම්පිටියවත්ත (01.11.2023 දක්වා) මහාචාර්ය ඩී.එම්.සී.සී. ගුණතිලක (01.11.2023 සිට වැඩ බලන අධ්‍යක්ෂක**)**
ජෛව රසායනවේද, අනුකජෛවවේදය සහ ජෛවතාක්ෂණවේද ආයතනය	මහාචාර්ය බී. පී. ගල්හේන
මානව සම්පත් අභිවර්ධන ආයතනය	මහාචාර්ය ඩබ්.එස්.වන්ද්‍රසේකර
දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය	මහාචාර්ය ප්‍රියානි පරණගම (2023.02.12 දක්වා)
ජාතික පුස්තකාල සහ විඥාපන සේවා ආයතනය	ආචාර්ය කේ. ජී. පී. ජී. විජේතුංග
වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය	මහාචාර්ය සේනක රාජපක්ෂ
දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය	මහාචාර්ය ක්‍රිෂාන්ත අබේසේන
කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක පාසල	ආචාර්ය ඩී.ඒ.එස්. අතුකෝරළ
අධ්‍යයනාංශ ප්‍රධානීන්	
ගිණුම්කරණ	ආචාර්ය එන්.කේ. ජයසිරි
කෘෂි තාක්ෂණය	ආචාර්ය එන්.පී. විදානපතිරණ
කෘෂිකාර්මික තාක්ෂණය	ආචාර්ය. ජේ. ජේ .වේවැල්වල
කාය ව්‍යවච්ඡේදය	මහාචාර්ය ඩී.ජේ.ඇන්තනි (10.06.2023 දක්වා) සහාය මහාචාර්ය එච්.ඩබ්.ඩබ්. ගුණසේකර (11.06.2023 සිට)
නිර්වින්දන විද්‍යාව හා දැඩි සත්තාර	මහාචාර්ය අනුජ අභයදීර
සම සෞඛ්‍ය විද්‍යාව	ආචාර්ය ඩී. ජී. එස්. කේ. එල්.ජයවර්ධන
ආයුර්වේද	ආචාර්ය එස්. පී. මොල්ලිගොඩ (12.02.2023 දක්වා)
ආයුර්වේද විද්‍යාව සහ දේශීය සෞඛ්‍ය විද්‍යාව	මහාචාර්ය ආර්.ඩී.එච්. කුලතුංග
ආයුර්වේද ශල්‍යකර්ම, ENT, අක්ෂි වෛද්‍ය විද්‍යාව, ප්‍රසව හා නාරීවේදය හා ළමා රෝග	ආචාර්ය කේ.පී.කේ.ආර්. කරුණාගොඩ
ආයුර්වේද ඖෂධවේදය, භිෂග්වේදය සහ ප්‍රජා වෛද්‍ය විද්‍යාව	මහාචාර්ය එස්.කේ.එම්.කේ. හැරපත්දෙණිය
මූලික මූලධර්ම, ආයුර්වේද ව්‍යූහ විද්‍යාව සහ කායික විද්‍යාව	සහාය මහාචාර්ය එස්. පී. මොල්ලිගොඩ
භෙද සේවය සඳහා මූලික විද්‍යාව සහ සමාජ විද්‍යාව	ආචාර්ය ඩී. ඒ. එස්. ඇල්විටිගල

ජෛවරසායන සහ අනුක ජීවවිද්‍යා	මහාචාර්ය එස්.එම්.ටී. ජයසේන
ව්‍යාපාර ආර්ථිකය	සහාය මහාචාර්ය එච්.එම්.එන්. පද්මසිරි (30.11.2023 දක්වා) මහාචාර්ය එම්.ඒ.ඩබ්ලිව්.ඩී. මදුරප්පෙරුම (01.12.2023 සිට)
බෞද්ධ අධ්‍යයනය	පූජ්‍ය යූ. ආනන්ද හිමි
රසායන විද්‍යාව	මහාචාර්ය කේ. එම්. එන්. ද සිල්වා (12.08.2023 දක්වා) මහාචාර්ය ඩබ්.ආර්.එම්. ද සිල්වා (13.08.2023 සිට)
සායනික වෛද්‍ය විද්‍යාව	මහාචාර්ය පී. කටුලන්ද
ජෛවරසායන සහ අනුක ජීවවිද්‍යා	ආචාර්ය ජී. කිසෝකාන්ත්
වාණිජ නීතිය	එච්. ඒ. මේනක මයා
සන්නිවේදනය සහ නිර්මාණාත්මක කලා	මහාචාර්ය එච්.එම්.එස්. හේරත්
ප්‍රජා වෛද්‍ය විද්‍යාව	මහාචාර්ය එල්.ඩී.ජේ.යූ. සෙනරත්
පරිගණක අධ්‍යයනය	ඩබ්. ඒ. එස් .බී. ෆොන්සේකා මයා
පරිගනකමය හා බුද්ධිමය පද්ධති	ආචාර්ය සී.අයි. කැප්පිටියාගම
සංනිවේදනය හා මාධ්‍ය තාක්ෂණය	මහාචාර්ය ටී.එන්.කේ. ද සොයිසා
ප්‍රජා විද්‍යාව	ආචාර්ය කේ. ඩී. එම්. එස්. කේ. වීරතුංග
ආර්ථික විද්‍යාව	මහාචාර්ය සී.පී. අලුත්ගේ
අධ්‍යාපන මනෝවිද්‍යාව	අයි.ජී.සී. චන්ද්‍රකුමාර මයා
ඉංග්‍රීසි	ආචාර්ය දිනිති කරුණානායක
ඉංග්‍රීසි භාෂා අධ්‍යයනය	එස්.ආර්. ඉලංගකෝන් මිය
පාරිසරික තාක්ෂණය	මහාචාර්ය ආර් .යූ.කේ. පියදාස (19.04.2023 දක්වා) මහාචාර්ය සී.කේ. හේමචන්ද්‍ර (20.04.2023 සිට)
පවුල් සෞඛ්‍ය වෛද්‍ය විද්‍යාව	ආචාර්ය ආර්.ඊ. එදිරිවීර ද සිල්වා
මූල්‍යය	ආචාර්ය ඩී.එල්.පී.එම්. රත්නසිංහ (13.09.2023 දක්වා) ආචාර්ය ටී.සී. එදිරිවික්‍රම (14.09.2023 සිට)
අධිකරණ වෛද්‍ය විද්‍යා සහ ධූලක විද්‍යා	ආචාර්ය එන්.ඩී.එන්.ඒ. මෙන්ඩිස්
ආහාර තාක්ෂණය	මහාචාර්ය ඩී.එම්.සී.සී. ගුණතිලක
මූලික හෙද කර්මය	ඩබ්ලිව්.ඒ.ආර්.පී. මැණිකේ
භූගෝල විද්‍යාව	ආචාර්ය ඩී.එම්. කරුණාදාස
ඉතිහාසය	ආචාර්ය ඩී.එන්. තෝරදෙණිය
මානව සම්පත් කළමනාකරණය	ආචාර්ය ඒ.ඩබ්ලිව්.එම්.එම්. අතපත්තු
මානව විද්‍යා අධ්‍යාපනය	ආචාර්ය ඊ.එස්. නෙරංජනී
තොරතුරු තාක්ෂණය	මහාචාර්ය පී. දුනුසිංහ
තොරතුරු හා සංනිවේදන තාක්ෂණය	ආචාර්ය එන්.ආර්. සමරසිංහ
තොරතුරු පද්ධති ඉංජිනේරු විද්‍යාව	මහාචාර්ය එම්.ජී.එන්.ඒ.එස්. ප්‍රනාන්දු (31.05.2023 දක්වා) ඩබ්.වී. වෙල්ගම මයා (01.06.2023 සිට)
මෙවලම් සහ ස්වයංකරණ තාක්ෂණය	ආචාර්ය එච්.වයි.ආර්. අතපත්තු
ජාත්‍යන්තර සම්බන්ධතා	ආචාර්ය එස්.සී පද්මකුමාර
ජාත්‍යන්තර වෙළඳාම	ආචාර්ය ඩබ්.ඒ.එස්. දිශංක
භාෂා	ආචාර්ය ඩබ්.එම්. ජයන්ත
කළමනාකරණ හා සංවිධාන අධ්‍යයනය	ආචාර්ය ජී.ඒ.ටී.ආර්. පෙරේරා
අලවිකරණය	ආචාර්ය එම්.ආර්. චන්ද්‍රසේකර
ජනමාධ්‍ය	ආචාර්ය එස්.ඒ.එස්.එම්. සෙනරත් (13.09.2023 දක්වා) කේ.එස්.ඩී. දර්ශන මයා (14.09.2023 සිට)
ගණිතය	මහාචාර්ය එස්.එස්.එන්. පෙරේරා
වෛද්‍ය අධ්‍යාපනය	මහාචාර්ය ජී.ජී. පොන්නම්පෙරුම (13.09.2023 දක්වා) මහාචාර්ය අයි.එම් කරුණාතිලක (14.09.2023 සිට)
මානව වෛද්‍ය විද්‍යාව	ආචාර්ය එස්.ඩී. අමරසූරිය
වෛද්‍ය තාක්ෂණවේදය	ආචාර්ය ආර්.එච්.හේවාපතිරණ
ක්ෂුද්‍ර ජෛවවේදය සහ ප්‍රතිශක්තිවේදය	ආචාර්ය සී.පී. සේනානායක
පරමාණු විද්‍යාව	ආචාර්ය එම්. ආර්. ලමාබදුසූරිය (11.12.2023 දක්වා) ආචාර්ය ජේ ජෙයසුගීතන් (12.12.2023 සිට)
ප්‍රසව සහ නාරීවේදය	ආචාර්ය ඩී.එම්.සී.එස්. ජයසුන්දර

පිළිලවේදය	මහාචාර්ය ටී.එන්. සමරනායක
ව්‍යාධිවේදය	මහාචාර්ය ඩී එස් ලොකුහෙට්ටි (31.03.2023 දක්වා) මහාචාර්ය ඒ.ඒ.එච්. ප්‍රියානි (01.04.2023 සිට)
ළමා රෝග	මහාචාර්ය ඊ.ජී.ඩී.එස්. රාජින්දජිත් (31.08.2023 දක්වා) මහාචාර්ය ජේ වනිගසිංහ (01.09.2023 සිට)
ප්‍රාසංගික කලා	කේ.එම්.ඩී.සී. නිමලචන්ද්‍ර මිය (10.06.2023 දක්වා) ආචාර්ය එස්.ඒ.එන්. පෙරේරා (11.06.2023 සිට)
භිෂග්වේදය	මහාචාර්ය චමරි වීරරත්න (10.09.2023 දක්වා) මහාචාර්ය පී රණසිංහ (11.09.2023 සිට)
භෞතික විද්‍යාව	මහාචාර්ය කේ.පී.එස්.සී. ජයරත්න
භෞතවේදය	මහාචාර්ය ඩබ්.ඩී.එන්. දිසානායක
ශාක විද්‍යාව	ආචාර්ය එච්. එස්. කත්‍රිආරච්චි
දේශපාලන විද්‍යාව සහ රාජ්‍ය ප්‍රතිපත්ති	ආචාර්ය පී.එන්. පීරිස්
පෞද්ගලික සහ තුලනාත්මක නීති	ආචාර්ය ඩී.එස්.ඊ.යූ.එස්. ලියනගේ
මනෝචිකිත්සාව	ආචාර්ය සී යූ සුරවීර
රාජ්‍ය සහ ජාත්‍යන්තර නීති	මහාචාර්ය එස්. එම්.ඩබ්. සෙනෙවිරත්න (13.05.2023 දක්වා) මහාචාර්ය ඩී.කේ.එල්. කෝනසිංහ (14.05.2023 දක්වා)
විද්‍යා සහ තාක්ෂණ අධ්‍යාපනය	ආචාර්ය ඩී.වී.කේ.පී. සෙනෙවිරත්න
සිංහල	මහාචාර්ය එච්.එස්. කෝපරහේවා
සමාජයීය විද්‍යා අධ්‍යාපනය	එච් එම් එල් කුමාරි මිය (16.07.2023 දක්වා) ආචාර්ය එච්.එම්.ජේ.සී. හේරත් (17.07.2023 සිට)
සමාජ විද්‍යාව	මහාචාර්ය එෆ්.එෆ්. හනිෆා (30.04.2023 දක්වා) මහාචාර්ය අයි.එම්.ලක්ෂ්මන් (01.05.2023 සිට)
සංඛ්‍යානය	ආචාර්ය ආර්.ඒ.බී. අබේගුණවර්ධන
ශල්‍ය වෛද්‍ය විද්‍යාව	මහාචාර්ය එස්.එම්.විජේරත්න (16.08.2023 දක්වා) මහාචාර්ය එස් සිවගණේෂ් (17.08.2023 සිට)
යුනානි	මහාචාර්ය එම්. එස්. ෂිෆා (12.02.2023 දක්වා)
යුනානි සායනික වෛද්‍ය විද්‍යාව	මහාචාර්ය එම්. එස්. ෂිෆා (13.02.2023 සිට 14.06.2023 දක්වා) ආචාර්ය ඒ.එම්. මුතාලිබ් (15.06.2023 සිට)
යුනානි ඖෂධවේදය	මහාචාර්ය එන්.ෆහාමියා (13.02.2023 සිට 22.10.2023 දක්වා) මහාචාර්ය එම්.අයි. මනුහා (23.10.2023 සිට)
සත්ත්ව හා පාරිසරික විද්‍යා	මහාචාර්ය දේවක වීරකෝන්

මහාචාර්යවරු : 1985 අංක 07 දරන විශ්වවිද්‍යාල (සංශෝධන) පනතේ 26 (2) (ඌ) වගන්තිය යටතේ
මහාචාර්ය ඒ කළුආරච්චි
මහාචාර්ය ඒ සර්වේස්වරන්
මහාචාර්ය ඒ.ඒ.සී. අබේසිංහ
මහාචාර්ය ඒ.ඩී.ඒ. ප්‍රනාන්දු
මහාචාර්ය ඒ.ඩී.එම්.එස්.ඒ. අබේරත්න (2023.06.25 සිට විශ්‍රාමික)
මහාචාර්ය ඒ.පී මලලසේකර
මහාචාර්ය ඒ.පී.පී.ටී. වැං
මහාචාර්ය ඒ.එස්. අදිකාරම්
මහාචාර්ය අසේල ඔළුපැලියාව
මහාචාර්ය අතුල රණසිංහ (2023.07.18 ඉල්ලා අස්විය)
මහාචාර්ය බී නිශාන්ත
මහාචාර්ය බී.එස්.එස්. සෙනෙවිරත්න
මහාචාර්ය සී නිරිඇල්ල (2023.07.24 සිට විශ්‍රාමික)
මහාචාර්ය සී වීරරත්න
මහාචාර්ය සී.ඒ. ඥානදාසන්
මහාචාර්ය සී.ඩී. දංගල්ල
මහාචාර්ය සී.ඩී. තිලකරත්න
මහාචාර්ය සී.ඩී. විජයරත්න
මහාචාර්ය සී ජේ ජයවර්ධන
මහාචාර්ය සී.එම්. එදිරිසිංහ

මහාචාර්ය සී.එම්. නානායක්කාර
මහාචාර්ය සී.එන්. විජයරත්න
මහාචාර්ය ඩී මෙන්ඩිස්
මහාචාර්ය ඩී.ඒ.සී. සිල්වා
මහාචාර්ය ඩී.ඒ.පී. ද සිල්වා
මහාචාර්ය ඩී.සී රණසිංහ
මහාචාර්ය ඩී.ඩී. කරුණාරත්න
මහාචාර්ය ඩී.ඩී. වික්‍රමසිංහ
මහාචාර්ය ඩී.ඩී.පී.එම්. දුනුසිංහ
මහාචාර්ය ඩී.ජේ. ඇන්තනි
මහාචාර්ය ඩී.එන් සමරසේකර
මහාචාර්ය ඩී.එන්.එන්.ආර්. දේවසිරි
මහාචාර්ය ඩී.පී. දිසානායක
මහාචාර්ය ඩී.පී. වික්‍රමසිංහ
මහාචාර්ය ඩී.ආර්.සී. හංවැල්ල
මහාචාර්ය ඩී.ටී.ඩී. කෝදාගොඩ
මහාචාර්ය ඩී.ටී.යූ. අබේතුංග
මහාචාර්ය දීපිකා ප්‍රනාන්දු
මහාචාර්ය ඊ.ජී.ඩී.එස්. රාජින්ද්‍රජිත්
මහාචාර්ය ඊ.එල්.එස්.ජේ. පෙරේරා
මහාචාර්ය ඊ.එම් කොරයා
මහාචාර්ය ඊ.එස්. විජේවික්‍රම
මහාචාර්ය ඊ.වයි.කේ. ලොකුපිටිය
මහාචාර්ය එෆ්.එෆ්. හනිෆා
මහාචාර්ය ෆරීනා රුසායික්
මහාචාර්ය ජී.පොන්නම්පෙරුම
මහාචාර්ය ජී.ඒ. ද සිල්වා
මහාචාර්ය ජී.ඒ.එස්. ප්‍රේමකුමාර
මහාචාර්ය ජී.ඩී.ඩී.කේ. ශ්‍රී රන්ජන්
මහාචාර්ය ජී.ඩී.එස්.පී. විමලරත්න
මහාචාර්ය ජී.එච්. ගල්හේන
මහාචාර්ය ජී.එච්.සී.එම්. හෙට්ටිආරච්චි
මහාචාර්ය ජී.කේ.ඒ. ඩයස්
මහාචාර්ය ජී.ආර්. කොන්ස්ටන්ටයින්
මහාචාර්ය එච්.ඩී.ඩී. බන්දුප්‍රිය
මහාචාර්ය එච්.ජී.එස්.පී. හේවාගීගන
මහාචාර්ය එච්.අයි.සී. ද සිල්වා
මහාචාර්ය එච්.ජේ.එම්. පෙරේරා (2023.09.30 සිට විශ්‍රාමික)
මහාචාර්ය එච්.එන්.පී. ජයසිංහ
මහාචාර්ය එච්.වී.වයි.ඩී. සිරිවර්ධන
මහාචාර්ය අයි.සී. පෙරේරා
මහාචාර්ය අයි.එම්.කේ. ප්‍රනාන්දු
මහාචාර්ය ජේ.එච්.සී. ලියනගේ
මහාචාර්ය ජේ.කේ.ඩී.එස්. ජයනෙත්ති
මහාචාර්ය ජේ.එම්.ඩී.ආර්. ජයසුන්දර
මහාචාර්ය ජේ.පී.ඩී.එස්.වී.ඩී.නානායක්කාර
මහාචාර්ය කේ.අමිර්තලිංගම්
මහාචාර්ය කේ දිසානායක
මහාචාර්ය කේ කජේන්ද්‍ර

මහාචාර්ය කේ සිරිදේව
මහාචාර්ය කේ.ඒ.එස්.ජී. කළුආරච්චි
මහාචාර්ය කේ.ජී.ඩී.ඒ.ඩී. තිලකරත්න
මහාචාර්ය කේ.ජී.එස්.ජේ. කෙහෙල්වලතැන්න
මහාචාර්ය කේ.එල්. ජයරත්න
මහාචාර්ය කේ.එම්.එන්. ද සිල්වා
මහාචාර්ය කේ.පී. හේවාගමගේ
මහාචාර්ය කේ.ආර්. වීරසේකර
මහාචාර්ය කේ.ආර්.ආර්. මහානාම
මහාචාර්ය කේ.එස්.එච්. ද සිල්වා (2023.09.30 සිට විශ්‍රාමික)
මහාචාර්ය කේ.වී. ධනපාල
මහාචාර්ය එල් ගුරුසිංහ
මහාචාර්ය එල්.ඒ.ඩී.ඒ.ටී. කුමාර
මහාචාර්ය එල්.එච්.ආර්. පෙරේරා
මහාචාර්ය එල්.කේ.පී. වෙඩික්කාරගේ
මහාචාර්ය එල්. ආර්. එම්. දයාබණ්ඩාර
මහාචාර්ය එල්.ටී. වීරසිංහ
මහාචාර්ය එල්.වී. ගුණරත්න
මහාචාර්ය එම් ගුණතිලක
මහාචාර්ය එම්.ඒ.ඩී.එස්.ජේ.එස්. නිරිඇල්ල
මහාචාර්ය එම්.ඒ.ආර්. ජයවර්ධන
මහාචාර්ය එම්.ඒ. වීරසිංහ
මහාචාර්ය එම්.ඩී.ජේ.එස්. ගුණතිලක
මහාචාර්ය එම්.ඩී.පී. ද කොස්තා
මහාචාර්ය එම්.ඩී.එස්. ලොකුහෙට්ටි (2023.05.14 ඉල්ලා අස්විය.)
මහාචාර්ය එම්.ජී.ජී. හේමකුමාර
මහාචාර්ය එම්.ජී.එන්.ඒ.එස්. ප්‍රනාන්දු
මහාචාර්ය එම්.අයි.එම්. ද සොයිසා
මහාචාර්ය එම්.ජේ.එෆ්. ෆසිලා ආසන්
මහාචාර්ය එම්.කේ.ඒ.ඒ. මහසිංහ
මහාචාර්ය එම්.එම්. දිසානායක
මහාචාර්ය එම්.එන්. කෞමාල්
මහාචාර්ය එම්.පී.පී. ධර්මදාස
මහාචාර්ය එම්.ආර්. සූරියආරච්චි (2023.06.01 ඉල්ලා අස්විය)
මහාචාර්ය එම්.ආර් විජේසිංහ
මහාචාර්ය එම්.ආර්.එන්. කාසිම්
මහාචාර්ය එම්.එස්.එම්. ෂිෆා
මහාචාර්ය එම්.එස්.එස්. වීරසිංහ (2023.09.30 සිට විශ්‍රාමික)
මහාචාර්ය එම්.එස්.ඩබ්. පැස්කුවල්
මහාචාර්ය එම්.ටී.එම්. මහීස්
මහාචාර්ය එම්. යූ.ඉසඩ්. එන්. ෆර්සානා
මහාචාර්ය එම්.වී. විතානපතිරණ
මහාචාර්ය එම්.වී.සී. ද සිල්වා
මහාචාර්ය එම්.ඩබ්ලිව්.ගුණතුංග
මහාචාර්ය එන්.ෆහාමියා
මහාචාර්ය එන් කමර්දීන්
මහාචාර්ය එන් මෙලගොඩ
මහාචාර්ය එන් විජේගුණවර්ධන
මහාචාර්ය එන්.ඩී.එන්.ඒ. මෙන්ඩිස්

මහාචාර්ය එන්.එම්.සී.කේ. අරඹේපොල
මහාචාර්ය එන්.ආර්. පෙරේරා
මහාචාර්ය එන්.ආර්. විජේසේකර
මහාචාර්ය නදීරා කරුණාවීර
මහාචාර්ය නෙලූෆර් ද මෙල්
මහාචාර්ය නෙලූකා ඩි සිල්වා
මහාචාර්ය ඕ.වී.ඩී.එස්.ජේ. වීරසේන
මහාචාර්ය පී ගලප්පත්ති
මහාචාර්ය පී ලැනරෝල්
මහාචාර්ය පී.එම් අතපත්තු
මහාචාර්ය පී රණසිංහ
මහාචාර්ය පී.ඒ.එන්. පුණ්‍යසිරි
මහාචාර්ය පී.ජී.ආර්.එස්.කේ. සෙනරත්
මහාචාර්ය පී.එච්.අයි.යූ. වෛද්‍යතිලක
මහාචාර්ය පී.කේ.ටී.එන්.එස්. පල්ලෙවත්ත (2023.03.26 සිට විශ්‍රාමික)
මහාචාර්ය පී.එන්. දයාවංශ
මහාචාර්ය පී.පී.එස්.එල්. පතිරණ
මහාචාර්ය පී.ආර්.ඩී. රණවක
මහාචාර්ය පී.ආර්.එන්. ප්‍රනාන්දු
මහාචාර්ය පී.වී. උඩගම (විශ්‍රාමික 2023.09.30)
මහාචාර්ය පවිත්‍රා කෙලාසපති
මහාචාර්ය ප්‍රියංජලී ද සොයිසා
මහාචාර්ය ආර් සේනාධිරාජා
මහාචාර්ය ආර්.සී.කේ. හෙට්ටිආරච්චි
මහාචාර්ය ආර්.ඩී විජේසේකර
මහාචාර්ය ආර්.ඩී.එච්. කුලතුංග
මහාචාර්ය ආර්. ජයවර්ධන (2023.10.06 සිට විශ්‍රාමික)
මහාචාර්ය එස් බුවනේන්ද්‍ර
මහාචාර්ය එස් වාසලතන්ත්‍රී
මහාචාර්ය එස්.ඒ.අභයරත්න
මහාචාර්ය එස්.ඒ ගුණවර්ධන
මහාචාර්ය එස්.ඒ සෙනෙවිරත්න
මහාචාර්ය එස්.ඒ.ඒ.පී. කරුණානායක
මහාචාර්ය එස්.එච්. දොඩම්පහල
මහාචාර්ය එස්.කේ.එම්.කේ. හැරපත්දෙණිය
මහාචාර්ය එස්.එම්. විජයරත්න
මහාචාර්ය එස්.එම්. යන්ග්
මහාචාර්ය එස්.එම්.කේ. හේරත්
මහාචාර්ය එස්.එම්.එස්. සමරකෝන්
මහාචාර්ය එස්.එම්.ඩබ්. රන්වල
මහාචාර්ය එස්.එන්. සෙනෙවිරත්න
මහාචාර්ය එස්.පී ප්‍රේමරත්න
මහාචාර්ය එස්.ආර්. මනෝරත්න
මහාචාර්ය එස්.එස්.රංගනාදන්
මහාචාර්ය එස්.එස්.එම්.කේ.කේ. හිරිඹුරේගම (2023.09.30 සිට විශ්‍රාමික)
මහාචාර්ය එස්.එස්.එම්.ඩබ්ලිව්. සෙනෙවිරත්න
මහාචාර්ය එස්.එස්.ආර්. සමරකෝන්
මහාචාර්ය එස්.ටී. තෝරදෙණිය
මහාචාර්ය සරත් විජේසූරිය

මහාචාර්ය ශිරෝමා හඳුන්නෙත්ති
මහාචාර්ය ශ්‍යාම් ප්‍රනාන්දු
මහාචාර්ය ටී.ඩී සිල්වා
මහාචාර්ය ටී.කේ. වෙත්තසිංහ
මහාචාර්ය ටී.එල්. ගුණරුවන්
මහාචාර්ය ටී.එල්.එස්. තිරිමාන්න
මහාචාර්ය ටී.එම්.ඩී.ඩී. තඹවිට
මහාචාර්ය ටී.එන්. ගුණරත්න
මහාචාර්ය යූ.කේ.එම්.අයි උඩුනුවර
මහාචාර්ය යූ.එන්.ඩී. සිරිසේන
මහාචාර්ය වී.ඒ. ද සිල්වා
මහාචාර්ය වී.පී. වික්‍රමසිංහ
මහාචාර්ය ඩබ්. හේවාමානගේ
මහාචාර්ය ඩබ්.ඒ.ඩී.එල්. අමරසිරි
මහාචාර්ය ඩබ්.අයි.නානායක්කාර
මහාචාර්ය ඩබ්.එම්.එස්.එස්.කේ. කුලතුංග
මහාචාර්ය ඩබ්.වී.ඒ.ඩී. සමරරත්න
මහාචාර්ය වයි.ඒ. විද්‍යාලංකාර
පූජ්‍ය මහාචාර්ය එම්.ධම්මජෝති හිමි

1.3 රැස්වීම්

අදාළ වර්ෂය තුළ විශ්වවිද්‍යාල පාලනාධිකාරි ඳ අනෙකුත් පාලන කමිටු නොකඩවා රැස්වීම් පැවැත්වීය. ඒ ඒ පාලනාධිකාරිය සහ අනෙකුත් පාලන මණ්ඩලවල රැස්වීම් සංඛ්‍යාව පහත දැක්වෙයි:

පාලක භාව	12
සනාතන භාව	12
මූල්‍ය කමිටුව	13
කළමනාකරණ කමිටුව	12
පීඨාධිපති කමිටුව	14
නිවාඩු සහ තිළිණ කමිටුව	12
නීතිකාරක කමිටුව	10
සැලසුම් හා සංවර්ධන කමිටුව	12
පර්යේෂණ සහ සංවර්ධන කමිටුව	10
පීඨ මණ්ඩල	
ශාස්ත්‍ර පීඨය	12
අධ්‍යාපන පීඨය	10
පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය	11
නීති පීඨය	14
කළමනාකරණ හා මූල්‍ය පීඨය	13
වෛද්‍ය පීඨය	13
භෙද පීඨය	11
විද්‍යා පීඨය	13
තාක්ෂණ පීඨය	12
දේශීය වෛද්‍ය විද්‍යා පීඨය	10
ශ්‍රීපාලි මණ්ඩප මණ්ඩලය	12

1.4 විශ්වවිද්‍යාලය පිළිබඳ දළ විශ්ලේෂණය

2021/2022/2023 ප්‍රථම උපාධි අපේක්ෂකයන් ඇතුලු කරගැනීම

පාඨමාලාව	මාධ්‍යය	ඇතුළත් කරගැනීම් **2021**	ඇතුළත් කරගැනීම් **2022**	ඇතුළත් කරගැනීම් **2023**
ශාස්ත්‍ර	සි/දෙ/ඉ	845	777	777
අධ්‍යාපන	සි/දෙ/ඉ	-	-	-
නීති	සි/දෙ/ඉ	326	323	323
කළමනාකරණ	ඉ	715	698	692
වෛද්‍ය	ඉ	267	275	259
ජෛවීය විද්‍යා .	ඉ	146	155	128
භෞතික විද්‍යා	ඉ	280	296	270
අණුක ජීවවිද්‍යා සහ ජීවරසායන විද්‍යා	ඉ	31	60	55
කාර්මික සංඛ්‍යාන සහ ගණිතමය මුල්‍ය	ඉ	107	113	101
තාක්ෂණ	ඉ	350	683	109
භෙද	ඉ	105	228	119
දේශීය වෛද්‍ය විද්‍යා	ඉ	-	-	218
ශ්‍රීපාලි මණ්ඩපය	සි	220	220	210
එකතුව		**2937**	**3828**	**3261**

ශිෂ්‍යයන් පිළිබඳ තොරතුරු - ප්‍රථම උපාධි අපේක්ෂක ශිෂ්‍ය ගහනය

පීඨය	අධ්‍යයන අංශ	**2022**	**2023**	උපාධිලත් සංඛ්‍යාව	
				2022	**2023**
ශාස්ත්‍ර	11	2527	2569	562	581
අධ්‍යාපන	4	364	348	146	128
නීති	3	1135	1216	249	241
කළමනාකරණ හා මූල්‍ය	7	2606	2700	497	552
වෛද්‍ය	20	1348	1389	201	261
විද්‍යා	7	2026	2112	416	435
තාක්ෂණ	4	1247	1385	-	162
භෙද	3	498	519	-	81
දේශීය වෛද්‍ය විද්‍යා	6	-	1294	-	77
ශ්‍රීපාලි මණ්ඩපය	4	723	788	161	152
එකතුව	**69**	**12474**	**14320**	**2232**	**2670**

උපාධි හදාරන මුළු විදේශීය සිසුන් සංඛ්‍යාව – 2022/2023

පීඨය	ප්‍රථම උපාධි විදේශීය සිසුන් සංඛ්‍යාව - **2022**	ප්‍රථම උපාධි විදේශීය සිසුන් සංඛ්‍යාව - **2023**	පශ්චාත් උපාධි විදේශීය සිසුන් සංඛ්‍යාව - **2022**	පශ්චාත් උපාධි විදේශීය සිසුන් සංඛ්‍යාව - **2023**
ශාස්ත්‍ර	01	1	114	49
අධ්‍යාපන	-	-	01	1
ප.උ.අ.පීඨය	-	-	15	17
නීති	-	-	07	3
කළමනාකරණ හා මූල්‍ය	-	-	38	62
වෛද්‍ය	72	73	00	0
විද්‍යා	-	-	05	2
එකතුව	**73**	**74**	**180**	**134**

2023 වර්ෂය සඳහා විදේශීය සිසුන්ගෙන් ලද ආදායම

පීඨය	උපාධි වැඩ සටහන (ප්‍රථම/පශ්චාත්/ද ර්ශ න සූ රී)	ආදායම (රු.)
ශාස්ත්‍ර	මූල්‍ය ආර්ථික විද්‍යාව - පශ්චාත් උපාධිය 2024- II කණ්ඩායම (සෙනසුරාදා)	17,229,731.32
	මූල්‍ය ආර්ථික විද්‍යාව - පශ්චාත් උපාධිය 2024- II කණ්ඩායම (ඉරිදා)	18,260,610.26
අධ්‍යාපන	අධ්‍යාපන විද්‍යාව - දර්ශන විශාරද	23,472,000.00
ප.උ.අ. පීඨය	ායනික මනෝ විද්‍යාව - දර්ශනපති 2023/2025	698,250.00
නීති	නීතිය -දර්ශනපති	507,000.00
කළමනාකරණ හා මූල්‍ය	ව්‍යාපාර පරිපාලනය- විධායක පශ්චාත් උපාධිය (G2)	10,521,875.00
	ව්‍යාපාර පරිපාලනය- විධායක පශ්චාත් උපාධිය (G3)	19,305,000.00
වෛද්‍ය	වෛද්‍යවේදී හා ශල්‍යවේදී	270,175,974.35
විද්‍යා	දර්ශනපති - භෞතික වෛද්‍ය විද්‍යාව	196,535.68
තාක්ෂණ	වෙරළ ඉංජිනේරු විද්‍යාව - දර්ශනසූරී	606,000.00
එකතුව		**360,972,976.61**

මණ්ඩපය සහ පීඨයන් විසින් පවත්වනු ලබන උපාධි පාඨමාලා

මණ්ඩපය/පීඨය	පාඨමාලා මාතෘකාව	SLQF මට්ටම	මාධ්‍යය
දර්ශන විශාරද (PhD)			
ශාස්ත්‍ර	ආර්ථික විද්‍යාව - දර්ශන විශාරද	12	ඉංග්‍රීසි
ශාස්ත්‍ර	ආර්ථික විද්‍යාව - දර්ශන විශාරද	12	ඉංග්‍රීසි
ශාස්ත්‍ර	දේශපාලන විද්‍යාව - දර්ශන විශාරද	12	සිංහල/ ඉංග්‍රීසි/ දෙමළ
ශාස්ත්‍ර	ප්‍රජා විද්‍යාව - දර්ශන විශාරද	12	සිංහල/ඉංග්‍රීසි
ශාස්ත්‍ර	භූගෝල විද්‍යාව - දර්ශන විශාරද	12	සිංහල/ඉංග්‍රීසි
ශාස්ත්‍ර	ඉතිහාසය - දර්ශන විශාරද	12	සිංහල/ඉංග්‍රීසි
ශාස්ත්‍ර	ජාත්‍යන්තර සම්බන්ධතා - දර්ශන විශාරද	12	සිංහල/ඉංග්‍රීසි
ශාස්ත්‍ර	සිංහල- දර්ශන විශාරද	12	සිංහල/ඉංග්‍රීසි
ශාස්ත්‍ර	සමාජ විද්‍යාව- දර්ශන විශාරද	12	සිංහල/ඉංග්‍රීසි
ශාස්ත්‍ර	බෞද්ධ අධ්‍යයනය- දර්ශන විශාරද	12	සිංහල/ඉංග්‍රීසි
ශාස්ත්‍ර	භූගෝල විද්‍යාව - දර්ශන විශාරද		සිංහල/ ඉංග්‍රීසි/ දෙමළ
අධ්‍යාපන	අධ්‍යාපන විද්‍යාව - දර්ශන විශාරද	12	සිංහල/ඉංග්‍රීසි
ප.උ. අධ්‍යයන	දර්ශන විශාරද	12	ඉංග්‍රීසි
නීති	දර්ශන විශාරද (නීති)	12	ඉංග්‍රීසි
කළමනාකරණ හා මූල්‍ය	ව්‍යාපාර පරිපාලන විශාරද	12	ඉංග්‍රීසි

වෛද්‍ය	දර්ශන විශාරද		ඉංග්‍රීසි
විද්‍යා	දර්ශන විශාරද	12	ඉංග්‍රීසි
තාක්ෂණ	දර්ශන විශාරද		ඉංග්‍රීසි
දර්ශනපති (Mphil)			
ශාස්ත්‍ර	ප්‍රජාවිද්‍යාව - දර්ශනපති	11	ඉංග්‍රීසි
ශාස්ත්‍ර	ආර්ථික විද්‍යාව - දර්ශනපති	11	ඉංග්‍රීසි
ශාස්ත්‍ර	ආර්ථික විද්‍යාව - දර්ශනපති	11	ඉංග්‍රීසි
ශාස්ත්‍ර	සිංහල - දර්ශනපති (පර්යේෂණ සංරචකයක් සහිත)	11	සිංහල
ශාස්ත්‍ර	දේශපාලන විද්‍යාව - දර්ශනපති	11	සිංහල/ ඉංග්‍රීසි/ දෙමළ
ශාස්ත්‍ර	භූගෝල විද්‍යාව - දර්ශනපති	11	සිංහල/ ඉංග්‍රීසි/ දෙමළ
ශාස්ත්‍ර	ඉතිහාසය - දර්ශනපති	11	සිංහල/ඉංග්‍රීසි
ශාස්ත්‍ර	ජාත්‍යන්තර සම්බන්ධතා - දර්ශනපති	11	ඉංග්‍රීසි
ශාස්ත්‍ර	මාජ විද්‍යාව - දර්ශනපති	11	සිංහල/ඉංග්‍රීසි
ශාස්ත්‍ර	බෞද්ධ අධ්‍යයනය - දර්ශනපති	11	සිංහල/ඉංග්‍රීසි
ශාස්ත්‍ර	භූගෝල විද්‍යාව - දර්ශනපති		සිංහල/ ඉංග්‍රීසි/ දෙමළ
අධ්‍යාපන	අධ්‍යාපන - දර්ශනපති උපාධිය	11	සිංහල/ඉංග්‍රීසි
අධ්‍යාපන	අධ්‍යාපන - දර්ශනපති උපාධිය	11	සිංහල/ඉංග්‍රීසි
ප.උ. අධ්‍යයන	ායනික මනෝ විද්‍යාව - දර්ශනපති (MPCP)	11	ඉංග්‍රීසි
ප.උ. අධ්‍යයන	දර්ශනපති	11	ඉංග්‍රීසි
නීති	නීතිය -දර්ශනපති	11	ඉංග්‍රීසි
කළමනාකරණ හා මූල්‍ය	කළමනාකරණ අධ්‍යයනය- දර්ශනපති/දර්ශන විශාරද	11	ඉංග්‍රීසි
වෛද්‍ය	දර්ශනපති උපාධිය		ඉංග්‍රීසි
විද්‍යා	දර්ශනපති උපාධිය	11	ඉංග්‍රීසි
තාක්ෂණ	දර්ශනපති උපාධිය		ඉංග්‍රීසි
පශ්චාත් උපාධි			
ශ්‍රීපාලි	ජනමාධ්‍ය අධ්‍යයනය - පශ්චාත් උපාධිය	9	සිංහල
ශ්‍රීපාලි	මාධ්‍ය පර්යේෂණ - පශ්චාත් උපාධිය	9	සිංහල
ශාස්ත්‍ර	ප්‍රජාවිද්‍යාව - පශ්චාත් උපාධිය	9	ඉංග්‍රීසි
ශාස්ත්‍ර	මූල්‍ය ආර්ථික විද්‍යාව - පශ්චාත් උපාධිය (අධ්‍යයන ක්‍රියාකාරකම් සහිත)	9	ඉංග්‍රීසි
ශාස්ත්‍ර	ඉංග්‍රීසි අධ්‍යයනය - පශ්චාත් උපාධිය	9	ඉංග්‍රීසි
ශාස්ත්‍ර	සිංහල - පශ්චාත් උපාධිය (taught)	9	සිංහල
ශාස්ත්‍ර	සමාජ විද්‍යාව - පශ්චාත් උපාධිය	9	සිංහල/ ඉංග්‍රීසි
ශාස්ත්‍ර	ඉතිහාසය - පශ්චාත් උපාධිය	9	සිංහල/ඉංග්‍රීසි
ශාස්ත්‍ර	බෞද්ධ අධ්‍යයනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය	9,10	සිංහල/ ඉංග්‍රීසි
ශාස්ත්‍ර	ප්‍රජාවිද්‍යාව - ශාස්ත්‍රපති උපාධිය (උපාධි නිබන්ධන ංරචකයක් සහිත)	10	ඉංග්‍රීසි

ශාස්ත්‍ර	සංචාරක ආර්ථික විද්‍යාව හා ආගන්තුක සත්කාර කළමනාකරණය- ශාස්ත්‍රපති	10	ඉංග්‍රීසි
ශාස්ත්‍ර	ආර්ථික විද්‍යාව -ශාස්ත්‍රපති	10	ඉංග්‍රීසි
ශාස්ත්‍ර	දේශපාලන විද්‍යාව හා රාජ්‍ය ප්‍රතිපත්ති- ශාස්ත්‍රපති	10	සිංහල/ ඉංග්‍රීසි/ දෙමළ
ශාස්ත්‍ර	සිංහල - ශාස්ත්‍රපති උපාධිය (පර්යේෂණ සංරචකයක් සහිත)	10	සිංහල
ශාස්ත්‍ර	මාජ විද්‍යාව -ශාස්ත්‍රපති	10	සිංහල/ ඉංග්‍රීසි
ශාස්ත්‍ර	ජාත්‍යන්තර සම්බන්ධතා - ශාස්ත්‍රපති	10	ඉංග්‍රීසි
ශාස්ත්‍ර	ඉතිහාසය ශාස්ත්‍රපති	10	සිංහල/ඉංග්‍රීසි
ශාස්ත්‍ර	පරිසරය සහ ප්‍රාදේශීය සංවර්ධනය - පශ්චාත් උපාධිය		ඉංග්‍රීසි
අධ්‍යාපන	අධ්‍යාපන පශ්චාත් උපාධිය (සාමාන්‍ය)	9	සිංහල
අධ්‍යාපන	අධ්‍යාපන පශ්චාත් උපාධිය - අධ්‍යාපන කළමනාකරණ	9	සිංහල/ ඉංග්‍රීසි
අධ්‍යාපන	අධ්‍යාපන පශ්චාත් උපාධිය - විද්‍යා අධ්‍යාපන	9	සිංහල
අධ්‍යාපන	අධ්‍යාපන පශ්චාත් උපාධිය - අධ්‍යාපන හා සංවර්ධන මනෝවිද්‍යාව	9	සිංහල
අධ්‍යාපන	අධ්‍යාපන පශ්චාත් උපාධිය (TESOL)	9	ඉංග්‍රීසි
අධ්‍යාපන	අධ්‍යාපන පශ්චාත් උපාධිය (චීන සිසුන් සඳහා ඇතුළත් කරගැනීම්)		ඉංග්‍රීසි
ප.උ. අධ්‍යයන	රාජ්‍ය පරිපාලනය හා කළමනාකරණය- පශ්චාත් උපාධිය (MPA&M)	9	ඉංග්‍රීසි
ප.උ. අධ්‍යයන	පරිසර කළමනාකරණය- පශ්චාත් උපාධිය (MEM)	9	ඉංග්‍රීසි
ප.උ. අධ්‍යයන	ව්‍යාපාර අධ්‍යයනය- පශ්චාත් උපාධිය (MBS)	9	ඉංග්‍රීසි
ප.උ. අධ්‍යයන	කලාපීය සංවර්ධනය සහ සැලසුම්කරණය පශ්චාත් උපාධිය (MRDP)	9	ඉංග්‍රීසි
ප.උ. අධ්‍යයන	ගැටුම් හා සාම අධ්‍යයනය - පශ්චාත් උපාධිය (MCPS)	9	ඉංග්‍රීසි
ප.උ. අධ්‍යයන	සංවර්ධන අධ්‍යයනය- පශ්චාත් උපාධිය (MDS)	9	ඉංග්‍රීසි
ප.උ. අධ්‍යයන	මානව හිමිකම්- පශ්චාත් උපාධිය (MHR)	9	ඉංග්‍රීසි
ප.උ. අධ්‍යයන	ජපන් අධ්‍යයනය- පශ්චාත් උපාධිය (MJS)	9	ඉංග්‍රීසි
ප.උ. අධ්‍යයන	කම්කරු සම්බන්ධතා හා මානව සම්පත් කළමනාකරණය - පශ්චාත් උපාධිය (MLRHRM)	9	ඉංග්‍රීසි
ප.උ. අධ්‍යයන	නිෂ්පාදන කළමනාකරණය - විද්‍යාපති උපාධිය (MMM)	10	ඉංග්‍රීසි
ප.උ. අධ්‍යයන	තොරතුරු පද්ධති කළමනාකරණය - විද්‍යාපති (MISM)	10	ඉංග්‍රීසි
ප.උ. අධ්‍යයන	උපදේශනය සහ මනෝවිද්‍යාත්මක සහාය -ශාස්ත්‍රපති (MCP)	10	ඉංග්‍රීසි
ප.උ. අධ්‍යයන	ස්ත්‍රී පුරුෂ භාවය සහ කාන්තා අධ්‍යයනය - ශාස්ත්‍රපති (MGWS)	10	ඉංග්‍රීසි
ප.උ. අධ්‍යයන	ජපන් අධ්‍යයන - ශාස්ත්‍රපති		ඉංග්‍රීසි
ප.උ. අධ්‍යයන	සායනික මනෝවිද්‍යාව - දර්ශනපති		ඉංග්‍රීසි
ප.උ. අධ්‍යයන	දර්ශනපති / දර්ශන විශාරද		ඉංග්‍රීසි
ප.උ. අධ්‍යයන	තාක්ෂණ හා නවෝත්පාදන කළමනාකරණය - පශ්චාත් උපාධිය (MTIM)	9	ඉංග්‍රීසි
ප.උ. අධ්‍යයන	නාගරික සහ ප්‍රාදේශීය සැලසුම්කරණය - විද්‍යාපති (MSc in URP)	10	ඉංග්‍රීසි

නීති	නීතිය පිළිබඳ ශාස්ත්‍රපති (taught)	9	ඉංග්‍රීසි
නීති	මානව හිමිකම් හා ප්‍රජාතන්ත්‍රවාදය - පශ්චාත් උපාධිය	9	ඉංග්‍රීසි
කළමනාකරණ හා මූල්‍ය	ව්‍යාපාර පරිපාලනය- විධායක පශ්චාත් උපාධිය	9	ඉංග්‍රීසි
කළමනාකරණ හා මූල්‍ය	ව්‍යාපාර පරිපාලනය- පශ්චාත් උපාධිය	9	ඉංග්‍රීසි
කළමනාකරණ හා මූල්‍ය	පරිපාලනය - ව්‍යාපාරපති - මූල්‍ය	9	ඉංග්‍රීසි
කළමනාකරණ හා මූල්‍ය	පරිපාලනය - ව්‍යාපාරපති - මානව සම්පත් කළමනාකරණය	9	ඉංග්‍රීසි
කළමනාකරණ හා මූල්‍ය	පරිපාලනය - ව්‍යාපාරපති - ජාත්‍යන්තර ව්‍යාපාර	9	ඉංග්‍රීසි
කළමනාකරණ හා මූල්‍ය	පරිපාලනය - ව්‍යාපාරපති - අලෙවිකරණය	9	ඉංග්‍රීසි
කළමනාකරණ හා මූල්‍ය	පරිපාලනය - ව්‍යාපාරපති - ගිණුම්කරණය සහ තොරතුරු පද්ධති	9	ඉංග්‍රීසි
කළමනාකරණ හා මූල්‍ය	පරිපාලනය - ව්‍යාපාරපති	10	ඉංග්‍රීසි
කළමනාකරණ හා මූල්‍ය	පරිපාලනය - ව්‍යාපාරපති - මූල්‍ය	10	ඉංග්‍රීසි
කළමනාකරණ හා මූල්‍ය	පරිපාලනය - ව්‍යාපාරපති - මානව සම්පත් කළමනාකරණය	10	ඉංග්‍රීසි
කළමනාකරණ හා මූල්‍ය	පරිපාලනය - ව්‍යාපාරපති - ජාත්‍යන්තර ව්‍යාපාර	10	ඉංග්‍රීසි
කළමනාකරණ හා මූල්‍ය	පරිපාලනය - ව්‍යාපාරපති - අලෙවිකරණය	10	ඉංග්‍රීසි
කළමනාකරණ හා මූල්‍ය	පරිපාලනය - ව්‍යාපාරපති - ගිණුම්කරණය සහ තොරතුරු පද්ධති	10	ඉංග්‍රීසි
කළමනාකරණ හා මූල්‍ය	ව්‍යවහාරික මූල්‍ය - විද්‍යාපති *(MAF)*		ඉංග්‍රීසි
වෛද්‍ය	ලිංගික සෞඛ්‍යය - පශ්චාත් උපාධිය	9	ඉංග්‍රීසි
වෛද්‍ය	ජෛව රසායනය හා අණුක ජීවවිද්‍යාව - විද්‍යාපති	10	ඉංග්‍රීසි
වෛද්‍ය	සායනික ප්‍රවේණි විද්‍යාව - විද්‍යාපති	10	ඉංග්‍රීසි
වෛද්‍ය	අණුක ව්‍යාධිවේදය - විද්‍යාපති	10	ඉංග්‍රීසි
වෛද්‍ය	ප්‍රජනක වෛද්‍ය විද්‍යාව - විද්‍යාපති	10	ඉංග්‍රීසි
වෛද්‍ය	වෘත්තීය සෞඛ්‍ය සහ ආරක්ෂාව - විද්‍යාපති	10	ඉංග්‍රීසි
වෛද්‍ය	දේශගුණික විපර්යාස සහ සෞඛ්‍ය - විද්‍යාපති	10	ඉංග්‍රීසි
වෛද්‍ය	ක්‍රීඩා සහ ව්‍යායාම - විද්‍යාපති	10	ඉංග්‍රීසි
විද්‍යා	විශ්ලේෂණ රසායන විද්‍යාව - විද්‍යාපති	9	ඉංග්‍රීසි
විද්‍යා	ව්‍යවහාරික කාබනික රසායන විද්‍යාව - විද්‍යාපති	9	ඉංග්‍රීසි
විද්‍යා	රසායන විද්‍යා අධ්‍යාපනය - විද්‍යාපති	9	ඉංග්‍රීසි
විද්‍යා	මූල්‍යමය ගණිතය - විද්‍යාපති	9	ඉංග්‍රීසි
විද්‍යා	ගණිතය අධ්‍යාපනය - විද්‍යාපති	9	ඉංග්‍රීසි
විද්‍යා	වෛද්‍ය භෞතික විද්‍යාව - විද්‍යාපති	9	ඉංග්‍රීසි
විද්‍යා	න්‍යෂ්ටික විද්‍යාව - විද්‍යාපති	9	ඉංග්‍රීසි

විද්‍යා	ව්‍යවහාරික ඉලෙක්ට්‍රොනික විද්‍යාව - විද්‍යාපති	9	ඉංග්‍රීසි
විද්‍යා	භෞතික විද්‍යා අධ්‍යාපනය - විද්‍යාපති	9	ඉංග්‍රීසි
විද්‍යා	කෘෂිකාර්මික ක්ෂුද්‍රජීව විද්‍යාව - විද්‍යාපති	9	ඉංග්‍රීසි
විද්‍යා	ශාක සෛල හා පටක රෝපණය - විද්‍යාපති	9	ඉංග්‍රීසි
එකතුව	**301,700,335.00**	**261,219,960.00**	**55,746,167.00**

ඡ. මූල්‍ය ප්‍රගතිය පිළිබඳ විස්තර (උත්පන්න ආදායම)

අරමුදල් ප්‍රභවය	2023 ප්‍රතිපාදන රු.	2023 රැස් කිරීම් රු.
අ. ව්‍යාපෘතිය හැර පුනරාවර්තන	-	9,279,050.00
ආ. ව්‍යාපෘතිය හැර ප්‍රාග්ධන	-	-
ඇ. ව්‍යාපෘතිය - දේශීය අරමුදල්	-	-
ඈ. ව්‍යාපෘතිය - විදේශීය අරමුදල්	-	-
එකතුව	**-**	**9,279,050.00**

මෙම වාර්තාවට අදාළ වෙනත් විස්තර/ කාර්ය සාධනයක්

- ජනමාධ්‍ය පීඨය ස්ථාපිත කිරීමට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසම (UGC) වාචික අනුමැතිය ලබා දී ඇති අතර එය ඉතා ඉක්මනින් ක්‍රියාත්මක කළ යුතුය.

  - ප්‍රසාංගික කලා පීඨය සඳහා අධ්‍යයන අංශ දෙකක් පිහිටුවීමට පියවර ගැනෙමින් පවතී.
  - QR කේත පද්ධතිය හඳුන්වා දීමෙන් මණ්ඩපයේ ශාක ඉන්වෙන්ට්‍රි ඩිජිටල්කරණය 2023 ඔක්තෝම්බර් මාසයේදී ක්‍රියාත්මක කරන ලදී.
  - carbon foot print ගණනය කිරීම පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන 2023 සැප්තැම්බර් මාසයේදී පවත්වන ලදී.
  - ඒකදේශික පලතුරු හා පැල සිටුවීමෙන් මණ්ඩපයේ පෙව විවිධත්වය ඉහළ නැංවීම සඳහා රුක් රෝපණ වැඩසටහනක් 2023 ඔක්තෝම්බර් මාසයේදී පවත්වන ලදී.

පුස්තකාලය - ශ්‍රීපාලි මණ්ඩපය

හැඳින්වීම

2023 දෙසැම්බර් 31 අවසානයේ මණ්ඩප පුස්තකාලයේ පොත් 27760 ක් හා සංයුක්ත තැටි, ඩිජිටල් දෘශ්‍ය තැටි හා නිල් කිරණ ඩිජිටල් දෘශ්‍ය තැටි 2119 ක් විය.

2023 පොත් හා වාර සඟරා මිලට ගැනීමට වෙන් කිරීම්

2023 වර්ෂය සඳහා ශ්‍රීපාලි මණ්ඩපයේ පුස්තකාලය සඳහා පොත් සහ වාර සඟරා මිලදී ගැනීමට මුදල් වෙන් කර නොමැත.
පරිත්‍යාග ලෙස ලැබුණු පොත් ගණන - 285

කවුළු සේවා – 2023

පුස්තකාල සාමාජිකත්වය:

සිසුන්	793
අධ්‍යයන කාර්ය මණ්ඩලය	34
පරිපාලන කාර්ය මණ්ඩලය	
අනධ්‍යයන කාර්ය මණ්ඩලය	60
බාහිර පර්යේෂකයන්	90
(වෙනත් විශ්වවිද්‍යාල වලින්)	

පුස්තකාල සේවා සම්බන්ධ තොරතුරු

පාඨක සේවා:

2023.01.01 සිට 2023.12.20 - 8032 දක්වා පොත් සහ සීඩීඩී නිකුත් කිරීම සහ ආපසු ලබා දීම

විමර්ශන සේවා:

SPC පුස්තකාලය එළිමහන් පර්යේෂකයන් 90 දෙනෙකුට විමර්ශන සේවාව ලබා දී ඇත

දේශීය පුවත්පත්

2023 වර්ෂය තුළ, පුස්තකාලය සඳහා ඉංග්‍රීසි සහ සිංහල පුවත්පත් 14 ක් සහ එක් දේශීය සිංහල සඟරාවක් මිලදී ගන්නා ලදී.
පුවත්පත් සඳහා ගෙවූ මුදල (2022.11.30 දක්වා) - රු.168,000.00

අස්ථානගත වූ පොත්

පොත් 14 ක් අස්ථානගත වූ බව පාඨකයන් විසින් ප්‍රකාශ කරන ලදී.

ඒවා ප්‍රතිස්ථාපනය සඳහා ඔවුන් ගෙවූ මුදල - රු. 19,137.00

බාහිර සිසුන් ලියාපදිංචි කිරීම

2023 වසර සඳහා වෙනත් විශ්වවිද්‍යාලවලින් පුස්තකාලයේ බාහිර සාමාජිකයන් ලෙස සිසුහු දෙදෙනෙක් ලියාපදිංචි වූහ.
පුස්තකාල ලියාපදිංචි ගාස්තුව ලෙස මසක කාලයක් සඳහා සාමාජිකයෙකුගෙන් රු.200/= අය කෙරේ.

පුස්තකාල ලියාපදිංචි ගාස්තුව ලෙස ලැබූ මුදල– රු. 400.00

පුස්තකාල දඩ

නියමිත දිනට පුස්තකාල ද්‍රව්‍ය ආපසු ලබා දීමට අසමත් වූ සිසුන්ට පුස්තකාලය සාමාන්‍යයෙන් දඩ නියම කරයි.

පුස්තකාල දඩ ලෙස ලැබුණු මුදල - රු.103,761.75

<u>පුස්තකාල සුළු මුදල්</u>

පුස්තකාල සුළු මුදල් ලෙස භාවිතා කරන ලද මුළු එකතුව - රු. 5,000.00

කේවල ශාස්ත්‍රීය කටයුතු

- ශ්‍රී පාලී මණ්ඩපයේ නියෝජ්‍ය පුස්තකාලයාධිපති ආචාර්ය වත්සලා අතුකෝරාල මහත්මියගේ ශාස්ත්‍රීය කටයුතු
- 2023 නොවැම්බර් 23 වැනි දින ජර්මනියේ ස්ටුට්ගාර්ට් විශ්ව විද්‍යාලයේ පැවති හම්බෝල්ට් පදනමේ වාර්ෂික මහා ජාලකරණ සමුළුවේදී "ජර්මානු ශාස්ත්‍රීය පුස්තකාලවල සමාජ මාධ්‍ය අලෙවිකරණය" යන මැයෙන් පර්යේෂණ පත්‍රිකාවක් ඉදිරිපත් කරන ලදී.
- 2023 දෙසැම්බර් 18 වන දින ජර්මනියේ මන්ස්ටර් විශ්ව විද්‍යාලයේ දී "ශ්‍රී ලංකාවේ පුස්තකාලයට සහ පොත් සඳහා ප්‍රවේශය" යන මාතෘකාවෙන් යුත් දේශනයක් පවත්වන ලදී. මෙය උසස් අධ්‍යයන මධ්‍යස්ථානය විසින් සංවිධානය කරන ලදී.

2.15 සමකාලීන ඉන්දියානු අධ්‍යයන මධ්‍යස්ථානය (CCIS)

සමකාලීන ඉන්දියානු අධ්‍යයන මධ්‍යස්ථානය (CCIS) යනු දෙරට අතර ආයතනික ජාලයක් හරහා ඉන්දියාවේ සමකාලීන අධ්‍යයන පිළිබඳ ශ්‍රී ලංකාවේ දැනුම වර්ධනය කිරීම සහ ඉන්දු-ලංකා සබඳතාව ශක්තිමත් කිරීම සම්බන්ධ ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය කිරීම සඳහා බහුවිධ පර්යේෂණ මධ්‍යස්ථානයකි. සමකාලීන ඉන්දියාව පිළිබඳ අධ්‍යයනය සඳහා කැප වූ ශ්‍රී ලංකාවේ එකම පර්යේෂණ ආයතනය එයයි. ශ්‍රී ලංකාවේ ඉන්දීය මහ කොමසාරිස් කාර්යාලය සහ කොළඹ විශ්වවිද්‍යාලය අතර අවබෝධතා ගිවිසුමක් (අවබෝධතා ගිවිසුම) යටතේ 2012 දී CCIS පිහිටුවන ලදී. මෙම මධ්‍යස්ථානය අධ්‍යයන හා පරිපාලන කටයුතු සඳහා පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය (FGS) යටතේ ක්‍රියාත්මක වන අතර එය එහි උපදේශක මණ්ඩලය සහ කළමනාකරණ මණ්ඩලය හරහා වෙනත් පීඨ සමඟ සම්බන්ධ වේ.

ඉන්දියාව සහ ශ්‍රී ලංකාව සියවස් ගණනාවකට පෙර සිට පැවත එන සමාජ, ආගමික, භාෂාමය, සංස්කෘතික, ආර්ථික සහ උපායමාර්ගික සබඳතා හරහා සම්බන්ධ වේ. කෙසේ වෙතත්, ඉන්දියාවේ සමකාලීන වර්ධනයන් සහ වෙනස්කම් පිළිබඳ අධ්‍යයනයට සැලකිය යුතු තරම් අඩු වැදගත්කමක් ලබා දී ඇති බව අවබෝධ වේ. ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපන ආසනයක සිටු කරනු ලබන එවැනි පර්යේෂණ සහ අධ්‍යයනය රටේ සමාජ හා ආර්ථික සංවර්ධනය සහ ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර පවතින මිත්‍රත්වය සඳහා මග පෙන්වීම සහ ශක්තිමත් කිරීම සඳහා වැදගත් කාර්යභාරයක් ඉටු කරනු ඇති බව වටහා ගැනීමෙන්, මෙම සමකාලීන ඉන්දියානු අධ්‍යයන මධ්‍යස්ථානය ශ්‍රී ලංකාව තුළ සමකාලීන ඉන්දියාව පිළිබඳ අවබෝධය පෘථුල කිරීමට උපකාරී වනු ඇත.

මධ්‍යස්ථානයේ ප්‍රධාන කාර්යය වන්නේ සමකාලීන ඉන්දියානු අධ්‍යයන ක්ෂේත්‍රයේ සේවය කරන අධ්‍යයන කාර්ය මණ්ඩලය සහ පශ්චාත් උපාධිධාරීන් සඳහා බුද්ධිමය සංසදයක් සැපයීම සහ එහි සාමාජිකයින්ට සහ වෙනත් ආයතන සමඟ සහයෝගයෙන් පර්යේෂණ සඳහා පදනමක් සැපයීමයි. සහයෝගීතා පර්යේෂණ ව්‍යාපෘති ඇතුළුව ක්ෂේත්‍රයේ දේශන, සම්මන්ත්‍රණ සහ වෙනත් පර්යේෂණ සිදුවීම් සඳහා කේන්ද්‍රස්ථානයක් ලෙස සේවය කිරීම මධ්‍යස්ථානයේ අරමුණයි. සමකාලීන ඉන්දියානු අධ්‍යයන මධ්‍යස්ථානය ජාතික හා ජාත්‍යන්තර වශයෙන් වෙනත් විද්වතුන් සමඟ සම්බන්ධතා සාදරයෙන් පිළිගනී.

දැක්ම

සමකාලීන ඉන්දියාව පිළිබඳ පර්යේෂණ සහ දැනුම ප්‍රවර්ධනය කිරීම සඳහා ශාස්ත්‍රීය කේන්ද්‍රස්ථානයක් ලෙස පරිණාමය වීම සහ වර්ධනය වීම

අරමුණු

- කොළඹ විශ්වවිද්‍යාලයට සීමා නොවූ පර්යේෂණ, ඉගැන්වීම්, ශිෂ්‍ය/කාර්ය මණ්ඩල හුවමාරු සහ වෙනත් අධ්‍යයන ක්‍රියාකාරකම් හරහා සමකාලීන ඉන්දියාව පිළිබඳ ශ්‍රී ලංකාව තුළ දැනුම වර්ධනය කිරීම.
- පර්යේෂණ, ඉගැන්වීම්, ශිෂ්‍ය/කාර්ය මණ්ඩල හුවමාරු සහ වෙනත් අධ්‍යයන ක්‍රියාකාරකම් හරහා ඉන්දියාව-ශ්‍රී ලංකාව පිළිබඳ දැනුම වර්ධනය කිරීම.
- ශ්‍රී ලාංකික සිසුන්, විද්වතුන් සහ පොදු ව්‍යාපාරික සහ විදේශ ප්‍රතිපත්ති ප්‍රජාවන්ට සමකාලීන ඉන්දියාව පිළිබඳ තොරතුරු සහ ඉන්දියානු ආයතන වෙත ප්‍රවේශය ලබා දීම.
- ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර ආයතනික ජාල සංවර්ධනය කිරීම
- සමකාලීන ඉන්දියානු අධ්‍යයන පිළිබඳව පුස්තකාල සහ තොරතුරු නාක්ෂණය පදනම් වූ සම්පත් සංවර්ධනය කිරීම.
- බාහිර දේශන, සම්මන්ත්‍රණ, සම්මේලන සහ සමකාලීන ඉන්දියානු අධ්‍යයන සම්බන්ධ අනෙකුත් ශාස්ත්‍රීය කාර්යයන් සඳහා සංසදයක් සැපයීම.
- විද්වත් දේශන මාලාවක් පවත්වාගෙන යාම.
- බාහිර විද්වතුන් සහ සාමාජිකයින්ගේ වැඩසටහනක් පවත්වාගෙන යාම.

2023 දී මධ්‍යස්ථානය විසින් සිදුකළ ක්‍රියාකාරකම්

- 'ශ්‍රී ලංකාවේ වත්මන් බදු ප්‍රතිසංස්කරණ' මැයෙන් 2023 ජනවාරි 17 වැනි දින කොළඹ විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍ර පීඨය හා එක්ව මාසික සංසදය පවත්වන ලදී.
  මෙම වැඩ සටහනේ සම්පත් පුද්ගලයන් වූයේ මෙම විද්වතුන්ය;

  - එරන්ද කොඩිතුවක්කු මහතා (ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය කොමසාරිස්, මහා ආයතන අභියාචනා ඒකකය, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව)
  - එන්. ආර්. ගජේන්ද්‍රන් මහතා (ජ්‍යෙෂ්ඨ බදු උපදේශක, ගජ්මා ටැක්ස් කන්සල්ටන්ට්ස්)
  - මහාචාර්ය සිරිමල් අබේරත්න (ආර්ථික විද්‍යාව පිළිබඳ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය, ආර්ථික විද්‍යා අ.අ, කොළඹ වි.වි.)
  - මහාචාර්ය කේ. අමිර්තලිංගම් (ආර්ථික විද්‍යාව පිළිබඳ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය, ආර්ථික විද්‍යා අ.අ, කොළඹ වි.වි.)

- CCIS සිය ත්‍රෛමාසික පුවත් පත්‍රිකාව වූ 'සමකාලීන' හි 2023 අප්‍රේල් - ජුනි කලාපය ප්‍රකාශයට පත්කළේය. (මෙය 2023 දී ප්‍රකාශයට පත්කරනු නොලැබිණි)
- CCIS සිය ත්‍රෛමාසික පුවත් පත්‍රිකාව වූ 'සමකාලීන' හි 2023 ජූලි - සැප්තැම්බර් කලාපය ප්‍රකාශයට පත්කළේය. (මෙය 2023 දී ප්‍රකාශයට පත්කරනු නොලැබිණි)
- 2023 ජනවාරි 13, 14 සහ 15 යන දිනයන්හිදී කොළඹ විශ්වවිද්‍යාලයීය ගෘහස්ථ ක්‍රීඩාගාරයේදී පවත්වන ලද ආරාධිත විශ්වවිද්‍යාල මාණ්ඩලික බැඩ්මින්ටන් තරඟාවලිය - 2023 සඳහා CCIS අනුග්‍රාහකත්වයක් ලබා දුන්නේය.
- CCIS මාසික සංසදය 2023 පෙබරවාරි 23 වැනි දින 'ඉන්දු-ශ්‍රී ලංකා වෙළෙඳාම: ගැටලු සහ අපේක්ෂා' පිළිබඳ ආචාර්ය එම්. ගනේෂමූර්ති (ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ආර්ථික විද්‍යා අ.අ., කොළඹ විශ්වවිද්‍යාලය) විසින් පවත්වන ලදී.
- CCIS සිය ත්‍රෛමාසික පුවත් පත්‍රිකාව වූ 'සමකාලීන' හි 2023 ඔක්තෝබර් - දෙසැම්බර් කලාපය ප්‍රකාශයට පත්කළේය.
- CCIS පුස්තකාලය සංවර්ධනය කිරීම සඳහා CCIS විසින් කරන ලද ඉල්ලීමකට ප්‍රතිචාර වශයෙන්, ඉන්දියාවේ හින්දුස්ථානි ප්‍රචාර් සභාවෙන් පුස්තකාලය සඳහා පොත් පරිත්‍යාගයක් CCIS වෙත ලැබුණි.
- CCIS සිය ත්‍රෛමාසික පුවත් පත්‍රිකාව වූ 'සමකාලීන' හි 2023 ජනවාරි - මාර්තු කලාපය ප්‍රකාශයට පත්කළේය.
- මැයි 9 වනදාට යෙදුනු නොබෙල් ත්‍යාගලාභී රවීන්ද්‍රනාත් තාගෝර් අනුස්මරණ දිනය නිමිත්තෙන් මැයි මාසයේ CCIS මාසික සංසද දේශනය "තාගෝර්ගේ ශ්‍රී ලංකා සංචාර" යන මැයෙන් ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සඳගෝමී කෝපරහේවා විසින් මැයි 09 වන දින ප.ව. 2.30 ට පවත්වන ලදී.
- CCIS ජූනි මාසික සංසදය ''ඉන්දියාව: ලෝකයේ වැඩිම ජනගහනයක් සහිත රටෙහි ජන විකාශනය'' යන තේමාව යටතේ 2023 ජූනි 28 වැනි දින මහාචාර්ය ඉන්ද්‍රලාල් ද සිල්වා විසින් මෙහෙයවන ලදී.
- CCIS සිය ත්‍රෛමාසික පුවත් පත්‍රිකාව වූ 'සමකාලීන' හි 2023 අප්‍රේල් - ජුනි කලාපය ප්‍රකාශයට පත්කළේය.
- විවරණයක් සහිත චිත්‍රපට දෙකක් තිරගත වූ ඉන්දියානු චිත්‍රපට දිනය 2023.07.19 දින පැවැත්විනි.
- CCIS සැප්තැම්බර් මාසික සංසදය 2023 සැප්තැම්බර් 05 වැනි දින ආචාර්ය මැණික් වක්කුඹුර විසින් "BRICS හි ඉන්දියාවේ භූමිකාව: දකුණු ආසියානු ඉදිරිදර්ශනය" මැයෙන් පවත්වන ලදී.
- CCIS සිය ත්‍රෛමාසික පුවත් පත්‍රිකාව වූ 'සමකාලීන' හි 2023 ජූලි - සැප්තැම්බර් කලාපය ප්‍රකාශයට පත්කළේය.
  2023 ඔක්තෝම්බර් 17 වන දින නියෝජ්‍ය ඉන්දීය මහ කොමසාරිස්වරයාගේ සහභාගීත්වයෙන් කොළඹ විශ්ව විද්‍යාල ප්‍රධාන පුස්තකාල පරිශ්‍රයේ දී CCIS පුස්තකාලය විවෘත කරන ලදී.

අ. සම්පත් සහ සිසුන් පිළිබඳ විස්තර

මධ්‍යස්ථානය	මුළු ශිෂ්‍ය සංඛ්‍යාව	මුළු අධ්‍යයන කාර්ය මණ්ඩලය	මුළු අනධ්‍යයන කාර්ය මණ්ඩලය
	2023	**2023**	**2023**
සමකාලීන ඉන්දියානු අධ්‍යයන මධ්‍යස්ථානය (CCIS)	අදාළ නොවේ	01	01
එකතුව	**-**	**01**	**01**

ආ. අධ්‍යයන කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර :

මධ්‍යස්ථානය	මහාචාර්ය	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය	කථිකාචාර්ය	සහ. කථිකාචාර්ය	උපදේශක
සමකාලීන ඉන්දියානු අධ්‍යයන මධ්‍යස්ථානය (CCIS)	01	-	-	-	-
එකතුව	**01**	-	-	-	-

ඇ. අනධ්‍යයන කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර :

මධ්‍යස්ථානය	ජ්‍යෙෂ්ඨතම	ජ්‍යෙෂ්ඨ	කනිෂ්ඨ	සුලු සේවක	කොන්ත්‍රාත්
සමකාලීන ඉන්දියානු අධ්‍යයන මධ්‍යස්ථානය (CCIS)	-	-	-	-	01
එකතුව	**-**	**-**	**-**	**-**	**01**

ඈ. පර්යේෂණ, නවෝත්පාදන හා ප්‍රකාශන පිළිබඳ තොරතුරු:

විෂයය	ප්‍රකාශයට පත්කළ	වාණිජකරණය කළ	ඉදිරිපත් කළ
	2023	**2023**	**2023**
අ. පර්යේෂණ සංඛ්‍යාව			
ආ. නවෝත්පාදන සංඛ්‍යාව			
ඇ. වාරසඟරා ලිපි සංඛ්‍යාව			
ඈ. ග්‍රන්ථ සංඛ්‍යාව			
ඉ. ලිපි සංඛ්‍යාව			
ඊ. වෙනත්	06 – CCIS ප්‍රවත් පත්‍රිකාව		
එකතුව	**06**		

ඉ. පුනරාවර්තන වියදම් පිළිබඳ විස්තර :

විෂයය	**2023** **රු.**
අ. පෞද්ගලික වැටුප් හා වේතන	1,032,900.00
ආ. ප්‍රවාහන	1083.00
ඇ.සැපයුම්	122,322.77
ඈ.නඩත්තු	-
ඉ. කොන්ත්‍රාත් සේවා	-
ඊ.වෙනත්	93,750.00
එකතුව	**1,250,055.77**

ඊ. ප්‍රාග්ධන වියදම් පිළිබඳ විස්තර :

විෂයය	**2023** **රු.**
අ. ගෘහභාණ්ඩ හා කාර්යාල උපකරණ අත්පත් කර ගැනීම	14,400.00
එකතුව	14,400.00

උ. මූල්‍ය ප්‍රගතිය පිළිබඳ විස්තර (වැය)

විෂයය	**2023** ප්‍රතිපාදන රු.	**2023** වැය රු.	ඉතුරුම්/ අතිරික්ත රු.
අ. ව්‍යාපෘතිය හැර පුනරාවර්තන		-	-
ආ. ව්‍යාපෘතිය හැර ප්‍රාග්ධන		-	-
ඇ. ව්‍යාපෘතිය - දේශීය අරමුදල්		-	-
ඈ. ව්‍යාපෘතිය - විදේශීය අරමුදල්		2,289,542.56	-
එකතුව		**2,289,542.56**	-

2.16 මානව හිමිකම් අධ්‍යයන කේන්ද්‍රය (CSHR)

දැක්ම: සියලු මිනිසුන්ගේ ගෞරවයට හා අයිතිවාසිකම්වලට ගරු කරන අයිතිවාසිකම් පිළිබඳ සවිඥානික ජාතියක් බිහි කිරීම.

මෙහෙවර: බහුවිධ ප්‍රවේශයක් භාවිතා කරමින් මානව හිමිකම් අධ්‍යාපනය, පර්යේෂණ, ධාරිතා ගොඩනැගීම සහ දැනුම සේවා පෝෂණය කිරීම

වගකීම : කොළඹ විශ්ව විද්‍යාලයේ නීති පීඨයට අනුබද්ධ ලාභ නොලබන අධ්‍යාපන ආයතනයක් ලෙස, CSHR හි වගකීම වන්නේ විශ්ව විද්‍යාලය සහ ප්‍රජාව සඳහා මානව හිමිකම් අධ්‍යාපනය සහ පර්යේෂණ වැඩසටහන් පැවැත්වීම සහ පහසුකම් සැලසීමයි.

හර වටිනාකම් සමුදාය

- **ගරුත්වය සහ ගෞරවය :** සෑම කෙනෙකුගේම සමාන ගෞරවයට සහ අයිතිවාසිකම්වලට ගරු කිරීම, සහ සියලු ආකාරයේ ප්‍රචණ්ඩත්වයන් නොයිවසීම.
- **සමානාත්මතාවය සහ විවිධත්වය :** ස්ත්‍රී පුරුෂ භාවය, ජාතිය, කුලය, ආගම, ජනවාර්ගික හෝ සමාජ සම්භවය, ආබාධිතභාවය, උපත හෝ වෙනත් සාධක මත පදනම්ව වෙනස් කොට සැලකීමකින් තොරව බහුත්වවාදය, අන්තර්ග්‍රහණය සහ සෑමට සමාන සැලකීමේ වටිනාකම් වැලඳ ගැනීම
- **විශිෂ්ටත්වය :** දැනුම නිෂ්පාදනයේ ගුණාත්මකභාවය සහතික කිරීම සඳහා ව්‍යාත්තීයභාවයේ ඉහළම ප්‍රමිතීන් ආරක්ෂා කිරීමට කැපවීම.
- **අවංකත්වය :** අඛණ්ඩතාව : සියලු අන්තර්ක්‍රියා වල අවංකභාවය, විනිවිදභාවය සහ වගවීම.
- **ව්‍යවසාය සහ නවෝත්පාදන:** CSHR හි ප්‍රගතිශීලී සහ තිරසාර වර්ධනයට දායක වන ව්‍යවසායක සහ නව්‍ය අදහස් සහ කුසලතා පෝෂණය කිරීම.
- **ප්‍රජාතන්ත්‍රවාදී සහභාගීත්වය :** සාකච්ඡා සහ තීරණ ගැනීමේ ක්‍රියාවලීන්හි ක්‍රියාකාරී සහ අර්ථවත් සහභාගීත්වය.

අරමුණු	ඉලක්ක
1. මානව හිමිකම් අධ්‍යාපනය පෝෂණය කිරීම.	1.1. ගෝලීය තත්ත්ව හා ප්‍රමිතීන්ට සමගාමීව මානව හිමිකම් පිළිබඳ අධ්‍යාපනික වැඩසටහන් ඉදිරිපත් කිරීම. 1.2. විවිධාංගීකරණය වූ ඉගෙනුම් හවුල්කරුවන් සමූහයක් ඉලක්ක කර ගනිමින් අද්විතීය අධ්‍යාපන කළඹක් නිර්මාණය කිරීම.
2. මානව හිමිකම් පරිසරයේ ඵලදායී වෙනසක් ඇති කිරීම සඳහා පර්යේෂණ ශක්තිමත් කිරීම.	2.1. ක්‍රියා දිශානතිගත නව්‍ය පර්යේෂණ ශක්තිමත් කිරීම සහ පර්යේෂණ ප්‍රතිඵල බෙදා හැරීම 2.2. උත්ප්‍රේරක පර්යේෂණ සහ භාවිතය සඳහා කාර්ය මණ්ඩලයේ පර්යේෂණ ධාරිතාව වැඩි දියුණු කිරීම.
3. සාම්ප්‍රදායික සීමා ඉක්මවා මානව හිමිකම් පිළිබඳ දැනුම් සේවා ශක්තිමත් කිරීම.	3.1. නවීන තාක්ෂණික ක්‍රම හරහා විවිධ ප්‍රේක්ෂකයින් අතර දැනුම සේවා බෙදා හැරීම, පුළුල් කිරීම සහ වැඩිදියුණු කිරීම.
4. මානව හිමිකම් ආරක්ෂා කිරීමට සමාජයට හැකියාව ලබා දීම.	4.1. අයිතිවාසිකම් පිළිබඳ සවිඥානික යුතුකම් දරන්නන් සහ හිමිකම් දරන්නන් නිර්මාණය කිරීම.
5. දේශීය හා ගෝලීය තලයේ ආයතනික දෘශ්‍යතාව ශක්තිමත් කිරීම.	5.1. දේශීය හා දෘශ්‍යතාව ශක්තිමත් කිරීම. 5.2. දැනුම ක්‍රියාවට පරිවර්තනය කරන ක්‍රියාශීලී ආදි විද්‍යාර්ථීන් බිහි කිරීම.
6. ගතික ශ්‍රම බලකායක් සහ වැඩ පරිසරයක් පෝෂණය කිරීම.	6.1. කාර්ය මණ්ඩලයේ සම්පත්දායකත්වය වැඩිදියුණු කිරීම 6.2. ආයතනික පාලනය සහ වගවීම වැඩිදියුණු කිරීම.

2023 වර්ෂය තුළ සිදු කරන ලද ක්‍රියාකාරකම්

වැඩසටහන්

1. තායිලන්තයේ මහිදොල් විශ්වවිද්‍යාලයේ ජනවාරි 9-11 පැවති MHRD නියාමන කමිටු රැස්වීම
2. ආසියා පැසිෆික් ශාස්ත්‍රපති උපාධි සමාරම්භක උත්සවය 2023 පෙබරවාරි 17 වැනි දින පැවැත්විණි
3. අධ්‍යයන වැඩසටහන් ප්‍රවර්ධනය සඳහා 2023 මාර්තු 2-3 දිනවල පුත්තලම EDU Expo 2023 ප්‍රදර්ශනයට සහභාගී වීම
4. 2023 ජූනි 6 වන දින නෙළුම් පොකුණ මහින්ද රාජපක්ෂ රඟහලේදී පැවති සම්මාන උළෙල
5. APMA සිසුන් සහ පූනේ විශ්ව විද්‍යාලයේ අධිශිෂ්‍යත්වලාභීන් සඳහා වනාතවිල්ලුව වෙත ක්ෂේත්‍ර චාරිකාව.
6. MHRD සිසුන් විසින් 2023 මාර්තු 7 දින වැලිකඩ බන්ධනාගාරය සහ කාන්තා බන්ධනාගාර වාට්ටුව වෙත බන්ධනාගාර චාරිකාව
7. සහතික සහ ඩිප්ලෝමා පාඨමාලා සමාරම්භක උත්සවය 2023 ජූලි 07 වනදා (Zoom හරහා)
8. කනිෂ්ඨ අණදෙන නිලධාරීන් සහ කාර්ය මණ්ඩලය සඳහා මානව හිමිකම් සහ ජාත්‍යන්තර මානුෂීය නීතිය පිළිබඳ පුහුණු වැඩසටහන්.- පෙබරවාරි 06 සිට පෙබරවාරි 08 දක්වා /2023 ඔක්තෝබර් 09 සිට ඔක්තෝබර් 11 දක්වා සහ 2023 ජූනි 12 සිට ජූනි 14 දක්වා
9. මාධ්‍ය සහ මානව හිමිකම් පිළිබඳ වැඩමුළුව-2023 සැප්තැම්බර් 23
10. විකල්ප සත්කාර පිළිබඳ වැඩමුළුව - ළමා රැකවරණය සහ අයිතිවාසිකම් පිළිබඳ සහතිකය - 2023 දෙසැම්බර් 02

ව්‍යාපෘති සම්බන්ධ කටයුතු

1. ආසියානු පදනම (Asia Foundation) සහ Save the Children සමඟ ගිවිසුම් අත්සන් කිරීම
2. පර්යේෂණ දියත් කිරීම සහ සාකච්ඡා මණ්ඩපය : භාෂා අයිතිවාසිකම් සහ ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය සහ කාන්තා සවිබල ගැන්වීම අතර සම්බන්ධය (ජාතික භාෂා සමානාත්මතා අභිවෘද්ධි ව්‍යාපෘතිය - NLEAP සහ කැනඩා රජය විසින් සහාය දක්වයි)
3. ක්ෂේත්‍ර පාදක කාර්ය මණ්ඩලයේ දිශානතිය: දිස්ත්‍රික් සම්බන්ධීකාරකවරුන් (නීතිඥවරුන්) සහ ශිෂ්‍ය ස්වේච්ඡා සේවකයන් (නීති සිසුන්)
4. ප්‍රාදේශීය ලේකම් කාර්යාල සඳහා තීරණ ගැනීම පිළිබඳ මානව හිමිකම් පදනම් කරගත් ප්‍රවේශය පිළිබඳ පුහුණුව (රට පුරා ප්‍රාදේශීය ලේකම්වරුන් 341 දෙනා සඳහා පුහුණු සැසි 11ක්)
5. 2023 ජූනි සිට මේ දක්වා සතිපතා රට පුරා නොමිලේ නීති උපදේශන ලබා දීම
6. රට පුරා සිටින ක්ෂේත්‍ර පදනම් කරගත් දිස්ත්‍රික් සම්බන්ධීකාරකවරුන් විසින්කරන නීතිමය දැනුවත් කිරීම
7. රත්නපුර නීති ආධාර ඒකකය සහ පාරිසරික නීතිය සහ ප්‍රතිපත්ති කේන්ද්‍රය සමග එක්ව පැවැත්වූ නීති ආධාර කඳවුර
8. අධිකරණ ක්ෂේත්‍රයට අනුගත වීම වැඩිදියුණු කිරීම සඳහා ක්ෂේත්‍ර පාදක කාර්ය මණ්ඩලයට ධාරිතා ගොඩනැගීමේ පුහුණු වැඩ සටහන් මාලාව

අ. සම්පත් සහ සිසුන් පිළිබඳ විස්තර

පාඨමාලාව	මුළු ශිෂ්‍ය සංඛ්‍යාව	මුළු අධ්‍යයන කාර්ය මණ්ඩලය	මුළු අනධ්‍යයන කාර්ය මණ්ඩලය
	2023	**2023**	**2023**
මානව හිමිකම් සහ ප්‍රජාතන්ත්‍රවාදය - පශ්චාත් උපාධි	41		
මානව හිමිකම් සහ ප්‍රජාතන්ත්‍රවාදය - ආසියා ශාන්තිකර පශ්චාත් උපාධි (APMA)	05		
ළමා ආරක්ෂාව සහ අයිතිවාසිකම් - පශ්චාත් උපාධි ඩිප්ලෝමා	63		
මානව හිමිකම් පදනම් කරගත් මානව සම්පත් කළමනාකරණය - උසස් ඩිප්ලෝමාව	10		
මානව හිමිකම් සහ ප්‍රජාතන්ත්‍රවාදය - දුරස්ථ ඉගෙනුම් ඩිප්ලෝමා	29		
මාධ්‍ය සහ මානව හිමිකම් - ඩිප්ලෝමාව	9 ලියාපදිංචිය තවම විවෘතව පවතී.		
මානව හිමිකම් පිළිබඳ ඩිප්ලෝමාව	27		1
මානව හිමිකම් පදනම් කරගත් නීතිය බලාත්මක කිරීම - ඩිප්ලෝමාව	13		
මානව හිමිකම් පදනම් කරගත් ප්‍රතිපත්ති ඩිප්ලෝමාව	44		
ළමා රැකවරණය සහ අයිතිවාසිකම් - උසස් සහතික පත්‍ර පාඨමාලාව	5		
මානව හිමිකම් සහ ජාත්‍යන්තර මානුෂීය නීතිය - උසස් සහතික පත්‍ර පාඨමාලාව	13		
ළමා රැකවරණය සහ අයිතිවාසිකම් - සහතික පත්‍ර පාඨමාලාව	74		
මානව හිමිකම් සහ මූලික අයිතිවාසිකම් - සහතික පත්‍ර පාඨමාලාව	5 ලියාපදිංචිය තවම විවෘතව පවතී.		
නීතිය සහ පුරවැසිභාවය - සහතික පත්‍ර පාඨමාලාව	සිසුන් සංඛ්‍යාව ප්‍රමාණවත් නොවූ බැවින් ආරම්භ නොවීය.		

ආ. පශ්චාත් උපාධි

පාඨමාලාව	මාධ්‍යය	ඇතුළත් කර ගැනීම් සිසුන් සංඛ්‍යාව	වත්මන් සිසුන් සංඛ්‍යාව
		2023	**2023**
ළමා රැකවරණය සහ අයිතිවාසිකම් - උසස් සහතික පත්‍ර පාඨමාලාව	සිංහල ඉංග්‍රීසි දෙමළ	40 23 -	49 24 1 ● පෙර කණ්ඩායම 08 = (සි-6 ඉ - 1 දෙ – 1) ● කල් තැබීම් 02 = (සි– 2)
මානව හිමිකම් සහ ප්‍රජාතන්ත්‍රවාදය - පශ්චාත් උපාධි	ඉංග්‍රීසි	38	41 ● කල් තැබීම් - 03
එකතුව		101	128

ඇ. විදේශීය ශිෂ්‍යයන් පිළිබඳ විස්තර

පාඨමාලාව	මාධ්‍යය	ඇතුළත් කර ගැනීම්	පළමු වසර සිසුන්	දෙවන වසර සිසුන්	තෙවන වසර සිසුන්	සිවුවන වසර සිසුන්	උපාධි ලත් සංඛ්‍යාව
		2023	**2023**	**2023**	**2023**	**2023**	**2023**
මානව හිමිකම් සහ ප්‍රජාතන්ත්‍රවාදය - ආසියා ශාන්තිකර පශ්චාත් උපාධි	ඉංග්‍රීසි	05	අ/ නැ	අ/ නැ	අ/ නැ	අ/ නැ	0
මානව හිමිකම් පිළිබඳ ඩිප්ලෝමාව	ඉංග්‍රීසි	01	-	-	-	-	-
මානව හිමිකම් පදනම් කරගත් මානව සම්පත් කළමනාකරණය - උසස් ඩිප්ලෝමාව	ඉංග්‍රීසි	01	-	-	-	-	-
එකතුව		**07**	-	-	-	-	-

ඈ. අනධ්‍යයන කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර

ජ්‍යෙෂ්ඨතම	ජ්‍යෙෂ්ඨ	කනිෂ්ඨ	සුලු සේවක	කොන්ත්‍රාත්	එකතුව
00	00	00	00	24	24

ඉ. පර්යේෂණ, නවෝත්පාදන සහ ප්‍රකාශන පිළිබඳ විස්තර:

විෂයය	ප්‍රකාශයට පත්කළ	වාණිජකරණය කළ	ඉදිරිපත් කළ
	2023	**2023**	**2023**
අ. පර්යේෂණ සංඛ්‍යාව	01	-	-
ආ. නවෝත්පාදන සංඛ්‍යාව	-	-	-
ඇ. වාරසඟරා ලිපි සංඛ්‍යාව	--	-	-
ඈ. ග්‍රන්ථ සංඛ්‍යාව	01	-	-
ඉ. ලිපි සංඛ්‍යාව	-	-	-
ඊ. වෙනත්	-	-	-
එකතුව	**02**	**00**	**00**

ඊ. වැඩ සටහන්, සම්මන්ත්‍රණ හා වැඩමුළු පිළිබඳ තොරතුරු:

විෂයය	සහභාගි වූ	සම්පූර්ණ කළ	ඉදිරිපත් කිරීම් කළ
	2023	**2023**	**2023**
අ. පශ්චාත් උපාධි පාඨමාලා සංඛ්‍යාව	3	-	-
ආ. පශ්චාත් උපාධි ඩිප්ලෝමා සංඛ්‍යාව	1	-	-
ඇ.උපාධි පාඨමාලා සංඛ්‍යාව	-	-	-
ඈ.ඩිප්ලෝමා වැඩසටහන් සංඛ්‍යාව	6	-	-
ඉ. උසස් ඩිප්ලෝමා වැඩසටහන් සංඛ්‍යාව	1	-	-
ඊ. සහතිකපත්‍ර පාඨමාලා සංඛ්‍යාව	6	-	-
උ. පුහුණු වැඩසටහන්	1	-	-
එකතුව	**17**	-	-

උ. අරඹන ලද නව පාඨමාලාවල විස්තර

පාඨමාලාව	මාධ්‍යය	සහතිකපත්‍ර	ඩිප්ලෝමා	ප.උ. ඩිප්ලෝමා	පශ්චාත් උපාධි	දර්ශනපති	දර්ශන විශාරද
		2023	**2023**	**2023**	**2023**	**2023**	**2023**
මාධ්‍ය සහ මානව හිමිකම් - ඩිප්ලෝමාව	සි/දෙ	-	10	-	-	-	-
මානව හිමිකම් පදනම් කරගත් මානව සම්පත් කළමනාකරණය - උසස් ඩිප්ලෝමාව	ඉ	-	13	-	-	-	-
මානව හිමිකම් පදනම් කරගත් නීතිය බලාත්මක කිරීම - ඩිප්ලෝමාව	සි/දෙ	-	13	-	-	-	-
සංවර්ධනය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ ශාස්ත්‍රපති	ඉ	-	-	-	2024 ජනවාරි ආරම්භ වේ.	-	-
එකතුව		-	**36**	-	-	-	-

ඌ. ව්‍යාපෘති වියදම් පිළිබඳ විස්තර (දේශීය/විදේශීය අරමුදල් සහිත)

විස්තර	**ණය/ ප්‍රදාන**	**අරමුදල් නියෝජිත ආයතනය**	**TCE රු.**	**RFA රු.**	**DF රු.**
රාජ්‍ය සහ අධිකරණ අංශයේ පාර්ශවකරුවන්ගේ නීතිමය දැනුවත්භාවය ඉහළ නැංවීම	ප්‍රදාන	UNDP Sri Lanka	197,721,065		
කුට්ටනයට ගොදුරු වූ ළමා වින්දිතයන් කළමනාකරණය කිරීම සහ රැකබලා ගැනීම පිළිබඳ පාඨමාලා සංවර්ධනය සහ ක්‍රියාත්මක කිරීම	ප්‍රදාන	Save the Children	7,500,000		
සමථකරණය පිළිබඳ පාඨමාලා සංවර්ධනය සහ දැනුවත් කිරීම	ප්‍රදාන	ආසියානු පදනම	8,060,000		
බුද්ධ ධර්මය සහ ජාත්‍යන්තර මානුෂීය නීතිය පිළිබඳ පාඨමාලා සංවර්ධනය සහ ක්‍රියාත්මක කිරීම	ප්‍රදාන	ජාත්‍යන්තර රතු කුරුස සංගමය	1,033,611		
භාෂා අයිතිවාසිකම් සහ ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය සහ කාන්තාවන් සවිබල ගැන්වීම (GEWE) පිළිබඳ පර්යේෂණ	ප්‍රදාන	ජාතික භාෂා සමානාත්මතා ප්‍රවර්ධන ව්‍යාපෘතිය (NLEAP)	4,661,170		
එකතුව			**218,975,846**		

(GOSL/ ADB/ IDA. WB/ .....)

RFA: ප්‍රතිපූරණය කළ හැකි විදේශීය ආධාර

DF: දේශීය අරමුදල්

2.17 සෞඛ්‍ය මධ්‍යස්ථානය

මෙහෙවර

වෛද්‍ය මානසික සහ නිවාරණ සෞඛ්‍ය ප්‍රවර්ධනය ලබා දීමෙන් ශිෂ්‍යයාගේ අධ්‍යාපන අත්දැකීම් වැඩි දියුණු කිරීම සඳහා සහාය ලබා දීම

අරමුණු

1. විශ්වවිද්‍යාලයේ සිසුන්ගේ සහ කාර්ය මණ්ඩලයේ ප්‍රශස්ත සෞඛ්‍යය ප්‍රවර්ධනය කිරීම
2. ශිෂ්‍යයින් සහ කාර්ය මණ්ඩලය ඔවුන්ගේ ප්‍රාථමික සෞඛ්‍ය සහ සුවතා අවශ්‍යතා සම්බන්ධයෙන් ආධාර කිරීම සහ උපදෙස් දීම.

2023 දී මධ්‍යස්ථානය විසින් සිදුකළ ක්‍රියාකාරකම්

- පැවති ඉන්ධන අර්බුදය මධ්‍යයේ වුවද සෞඛ්‍ය මධ්‍යස්ථානය විසින් සාමාන්‍යයෙන් සපයනු ලබන සියලුම සේවාවන් සිදු කරන ලදී .

- සෞඛ්‍ය මාර්ගෝපදේශ සැපයීම සහ විශ්වවිද්‍යාලයේ පැවැත්වෙන සියලුම ප්‍රධාන උත්සව අධීක්ෂණය සෞඛ්‍ය මධ්‍යස්ථානය මගින් සිදු කරන ලදී.

අනධ්‍යයන කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර :

ජ්‍යෙෂ්ඨතම	ජ්‍යෙෂ්ඨ	කනිෂ්ඨ	සුලු සේවක	එකතුව
01	03	04	03	11

2.18 ජාතික අධ්‍යාපන පර්යේෂණ සහ ඇගයීම් මධ්‍යස්ථානය (NEREC)

ජාතික අධ්‍යාපන පර්යේෂණ සහ ඇගයීම් මධ්‍යස්ථානය (NEREC) ජාතික අධ්‍යාපන පර්යේෂණ සහ ඇගයීම් මධ්‍යස්ථානය ප්‍රතිපත්ති ගොඩනැගීම සඳහා පර්යේෂණ මත පදනම් වූ දත්ත සැපයීමේ අරමුණින් 2000 වසරේදී ස්ථාපනය කෙරිණි. එය පිහිටුවීමේ අරමුණට අනුගත වෙමින් ජාතික අධ්‍යාපන පර්යේෂණ සහ ඇගයීම් මධ්‍යස්ථානය ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ප්‍රතිපත්ති සහ ශිෂ්‍ය කාර්ය සාධනයට අදාළ පර්යේෂණ සහ ඇගයීම් අධ්‍යයන පර්යේෂණ ආරම්භ කිරීම සහ පවත්වාගෙන යාම සඳහා කැපවී සිටියි. ජාතික අධ්‍යාපන පර්යේෂණ සහ ඇගයීම් මධ්‍යස්ථානය අධ්‍යාපන අමාත්‍යාංශයේ සහ ලෝක බැංකුවේ උපදේශකත්වය යටතේ දසකයකට අධික කාලයක් විවිධ ශ්‍රේණිවලට අයත් ශිෂ්‍යයන් ගේ කාර්ය සාධනය ජාතික මට්ටමින් ඇගයීම් ක්‍රියාවට නංවා ඇත. අධ්‍යාපනය හා ඇගයීම්වලට සම්බන්ධ සම්මන්ත්‍රණ, වැඩමුළු, ධාරිතා සංවර්ධන පුහුණු සැසි අධ්‍යාපනය සහ පර්යේෂණ මගින් ජාතික පර්යේෂණ සහ මධ්‍යස්ථානය රජයේ සහ රාජ්‍ය නොවන සංවිධාන වෙත තම සේවා ලබාදෙයි. මෙසේ අධ්‍යාපනික පර්යේෂණ සඳහා කැප වූ පර්යේෂණාත්මක ප්‍රජාවක් නිර්මාණය කිරීමට ජාතික අධ්‍යාපන පර්යේෂණ සහ ඇගයීම් මධ්‍යස්ථානය කැපව සිටියි.

දැක්ම

පර්යේෂණ, ඇගයීම්, සංවර්ධනය, බෙදාහැරීමේ කාර්ය සහ අධ්‍යාපන තොරතුරු සැපයීමේ සේවා මගින් ජාතික සහ

කලාපීය මට්ටමින් අධ්‍යාපනය සහ පුහුණුව වර්ධනය කිරීම.

මෙහෙවර

ජාතික හා කලාපීය පැතිකඩක් ඇති ශක්ති සම්පන්න, ඉදිරි දැක්මක් ඇති, අධ්‍යාපන පර්යේෂණ, ඇගයීම්, පරීක්ෂණ සහ පුහුණු කිරීමේ

ආයතනයක් ස්ථාපිත කිරීම

2023 දී මධ්‍යස්ථානය විසින් සිදුකළ ක්‍රියාකාරකම්

- ලෝක බැංකුව විසින් සපයන ලද මූල්‍ය ආධාර මත අධ්‍යාපන අමාත්‍යාංශය විසින් ජාතික මට්ටමේ පර්යේෂණ අධ්‍යයන දෙකක් ක්‍රියාත්මක කරන ලදී.
    - 2022/2023 වසරේ 4 ශ්‍රේණිය සම්පූර්ණ කරන සිසුන්ගේ ගණිතය සහ ඉංග්‍රීසි ඉගෙනුම් ප්‍රතිඵල සාක්ෂාත් කර ගැනීමේ ජාතික තක්සේරුව
    - 2022/2023 වසරේ 8 ශ්‍රේණිය සම්පූර්ණ කරන සිසුන්ගේ ගණිතය සහ ඉංග්‍රීසි ඉගෙනුම් ප්‍රතිඵල සාක්ෂාත් කර ගැනීමේ ජාතික තක්සේරුව

    ඉහත අධ්‍යයනයන් අවසන් කර අධ්‍යයන දෙකෙහි අවසන් කෙටුම්පත් වාර්තා අධ්‍යාපන අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරන ලදී. අධ්‍යයනවල සොයාගැනීම් ඔක්තෝබර් 20 වැනි දින ලෝක බැංකුවට සහ අමාත්‍යාංශ නිලධාරීන්ට අධ්‍යාපන අමාත්‍යාංශයේදී සහ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් වෙත 2023 දෙසැම්බර් 18 වැනි දින Zoom හරහා ඉදිරිපත් කරන ලදී.

- ඔස්ලෝ විශ්වවිද්‍යාලයේ හිටපු බාහිර මහාචාර්ය බ්‍රිජිට් බ්‍රොක් උට්න් විසින් සංවර්ධනය වෙමින් පවතින රටවල අධ්‍යාපනය සම්බන්ධ ගැටළු පිළිබඳව අධ්‍යයන කාර්ය මණ්ඩලය සහ අධ්‍යාපන පීඨයේ පශ්චාත් උපාධි සිසුන් සමඟ සංවාදයක් පවත්වන ලදී. NEREC විසින් සංවිධානය කරන ලද මෙම විවෘත සාකච්ඡාව 2023 **ජූනි** 23 වන දින අධ්‍යාපන පීඨයේදී පැවැත්විණි.
- ශ්‍රී ලංකා අධ්‍යාපන සහරාවේ (SLJE) 2 වන වෙළුමේ, 1 හා 2 කලාප දැනට ප්‍රකාශනය සඳහා සැකසෙමින් පවතී.

අ. අධ්‍යයන කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර :

මහාචාර්ය	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය	කථිකාචාර්ය	එකතුව
01	00	00	01

ආ. අනධ්‍යයන කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර :

ජ්‍යෙෂ්ඨතම	ජ්‍යෙෂ්ඨ	කනිෂ්ඨ	සුලු සේවක	කොන්ත්‍රාත්	එකතුව
00	00	00	01	01	02

ඇ. පර්යේෂණ, නවෝත්පාදන හා ප්‍රකාශන පිළිබඳ තොරතුරු

විෂයය	ප්‍රකාශයට පත්කළ	වාණිජකරණය කළ	ඉදිරිපත් කළ
	2023	**2023**	**2023**
අ. පර්යේෂණ සංඛ්‍යාව	02	-	-
ආ. නවෝත්පාදන සංඛ්‍යාව		-	-
ඇ. වාරසහරා ලිපි සංඛ්‍යාව		-	-
ඈ. ග්‍රන්ථ සංඛ්‍යාව	02	-	-
ඉ. ලිපි සංඛ්‍යාව		-	-
ඊ. වෙනත්		-	-
එකතුව	**04**	-	-

2.19 කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය (SDC)

කොළඹ විශ්වවිද්‍යාලයීය කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය (SDC) එහි ස්ථාපනයේ සිට සාර්ථක විසි පස්වන වසරද සම්පූර්ණ කර ඇත. කොළඹ විශ්වවිද්‍යාලයීය කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය ශ්‍රී ලාංකේය ජාතික විශ්වවිද්‍යාල පද්ධතිය තුළ ප්‍රථම කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය වශයෙන් 1997 ආරම්භ වුයේ ශ්‍රී ලාංකේය විශ්වවිද්‍යාලයන්හි සැලසුම්සහගතව කාර්ය මණ්ඩල සංවර්ධනය කිරීමට ඇති අවශ්‍යතාව පදනම් කර ගනිමිනි.

කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානයෙහි මෙහෙවර වන්නේ " සාමාන්‍යයෙන් ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ සහ විශේෂයෙන් කොළඹ විශ්වවිද්‍යාලය තුළ කාර්ය මණ්ඩලය සහ සිසුන් විසින් සිදු කරනු ලබන අධ්‍යයන කටයුතුවල ගුණාත්මක භාවය ඉහළ නැංවීමයි". මෙම පරමාර්ථය සාක්ෂාත් කර ගැනීම සඳහා, විශ්ව විද්‍යාල ඉගැන්වීම/ඉගෙනීම වඩාත් ඵලදායී, වඩාත් අදාළ, ශිෂ්‍ය නැඹුරුවක් සහිත සහ ජාත්‍යන්තරව උසස් ප්‍රමිතියෙන් යුක්ත කිරීමට කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය පහසුකම් සපයයි. අධ්‍යයන හා අධ්‍යයන කාර්ය මණ්ඩලය ඇතුළුව විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩලයේ සියලුම සාමාජිකයන් අතර වඩාත් ඵලදායී හා කාර්යක්ෂම කාර්ය සාධනයක් සඳහා අවශ්‍ය කුසලතා සහ නිපුණතා වර්ධනය කිරීමට ද එය පහසුකම් සපයයි. පවතින මූල්‍ය හා මානව සම්පත් සීමාවන් තුළ විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩලයේ වෘත්තීය සංවර්ධනයට සහාය වන අදාළ පුහුණු වැඩසටහන් සහ වැඩමුළු කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය විසින් සිදු කරයි.

කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානයේ අරමුණු සහ අපේක්ෂිත ක්‍රියාකාරකම් [1]

1. විෂයමාලා සංශෝධනය සහ සැකසීම, ඉගැන්වීම සහ පර්යේෂණය යනාදී අධ්‍යයන කාර්ය සඵල කරගැනීම සඳහා අවශ්‍ය විවිධ හැකියා ප්‍රවර්ධනය සඳහා අධ්‍යයන කාර්ය මණ්ඩලයට සහයෝගය සහ උපකාර සැපයීම.

2. විවිධ අධ්‍යයන සහයක සේවා සහ කාර්යයන් සඳහා අවශ්‍ය හැකියා ප්‍රවර්ධනය පිණිස අනධ්‍යයන කාර්ය මණ්ඩලයට උදව් උපකාර සැපයීම.

3. අධ්‍යයන පරිපාලන තනතුරු දරන අධ්‍යයන කාර්ය මණ්ඩලයට (අංශාධිනිවරු, පීඨාධිපතිවරු, අධ්‍යක්ෂවරු , මණ්ඩපාධිපතිවරුන්) සහය සහ උදව් සැපයීම හෝ එම තනතුරු හෙබවීම සඳහා අවශ්‍ය ශක්‍යතා සහ නිපුනතා අත්පත්කරගැනීමට උනන්දු කරවීම.

4. අධ්‍යයනාංශ, වෙනත් අධ්‍යයන ඒකක, පාඨමාලා, වැඩසටහන් සහ පීඨවල සිටින පුද්ගලයන් සහ කණ්ඩායම්වලට ඉගැන්වීම පුනරීක්ෂණය සහ ඇගයීම සඳහා සහයවීම
5. විශ්වවිද්‍යාල ඉගැන්වීම සහ ඉගෙනීම ප්‍රවර්ධනය ඉලක්ක කරගත් ව්‍යාපෘතිවල නිරත විශ්වවිද්‍යාලය තුළ සිටින පුද්ගලයන් සහ කණ්ඩායම් සමග ඒකාබද්ධ වීම.

6. ඉල්ලීම මත ගුරුවරුන්ට ශිෂ්‍ය ප්‍රතිපෝෂණ සේවා ලබාදීම

7. ඉගැන්වීම සහ ඉගෙනීමට අදාලව විශ්වවිද්‍යාලය තුල පවතින ප්‍රතිපත්ති සහ සාමාන්‍ය ක්‍රියාවලීන්ට දායක වීම.

8. උසස් අධ්‍යාපන ක්ෂේත්‍රය හා සම්බන්ධව පුළුල් පර්යේෂණ සහ ශාස්ත්‍රීය ක්ෂේත්‍රයට දායක වීම
9. කොළඹ විශ්වවිද්‍යාලයේත් අනෙක් උසස් අධ්‍යාපන ආයතනවලත් භාවිතය සඳහා විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩල සංවර්ධනය පිළිබඳ පොදුවේත්, ඉගැන්වීම සහ ඉගෙනීම පිළිබඳව සුවිශේෂ වශයෙනුත් ප්‍රකාශන පළ කිරීම

10. සමාන අරමුණු ඇති දේශීය සහ විදේශීය කාර්ය මණ්ඩල සංවර්ධන සංගම් සමග සම්බන්ධතා ගොඩනගා ගැනීම.

[1] මූලාශ්‍ර: කො.වි.වි. පාලක සභා සටහන් 252/34 පි.75 . 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පණතේ 135 වගන්තිය සහ ආනුෂංගික සංශෝධන යටතේ කො.වි.වි. පාලක සභාව විසින් සකසන ලද (2010 අංක 01) දරන අ. ව්‍යවස්ථාව.

11. විශ්වවිද්‍යාලය විසින් ලබා දුන් අරමුදල් ප්‍රමාණවත් නොවන අවස්ථාවල තම ක්‍රියාකාරකම් සඳහා විශ්වවිද්‍යාල පාලක සභාවේ අනුමැතියට යටත්ව දේශීය සහ විදේශීය මූලාශ්‍රය ඇසුරින් අරමුදල් රැස් කිරීම
12. විශ්ව විද්‍යාලයට අදාළ වන විෂයයන්වල පාඨමාලා ව්‍යුහ, විෂයමාලා වෙනස්කම්, ඉගනුම් හා ඉගැන්වීම් හා පර්යේෂණ විධික්‍රම පිළිබඳ සම්පත් සහිත තොරතුරු මධ්‍යස්ථානයක් ගොඩනැගීම

වර්තමානයේ මෙම මධ්‍යස්ථානය සියලු අධ්‍යයන, පරිපාලන හා වෙනත් සහකාර කාර්ය මණ්ඩල ඉලක්ක කර ගනිමින් විශ්වවිද්‍යාල අධ්‍යාපනය සංවර්ධනය උදෙසා මනාව කේන්ද්‍රගතව පුහුණු වැඩසටහන්වල නිරත වේ.

අධ්‍යයන කාර්ය මණ්ඩලය ඉලක්ක කරගත් ප්‍රධානතම පාඨමාලාව වන්නේ ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසම සහ බ්‍රිතාන්‍යයේ කාර්ය මණ්ඩල සහ අධ්‍යාපන සංවර්ධන සංගමය විසින් පිළිගත් උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයේ ඉගැන්වීම පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාවයි (CTHE).

මීට අමතරව, SDC විසින් අධ්‍යයන සහ අනධ්‍යයන යන කාර්ය මණ්ඩල දෙඅංශයෙන්ම වැඩමුළු කිහිපයක් පවත්වන ලදී.

කොළඹ විශ්වවිද්‍යාලයේ කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය කොළඹ විශ්වවිද්‍යාලය පමණක් නොව ශ්‍රී ලංකාවේ අනෙකුත් විශ්වවිද්‍යාල/ආයතනවල අධ්‍යයන හා අධ්‍යයන කාර්ය මණ්ඩලයේ ධාරිතාව ඉහළ නැංවීමට සහ වැඩිදියුණු කිරීමට සිය සුවිශේෂී දායකත්වය ලබා දෙයි. 2023 වර්ෂය තුළ කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානයට විවිධ මාණ්ඩලික කාණ්ඩ යටතේ සහ ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල කිහිපයක කාර්ය මණ්ඩල සාමාජිකයින් 680 කට අධික සංඛ්‍යාවක් සාර්ථකව පුහුණු කළ හැකි වූ අතර, පෞද්ගලික විශ්ව විද්‍යාලවල අයදුම්කරුවෝ ද රාජ්‍ය විශ්ව විද්‍යාල කාර්ය මණ්ඩලය සමඟ පහසුවෙන් මිශ්‍ර වූහ.

කොළඹ විශ්වවිද්‍යාලයේ පිහිටි කාර්යාල සංකීර්ණයේ කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය ක්‍රියාත්මක වෙයි.

2023 දී මධ්‍යස්ථානය විසින් සිදුකළ ක්‍රියාකාරකම්

2023 දී කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය විසින් පිරිනමන ලදපාඨමාලා සහ පවත්වන ලද වැඩමුළු ලැයිස්තුව පහත දැක්වේ. :

#	වැඩමුළුව/පාඨමාලාව	දිනය / දින	සම්පත් පුද්ගලයා / පුද්ගලයන්
1.	මානසික යහපැවැත්ම පිළිබඳ වැඩමුළු 1.ආතතිය සහ එය කළමනාකරණය 2. ඔරොත්තු දෙන මනසේ බලය 3.දැඩි පුරුදු වෙනස් කිරීම	08.03.2023 14.03.2023 21.03.2023	මහාචාර්ය ප්‍රියංජලී ද සොයිසා, මනෝ වෛද්‍ය අ.ඇ, වෛද්‍ය පීඨය
2.	වැඩ සහායක කාර්ය මණ්ඩලය සඳහා එක්දින අභිප්‍රේරණ වැඩමුළුව	24.03.2023	සනත් ගමගේ මහතා, අභිප්‍රේරණ දේශක Academy of Colombo Adventure
3	උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයේ ඉගැන්වීම පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව (CTHE - 26 කණ්ඩායම)	03.04.2023 to 27.11.2023	1මහාචාර්ය මධුක උඩුනුවර, අධ්‍යක්ෂ, SDC 2. ආචාර්ය සුලෝචනා නෙරංජනී, මානව ශාස්ත්‍ර අධ්‍යාපන අ.ඇ., අධ්‍යාපන පීඨය 3. ආචාර්ය ඩී වී කේ පී සෙනෙවිරත්න, විද්‍යා හා තාක්ෂණ අධ්‍යාපන අ.ඇ., අධ්‍යාපන පීඨය 4. මහාචාර්ය ඒ. එස්. අදිකාරම්, මානව සම්පත් කළමනාකරණ අ.ඇ., කළමනාකරණ සහ මූල්‍ය පීඨය 5. මහාචාර්ය පණ්ඩුක කරුණානායක, සායනික වෛද්‍ය අ.ඇ., වෛද්‍ය පීඨය 6. ජ්‍යෙෂ්ඨ මහාචාර්ය දීප්ති වික්‍රමසිංහ,

			සත්ත්ව හා පාරිසරික විද්‍යා අධ්‍යයන අංශය, විද්‍යා පීඨය 7. මහාචාර්ය වමරි හෙට්ටිආරච්චි රසායන විද්‍යා අධ්‍යයන අංශය, විද්‍යා පීඨය 8. ආචාර්ය අසංක ජයවර්ධන ප්‍රසව හා නාරිවේද අ.අ., වෛද්‍ය පීඨය 9. මහාචාර්ය කෝකිලා කෝනසිංහ රාජ්‍ය සහ ජාත්‍යන්තර නීති අ.අ., නීති පීඨය 10. මහාචාර්ය යමුනා සිරිවර්ධන පරපෝෂිත විද්‍යා අ.අ., වෛද්‍ය පීඨය 11ආචාර්ය එස් රාජදුරෙයි පාඨමාලා සමායෝජක කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය
4	නායකත්වයේ විශිෂ්ටත්වය සහ මෘදු කුසලතා පිළිබඳ වැඩමුළුව	07.06.2023	1. මේජර් ජෙනරාල් උදය පෙරේරා, සීමාසහිත බ්‍රැන්ඩික්ස් ලංකා සමාගමේ සමූහ පරිපාලන ප්‍රධානී 2. මහාචාර්ය මයිකල් පීටර්සන්, ඕක්ලන්ඩ් විශ්වවිද්‍යාලය, නවසීලන්තය
5.	කළමනාකරණ සහකාර කාර්ය මණ්ඩලය සඳහා එක්දින අභිප්‍රේරණ වැඩමුළුව - කණ්ඩායම 01	18.07.2023	1. වෛද්‍ය චමින්ද වීරසිරිවර්ධන, 2.OBT කණ්ඩායම, Academy of Colombo Adventure.
6.	කළමනාකරණ සහකාර කාර්ය මණ්ඩලය සඳහා එක්දින අභිප්‍රේරණ වැඩමුළුව - කණ්ඩායම 02	22.08.2023	1. වෛද්‍ය චමින්ද වීරසිරිවර්ධන, 2.OBT කණ්ඩායම, Academy of Colombo Adventure

කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානයේ කළමණාකරන තොරතුරු දත්ත සමුදාය - විවිප්‍රකෝ පීඨ සමාලෝචනයේ භාවිතාව

කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය විසින් එහි පුහුණු ක්‍රියාකාරකම් සහ පුහුණුවූ කාර්ය මණ්ඩලය පිළිබඳ වල දත්ත සමුදායක් පවත්වාගෙන යයි. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විධිමත් වැඩසටහන් විමර්ශන හරහා විශ්වවිද්‍යාල , අධ්‍යයන අංශ හා පීඨ වලින් බලාපොරොත්තුවන ගුණාත්මක ප්‍රමිතීන් සපුරාලීමට මෙම දත්ත පදනම් ඉතා වටිනා බව සොයාගෙන තිබේ. ඒ අනුව කොළඹ විශ්වවිද්‍යාලයේ පීඨ හා ඔවුන්ගේ අධ්‍යයන අංශවලට ඔවුන්ගේ වැඩසටහන් සමාලෝචන සඳහා සූදානම් වීමට කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය තොරතුරු සපයන ලදී. වැඩසටහන් සමාලෝචනයේ 7.9 වන නිර්ණායකය වන ‘‘සිසුන් ඇගයීමට ලක් කරන කාර්ය මණ්ඩලය ඔවුන්ගේ කාර්යභාරය හා වගකීම් ඉටු කිරීමට ශක්‍යතා සහිත හා අවශ්‍යතා පිළිබඳ ගැටුම් රහිත පිරිසක්වන බවට පීඨය/ ආයතනය වගබලා ගනියි’’ යන්න සැපිරීම පිළිබඳ සාක්ෂි ලෙස මෙම දත්ත අත්‍යවශ්‍ය අංගයක් වේ.

පර්යේෂණ, නවෝත්පාදන හා ප්‍රකාශන පිළිබඳ තොරතුරු

විෂයය	**සහභාගී වූ**	**සම්පූර්ණ කළ**
	2023	**2023**
සහතිකපත්‍ර පාඨමාලා සංඛ්‍යාව		
උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයේ ඉගැන්වීම පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව (CTHE26)	38	කෙරෙමින් පවතී.
මානසික යහපැවැත්ම පිළිබඳ වැඩමුළු– 01 දින- ආතතිය සහ එය කළමනාකරණය	7	7

02 දින- ඔරොත්තු දෙන මනසේ බලය	9	9
03 දින - දැඩි පුරුදු වෙනස් කිරීම	9	9
නායකත්වයේ විශිෂ්ටත්වය සහ මෘදු කුසලතා පිළිබඳ වැඩමුළුව	35	35
එකතුව	**98**	**60**

2.20 සමාජ ප්‍රතිපත්ති විශ්ලේෂණ සහ පර්යේෂණ මධ්‍යස්ථානය (SPARC)

කොළඹ විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍ර පීඨයේ සමාජ ප්‍රතිපත්ති විශ්ලේෂණ හා පර්යේෂණ මධ්‍යස්ථානය (SPARC) ශ්‍රී ලංකාවේ සමාජ සංවර්ධනයේ තීරණාත්මක ක්ෂේත්‍රයන් පිළිබඳ පර්යේෂණ, පුහුණුව, ප්‍රතිපත්ති විශ්ලේෂණය සහ උපදේශනය ඒකාබද්ධ කිරීම සඳහා ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල පද්ධතිය තුළ කේන්ද්‍රීය ස්ථානයක් සපයයි. සමාජ ප්‍රතිපත්තියට අදාළ ගැටළු සම්බන්ධයෙන් කටයුතු කරන රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන ඇතුළුව විශ්වවිද්‍යාලයේ විවිධ ශික්ෂණ පසුබිම්වල සිටින විශ්වවිද්‍යාල විද්වතුන්ට මෙන්ම විශ්වවිද්‍යාල පද්ධතියෙන් පිටත ආයතන අතර සහයෝගීතාවයට මෙම මධ්‍යස්ථානය පහසුකම් සපයයි.

මෙම මධ්‍යස්ථානය පිහිටුවීම සඳහා කොළඹ විශ්ව විද්‍යාලයේ 273 වන සභාතන සභා රැස්වීමේදී අනුමැතිය ලබා දුන් අතර, ඉන් අනතුරුව 2005 ජුනි 10 වෙනිදා කොළඹ ශ්‍රී ලංකා පදනම් ආයතනයේදී (SLFI) නිල වශයෙන් ආරම්භ කෙරිණි.

අරමුණු

- සමාජ සංවර්ධනය හා සම්බන්ධ ගැටළු පිළිබඳව ශ්‍රී ලංකා විශ්ව විද්‍යාල තුළ ස්වායත්ත පර්යේෂණ සඳහා පහසුකම් සැලසීම
- විවිධ පසුබිම්වල විද්වතුන් අතර අන්තර්ශික්ෂණ හුවමාරුව සඳහා පහසුකම් සැලසීම
- පුහුණුව ලබා දීම සහ සමාජ විද්‍යා අධ්‍යාපනයේ ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම
- දරිද්‍රතාවය අවම කිරීම සහ සමාජ ප්‍රතිපත්ති සම්පාදනය පිළිබඳ විශ්ව විද්‍යාල තුළ දේශීය විශේෂඥතාව ශක්තිමත් කිරීම
- ලංකාවේ සමාජ ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ සඳහා අවස්ථා හඳුනාගැනීම

මෙම මධ්‍යස්ථානය සිය පර්යේෂණ සිදු කරනු ලබන්නේ තෝරාගත් නාභිගත ක්ෂේත්‍ර ගණනාවකට ය. එමඟින් විශ්ව විද්‍යාලයෙන් ප්‍රමාණවත් විශේෂඥ දැනුම හා දැනුම ලබා ගත හැකිය. මෙම නාභීය ක්ෂේත්‍ර වරින් වර සමාලෝචනය කරනු ලබන්නේ විශ්වවිද්‍යාලය තුළ ලබා ඇති නව අත්දැකීම් හා විශේෂඥ අවධානය අවශ්‍ය වන නැගී එන තීරණාත්මක කරුණු අනුව ය.

2023 දී මධ්‍යස්ථානය විසින් සිදුකළ ක්‍රියාකාරකම්

නිවර්තන කෘෂි පරිසර පද්ධතිවල ඔරොත්තු දීමේ හැකියාව ගොඩ නැගීම (BRITAE) සහ දේශගුණික අනුවර්තනය සඳහා ගොඩනඟන ලද පරිසර ඉගෙනුම් (BEACON) යන ව්‍යාපෘතිවල පර්යේෂණ ක්‍රියාකාරකම් සිදු කරන ලදී.

අ. සම්පත් සහ සිසුන් පිළිබඳ විස්තර

මධ්‍යස්ථානය	පාඨමාලාව	මුළු ශිෂ්‍ය සංඛ්‍යාව	මුළු අධ්‍යයන කාර්ය මණ්ඩලය	මුළු අනධ්‍යයන කාර්ය මණ්ඩලය
		2023	**2023**	**2023**
සමාජ ප්‍රතිපත්ති විශ්ලේෂණ හා පර්යේෂණ මධ්‍යස්ථානය	අ/ නො	අ/ නො	2	අ/ නො
එකතුව	**-**	**-**	**2**	**-**

ආ. පර්යේෂණ, නවෝත්පාදන හා ප්‍රකාශන පිළිබඳ තොරතුරු:

විෂයය	ප්‍රකාශයට පත් නොකළ	ප්‍රකාශයට පත්කළ	ඉදිරිපත් කළ
	2023	**2023**	**2023**
අ. පර්යේෂණ ව්‍යාපෘති සංඛ්‍යාව			04
ආ. නවෝත්පාදන සංඛ්‍යාව			
ඇ. වාරසඟරා ලිපි සංඛ්‍යාව		01	
ඈ. ලිපි සංඛ්‍යාව			
ඊ. ග්‍රන්ථ ගණන (පරිච්ඡේද)		03	

ඉ. වෙනත්	05		
එකතුව	**05**	**04**	**04**

ඇ. පුනරාවර්තන වියදම් පිළිබඳ විස්තර :

විෂයය	**2023 (රු.)**
අ. පෞද්ගලික වැටුප් හා වේතන	-
ආ. ප්‍රවාහන	-
ඇ.සැපයුම්	-
ඈ.නඩත්තු	177,325.72
ඉ. කොන්ත්‍රාත් සේවා	-
ඊ.වෙනත්	-
එකතුව	**177,325.72**

ඇ. ව්‍යාපෘති පිළිබඳ තොරතුරු (දේශීය/විදේශීය ආධාර සහිත) :

විස්තර	**ණය / ආධාර**	**අනුග්‍රාහක ආයතනය**	**TCE (රු.)**
නිවර්තන කෘෂි පරිසර පද්ධතිවල ඔරොත්තු දීමේ හැකියාව ගොඩ නැගීම (BRITAE)	ආධාර	Erasmus + යුරෝපා සංගමය	15,736,316.76
දේශගුණික අනුවර්තනය සඳහා ගොඩනහන ලද පරිසර ඉගෙනුම් (BEACON 2020-2023)	ආධාර	Erasmus + යුරෝපා සංගමය	8,464,896.72

*TCE: ස්පෘශ්‍ය පොදු කොටස්

ඉ. ව්‍යාපෘති වියදම් පිළිබඳ විස්තර (දේශීය/විදේශීය අරමුදල් සහිත)

නම	**TCE (රු.)**	**2023 වැය (රු.)**	**31.12.2023 දිනට සමුච්චිත වැය**	**භෞතික ප්‍රගති ප්‍රතිශතය**
නිවර්තන කෘෂි පරිසර පද්ධතිවල ඔරොත්තු දීමේ හැකියාව ගොඩ නැගීම (BRITAE)	15,736,316.76	5,519,298.27	13,900,807.00	90%
දේශගුණික අනුවර්තනය සඳහා ගොඩනහන ලද පරිසර ඉගෙනුම් (BEACON 2020-2023)	8,464,896.72	1,388,141.80	3,759,589.00	98%

*TCE: ස්පෘශ්‍ය පොදු කොටස්

2.21 ජාත්‍යන්තර කාර්යාලය (IOUC)

දැක්ම

උසස් තත්ත්වයේ ඉගැන්වීම් හා පර්යේෂණ තුළින් දැනුම නිෂ්පාදනයේ ගෝලීය හවුල්කරුවකු බවට පත්වීම සඳහා අන්තර්ජාතික පිළිගත් ශාස්ත්‍රීය විශිෂ්ටතා මධ්‍යස්ථාන සමඟ උපාය මාර්ගික සබඳතා වර්ධනය කර ගැනීමට කොළඹ විශ්වවිද්‍යාලය සතුව දැඩි කැපවීමක් ඇත. 2008 දී පිහිටුවන ලද කොළඹ විශ්වවිද්‍යාලයේ අන්තර්ජාතික කාර්යාලය ප්‍රසිද්ධ විශ්ව විද්‍යාල සමඟ අන්තර්ජාතික සහයෝගිතාවයන්, අධ්‍යාපන මධ්‍යස්ථාන, අධ්‍යාපනික වැඩසටහන්, වෘත්තීය ශාස්ත්‍රීය සංගම් සහ ශිෂ්‍ය හුවමාරු වැඩසටහන්, කාර්ය මණ්ඩල සංචලන වැඩසටහන්, සම්මන්ත්‍රණ, වැඩමුළු සහ ඒකාබද්ධ පර්යේෂණ තුළින් එවැනි සම්බන්ධතා වර්ධනය කර ගැනීමට හා වැඩිදියුණු කිරීමට උත්සාහ කරයි.

මෙහෙවර

කොළඹ විශ්වවිද්‍යාලයීය ජාත්‍යන්තර සබඳතා වර්ධනය කිරීම සඳහා පහසුකම් සැපයීම, කොළඹ විශ්වවිද්‍යාලය පිළිබඳ තොරතුරු යථා කාලයේ දී පැමිණෙන ශිෂ්‍යයන් හට ලබා දීම සහ ඔවුන් ආචාර්ය මණ්ඩලය සමඟ සම්බන්ධ කිරීම, විශ්වවිද්‍යාලයට පැමිණෙන ජාත්‍යන්තර සිසුන් සහ කාර්ය මණ්ඩල සාමාජිකයන් මෙරට වාසය කරන කාල සීමාව තුළ ඔවුන්හට උපකාර කිරීම සුසාධ්‍යකරණය මෙහි මෙහෙවර වේ.

2008 වසරේ දී ජාත්‍යන්තර කාර්යාලය ආරම්භ කළ දා පටන් ම කොළඹ විශ්වවිද්‍යාලයේ ජාත්‍යන්තර සම්බන්ධතා ප්‍රවර්ධනයෙහි ලා එය මහෝපකාරී විය. ව්‍යාප්තව පැවති කොවිඩ් -19 වසංගතය හේතුවෙන් බොහෝ ක්‍රියාකාරකම් කල් තැබීමට සිදු වුවද එය සතුව වර්තමානයේ දී සාර්ථක ශිෂ්‍ය හුවමාරු හා කාර්යමණ්ඩල සංචරන වැඩසටහන් බොහොමයක් ද පවතී.

කොළඹ විශ්වවිද්‍යාලයීය ජාත්‍යන්තර කාර්යාලයේ අරමුණු:

1. විදේශ අධ්‍යාපනය ලැබීමේ නව වැඩසටහන් ස්ථාපනය කිරීම හා පවත්නා සහයෝගිතාවන් වර්ධනය
2. කොළඹ විශ්වවිද්‍යාලය හා සහයෝගී විශ්වවිද්‍යාල/අධ්‍යයනායතන අතර සහයෝගිතා පර්යේෂණ හා නව්‍යජනන සඳහා පර්යේෂණ ප්‍රවර්ධනය.
3. පශ්චාත් උපාධි සිසුන් සඳහා ඊ- ඉගෙනුම් හා දුරස්ථ ඉගෙනීම් වැඩසටහන් සවිමත් කිරීම හා තොරතුරු තාක්ෂණ සංවර්ධනය
4. සම්බද්ධ විශ්වවිද්‍යාල සමග ඒකාබද්ධ සම්මන්ත්‍රණ, සමුළු හා වැඩමුළු සංවිධානය
5. හවුල්කාර ආයතන සමඟ උපාධි අපේක්ෂකයින් සහ පශ්චාත් උපාධි සිසුන් සඳහා නව පර්යේෂණ අවස්ථා ඇති කිරීම සහ පවතින පර්යේෂණ ජාල ශක්තිමත් කිරීම.

ඉහත කී අරමුණු අනුව යමින් 2023 වසරේ දී ජාත්‍යන්තර ඒකකය ක්‍රියාකාරකම් රැසකට සහභාගී වූ අතර විදේශයන්හි විශ්වවිද්‍යාල හා අධ්‍යයනායතන සමග නව සබඳතා ගොඩ නැගීය.

2023 දී මධ්‍යස්ථානය විසින් සිදුකළ ක්‍රියාකාරකම්

ජාත්‍යන්තර විශ්වවිද්‍යාල හා පර්යේෂණ ආයතන සමඟ සහයෝගිතා

1. අවබෝධතා ගිවිසුම – යූරල් ෆෙඩරල් විශ්වවිද්‍යාලය, රුසියාව
2. අවබෝධතා ගිවිසුම - ඉන්දියානු තාක්ෂණ ආයතනය, මදුරාසිය
3. අභිප්‍රාය ලිපිය - බීජිං උද්භිද විද්‍යා විශ්වවිද්‍යාලය
4. ව්‍යාපෘති ගිවිසුම - මානව හිමිකම් සහ ප්‍රජාතන්ත්‍රකරණය පිළිබඳ ආසියා පැසිෆික් පශ්චාත් උපාධිය (APMA)
5. ව්‍යාපෘති ගිවිසුම – UNFPA (ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය, ලිංගික සහ ප්‍රජනක සෞඛ්‍ය පර්යේෂණ සහ මැදිහත්වීම් සඳහා දකුණු ආසියානු විශිෂ්ටතා මධ්‍යස්ථානය පිහිටුවීම)
6. ගිවිසුම- Erasmus + වැඩසටහන ජස්ටස් ලීබිග් විශ්වවිද්‍යාලය

2023/2024 සඳහා ඇති කරගත හැකි සහයෝගීතා

1. AIT (ආසියානු තාක්ෂණික ආයතනය), තායිලන්තය
2. ඇන්ඩොලූ විශ්ව විද්‍යාලය, තුර්කිය
3. පෝලන්තයේ වෝර්සෝ විශ්ව විද්‍යාලය සමඟ රැස්වීම
4. එක්සත් රාජධානියේ ඩන්ඩී විශ්ව විද්‍යාලය සමඟ රැස්වීම
5. ක්වීන්ස්ලන්ත තාක්ෂණ විශ්වවිද්‍යාලය සමඟ පර්යේෂණ සහයෝගිතාව
6. කොළඹ විශ්වවිද්‍යාලයේ උපකුලපතිවරයා සහභාගී වූ හොංකොංහිදී පැවති AUA විධායක රැස්වීම

2023 දී සිදු කරන ලද ජාත්‍යන්තර සහයෝගීතා සහ ක්‍රියාකාරකම්

1. JICA මූලාසන වැඩසටහන 2022/23 සම්පූර්ණ කිරීම
2. ජාත්‍යන්තර ශිෂ්‍ය සංගමය 2023 මැයි 16 වන දින පිහිටුවන ලදී.
3. ජාත්‍යන්තර ශිෂ්‍ය දිනය 2023 අගෝස්තු 8 වන දින පවත්වන ලදී.
4. ජයිකා මූලාසන වැඩසටහනේ සමාරම්භක උත්සවය 2023/24
5. JICA මූලාසන වැඩසටහන 2023/24 යටතේ Dockyard PLC වෙත ක්ෂේත්‍ර සංචාරය
6. චීන තානාපති ශිෂ්‍යත්ව වැඩසටහන 2023 සහ සංස්කෘතික උත්සවය

- **මෙම වාර්තාවට අදාළ වෙනත් විස්තර/ කාර්ය සාධනයක්**

ශිෂ්‍යත්ව

පහත දැක්වෙන උපාධි අපේක්ෂකයින් 17 දෙනා මිට්සුබිෂි යූඑෆ්ජේ ශිෂ්‍යත්ව 2023 සඳහා නම් කරන ලදී.

1. ඩී ඒ එදිරිවීර
2. බී වයි ගුණවර්ධන
3. එම් අයි එෆ් හික්මා
4. ජී ඒ එච් නදී ශාක්‍යා
5. ටී ටී වික්‍රමනායක
6. ඩබ් පී එස් තරුනිකා
7. කේ කේ ලක්ෂානි
8. පී පතීරතන්
9. කේ ඒ සී එම් පෙරේරා
10. එස් එන් නවියාන් නයීර්
11. සුජාජිනි රවිචන්ද්‍රන්
12. සිවතාසන් තර්සිකන්
13. ඒ කේ කරුණාරත්න
14. කේ ජී කොළඹගේ
15. එස් එම් ඩී එම් ශියංග පෙරේරා
16. ඩී එස් කේ ඇතුලත්මුදලි
17. කේ පී එස් එස් ධර්මදාස

7. <u>ආරාධිත දේශන, වැඩමුළු, සම්මුඛ සාකච්ඡා, පැමිණීම් සහ වෙනත් ක්‍රියාකාරකම් -2023:</u>

1. වැඩමුළු

ප්‍රදාන යෝජනා ලිවීමේ වැඩමුළුව - මහාචාර්ය මාටින් පර්සන්

2. පැමිණීම්

1. 24.08.2023 දින ශ්‍රී ලංකාවේ එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ තානාපතිතුමාගේ සංචාරය.
2. 2023.02.20 දින කොළඹ රුසියානු මධ්‍යස්ථානයේ ප්‍රධාන විධායක නිලධාරී බුද්ධප්‍රිය සේනානායක මහතාගේ පැමිණීම
3. 06.02.2023 දින භූතානයේ රාජකීය රජයේ අධ්‍යාපන හා නිපුණතා සංවර්ධන අමාත්‍ය, ගරු ජායි බීර් රායි සහ තානාපති රින්චෙන් ක්වෙන්ටිසිල් මහතා ගේ සංචාරය
4. මාලදිවයින් ජනරජයේ ඉහළ පෙළේ නියෝජිත පිරිසකගේ සංචාරය

2.22 කොන්ෆියුසියස් ආයතනය

මෙම ආයතනයේ ප්‍රධාන පරමාර්ථය වන්නේ චීන භාෂාව සහ සංස්කෘතිය පිළිබඳ දැනුම හා ප්‍රවීණතාවය ලබා ගැනීමට පහසුකම් සැලසීමයි. මීට අමතරව, මෙම ආයතනය මෙම රටවල් දෙකට සම්බන්ධ වෙනත් ආශ්‍රිත අධ්‍යයන ක්ෂේත්‍ර ගණනාවක පර්යේෂණවල නිරත වීමට කැමති විද්වතුන්ට ද අවස්ථා ලබා දෙයි. කොන්ෆියුසියස්තුමා තමා නවෝත්පාදකයෙකු නොව, පැරණි චීන සම්ප්‍රදායේ සහ සදාචාරයේ සම්ප්‍රේෂකයෙකු පමණක් බව ප්‍රකාශ කිරීමට තරම් නිහතමානී වුවද, කෘතවේදී චීන ජනතාව ඔහු එහි භාෂාව, දර්ශනය, සදාචාරය, අධ්‍යාපනය, දේශපාලනය සහ යනාදියෙන් යුතු සමස්ත චීන සංස්කෘතියේ මූලයට සේවය සැලසූ මහා ඍන්තුවරයෙකු වැනි ගුරුවරයෙකු ලෙස ඉතා ඉහළින් සලකති. සැබවින්ම, චීන ජනතාව වෙතින් ඔහුට පිදෙන්නේ සමස්ත චීන ප්‍රායෝගික සංස්කෘතික ජීවිතයේ සාරාංශය ලෙස සලකා කෙරෙන ඉතා ගෞරවාන්විත ආකල්පයකි.

දැක්ම

දැනුම, අධ්‍යාපනය, පර්යේෂණ සහ ව්‍යවසායකත්වය අතර සහයෝගීතාව ගොඩනඟමින් කලාපීය සහ ජාත්‍යන්තර කීර්තියේ විශිෂ්ටත්වයේ මධ්‍යස්ථානයක් වීමට ප්‍රයත්න දැරීම.

මෙහෙවර

ජාතික සංවර්ධනයට දායක වන ස්වාධීන චින්තනයෙන් හා විශ්ලේෂණාත්මක කුසලතාවයෙන් නව්‍යකරණය වූ උසස් ප්‍රමිතීන් සහ සමාජ වගකීම් සහිත මානව දක්ෂතා බිහි කිරීමට කැපවීමෙන් යුතු ඉගැන්වීමේ සහ පර්යේෂණවල විශිෂ්ටත්වයේ මධ්‍යස්ථානයක් වීම.

අරමුණු

පහත සඳහන් නිශ්චිත අරමුණු සාක්ෂාත් කර ගැනීමට ආයතනය පරිශ්‍රම දරයි:

- කොළඹ විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍ර පීඨය යටතේ සියලුම පහසුකම් සහිත චීන භාෂාව සහ සංස්කෘතිය ඉගෙනීම සඳහා කොන්ෆියුසියස් ආයතනයක් පිහිටුවීම.

- අනෙකුත් පිළිගත් ආයතන විසින් ඒවායේ ගුණාත්මක භාවය සහ ප්‍රමිතිය අනුව ක්‍රියාත්මක කරන අනෙකුත් සමාන වැඩසටහන් හා සමගාමීව කොළඹ විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍ර පීඨය යටතේ චීන භාෂාව සහ සංස්කෘතිය ඉගෙනීමට ඇති උනන්දුව දිරිමත් කිරීම.
- කොළඹ විශ්වවිද්‍යාලය තුළ සිටින සිසුන්ට මෙන්ම චීන භාෂාව සහ සංස්කෘතිය පිළිබඳ ප්‍රවීණතාවය සහ කුසලතා ලබා ගැනීමට අපේක්ෂා කරන විෂය පිළිබඳව උනන්දුවක් දක්වන අනෙකුත් සියලුම සහභාගිවන්නන් සඳහා විශිෂ්ට ඉගෙනුම් අවස්ථා ලබා දීම.
- රජය විසින් සිදු කරනු ලබන පශ්චාත් ගැටුම් යුගයෙහි සංවර්ධන ක්‍රියාවලියට අවශ්‍ය ප්‍රවීණතාවයෙන් හා නිපුණතාවයෙන් යුතු මානව සම්පත් නිෂ්පාදනය කිරීමෙන් ජාතික අවශ්‍යතා සඳහා දායක වීම.
- කොළඹ විශ්වවිද්‍යාලය තුළ චීනය සහ එහි සංස්කෘතිය පිළිබඳ ඉගෙනීමේ ප්‍රධාන මධ්‍යස්ථානයක් බවට පත්වීම, රැකියා වෙළෙඳපොළ අවශ්‍යතා සහ චීන භාෂාව සහ සංස්කෘතිය පිළිබඳ උසස් අධ්‍යාපන අපේක්ෂාවන් සඳහා සහාය වීම.

2.23 පුස්තකාලය

දැක්ම

ඉගෙනීම, ඉගැන්වීම හා බුද්ධිමය අභිවෘද්ධිය උදෙසා උචිත වටපිටාවක් නිර්මාණය කිරීමට ප්‍රයත්න දැරීම තුළින් දැනුම, අධ්‍යාපනය සහ පර්යේෂණ අතර ඇතිවන ඒකාබද්ධතාව ගොඩනැගීමේ විශ්වවිද්‍යාලයීය දැක්ම සාක්ෂාත් කරගැනීම සඳහා සහයෝගය දැක්වීම

මෙහෙවර

කාර්ය මණ්ඩලය, සිසුන් හා පර්යේෂකයින්ගේ දැනුම් පිපාසය සංසිඳවීම සඳහා ඉහළ ගුණාත්මක සේවාවක් ලබා දීම මගින් විශ්වවිද්‍යාලයීය මෙහෙවර ශක්තිමත් කිරීම

අ. සම්පත් පිළිබඳ විස්තර

පුස්තකාලය	ලියාපදිංචි මුළු ශිෂ්‍ය සංඛ්‍යාව	මුළු අධ්‍යයන සහ තාවකාලික කාර්ය මණ්ඩලය	පරිපාලන කාර්ය මණ්ඩලය	මුළු අධ්‍යයන සහායක කාර්ය මණ්ඩලය	මුළු අනධ්‍යයන කාර්ය මණ්ඩලය
	2023	**2023**	**2023**	**2023**	**2023**
ප්‍රධාන පුස්තකාලය	13,159	355	34	07	343
වෛද්‍ය පුස්තකාලය	1782	153	-	03	87
විද්‍යා පුස්තකාලය	3101	175	04	02	48
භෙද විද්‍යා පුස්තකාලය	557	17	01	-	13
තාක්ෂණ පුස්තකාලය	1247	01	-	-	02
දේශීය වෛද්‍ය පුස්තකාලය	1360	84	-	51	69
එකතුව	**21,206**	**785**	**39**	**63**	**562**

ආ. අධ්‍යයන කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර (ප්‍රධාන පුස්තකාලය/ විද්‍යා පීඨය සහ වෛද්‍ය පීඨය)

වර්ගය	පුස්තකාලයාධිපති	නි. පුස්තකාලයාධිපති	ජ්‍යෙෂ්ඨ සහ. පුස්තකාලයාධිපති (I)	ජ්‍යෙෂ්ඨ සහ. පුස්තකාලයාධිපති II	සහ. පුස්තකාලයාධිපති
අනුමත සේවක සංඛ්‍යාව	01	01	06	06	02
සිටින සේවක සංඛ්‍යාව	-	-	උසස්වීම් ක්‍රමයට අනුව ඉහත සේවකයන් 14ක පිරිස උසස් කර ඇත.		
පුරප්පාඩු	-	-	**03 (*)**		
එකතුව	**01**	**01**	**17**		

අනුමත සේවක සංඛ්‍යාව: 19
සටහන් : (*) පිරවිය යුතු පුරප්පාඩු සංඛ්‍යාව.

දේශීය වෛද්‍ය පීඨය (FIM)/ තාක්ෂණ (FOT)/ හෙද **(FON)**

වර්ගය	පුස්තකාල--යාධිපති	නි. පුස්තකාලයාධිපති	ජ්‍යෙෂ්ඨ සහ. පුස්තකාලයාධිපති - I/II		සහ. පුස්තකාලයා-ධිපති
අනුමත සේවක සංඛ්‍යාව: FIM FOT FON	- - -	- - -	02 - -	- - -	- **(**)** 01
සිටින සේවක සංඛ්‍යාව	-	-	02	-	01
පුරප්පාඩු	-	-	-	-	-
එකතුව	**-**	**-**	**02**	**-**	**01**

(**) තාක්ෂණ හා හෙද පීඨ දෙකම අලුතින් පිහිටුවන ලද පීඨ බැවින් සහකාර පුස්තකාලයාධිපති තනතුර සඳහා නව සේවක තනතුරක් 2019 වර්ෂයේදී එම පීඨ දෙකටම ඉල්ලා ඇත.

ඇ. පරිපාලන කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර

පුස්තකාලය	**සහ. ලේඛ.**	**ජෝ.සහ.ලේඛ.**	**නි. ලේඛ.**	**එකතුව**	**සටහන්**
පුස්තකාලය	01	01	03/2020 විවිප්‍රකොවක්‍රලේඛය මත පදනම්ව, සේවක සංඛ්‍යාව වැඩි කිරීමට හෝ නියෝජ්‍ය ලේඛකාධිකාරී තනතුර සඳහා නව තනතුරක් නිර්මාණය කිරීමට ඉල්ලා ඇත.	02	* සේවයේ නියුතු සහ. ලේ. සහ ජ්‍යෙෂ්ඨ සහ. ලේ. පිළිවෙලින් 2018 සහ 2019 වර්ෂයේ සිට බලපැවැත්වෙන පරිදි සිය උසස්වීම් සඳහා සුදුසුකම් ලබා ඇත. සහ. ලේ. - ජ්‍යෙෂ්ඨ සහ. ලේ. ලෙස ජ්‍යෙෂ්ඨ සහ. ලේ.- නි. ලේ. ලෙස
පුරප්පාඩු	-	-	-	-	
එකතුව	01	01		02	

ඇ. අනධ්‍යයන කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර: වෙනත්

පුස්තකාලය	**අධ්‍යයන සහායක**	**තාක්ෂණික නිලධාරී**	**ජ්‍යෙෂ්ඨතම (පු.තො.ස)ජෙ. මා. සහ.**	**ජ්‍යෙෂ්ඨ (පු.තො.ස) මා.ස.**	**කනිෂ්ඨ (පු.තො.ස) I/II/III**	**සුලු සේවක (පොත් බඳින්නා / පුස්. සහ./වැඩ සහයක)**
ප්‍රධාන පුස්තකාලය	-	01	02	05	19	BB-06 LA - 08 WA - 02
වෛද්‍ය පුස්තකාලය	-	-	01	-	08	LA - 02 WA - 04

විද්‍යා පුස්තකාලය		MA - 01	-	-	07	LA – 04 WA - 01
තාක්ෂණ පුස්තකාලය	-	-	-	-	01	-
හෙද විද්‍යා පුස්තකාලය	-	-	-	-	-	-
දේශීය වෛද්‍ය පුස්තකාලය				01	04	LA – 02 WA - 01
පුරප්පාඩු	01	02	-	-	06	BB – 03 LA - 13
එකතුව	01	04	03	06	45	46

ඉ. පර්යේෂණ, නවෝත්පාදන හා ප්‍රකාශන පිළිබඳ තොරතුරු

විෂයය	ප්‍රකාශයට පත්කළ	වාණිජකරණය කළ	ඉදිරිපත් කළ
	2023	**2023**	**2023**
අ. පර්යේෂණ සංඛ්‍යාව	-	-	-
ආ. නවෝත්පාදන සංඛ්‍යාව	-	-	-
ඇ. වාරසඟරා ලිපි සංඛ්‍යාව	12	-	-
ඈ. ග්‍රන්ථ සංඛ්‍යාව	01	-	-
ඉ. ලිපි සංඛ්‍යාව	02	-	-
ඊ. වෙනත් (සමුළු/පර්.ස‍ම්.සැසි සාරසංක්ෂේප)	16	-	16
එකතුව	**31**	**-**	**16**

ඊ. පාඨමාලා, සම්මන්ත්‍රණ හා වැඩමුළු පිළිබඳ තොරතුරු

විෂයය	සහභාගි වූ	සම්පූර්ණ කළ
	2023	**2023**
අ. පශ්චාත් උපාධි පාඨමාලා සංඛ්‍යාව	-	-
ආ. පශ්චාත් උපාධි ඩිප්ලෝමා සංඛ්‍යාව	-	-
ඇ. උපාධි පාඨමාලා සංඛ්‍යාව	-	-
ඈ. ඩිප්ලෝමා පාඨමාලා සංඛ්‍යාව	-	-
ඉ. සහතික පත්‍ර පාඨමාලා සංඛ්‍යාව	-	-
ඊ.වෙනත්	07	07
එකතුව	**07**	**07**

උ. ලැබුණු සම්මාන පිළිබඳ තොරතුරු

විෂයය	සම්මාන සංඛ්‍යාව	ආචාර්යවරුන් සංඛ්‍යාව	ශිෂ්‍ය සංඛ්‍යාව
	2023	**2023**	**2023**
අ. දේශීය සම්මාන	02		-
ආ. ජාතික සම්මාන		(ඇමුණුම 02)	-
ඇ.අන්තර්ජාතික සම්මාන			-
ඈ. වෙනත්			
එකතුව	**02**		**-**

ඌ. පුනරාවර්තන වියදම් පිළිබඳ විස්තර :

විෂයය	**2023** රු.
අ. පෞද්ගලික වැටුප් හා චේතන	132,620,729.00
ආ. ප්‍රවාහන	-
ඇ.සැපයුම්	1,651,690.00
ඈ.නඩත්තු	1,449,778.00
ඉ. කොන්ත්‍රාත් සේවා	13,480,007.00
ඊ.වෙනත්	957,726.00
එකතුව	**150,159,930.00**

එ. ප්‍රාග්ධන වියදම් පිළිබඳ විස්තර :

විෂයය	**2023** රු.
අ. ගෘහභාණ්ඩ හා කාර්යාල උපකරණ අත්පත් කර ගැනීම	1,113,066.11
ආ. යන්ත්‍ර සූත්‍ර අත්පත් කර ගැනීම	-
ඇ. ගොඩනැගිලි සහ සැකිලි අත්පත් කර ගැනීම සහ නඩත්තුව	780,324.46
ඈ. ග්‍රන්ථ	665,333.54
(වාර සහරා සහ ඉලෙක්ට්‍රොනික දත්ත සමුදායන්) $2100 (ගණනය කරන ලද මිල : 1$= රු. 304.77/=) නියමිත දිනය - 23/05/2023	640,017.00
ඉ. පරිභෝජන සහ වෙනත්	212,678.06
එකතුව	**34,111,419.17**

ඒ. ව්‍යාපෘති වියදම් පිළිබඳ තොරතුරු (දේශීය/විදේශීය ආධාර සහිත)

නම හා විස්තර	ණය / ආධාර	අනුග්‍රාහක ආයතනය	TCE රු.	RFA රු.	DF රු.
SLIDA/SARAEC		SLIDA/SARAEC	-	682145.73	-
එකතුව				**682145.73**	

(GOSL/ ADB/ IDA. WB/ .....)

RFA: ප්‍රතිපූරණය කළ හැකි විදේශීය ආධාර

DF: දේශීය අරමුදල්

ඔ. මූල්‍ය ප්‍රගතිය පිළිබඳ විස්තර (වැය)

විෂයය	ප්‍රතිපාදන -**2023** රු.	වැය - **2023** රු.	ඉතුරුම්/ අතිරික්ත රු.
අ. ව්‍යාපෘතිය හැර පුනරාවර්තන			
ආ. ව්‍යාපෘතිය හැර ප්‍රාග්ධන	ශේෂය 18,637,088.38	2,109,867.57	24,582,619.81

	8,055,400.00+		
ඇ. ව්‍යාපෘතිය - දේශීය අරමුදල්	-	-	-
ඈ. ව්‍යාපෘතිය - විදේශීය අරමුදල්	-	-	-
එකතුව	**26,692,488.38**	**2,109,867.57**	**24,582,619.81**

ඕ.මූල්‍ය ප්‍රගතිය පිළිබඳ විස්තර (උත්පන්න ආදායම)

අරමුදල් ප්‍රභවය	**ප්‍රතිපාදන -2023 රු.**	**රැස් කිරීම් 2023 රු.**	**හිඟ/ අතිරික්ත**
අ. ව්‍යාපෘතිය හැර පුනරාවර්තන (MLDF)	8,055,400.00	8,055,400.00	-
ආ. ව්‍යාපෘතිය හැර ප්‍රාග්ධන	-	-	-
ඇ. ව්‍යාපෘතිය - දේශීය අරමුදල්	-	-	-
ඈ. ව්‍යාපෘතිය - විදේශීය අරමුදල්	-	-	-
(පුස්තකාල දඩ/බැඳුම් ගාස්තු/ ශාලා ප්‍රතිසංස්කරණය/ පුස්තකාල ගාස්තු)	726,140.00	726,140.00	-
එකතුව	**8,781,540.00**	**8,781,540.00**	

ක. මූල්‍ය කාර්ය සාධන විශ්ලේෂණය– 2023

විෂයය	**සූත්‍රය**	**සිසුවෙකු සඳහා වියදම රු.**
අ. සිසුවෙකු සඳහා පුනරාවර්තන වියදම් (RE)	RE/ ශිෂ්‍ය සංඛ්‍යාව	7081.01
ආ. සිසුවෙකු සඳහා ප්‍රාග්ධන වියදම් (CE)	CE/ ශිෂ්‍ය සංඛ්‍යාව	160.87
එකතුව		**7241.88**

ග. ලැබුණු යටිතල පහසුකම් පිළිබඳ විස්තර 2023

යටිතල පහසුකම් පිළිබඳ විස්තර	**වියදම රු.**	**භෞතික ප්‍රගතිය**
ඇලුමිනියම් පාටිෂන් - ML	389,524.46	සම්පූර්ණයි
නව පුස්තකාල පරිශ්‍රය - FOM	FOM කුලුණ (FOM ස්ථාවර වත්කම්)	සම්පූර්ණයි

2.24 අභ්‍යන්තර තත්ත්ව සහතික මධ්‍යස්ථානය (CQA)

කලින් අභ්‍යන්තර තත්ත්ව සහතික ඒකකය (IQAU) ලෙස හැඳින්වූ කොළඹ විශ්වවිද්‍යාලයේ තත්ත්ව සහතික මධ්‍යස්ථානය (CQA) විශ්වවිද්‍යාලයේ තත්ත්ව සහතික (QA) ක්‍රියාකාරකම් අධීක්ෂණය සහ සම්බන්ධීකරණය කිරීම සහ IQAC (අභ්‍යන්තර තත්ත්ව සහතික කුටිවල) ප්‍රගතිය සම්බන්ධීකරණය කිරීමේ වගකීම දරයි. තත්ත්ව සහතික කිරීමේ මධ්‍යස්ථානය සෘජුවම උපකුලපතිවරයා යටතේ පවතින අතර කළමනාකරණය කරනු ලබන්නේ විශ්වවිද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයෙකු වන අධ්‍යක්ෂවරයෙකු විසිනි. (වර්තමාන අධ්‍යක්ෂ මහාචාර්ය ගෝමින්ද පොන්නම්පෙරුම - වෛද්‍ය පීඨය). තත්ත්ව සහතික මධ්‍යස්ථානයෙහි පරිපාලන හා මූල්‍ය කටයුතු අධීක්ෂණය කරනු ලබන්නේ පීඨාධිපතිවරුන්, අධ්‍යක්ෂවරුන් සහ සියලුම පීඨ/ආයතනවල හා ශ්‍රීපාලි මණ්ඩපයෙහි අභ්‍යන්තර තත්ත්ව සහතික කිරීමේ කුටිවල අධ්‍යයන සම්බන්ධීකාරකවරුන්ගෙන් සහ ජ්‍යෙෂ්ඨ පරිපාලන නිලධාරීන්ගෙන් සමන්විත 'සනාතන සභාවේ තත්ත්ව සහතික මධ්‍යස්ථාන ස්ථාවර කමිටුව' විසිනි. තත්ත්ව සහතික මධ්‍යස්ථාන ස්ථාවර කමිටුව මාසිකව නිශ්චිත දිනයක රැස්වන අතර එහි සභාපතිත්වය

උපකුලපතිවරයා විසින් දරනු ලැබේ. එහි ප්‍රගතිය සහ ක්‍රියාකාරකම් කොළඹ විශ්වවිද්‍යාලයේ සනාතන සභාවේදී මාසිකව වාර්තා වේ. තත්ත්ව සහතික මධ්‍යස්ථාන අධ්‍යක්ෂ තත්ත්ව සහතික කිරීම පිළිබඳ විවිප්‍රකොා ස්ථාවර කමිටුවේ සාමාජිකයෙකු ද වන අතර ඔහු කොළඹ විශ්වවිද්‍යාලය නියෝජනය කරයි. අධ්‍යක්ෂවරයා තත්ත්ව සහතික කිරීමේ මධ්‍යස්ථානයෙහි ප්‍රගතිය පිළිබඳව විවිප්‍රකොා ස්ථාවර කමිටුවට වාර්තා කරන අතර, කොළඹ විශ්වවිද්‍යාලයේ පීඨ, ආයතන සහ මණ්ඩප නියෝජනය කරන අභ්‍යන්තර තත්ත්ව සහතික සම්බන්ධීකාරකවරුන් හරහා තත්ත්ව සහතික කිරීම ආශ්‍රිත සියලුම ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය සහ ක්‍රියාත්මක කිරීම සිදු කරයි.

දැක්ම

දැනුම, අධ්‍යාපනය, පර්යේෂණ සහ ව්‍යවසායකත්වය අතර සහයෝගීතාවයන් ගොඩනඟා ගනිමින් කලාපීය හා ජාත්‍යන්තර කීර්තියේ විශිෂ්ටත්වයේ මධ්‍යස්ථානයක් වීමට පරිශ්‍රම දැරීම.

මෙහෙවර

පරිවර්තනීය අධ්‍යාපනය සඳහා විනිවිදභාවය, වගවීම සහ ආවර්ජනයෙන් විශ්වවිද්‍යාලයීය ඉගැන්වීම්, ඉගෙනුම්, ඇගයුම් සහ අධ්‍යයන පාලනයේ ගුණාත්මකභාවය සහතික කිරීම සහ වැඩිදියුණු කිරීම සඳහා මිණුම් දණ්ඩක් වීම.

පරමාර්ථය

විශ්වවිද්‍යාලය තුළ තත්ත්ව සහතික සංස්කෘතියක් ප්‍රවර්ධනය කිරීම

අරමුණු

- ඉගෙනීම් ක්‍රියාවලිය වැඩි දියුණු කිරීම සඳහා නවීන වැඩිහිටි ඉගෙනුම් ප්‍රවේශයන් අනුගමනය කිරීම.
- ව්‍යක්තීය සහ සදාචාරාත්මක හැසිරීම් ශක්තිමත් කිරීම
- වගකිවයුතු භාවිතයන් ප්‍රවර්ධනය කිරීම

මෙම අරමුණු ළඟා කර ගැනීම පිණිස මධ්‍යස්ථානය පහත කටයුතුවල නිරත වෙයි.

- විෂයමාලා සහ අධ්‍යයන සංවර්ධන කමිටුව (හෝ ඊට සමාන වෙනත් කමිටු), ඉගෙනුම් ඉගැන්වීම් කමිටුව සහ අනෙකුත් පීඨ කමිටු සහ අධ්‍යයන අංශ සමඟ සම්බන්ධ වී මණ්ඩපය/පීඨ/ආයතන තුළ ගුණාත්මකතාවය වැඩිදියුණු කිරීමේ ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය කිරීම.
- පීඨය තුළ ආයතනික සමාලෝචන සහ වැඩසටහන් සමාලෝචන පැවැත්වීම සඳහා පහසුකම් සැලසීමේදී කොළඹ විශ්වවිද්‍යාලයේ IQAC සමඟ සම්බන්ධ වීම.
- ආයතනික සහ වැඩසටහන් සමාලෝචන සඳහා අවශ්‍ය ලිපි ලේඛන සකස් කිරීම.
- ආයතන/වැඩසටහන්/විෂය සමාලෝචන වාර්තා තුළ නිර්දේශිත පසු විපරම් ක්‍රියාවන් ක්‍රියාත්මක කිරීමට පහසුකම් සැලසීම සහ ඒවා ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය නිරීක්ෂණය කිරීම.
- ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපනයේ ගුණාත්මක භාවය ඉහළ නැංවීමට සහ යහ භාවිතයන් බෙදාහදා ගැනීමට, කොළඹ විශ්වවිද්‍යාලය තුළ අනෙකුත් පීඨ/ආයතන/මණ්ඩපවල IQAC සමඟ සම්බන්ධ වීම.
- සම සමාලෝචන පෝරම සහ ශිෂ්‍ය ප්‍රතිපෝෂණ ආකෘති වැනි පීඨ/ආයතන/ මණ්ඩපවල තත්ත්ව සහතික දත්ත එක් රැස් කර විශ්ලේෂණය කිරීම
- සම පදස්ථ ප්‍රතිපෝෂණ ශිෂ්‍ය ඇගයීම් වාර්තා, සහ බාහිර සමාලෝචන වැනි විවිධ තත්ත්ව සහතික දර්ශක මත එකතු කරන ලද දත්ත මත පදනම්ව, අතිරේක QA මිනුම් හෝ පවතින ක්‍රියාමාර්ගවලට වෙනස් කිරීම් සැලසුම් කිරීම සහ යෝජනා කිරීම.

2023 දී මධ්‍යස්ථානය විසින් සිදුකළ ක්‍රියාකාරකම්

- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ තත්ත්ව සහතික කවුන්සිලයේ (QAC) ආයතනික සමාලෝචනය (IR) පිළිබඳ නවතම චක්‍රලේඛයට අනුව, කොළඹ විශ්වවිද්‍යාලයේ සඳහා ආයතනික සමාලෝචනය 2023 දී සිදු විය.

- සියලු පීඨ, ආයතන සහ මණ්ඩපවල නියෝජිතයන් ඇතුළත් ව 2023 ආයතනික සමාලෝචනය සඳහා ස්වයං-ඇගයුම් වාර්තාව (SER) සැකසීමේ කමිටුව පත් කරන ලදී.
- ස්වයං-ඇගයුම් වාර්තාව සැකසීම සඳහා තත්ත්ව සහතික මධ්‍යස්ථානය ස්වයං-ඇගයුම් වාර්තා ලේඛක මඩුල්ල සමග එක්ව වැඩමුළු කීපයක් සංවිධානය කළේය.
- විශ්වවිද්‍යාලය විසින් ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතනවල ආයතනික සමාලෝචනය සඳහා සංශෝධිත අත්පොතෙහි දක්වා ඇති මාර්ගෝපදේශවලට අනුකූලව 2018 සිට 2022/2023 දක්වා කාලය ආවරණය වන පරිදි පුළුල් ස්වයං-ඇගයුම් වාර්තාවක් සම්පාදනය කර ඉදිරිපත් කරන ලදී. ස්වයං-ඇගයුම් වාර්තාව ඉදිරිපත් කිරීමෙන් පසුව, තත්ත්ව සහතික මධ්‍යස්ථානය විසින් විශේෂ Google Drive ෆෝල්ඩරයක් හරහා සමාලෝචකයින්ට අමතර ලේඛන සහ සාධක සපයන ලදී.
- ස්ථානීය සමාලෝචනය 2023 ජූලි 24 සිට ජූලි 28 දක්වා සමාලෝචන මණ්ඩලය විසින් පවත්වන ලදී. මෙම ඇගයීම මත පදනම්ව, කොළඹ විශ්වවිද්‍යාලයට "ඉතා හොඳයි" යන කාර්ය සාධන විස්තරය සහිත A ශ්‍රේණිය පිරිනමන ලදී,
- තත්ත්ව සහතිකකරණයේදී ශිෂ්‍ය නියැලීම ප්‍රවර්ධනය කිරීම උදෙසා පීඨ මට්ටමේ රැස්වීම්වලට ශිෂ්‍ය නියෝජිතයින් සම්බන්ධ කර ගැනීම ආරම්භ කරන ලදී.
- තත්ත්ව සහතිකයට අදාළ ප්‍රතිපත්ති, මාර්ගෝපදේශ සහ අතුරු ව්‍යවස්ථා මාලාව 2023 මාර්තු 30 සහ ජූලි 17 යන දිනවල පිළිවෙළින් පැවැත්වුණු තත්ත්ව සහතිකකරණය පිළිබඳ සනාතන සභා ස්ථාවර කමිටුවේ 61 වැනි සහ 63 වැනි රැස්වීම්වලදී සකස් කර සභාගත කරන ලදී. මීට අමතරව, මෙම ප්‍රතිපත්ති 2023 අප්‍රේල් 26 සහ මැයි 31 වැනි දිනවල පැවති 485 වැනි සහ 486 වැනි සනාතන සභා රැස්වීම්වලදී සහ 2023 මැයි 16 සහ ජූලි 19 වැනි දින පැවති 608 වැනි සහ 610 වැනි පාලක සභා රැස්වීම්වලදී සභාගත කර සම්මත කර ගන්නා ලදී.

ප්‍රතිපත්ති, මාර්ගෝපදේශ සහ අතුරු ව්‍යවස්ථා මාලාව පහත පරිදි වේ,

- කාර්මික සහ සේවා ස්ථාන පුහුණුව පිළිබඳ ප්‍රතිපත්තිය
- ගැලීම් සටහන - වැඩසටහන් සඳහා අභ්‍යන්තර අනුමැතිය
- විශ්වවිද්‍යාලයීය උපාධිධාරීන්ගේ පැතිකඩ
- අවශ්‍යතා විශ්ලේෂණයක් සිදු කිරීම පිළිබඳ මාර්ගෝපදේශය
- විෂයමාලා සංවර්ධනය පිළිබඳ මාර්ගෝපදේශය
- ඇගයීම් පිළිබඳ ප්‍රතිපත්තිය
- විෂයමාලා සංවර්ධනය, ඇගයීම, සංශෝධනය සහ ඉවත් කිරීම පිළිබඳ විශ්වවිද්‍යාලයීය ප්‍රතිපත්ති
- ප්‍රතිපෝෂණ ලබා දීම සහ ලබා ගැනීම පිළිබඳ විශ්වවිද්‍යාලයීය ප්‍රතිපත්තිය
- ඉගෙනුම් ප්‍රගතිය පිළිබඳ විශ්වවිද්‍යාලයීය ප්‍රතිපත්තිය
- ඉගැන්වීම සහ ඉගෙනීම පිළිබඳ විශ්වවිද්‍යාලයීය ප්‍රතිපත්තිය
- ඉගැන්වීමේ විශිෂ්ටත්වය සහ නව්‍ය ඉගැන්වීම් ඇගයීම සඳහා දිරිගැන්වීම්/ත්‍යාග/සම්මාන පිළිබඳ විශ්වවිද්‍යාලයීය ප්‍රතිපත්තිය
- CQA ව්‍යවස්ථාව
- CQA ක්‍රියාකාරී සැලැස්ම 2023

- දෘශ්‍ය ආකර්ෂණය වැඩි දියුණු කිරීම සහ පාර්ශවකරුවන් වෙත වටිනා තොරතුරු ලබා දීම අරමුණු කරගනිමින්, CQA වෙබ් අඩවිය (https://cmb.ac.lk/cqa) ප්‍රතිසංස්කරණයකට ලක් කරන ලදී.
- IQAC හි වාර්තාකරණ ආකෘතිය විශ්වවිද්‍යාල මූලෝපායික සැලැස්ම සමඟ සමපාත වන සේ 2023 ආයතනික සමාලෝචන (IR) වාර්තාවෙන් ලද නිර්දේශ ද ඇතුළත් කර නැවත සකස් කරන ලදී.
- QAC වෙත ඉදිරිපත් කිරීමට නියමිත තත්ත්ව සහතික මධ්‍යස්ථාන වාර්ෂික වාර්තාව 2023 දෙසැම්බර් අගදී සකස් කරන ලදී.
- තත්ත්ව සහතික මධ්‍යස්ථාන අධ්‍යක්ෂවරයා විසින් මධ්‍යස්ථානයෙහි නියෝජ්‍ය අධ්‍යක්ෂ, සහකාර ලේකඛාධිකාරී සහ සම්බන්ධීකාරකවරයාගේ සහාය ඇතිව, තත්ත්ව සහතිකකරණය පිළිබඳ සනාතන සභා මාසික ස්ථාවර කමිටුව සඳහා වන රැස්වීම් වාර්තා සහ අනෙකුත් ලේඛන සකස් කර ඉදිරිපත් කරන ලදී, එසේම විශ්වවිද්‍යාලය තුළ ක්‍රියාත්මක කිරීම සඳහා UGC ස්ථාවර කමිටුවේ දී ගන්නා ලද තීරණ දැනුම් දෙන ලද අතර, IQAC වල තත්ත්ව සහතිකකරණ ප්‍රගතිය පිළිබඳ යාවත්කාලීන කිරීම් ලබා ගැනිනි.

- CQA නව උපාධි වැඩසටහන් අනුමත කිරීමේ ක්‍රියාවලියට පහසුකම් සලසන්නෙකු ලෙස කටයුතු කළේය.

2.25 ශාරීරික අධ්‍යාපන අංශය

ශාරීරික අධ්‍යාපන අංශයෙහි සමස්ත අරමුණ වන්නේ විශ්ව විද්‍යාලය තුළ ශාරීරික අධ්‍යාපන ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය කිරීම සහ සංවර්ධනය කිරීම මෙන්ම තරඟකාරී සහ විනෝදාත්මක ක්‍රීඩා ප්‍රවර්ධනය කිරීමයි.

විශ්වවිද්‍යාලය විසින් පිරිනමනු ලබන විෂය බාහිර ක්‍රියාකාරකම් රාශියකින් ශිෂ්‍ය ජීවිතය වැඩිදියුණු වේ. ක්‍රීඩා පිටියක්, ගෘහස්ථ ක්‍රීඩාගාරයක්, ටෙනිස් පිටියක්, පැසිපන්දු පිටියක් සහ අංගසම්පූර්ණ නවීන බර ඉසිලීම් ශාලාවක් ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට ඔවුන්ගේ හැකියාවන් උපරිමයෙන් ගවේෂණය කිරීමට සහ වර්ධනය කිරීමට අවස්ථාව ලබා දෙයි.

2023 වර්ෂය තුළ ශාරීරික අධ්‍යාපන අංශයෙහි ක්‍රියාකාරකම්

1. ශූරයන්ගේ රාත්‍රිය (Colors Night 2022) 2023 අප්‍රේල් 04 දින පවත්වන ලදී.
2. 2023 පෙබරවාරි 24 වැනි දින පැවති ඒකාබද්ධ සමාජයේ වාර්ෂික මහා සභා රැස්වීම - 2023
3. . නායකත්ව පුහුණු වැඩසටහන 2023
4. පළමු වසර උපාධි අපේක්ෂකයින් සඳහා ක්‍රීඩා දිශානති වැඩසටහන
5. අන්තර් පීඨ ශූරතාවලිය 2023 අප්‍රේල් 29 සිට 2023 මැයි 24 දක්වා පැවැත්විනි.
6. අන්තර් පීඨ නවකයින්ගේ ශූරතාවලිය 2023 නොවැම්බර් 05 සිට දෙසැම්බර් 03 දක්වා පැවැත්විනි.
7. ආරාධිත විශ්ව විද්‍යාල මාණ්ඩලික බැඩ්මින්ටන් ශූරතාවලිය 2023 ජනවාරි 13, 14 සහ 15 යන දිනවල පැවැත්විනි.
8. ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ක්‍රීඩා උළෙලේ බැඩ්මින්ටන් ශූරතාවලිය - 2023
9. “තානාපති කුසලාන 2023” ආරාධිත විශ්වවිද්‍යාල බැඩ්මින්ටන් ශූරතාවලිය 2023 ඔක්තෝබර් 06, 07 සහ 08 යන දිනවල පැවැත්විනි.
10. නැගෙනහිර විශ්වවිද්‍යාලය විසින් සංවිධානය කරන ලද 2023 ශ්‍රී ලංකා විශ්ව විද්‍යාල ක්‍රීඩා උළෙලට සහභාගී වූ කොළඹ විශ්ව විද්‍යාලය සමස්ත 3 වන ස්ථානය දිනා ගන්නා ලදී.
11. විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩලය සහ උපාධි අපේක්ෂකයින් සඳහා අහඹරුවාදා සහ සිකුරාදා දිනවල යෝග වැඩසටහනක් පැවැත්වීම.
12. සඳුදා සහ බදාදා දිනවල විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩලය සහ උපාධි අපේක්ෂකයින් සඳහා සුම්බා සහ එරොබික්ස් වැඩසටහන පැවැත්වීම

2.26 පාරිසරික මුලපිරීම් සඳහා වූ මධ්‍යස්ථානය (CEI)

පාරිසරික ආරක්ෂාව සහ තිරසාර හරිත සංවර්ධනයක් සාක්ෂාත් කර ගැනීම සඳහා පාරිසරික මුලපිරීම් සඳහා මධ්‍යස්ථානය (CEI) ස්ථාපනය කරන ලදී. පාරිසරික මුල පිරීම් මධ්‍යස්ථානයේ අරමුණු පහත පරිදි වේ:

- හරිත මූලාරම්භයන් අනුගමනය කරමින් 2020 දී හරිත විශ්ව විද්‍යාලයක් බවට පත්වීම
- විශ්වවිද්‍යාලය සඳහා විධිමත් සහ අපද්‍රව්‍ය කළමනාකරණ පද්ධතියක් ස්ථාපිත කිරීම
- විශ්වවිද්‍යාලයීය පරිසරය ආරක්ෂා කිරීම සහ විශ්වවිද්‍යාල පරිශ්‍රය වඩාත් පරිසර හිතකාමී බවට පත් කිරීම
- විශ්වවිද්‍යාල ප්‍රජාව අතර සහ විශ්වවිද්‍යාලයෙන් පිටත (පාසල්) පාරිසරික දැනුවත්භාවය ඇති කිරීම සහ හරිත ක්‍රියාකාරකම් සඳහා වෙනත් සහයෝගයන් ලබා දීම

ඉහත අරමුණු සාක්ෂාත් කර ගැනීමේදී විශ්ව විද්‍යාල ප්‍රජාව අතර පාරිසරික දැනුවත්භාවය ඇති කිරීම සඳහා බොහෝ රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ නිලධාරීන්ගේ සහ සංවිධානවල සහය ඇතිව වැඩසටහන් රැසක් සංවිධානය කිරීමට පාරිසරික මුලපිරීම් සඳහා මධ්‍යස්ථානය සැලසුම් කරයි.

2023 දී මධ්‍යස්ථානය විසින් සිදුකළ ක්‍රියාකාරකම්

- දැනුවත් කිරීමේ වැඩසටහන "අපේ විශ්වවිද්‍යාලය හරිතකරණය කරමු" - 2023 ජනවාරි 5
- විද්‍යා පීඨයේ නවක සිසුන් සඳහා දිශානති වැඩසටහන - මැයි, 2023
- ලෝක පරිසර දින දැනුවත් කිරීමේ වැඩසටහන - 2023 ජූනි 5
- වාර්ෂික අපද්‍රව්‍ය සමීක්ෂණය - 2023 අගෝස්තු 17 සිට 2023 අගෝස්තු 24 දක්වා
- Green Talk - "නිරසර බලශක්ති නිෂ්පාදනය සඳහා ශ්‍රී ලංකාවේ විභවය" - 24 අගෝස්තු 2023
- UI GreenMetric සම්මාන සඳහා සහභාගී වීම (ප්‍රශ්නාවලියක් සහ සාධක වාර්තාවක් ඉදිරිපත් කරන ලදී. කොළඹ විශ්ව විද්‍යාලය දිවයිනේ දෙවන ස්ථානය සහ ගෝලීය මට්ටමෙන් 263 ලෙස ශ්‍රේණිගත කර ඇත) - ඔක්තෝබර්, 2023
- THE Awards Asia 2024 සඳහා සහභාගී වීම ("පාරිසරික නායකත්වය සඳහා කැපී පෙනෙන දායකත්වය" සඳහා අයදුම්පතක් ඉදිරිපත් කරන ලදී) - ඔක්තෝබර්, 2023
- නිතිපතා සිදු කෙරෙන CEI හි කළමනාකරණ කමිටු සහ කළමනාකරණ මණ්ඩල මාසික රැස්වීම්
- මහජන පරීක්ෂකවරුන් දෙදෙනෙක්, ආපනශාලා කාර්ය මණ්ඩලය සහ සනීපාරක්ෂක කාර්ය මණ්ඩලය සමඟ රැස්වීම්
- සම්මුඛ පරීක්ෂණයක් පැවැත්වීම මගින් නව පරිසර නිලධාරියෙකු පත් කිරීම
- අපද්‍රව්‍ය කළමනාකරණය සහ අපද්‍රව්‍ය ගබඩා කිරීමේ මධ්‍යස්ථානයේ ක්‍රියාකාරිත්වය පිළිබඳ නිරන්තර අධීක්ෂණ කටයුතු
- හරිත පරිසරය සහ හරිත විශ්වවිද්‍යාල සම්බන්ධ දැනුවත් කිරීමේ වැඩසටහන් සහ වැඩමුළු සඳහා සහභාගී වීම

අ. ලැබුණු සම්මාන පිළිබඳ තොරතුරු:

විෂයය	**සම්මාන සංඛ්‍යාව**	**ආචාර්යවරුන් සංඛ්‍යාව**	**ශිෂ්‍ය සංඛ්‍යාව**
	2023	**2023**	**2023**
අ. දේශීය සම්මාන			
ආ. ජාතික සම්මාන			
ඇ.අන්තර්ජාතික සම්මාන	1		
ඈ. වෙනත්			
එකතුව	1		

ආ. ව්‍යාපෘති ව්‍යදම් පිළිබඳ තොරතුරු (දේශීය/විදේශීය ආධාර සහිත):

නම හා විස්තර	**ණය** / ආධාර	**අනුග්‍රාහක ආයතනය**	**TCE රු.**	**RFA රු.**	**DF රු.**
වාර්ෂික අපද්‍රව්‍ය සමීක්ෂණය සහ හරිත සංවාදය	ආධාර	ෆ්‍රෙඩ්‍රික් නූමන් පදනම (FNF)			225,000
වාර්ෂික අපද්‍රව්‍ය සමීක්ෂණය සහ හරිත සංවාදය	ආධාර	Cleanco (PVT) Ltd			50,000

(GOSL/ ADB/ IDA. WB/ .....)

RFA: ප්‍රතිපූරණය කළ හැකි විදේශීය ආධාර

DF: දේශීය අරමුදල්

ආ. ව්‍යාපෘති ව්‍යදම් පිළිබඳ විස්තර (දේශීය/විදේශීය අරමුදල් සහිත)

නම	TCE රු.	2023 වැය- රු.	31.12.2023 දිනට සමුච්චිත වැය	භෞතික ප්‍රගති ප්‍රතිශතය
වාර්ෂික අපද්‍රව්‍ය සමීක්ෂණය සහ හරිත සංවාදය		219,215		

2.27 විශ්වවිද්‍යාල ව්‍යාපාර සංධාරක කුටිය (UBL)

විශ්වවිද්‍යාල දැනුම, පර්යේෂණ, නවෝත්පාදන සහ අති නවීන තාක්ෂණයේ පෙරමුණ ගෙන සිටී. කොළඹ විශ්වවිද්‍යාලයේ ප්‍රධාන ශක්තීන්ගෙන් එකක් වන්නේ කැපවීමෙන්, විවිධත්වයෙන් සහ පරිණත බවින් යුතුව අති නවීන පර්යේෂණවල නියැලෙන පර්යේෂකයන් කණ්ඩායමයි. එබැවින්, පර්යේෂණ හා නවෝත්පාදන මත පදනම් වූ ශාස්ත්‍රීය සංස්කෘතියක් නිර්මාණය කිරීමට යත්න දරන කොළඹ විශ්වවිද්‍යාලය සිය පර්යේෂණ ප්‍රතිඵල මහජන භාවිතය සඳහා ප්‍රයෝජනවත් නිෂ්පාදන සහ සේවා බවට පත් කළ යුතු අතර ඔවුන්ගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීමෙන් ජනතාවට ප්‍රතිලාභ ලබා දිය යුතුය යන අදහසින් පසුවේ. ඉහත සඳහන් කළ අරමුණ සාක්ෂාත් කර ගැනීම සඳහා විශ්වවිද්‍යාලයේ පර්යේෂණ ප්‍රතිඵල කර්මාන්ත හා ව්‍යාපාර වෙත පැවරීම අත්‍යවශ්‍ය වේ. මෙම පසුබිම යටතේ, කොළඹ විශ්වවිද්‍යාලය තුළ අංක 10/2016 දරන විවිප්‍රකො චක්‍රලේඛය ක්‍රියාවට නැංවීම සඳහා උසස් අධ්‍යාපන ව්‍යාජ්තිය සහ සංවර්ධනය වේගවත් කිරීමේ (AHEAD) ව්‍යාපෘතියේ ද සහය ඇතිව විශ්වවිද්‍යාල ව්‍යාපාර සංධාර කුටිය (UBL) පිහිටුවීම අත්‍යවශ්‍ය පියවරකි. කොළඹ විශ්වවිද්‍යාලයේ තාක්ෂණ හුවමාරු කාර්යාලය (TTO) ලෙස ක්‍රියා කරන විශ්වවිද්‍යාල ව්‍යාපාර සංධාර කුටිය විශ්වවිද්‍යාලය තුළ කෙරෙන නවෝත්පාදනයන් සුරක්ෂිත කිරීම, කළමනාකරණය කිරීම සහ වාණිජකරණය කිරීම සඳහා පහසුකම් සපයන අතර මහජනතාවගේ ප්‍රයෝජනය සඳහා පර්යේෂණ ප්‍රතිඵල වෙළඳපොළට ගෙන ඒමට සහාය වේ.

දැක්ම

කොළඹ විශ්වවිද්‍යාලය තුළ සජීවී නවෝත්පාදන පරිසරයක් නිර්මාණය කරමින් තාක්ෂණ හුවමාරුව සහ වාණිජකරණය ප්‍රවර්ධනය කිරීමේ ප්‍රමුඛයා බවට පත්වීම.

මෙහෙවර

විශ්වවිද්‍යාලය විසින් නිර්මාණය කරන ලද තාක්ෂණය මහජන භාවිතය සහ ප්‍රතිලාභ සඳහා නව නිෂ්පාදන සහ සේවාවන් බවට හැරවීමට පහසුකම් සැලසීම සහ විශ්වවිද්‍යාලය තුළ පවත්නා දැනුම් ප්‍රාග්ධනය සහ ව්‍යාපාරික ප්‍රජාවගේ ව්‍යවසායක විශිෂ්ටත්වය සම්බන්ධ කරමින් ජාතික සංවර්ධනයට දායක වීම.

අරමුණු

විශ්වවිද්‍යාල ව්‍යාපාර සංධාර කුටිය පහත අරමුණු අපේක්ෂා කරයි:

- අධ්‍යයන කාර්ය මණ්ඩලය සහ විද්‍යාර්ථීන් අතර විශ්වවිද්‍යාල ව්‍යාපාර සම්බන්ධය (UBL) ජනප්‍රිය කිරීම සහ ප්‍රවර්ධනය කිරීම
- විශ්වවිද්‍යාල පර්යේෂණ සහ නවෝත්පාදනවලින් උත්පන්න වන බුද්ධිමය දේපළ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම, කළමනාකරණය කිරීම සහ වාණිජකරණය කිරීම
- විශ්වවිද්‍යාල පර්යේෂණ මහජන භාවිතය සහ ප්‍රයෝජනය සඳහා නව නිෂ්පාදන සහ සේවා බවට පරිවර්තනය කිරීමට පහසුකම් සැලසීම
- විශ්වවිද්‍යාලවල සිදු කෙරෙන පර්යේෂණ සහ නවෝත්පාදනවල ඵල මහජනතාව වෙත ගෙන යාම
- කාර්මික සමාජයේ අවශ්‍යතා සපුරාලීම සඳහා ශිෂ්‍ය ව්‍යාපෘති වැඩිදියුණු කිරීමට සහාය වීම
- ජාතික සහ ජාත්‍යන්තර ගොනු කිරීම සහ ලියාපදිංචිය තුළින් බුද්ධිමය දේපළ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා විශ්වවිද්‍යාල පර්යේෂකයන්ට අවශ්‍ය සහාය ලබා දීම
- ප්‍රාරම්භක අවස්ථාවෙහි පවතින ව්‍යාපාර වැනි නව ව්‍යාපාර ආරම්භ කිරීමට විශ්වවිද්‍යාල ආචාර්යවරුන්ට සහ විද්‍යාර්ථීන්ට මග පෙන්වීම
- විශ්වවිද්‍යාලයේ බුද්ධිමය වත්කම් කළමනාකරණයට සහාය වීම
- ව්‍යාපාරික ප්‍රජාව විශ්වවිද්‍යාල සම්පත් සමඟ සම්බන්ධ කිරීමෙන් විශ්වවිද්‍යාල-කර්මාන්ත සහයෝගිතා සහ හවුල්කාරිත්වය වැඩි දියුණු කිරීම

- තාක්ෂණය පදනම් කරගත් ආර්ථික සංවර්ධනය සහ රැකියා උත්පාදනය සඳහා ක්‍රියාකාරී භූමිකාවක් ඉටු කිරීමට විශ්ව විද්‍යාලය දිරිමත් කිරීම
- බලපත්‍ර ලබාදීම හරහා විශ්වවිද්‍යාලයට නව ආදායම් මාර්ග උත්පාදනය කිරීම

2.28 වෘත්තීය මාර්ගෝපදේශක ඒකකය (CGU)

දැක්ම

කොළඹ විශ්වවිද්‍යාලයේ උපාධි අපේක්ෂකයින්ට ප්‍රශස්ත වෘත්තියක් ආරම්භ කිරීමට සහ ශ්‍රම බලකායේ කාර්යක්ෂම සාමාජිකයින් වීමට අවශ්‍ය ආකල්පය, අභිප්‍රේරණය සහ කුසලතා ඇතුළුව අවශ්‍ය සම්ප්‍රේෂණය කළ හැකි කුසලතා ලබා දීම සහ පුහුණු කිරීම.

<u>අරමුණු</u>

පහත දැක්වෙන අරමුණු ඇතිව වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය (CGU) නිර්මාණය කරන ලදී:

- විශ්වවිද්‍යාලය සහ රැකියා අංශය අතර සබඳතා අන්‍යෝන්‍ය වශයෙන් වාසිදායක ලෙස වර්ධනය කර ගැනීම
- විද්‍යාර්ථීන්ගේ හැකියාව, ආශාව සහ පවතින අවස්ථා මත පදනම්ව ප්‍රශස්ත වෘත්තීය මාවතක් තෝරා ගැනීමට හා ඉදිරියට යාමට උපාධි අපේක්ෂකයින්ට උපකාර කිරීම.
- උපාධි අපේක්ෂකයින්ට රැකියා අංශය වෙත දිශානතියක් ලබා ගැනීමට සහ ඵලදායී සන්නිවේදන කුසලතා, නායකත්ව කුසලතා, කණ්ඩායම් වැඩ කිරීමේ කුසලතා සහ කළමනාකරණ කුසලතා වැනි හුවමාරු කළ හැකි කුසලතා වර්ධනය කර ගැනීමට උපකාර කිරීම තුළින් ඔවුන් කායී බලකායේ ඵලදායී හා කායීක්ෂම සාමාජිකයින් බවට පත්කිරීම
- පවතින රැකියා අවස්ථා සෙවීම සඳහා පෞද්ගලික හා රාජ්‍ය අංශයේ ආයතන සමඟ සම්බන්ධ වී උපාධිධාරීන්ගේ අවධානයට යොමු කර වඩාත් සුදුසු අයැදුම්කරුවන් සංවිධානය වෙත යොමු කිරීම.

<u>අප විසින් විද්‍යාර්ථීන්ට පිරිනමන සේවාවන්</u>

- වෘත්තීය සංවර්ධනය සඳහා උපදේශන සහ මග පෙන්වීම
- පෞද්ගලික උපදේශනය සහ මනෝවිද්‍යාත්මක උපදේශනය
- උපාධි අපේක්ෂකයින්ගේ ව්‍යවසායකත්ව කුසලතා වැඩි දියුණු කිරීම සඳහා ව්‍යවසාය පදනම් වූ ව්‍යාපෘතිය
- සේවා නියුක්තිය සහ මෘදු කුසලතා වැඩි දියුණු කිරීම පිළිබඳ වැඩමුළු පැවැත්වීම
- උපාධිධාරීන් ස්ථානගත කිරීම/ සේවා පළපුරුද්ද ලබා ගැනීම (කර්මාන්ත නිරාවරණය ලබා ගැනීම සඳහා අවස්ථා ලබා දීම)
- ප්‍රජා මූලික ක්‍රියාකාරකම් (සමාජ කුසලතා වැඩි දියුණු කිරීම සඳහා)
- වෘත්තීය සංවර්ධන වැඩසටහන (පාසලෙන් විශ්වවිද්‍යාල පරිසරයට මාරුවීමට පහසුකම් සැලසීම)

2.29 ස්ත්‍රී පුරුෂ සමාජභාව සමානාත්මතාවය සඳහා වූ මධ්‍යස්ථානය (CFGE)

කොළඹ විශ්වවිද්‍යාලයේ ස්ත්‍රී පුරුෂ සමාජභාව සමානාත්මතාවය සඳහා වූ මධ්‍යස්ථානය (CGE) කැපවී සිටින්නේ විශ්වවිද්‍යාලයේ අධ්‍යයන හා අනධ්‍යයන කායී මණ්ඩල සහ ශිෂ්‍ය ප්‍රජාවෙහි පුරුෂයින් හා කාන්තාවන් අතර සමගිය, සහයෝගීතාවය සහ අන්‍යෝන්‍ය ගෞරවය ප්‍රවර්ධනය කිරීම සඳහා ය.විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ (UGC) නියෝග සහ උසස් අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය සහ සාධාරණත්වය පිළිබඳ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා ස්ථාවර කමිටුවේ පෙරදසුන යටතේ පිහිටුවන ලද කොළඹ විශ්වවිද්‍යාලයේ ස්ත්‍රී පුරුෂ සමාජභාව සමානාත්මතාවය සඳහා වූ මධ්‍යස්ථානය විශ්වවිද්‍යාලයේ සියලුම සාමාජිකයන් සඳහා හිතකර, සාධාරණ ස්ත්‍රී පුරුෂ සමාජභාවී වැඩ සහ ඉගෙනුම් පරිසරයක පැවැත්ම සහතික කිරීමෙහි නිරතව සිටී.

කොළඹ විශ්වවිද්‍යාලයේ ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය සහ සමානාත්මතාවය සහතික කිරීමේ පෘථුල සංකල්පය තුළ, ස්ත්‍රී පුරුෂ සමාජභාව සමානාත්මතාවය සඳහා වූ මධ්‍යස්ථානය පහත සඳහන් කාර්යයන්හි නිරත වේ.

1. ස්ත්‍රී පුරුෂ සමාජභාවය සම්බන්ධ සංකල්ප සහ කරුණු පිළිබඳව විශ්වවිද්‍යාල ප්‍රජාව අතර දැනුවත්භාවය ඇති කිරීම
2. කොළඹ විශ්වවිද්‍යාලය තුළ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ අසමානතාවය, අසාධාරණත්වය සහ ප්‍රචණ්ඩත්වය වැලැක්වීමට ක්‍රම සහ විධි හඳුනා ගැනීම.
3. ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ අසමානතාවය, අසාධාරණත්වය සහ ප්‍රචණ්ඩත්වය වැළැක්වීමට සහ ඒවාට ප්‍රතිචාර දැක්වීමට විශ්වවිද්‍යාල ප්‍රජාව බල ගැන්වීම
4. ස්ත්‍රී පුරුෂ සමාජභාවය සහ ලිංගික හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය පිළිබඳ සම්පත් ගොනුවක් පවත්වා ගැනීම
5. විශ්වවිද්‍යාලය තුළ ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය සහ සාධාරණත්වය ඉහළ නැංවීම සඳහා සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වයෙන් තොර සුරක්ෂිත පරිසරයක් නිර්මාණය කිරීම සඳහා නියාමන කටයුතු සිදු කිරීම සහ යෝජනා ඉදිරිපත් කිරීම.
6. ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ අසමානතාවය, අසාධාරණත්වය සහ ප්‍රචණ්ඩත්වය සම්බන්ධ පැමිණිලි විසඳීමට සහ විශ්වවිද්‍යාලයට සහාය වීම.

කොළඹ විශ්වවිද්‍යාලයේ සියලුම පීඨ, මණ්ඩපය සහ ආයතන නියෝජනය කරන සාමාජිකයින්ගෙන් සමන්විත මෙහෙයුම් කමිටුවක් හරහා මෙම කටයුතු සිදු කෙරේ.

2023 දී මධ්‍යස්ථානය විසින් සිදුකළ ක්‍රියාකාරකම්

- ස්ත්‍රී පුරුෂ භාවය සම්බන්ධ තොරතුරු සහ සම්පත් පිළිබඳව වෙබ් අඩවිය යාවත්කාලීන කරන ලදී.
- විශ්වවිද්‍යාල වෙබ් අඩවිය, පීඨ වෙබ් අඩවි සහ ශිෂ්‍ය අත්පොත් හරහා විශ්වවිද්‍යාල තුළ නවක වදය සහ ලිංගික හිංසනයන් පිළිබඳ ප්‍රතිපත්ති සහ නීති සිසුන්ට සහ කාර්ය මණ්ඩලයට ලබා ගත හැකිය.
- CGE වෙත ලැබෙන පැමිණිලි භාර ගැනීම, ඉදිරිපත් කිරීම සහ පසු විපරම් කිරීම

2.30 දුම්කොළ විරෝධී මධ්‍යස්ථානය (CCT)

දුම්කොළ විරෝධී මධ්‍යස්ථානය (CCT) යනු දුම්කොළ පාලනය පිළිබඳ රාමු සම්මුතියේ (FCTC) 5.3 වගන්තිය යටතේ කොළඹ විශ්වවිද්‍යාල වෛද්‍ය පීඨයේ පිහිටුවන ලද ශ්‍රී ලාංකික දුම්කොළ නිරීක්ෂණාගාරයයි. මෙහි අරමුණ වන්නේ 5.3 වගන්තිය ශ්‍රී ලංකාව සහ කලාපය තුළ ක්‍රියාත්මක කිරීම හා සම්බන්ධ දුම්කොළ කර්මාන්ත ක්‍රියාකාරකම් නිරීක්ෂණය කිරීමයි. දුම්කොළ පාලනය පිළිබඳ රාමු සම්මුතිය (FCTC) යනු ලෝක සෞඛ්‍ය සංවිධානයේ 56 වන ලෝක සෞඛ්‍ය සභාව (WHO) විසින් 2003 මැයි මාසයේදී සම්මත කරන ලද අන්තර්ජාතික නීති යටතේ ඇති ගිවිසුමකි. මෙය 2005 පෙබරවාරි සිට බලාත්මක වූ අතර, 2019 වන විට එය අනුමත කරන රටවල් 181 ක් ඊට නීත්‍යානුකූලව බැඳී සිටී. දුම්කොළ පාලනය පිළිබඳ රාමු සම්මුතියේ 5.3 වගන්තියට බැඳුනු පාර්ශවයන් තම මහජන සෞඛ්‍ය ප්‍රතිපත්ති දුම්කොළ කර්මාන්තයේ වාණිජමය හා වෙනත් වේෂ්ටිත බැඳියාවන්ගෙන් ආරක්ෂා කර ගත යුතුය.

කොළඹ විශ්වවිද්‍යාල වෛද්‍ය පීඨයේ මධ්‍යස්ථානයක් ලෙස දුම්කොළ විරෝධී මධ්‍යස්ථානය ක්‍රියා කරයි. (UCFM)

2023 දී මධ්‍යස්ථානය විසින් සිදුකළ ක්‍රියාකාරකම්

1. වෛද්‍ය වෘත්තිකයන් සඳහා සම්මන්ත්‍රණයක් - ගංජා භාවිතය, වගා කිරීම, නීතිගත කිරීම සහ ප්‍රචලිත කිරීමේ ගතිකත්වය අවබෝධ කර ගැනීම
2. ගෝලීය වශයෙන් COVID-19 සහ ව්‍යාප්තිය අතරතුර දුම්කොළ කර්මාන්තයේ මැදිහත්වීම් සහ ක්‍රියාකාරකම් පිළිබඳ විමර්ශන පර්යේෂණ.
3. දුම්කොළ පාලන ජාතික මෙහෙයුම් කමිටුවට විශේෂඥ දැනුම ලබා දීම
4. SARC CCT වාර්ෂික හමුවීම් දියත් කිරීම
5. දකුණු ආසියාවේ දුම්කොළ කර්මාන්තයේ මැදිහත්වීම් පිළිබඳ වාර්තා වූ සිදුවීම්වල සාරාංශය ප්‍රකාශයට පත් කිරීම.
6. TobaccoUnmasked app සහ hotspots හරහා රට සහ කලාපය තුළ දුම්කොළ කර්මාන්තයේ මැදිහත්වීම් නිරීක්ෂණය කිරීම.
7. 2023 දී පැවැත්වූ 136 වැනි සංවත්සර ජාත්‍යන්තර වෛද්‍ය සම්මේලනයට සහභාගී වීම.
8. CDTSS - ප්‍රජාව මෙහෙයවන දුම්කොළ නිරීක්ෂණ පද්ධතිය

9. TU හොට්ස්පොට් නිරීක්ෂණය කිරීම
10. TobaccoUnmasked පිටු සංවර්ධනය කිරීම.
11. TU පෝස්ට් පරිවර්තනය කිරීම සහ ප්‍රකාශනය කිරීම.
12. TU පෝස්ට් ප්‍රකාශනයට පත් කිරීම
13. CCT වෙබ් අඩවි ප්‍රකාශයට පත් කිරීම

අ. පුනරාවර්තන වියදම් පිළිබඳ විස්තර :

විෂයය	**2023 රු.**
අ. පෞද්ගලික වැටුප් හා වේතන	-
ආ. ප්‍රවාහන	-
ඇ.සැපයුම්	-
ඈ.නඩත්තු	-
ඉ. කොන්ත්‍රාත් සේවා	875,000.00
ඊ.වෙනත්	-
එකතුව	**875,000.00**

ආ. ව්‍යාපෘති වියදම් පිළිබඳ තොරතුරු (දේශීය/විදේශීය ආධාර සහිත):

නම හා විස්තර	**ණය / ආධාර**	**අනුග්‍රාහක ආයතනය**	**TCE රු.**	**RFA රු.**	**DF රු.**
සෞඛ්‍යය සඳහා තරුණ වෘත්තිකයින්ගේ සන්ධානයෙන් ලත් පරිත්‍යාගය (YouPAH)		සෞඛ්‍යය සඳහා තරුණ වෘත්තිකයින්ගේ සන්ධානය (YouPAH)			875,000.00 (2022 දී YouPAH වෙතින් ලැබුණු පරිත්‍යාගයෙන් ඉදිරියට ගෙන ගිය රුපියල් 375,000 ක ශේෂය + 2023 දී රු. 500,000 ක පරිත්‍යාගයක්)

(GOSL/ ADB/ IDA. WB/ .....)
RFA: ප්‍රතිපූරණය කළ හැකි විදේශීය ආධාර
DF: දේශීය අරමුදල්

ඇ. ව්‍යාපෘති වියදම් පිළිබඳ විස්තර (දේශීය/විදේශීය අරමුදල් සහිත)

නම	**TCE රු.**	**2023 වැය රු.**	**31.12.2023 දිනට සමුච්චිත වැය**	**භෞතික ප්‍රගති ප්‍රතිශතය**
CCT සංවර්ධන අරමුදල		875,000.00		

2.31 අරාබි සහ ඉස්ලාමීය ශිෂ්ටාචාර ඒකකය

අරාබි සහ ඉස්ලාමීය ශිෂ්ටාචාර ඒකකය සිය පිරිනැමීම් තුළින් භාෂාව සහ ශිෂ්ටාචාර අධ්‍යයනයන් සඳහා වන වරණයන් පුළුල් කිරීම මගින් සහ සහ සියලුම විෂයයන්ගෙන් සිසුන් සහභාගී කිරීම මගින් අරමුණු කරයි. ඉස්ලාමීය ඉතිහාසය සහ ශිෂ්ටාචාරය, සංසන්දනාත්මක ආගම් සහ මැදපෙරදිග අධ්‍යයනයන් පිළිබඳව උගන්වන විවිධ පාඨමාලා ඒකක අතරින් එකක් හෝ කීපයක් තෝරා ගැනීමට පීඨයේ විද්‍යාර්ථීන්ට අවස්ථාව ලබාදීම

තහවුරු කිරීම මගින් ඉස්ලාමීය ඉතිහාසය සහ ශිෂ්ටාචාරය යන ක්ෂේත්‍රවල සමීප සහයෝගීතාවයක් සහ සංවර්ධනයක් ඇති කර ගැනීමට අපේක්ෂා කරයි.

ඒකකයෙහි වැඩසටහන් මගින් ඉස්ලාමීය ඉතිහාසය සහ ශිෂ්ටාචාරය පිළිබඳ අවබෝධය තුළින් ඉස්ලාමීය ලෝකය පිළිබඳ පුළුල් අවබෝධයක් ඇති කිරීම සහ පොදුවේ ඉස්ලාමීය සංස්කෘතිය අවබෝධ කර ගැනීම අවධාරණය කෙරෙයි. අපගේ භාෂා පාඨමාලා වලදී විද්‍යාර්ථීහු කථන සහ ලිඛිත අරාබි යන භාෂා දෙකෙහිම උසස් ප්‍රවීණතා මට්ටම් කරා ළඟා වෙති. මෙම වැඩසටහන් සැලසුම් කර ඇත්තේ විද්‍යාර්ථීන්ගේ සියලුම ඉස්ලාමීය ඓතිහාසික කාලපරිච්ඡේදවල සහ මුස්ලිම් ලෝකයේ සාහිත්‍ය, ආගමික, නීතිමය සහ ඓතිහාසික ග්‍රන්ථ කියවීමේ හැකියාව වර්ධනය කිරීමට සහ මුස්ලිම් ජනයාගේ අන්තර්ශික්ෂණ අභිලාෂයන් දිරිමත් කිරීම සහ විවිධ සංස්කෘතික වටිනාකම් අගය කිරීම සඳහා ය.

දැක්ම:

විශ්වවිද්‍යාලයේ සහ සමස්ත ජාතියේ සංවර්ධනයට දායක වන විශ්ව විද්‍යාලයේ ප්‍රමුඛ අධ්‍යයන අංශයක් වීම.

මෙහෙවර:

අරාබි භාෂාව සහ ඉස්ලාමීය අධ්‍යයනයන් ඉගැන්වීම මගින් සදාචාරය වර්ධනය කිරීම, ජාත්‍යන්තර භාෂාවක සහ ප්‍රධාන ලෝක ශිෂ්ටාචාරයක දැනුමින් විද්‍යාර්ථීන් පොහොසත් කිරීම සහ ඉහළ ගුණාත්මකයකින් යුතු කාර්ය සාධනයන් සඳහා මඟ පෙන්වීම තුළින් අන්තර් විශ්වවිද්‍යාලයීය ප්‍රජාවට, කලාපයට සහ සමස්ත ජාතියටම සේවය කිරීම.

2023 දී ඒකකය විසින් සිදුකළ ක්‍රියාකාරකම්

1. උපාධි අපේක්ෂක ක්ෂේත්‍ර පර්යේෂණ පුහුණුවක් පවත්වන ලදී .
2. විෂයමාලා සමාලෝචන හා සංවර්ධන සැසි දෙකක් පවත්වන ලදී.
3. නවීන අරාබි භාෂාව පිළිබඳ ඩිප්ලෝමා වැඩසටහනේ පළමු කණ්ඩායම ආරම්භ විය.
4. සංනිවේදන අරාබි භාෂාව පිළිබඳව සහතික පත්‍ර පාඨමාලාවේ 5 වන කණ්ඩායම සම්පූර්ණ කළ අතර 6 වන කණ්ඩායම ආරම්භ කළේය.

අ. වෙනත් ව්‍යාප්ති වැඩ සටහන්

පාඨමාලාව	මාධ්‍යය	ඇතුළත් කර ගැනීම් (2023 වර්ෂයේ ලියාපදිංචි වූ නවක සිසුන් සංඛ්‍යාව)
නවීන අරාබි භාෂාව පිළිබඳ ඩිප්ලෝමා වැඩසටහන- පළමු කණ්ඩායම	අරාබි /ඉංග්‍රීසි	26
සංනිවේදන අරාබි භාෂාව පිළිබඳව සහතික පත්‍ර පාඨමාලාව- 06 කණ්ඩායම	අරාබි /ඉංග්‍රීසි	13

ආ. පර්යේෂණ, නවෝත්පාදන හා ප්‍රකාශන පිළිබඳ තොරතුරු:

විෂයය	ප්‍රකාශයට පත්කළ	වාණිජකරණය කළ	ඉදිරිපත් කළ
	2023		
අ. පර්යේෂණ සංඛ්‍යාව	-	-	-
ආ. නවෝත්පාදන සංඛ්‍යාව	-	-	-
ඇ. වාරසහරා ලිපි සංඛ්‍යාව	03	03	03
ඈ. ග්‍රන්ථ සංඛ්‍යාව	-	-	-
ඉ. ලිපි සංඛ්‍යාව	-	-	-
ඊ. වෙනත්	-	-	-
එකතුව	03	03	03

ඇ. **2023** දී ආරම්භ කරන ලද නව පාඨමාලා පිළිබඳ විස්තර

පීඨය	පාඨමාලාව	මාධ්‍යය	කාලසීමාව	පාඨමාලා වර්ගය(ප.උ. ඩිප්ලෝමා/ ප. උපාධි/ දර්ශනපති/දර්ශන විශාරද)
ශාස්ත්‍ර පීඨය	නවීන අරාබි භාෂාව පිළිබඳ ඩිප්ලෝමා වැඩසටහන- පළමු කණ්ඩායම	අරාබි /ඉංග්‍රීසි	වර්ෂ 1	ඩිප්ලෝමා

2.32 දත්ත විද්‍යාව සඳහා වූ මධ්‍යස්ථානය (CDS)

2016 දී විද්‍යා පීඨයේ සංඛ්‍යාන විද්‍යා අධ්‍යයන අංශය යටතේ දත්ත විද්‍යා මධ්‍යස්ථානය (CDS) පිහිටුවන ලද්දේ ආචාර්යවරුන් , ශිෂ්‍යයන් සහ දත්ත විද්‍යා ක්ෂේත්‍රය අතර සහයෝගීතාව ඉහළ නැංවීම සඳහාය. ශ්‍රී ලංකාවේ දත්ත විද්‍යාවේ පර්යේෂණ හා සංවර්ධනයේ විශිෂ්ටත්වයේ කේන්ද්‍රස්ථානය බවට පත්වීම දත්ත විද්‍යා මධ්‍යස්ථානයෙහි **දැක්ම** වන අතර එහි **මෙහෙවර** වන්නේ ශාස්ත්‍රීය හා කාර්මික යන දෙඅංශයෙහිම හා දේශීය හා ජාත්‍යන්තර ප්‍රවීණයන් සමඟ සහයෝගීතාවයෙන් ශ්‍රී ලංකාවේ දත්ත විද්‍යාව පිළිබඳ පර්යේෂණ සහ සංවර්ධනයට පහසුකම් සැලසීමයි.

පහත සඳහන් අරමුණු සාක්ෂාත් කර ගැනීමට මධ්‍යස්ථානය ප්‍රයත්න කරයි:

- දේශීය හා ජාත්‍යන්තර විද්වතුන් සහ කර්මාන්ත විශේෂඥයින් සමඟ සහයෝගයෙන් දත්ත විද්‍යා ක්ෂේත්‍රයේ සහයෝගී පර්යේෂණ පැවැත්වීම සහ දත්ත විද්‍යාවට අදාළ පශ්චාත් උපාධි සහ උපාධි මට්ටමේ පර්යේෂණ කටයුතු සඳහා පහසුකම් සැලසීම සහ ප්‍රවර්ධනය කිරීම.

- වැඩමුළු, සම්මන්ත්‍රණ සහ සම්මන්ත්‍රණ හරහා සහ ගෝලීය සහභාගීත්වය සංවර්ධනය පිළිබඳ පුහුණු වැඩසටහන් පැවැත්වීම මගින් දත්ත විද්‍යාව පිළිබඳ දැනුම බෙදා හැරීම.

- සැබෑ ලෝකයේ දත්ත විද්‍යා ශිල්පීය ක්‍රම භාවිතා කිරීමේදී සිසුන්ගේ සහ ආචාර්යවරුන්ගේ කුසලතා වැඩි දියුණු කරන අතරම ඔවුන්ට තාක්ෂණික ප්‍රවීණත්වය ලබා දෙමින් උපදේශන ව්‍යාපෘති හරහා දේශීය හා ජාත්‍යන්තර කර්මාන්ත සමඟ හවුල්කාරිත්වයට පහසුකම් සැලසීම සහ ප්‍රවර්ධනය කිරීම.

2023 දී මධ්‍යස්ථානය විසින් සිදුකළ ක්‍රියාකාරකම්

- මොඩියුල 6කින් සහ අවසාන ව්‍යාපෘතියකින් සමන්විත Essentials of Data Science මාර්ගගත වැඩමුළු මාලාව සාර්ථකව සම්පූර්ණ කරන ලදී. එක් එක් මොඩියුලය සඳහා සහභාගිවන්නන් 35 කට වඩා ලියාපදිංචි වූ අතර අවසන් ව්‍යාපෘතිය සඳහා යෝජනා 25 ක් ඉදිරිපත් කරන ලදී.
- දෙසැම්බර් 19 සහ 20 යන දිනවල පැවැත්වෙන **දත්ත විද්‍යාව පිළිබඳ ජාත්‍යන්තර සම්මන්ත්‍රණය (ICDS 2023)** සංවිධානය කළේය. සම්මන්ත්‍රණය සඳහා තේමාව වන්නේ "AI යුගයේ දත්ත විද්‍යාව" වන අතර සංඛ්‍යාන විද්‍යා අධ්‍යයන අංශය දත්ත විද්‍යා මධ්‍යස්ථානය සමඟ සහයෝගීතාවයෙන් ICDS 2023 සත්කාරකත්වය දරනු ඇත.
- **MERCon 2023 වැඩමුළුව 1- Essentials of R for researchers** - 2023 නොවැම්බර් 11 වන දින මොරටුව ඉංජිනේරු පීඨයේ පර්යේෂණ සම්මන්ත්‍රණය 2023 සමඟ එක්ව පර්යේෂකයන් සඳහා මාර්ගගත වැඩමුළුවක් පවත්වන ලදී. මෙම වැඩමුළුව සඳහා පර්යේෂකයෝ හතළිස් දෙනෙක් සහභාගී වූහ.
- උපකාර සැසි ඔස්සේ පශ්චාත් උපාධි සිසුන්ට සහය වීම

2.33 කොළඹ විද්‍යා හා තාක්ෂණ කුටිය

"Cell" ලෙස හැඳින්වෙන කොළඹ විද්‍යා හා තාක්ෂණික කුටිය යනු කොළඹ විශ්වවිද්‍යාලයේ විද්‍යා පීඨය යටතේ ඇති ඇපයෙන් සීමිත සමාගමක් වන අතර එහි සියලුම සාමාජිකයින් පීඨයේ ආචාර්යවරුන් වේ. සමාගමේ වගන්ති විශ්වවිද්‍යාල පාලක සභාව සහ වි.වි. ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමත කර ඇති අතර සමාගම 2013 සැප්තැම්බර් 26 දින සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් වෙත ලියාපදිංචි කරන ලදී.

විද්‍යා හා තාක්ෂණික කුටිය ස්ථාපනය කිරීමෙහි අරමුණු පහත දැක්වේ:

- පර්යේෂණ, සංවර්ධන, නවෝත්පාදන, විද්‍යාත්මක සේවාවන් සහ දැනුම හා තාක්ෂණ හුවමාරුව තුළින් ශ්‍රී ලංකාවේ නිෂ්පාදන හා සේවා කර්මාන්ත මෙන්ම කෘෂිකර්මාන්තය ද ප්‍රවර්ධනය කිරීමට හා සේවය කිරීමට
- විශ්වවිද්‍යාල ප්‍රජාවේ සාමාජිකයින් අතර ව්‍යවසායකත්වය පෝෂණය කිරීම සඳහා
- ආර්ථික වර්ධනය ඉලක්ක කරගත් පර්යේෂණ ව්‍යාපෘති සහ උපදේශන කටයුතු ආරම්භ කිරීමේ අවස්ථා වැඩි දියුණු කිරීම සහ
- සමාගම තුළින් දියුණු කරන ලද බුද්ධිමය දේපල සඳහා අයිතිවාසිකම් ලබා ගැනීමට සහ ආරක්ෂා කිරීමට පහසුකම් සැලසීම

ස්වදේශීය තාක්ෂණයන් නවීකරණය කිරීම සහ නවීන තාක්ෂණයන් මාරු කිරීම තුළින් ප්‍රජා සංවර්ධන කටයුතුවලදී විශ්වවිද්‍යාලයට විශාල කාර්යභාරයක් ඉටු කළ හැකි අතර එම දැනුම හා කුසලතාවන් ලබා ගැනීමට හා ප්‍රයෝජනයට ගැනීමට ප්‍රජාවට ඇති හැකියාව වැඩි දියුණු කෙරේ.

2.34 ආබාධිකත්ව පර්යේෂණ, අධ්‍යාපනය හා භාවිතය සඳහා වූ මධ්‍යස්ථානය (CEDREP)

කොළඹ විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍ර පීඨයේ ආබාධිකත්ව පර්යේෂණ, අධ්‍යාපනය හා භාවිතය සඳහා වූ මධ්‍යස්ථානය (CEDREP), ආබාධ සහිත පුද්ගලයින් සහ ඔවුන්ගේ පවුල්වලට සම්බන්ධ ආබාධිත පර්යේෂණ, අධ්‍යාපනය සහ අදාළ ජාතික හා ජාත්‍යන්තර ආයතන සහ සංවිධාන සඳහා අධ්‍යාපනික නායකත්වය සැපයීමේ සහ ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් ස්ථාපිත කර ඇත. මෙම මධ්‍යස්ථානය විසින් ජාතික ආබාධිත ප්‍රතිපත්ති සහ උපාය මාර්ග සූත්‍රය අන්තර්ග්‍රහණ සංස්කෘතියක් ඇති කිරීම සඳහා ක්‍රියාකාරී හවුල්කරුවෙකු වීමට කොළඹ විශ්වවිද්‍යාලයේ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ සහ වෙනත් හවුල්කරුවන්ගේ සමුච්චිත දැනුම සහ ප්‍රවීණත්වය එක් කරයි. මීට අමතරව, වර්තමානයේ මෙම මධ්‍යස්ථානය ආබාධ සහිත සිසුන් සඳහා ශාස්ත්‍ර පීඨය සහ අධ්‍යාපන පීඨය මගින් ඔවුන්ගේ උපාධි පාඨමාලා සාර්ථකව නිම කිරීමට උපකාරක සේවා සපයයි. මෙම සේවාවන් කොළඹ විශ්වවිද්‍යාලයේ ආබාධ සහිත ඕනෑම සිසුවෙකුට විවෘතය.

දැක්ම

අන්තර්ග්‍රහණ සංස්කෘතියක් තුළ ආබාධ සහිත පුද්ගලයින්ගේ ජීවිත පොහොසත් කිරීම සඳහා ආබාධිතභාවය පිළිබඳ අධ්‍යයන සහ භාවිතයන් ප්‍රදර්ශනය කිරීම සහ ඒ සම්බන්ධ දැනුම බෙදා හැරීම සඳහා ශාස්ත්‍රීය නායකත්වය සැපයීමේ කේන්ද්‍රස්ථානයක් වීම.

මෙහෙවර

උපාධි හා පශ්චාත් උපාධි මට්ටම් දෙකෙහිම ආබාධිත අධ්‍යයන ප්‍රවර්ධනය කිරීම මගින් විවිත්‍රවත් අධ්‍යයන පරිසරයක් තුළ ආබාධ සහිත සිසුන් සහ කාර්ය මණ්ඩලය සඳහා අන්තර්ග්‍රහණ විශ්ව විද්‍යාල අත්දැකීමක් ප්‍රවර්ධනය කිරීම සහ රජය, ආයතනික අංශය, සිවිල් සමාජය සහ ආබාධ සහිත පුද්ගලයින් ඇතුළු ප්‍රජාවන් විසින් සිදු කරනු ලබන ආබාධිතබව සම්බන්ධ කාර්යයන්හි ජාතික සාක්ෂි පදනම් කරගත් භාවිතයන් සංවර්ධනය කිරීම හා ඒවා ක්‍රියාත්මක කිරීම සඳහා පර්යේෂණ සහ ඇගයීම් තුළින් සහාය වීම

2023 දී මධ්‍යස්ථානය විසින් සිදුකළ ක්‍රියාකාරකම්

- බ්‍රේල් පිළිතුරු පිටපත් පිටපත් කිරීම
- බ්‍රේල් විභාග ප්‍රශ්න පත්‍ර සැකසීම
- යතුරුපුවරු දිශානතිය සහ ස්පර්ශ ටයිප් කිරීමේ පුහුණුව (Keyboard Orientation and Touch Typing Training)
- නවක සිසුන් සඳහා ක්‍රියාකාරී තක්සේරුව
- පර්යේෂණ පත්‍රිකා ඉදිරිපත් කිරීම
- අභිප්‍රේරණ කතා සැසි මාලාවක් පැවැත්වීම

අ. සම්පත් සහ සිසුන් පිළිබඳ විස්තර

a.

මධ්‍යස්ථානය	පාඨමාලාව	මුළු ශිෂ්‍ය සංඛ්‍යාව	මුළු අධ්‍යයන කාර්ය මණ්ඩලය	මුළු අනධ්‍යයන කාර්ය මණ්ඩලය
		2023	**2023**	**2023**
ආබාධිකත්ව පර්යේෂණ, අධ්‍යාපනය හා භාවිතය සඳහා වූ මධ්‍යස්ථානය	ශාස්ත්‍ර පීඨයේ සහ අධ්‍යාපන පීඨයේ ප්‍රථම උපාධි වැඩසටහන්	88	1	1
එකතුව		**88**	**1**	**1**

ආ. පර්යේෂණ, නවෝත්පාදන හා ප්‍රකාශන පිළිබඳ තොරතුරු :

විෂයය	ප්‍රකාශයට පත්කළ	වාණිජකරණය කළ	ඉදිරිපත් කළ
	2023	**2023**	**2023**
අ. පර්යේෂණ සංඛ්‍යාව	1	-	1
ආ. නවෝත්පාදන සංඛ්‍යාව	-	-	-
ඇ. වාරසඟරා ලිපි සංඛ්‍යාව	-	-	-
ඈ. ග්‍රන්ථ සංඛ්‍යාව	-	-	-
ඉ. ලිපි සංඛ්‍යාව	-	-	-
ඊ. වෙනත්	-	-	-
එකතුව	**1**	**0**	**1**

3. පත්වීම් හා කායී මණ්ඩල තොරතුරු

පත්වීම්

2023 වර්ෂය තුළ අධ්‍යයන, අධ්‍යයන සහාය, පරිපාලන සහ මූල්‍ය සහ පරිපාලන අනෙකුත් ශ්‍රේණි සඳහා නව පත්වීම් 49 ක් පියවල සිදු කරන ලදී.

අධ්‍යයන	-	48
අධ්‍යයන සහායක	-	00
පරිපාලන හා මූල්‍ය	-	01
පරිපාලන වෙනත්	-	00

කායී මණ්ඩල වෙනස් වීම්

2023 වසරේදී සිදුකරන ලද මුළු පත්වීම්, ස්ථිර කිරීම්, උසස් කිරීම් ස්ථානමාරු හා අනෙකුත් කාර්ය මණ්ඩල වෙනස් කිරීම් පහත උපලේඛනයෙහි දැක්වේ.

වගුව 3.1: කාර්ය මණ්ඩල වෙනස්වීම්

සිදුවීම	අධ්‍යයන	අධ්‍යයන සහායක	පරිපාලන සහ මූල්‍යය	පරිපාලන වෙනත්
නව පත්වීම්	48	0	1	0
නව පත්වීම් ජ්‍යෙෂ්ඨ මහාචාර්ය / මූලාසන මහාචාර්ය	1	0	0	0
ස්ථිරවීම්	29	1	4	1
උසස්වීම්	50	4	0	0
ස්ථානමාරු	0	0	0	0
සේවා දිගු	25	0	0	0
නිදහස්කිරීම්	1	0	0	0
විශ්‍රාමයාම්	13	0	2	2
ඉල්ලා අස්වීම්	24	11	1	0
තනතුරු හිස් කිරීම්	10	0	0	0
සේවා අවසන් කිරීම	0	0	0	0
සේවා අත්හිටුවීම්	0	0	0	0
සප්තවර්ෂික නිවාඩු	39	0	2	0
අධ්‍යයන නිවාඩු	29	0	0	0
අධ්‍යයන නිවාඩු දිගු	46	0	0	0
සම්මන්ත්‍රණ /සමුළු/ පුහුණු වැඩසටහන්	249	0	1	0
විවේක නිවාඩු	308	0	0	0
වෛද්‍ය නිවාඩු	16	0	0	0
අඩ වැටුප් නිවාඩු	0	0	0	0
වැටුප් රහිත නිවාඩු	14	0	0	0
සප්තවර්ෂික නිවාඩුවලින් පසු පැමිණීම්	31	0	2	0
අධ්‍යයන නිවාඩුවලින් පසු පැමිණීම්	23	0	0	0
විශේෂ නිවාඩු	0	0	0	0
සේවයෙන් නිදහස්කිරීම්	6	0	0	1
මරණ	1	0	0	0
එකතුව	963	16	13	4

වගුව 3.2: පීඨයන්හි සහ පුස්තකාලයෙහි අධ්‍යයන කාර්ය මණ්ඩලය

	වැටුප් පරිමාණය	අනුමත සේවක සංඛ්‍යාව	සිටින සේවක සංඛ්‍යාව			පුරප්පාඩු
			ස්ත්‍රී	පුරුෂ	මුළු එකතුව	
ජ්‍යෙෂ්ඨ මහාචාර්ය/ මහාචාර්ය (මූලාසන)	U-AC 5(I)&(II)	44	14	18	32	12
ජ්‍යෙෂ්ඨ මහාචාර්ය	U-AC 5(I)	867	14	10	24	154
මහාචාර්ය	U-AC 5(II)		71	67	138	
සහාය මහාචාර්ය	U-AC 4		5	7	12	
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (I ශ්‍රේණිය)	U-AC 3(I)		67	53	120	
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (II ශ්‍රේණිය)	U-AC 3(II)		133	65	198	
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (සංක්‍රාමික) / කථිකාචාර්ය (ස්ථිර නොවූ)	U-AC 3(III)		43	22	65	
කථිකාචාර්ය	U-AC 3(IV)		17	5	22	
කථිකාචාර්ය (ආධුනික)	U-AC 3(IV)		83	51	134	
පුස්තකාලයාධිපති	U-AC 5 (II)	01	1	0	1	0
නියෝජ්‍ය පුස්තකාලයාධිපති	U-AC 4	01	1	0	1	0
ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපති (I ශ්‍රේණිය)	U-AC 3 (I)	20	13	4	17	3
ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපති (II ශ්‍රේණිය)	U-AC 3 (II)					
සහකාර පුස්තකාලයාධිපති	U-AC 3 (IV)					

වගුව 3.3: පීඨයන්හි සහ පුස්තකාලයෙහි පරිපාලන, මූල්‍ය හා අධ්‍යයන සහායක කාර්ය මණ්ඩලය

සේවා ප්‍රවර්ගය	කාර්ය මණ්ඩල ප්‍රවර්ගය	වැටුප් පරිමාණය	අනුමත සේවක සංඛ්‍යාව	සිටින සේවක සංඛ්‍යාව			පුරප්පාඩු
				ස්ත්‍රී	පුරුෂ	මුළු එකතුව	
තෘතීයික මට්ටම	පරිපාලන කාර්ය මණ්ඩලය	U EX I	18	8	4	12	6
ජ්‍යෙෂ්ඨ මට්ටම	පරිපාලන කාර්ය මණ්ඩලය	U EX II	34	16	12	28	6
	පරිපාලන කාර්ය මණ්ඩලය	U EX III	02	1	0	1	1
තෘතීයික මට්ටම	වෙනත් විධායක කාර්ය මණ්ඩලය	U EX I	04	1	1	2	07
ජ්‍යෙෂ්ඨ මට්ටම	වෙනත් විධායක කාර්ය මණ්ඩලය	U EX II	02	0	0	0	
තෘතීයික මට්ටම / ජ්‍යෙෂ්ඨ මට්ටම	වෙනත් විධායක කාර්ය මණ්ඩලය	U EX I/ U EX II	05	0	2	2	
ජ්‍යෙෂ්ඨ මට්ටම	වෛද්‍ය නිලධාරී	U MO	05	0	1	1	4
තෘතීයික මට්ටම	අධ්‍යයන සහායක කාර්ය මණ්ඩලය	U AS	85	22	20	42	43

වගුව 3.4: පීඨයන්හි සහ පුස්තකාලයෙහි අනධ්‍යයන කාර්ය මණ්ඩලය

සේවා ප්‍රවර්ගය	කාර්ය මණ්ඩල ප්‍රවර්ගය	වැටුප් පරිමාණය	අනුමත සේවක සංඛ්‍යාව	සිටින සේවක සංඛ්‍යාව						ස්ථිර සේවක පුරප්පාඩු	තාවකාලික සේවක පුරප්පාඩු
				ස්ථිර			කොන්ත්‍රාත්				
				පි	ගැ	එ	පි	ගැ	එ		
ද්විතියික මට්ටම	තාක්ෂණික කාර්ය මණ්ඩලය	U-MN 4	199	18	14	32	-	-	-	42	42
		U-MN 3		-	-	-	-	-	-		
		U-MN 2		-	-	-	-	-	-		
		U-MN 1		-	-	-	-	-	-		
		U-MT 1		60	65	125	-	-	-		
ද්විතියික මට්ටම	ලිපිකරු හා සම කාර්ය මණ්ඩලය	U-MN 4	499	25	70	95	-	-	-	68	62
		U-MN 3		14	6	20	4	2	6		
		U-MN 2		4	7	11	-	-	-		
		U-MN 1		82	223	305	-	-	-		
ප්‍රාථමික මට්ටම	ප්‍රාථමික කාර්ය මණ්ඩලය	U-PL 3	580	98	3	101	-	-	-	186	186
		U-PL 2		59	18	77	-	-	-		
		U-PL 1		191	25	216	-	-	-		
	එකතුව		1278	551	431	982	4	2	6	296	290

4 පර්යේෂණ හා පර්යේෂණ ප්‍රවර්ධන ක්‍රියාකාරකම්

නව පර්යේෂණ රැසක් කිරීම තුළින් පර්යේෂණ ක්ෂේත්‍රයේ සිය විශිෂ්ටත්වය රැක ගැනීමට කොළඹ විශ්වවිද්‍යාලය සමත් විය. ප්‍රකාශන විශාල ප්‍රමාණයක් ප්‍රකාශනයට පත්කර ඇත. මේ අතර සමාලෝචිත සඟරා, දේශීය සහ විදේශීය සඟරා, සාරසංක්ෂේප, තීසිස සහ නිබන්ධන, ඉදිරිපත් කිරීම් සහ සංනිවේදන වේ. ඒ පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

පීඨය	2021	2022	2023
ශාස්ත්‍ර	105	59	179
අධ්‍යාපන	15	14	32
නීති	53	88	47
කළමනාකරණ	153	98	54
වෛද්‍ය	498	538	402
විද්‍යා	363	317	277
තාක්ෂණ	75	54	46
හෙද	13	71	34
ශ්‍රීපාලි මණ්ඩපය	114	62	10
එකතුව	**1389**	**1301**	**1081**

තරඟකාරී අයදුම්පත්‍ර ඉදිරිපත් කිරීම් ක්‍රියාවලියක් හරහා ආචාර්යවරුන්ට රජයේ සහ විදේශීය අරමුදල් ලබා ගත හැකි විය.

වාර්ෂික පර්යේෂණ සම්භාෂණය 2023

2008 දී පැවති සමාරම්භක උත්සවයේ සිට, කොළඹ විශ්වවිද්‍යාලයේ වාර්ෂික පර්යේෂණ සම්භාෂණය (ARS) විශ්ව විද්‍යාලයේ වාර්ෂික දින දර්ශනයේ ප්‍රමුඛතම සිදුවීමක් ලෙස අඛණ්ඩව පවතී. මෙම වර්ෂයේ පර්යේෂණ සම්භාෂණයෙහි සමාරම්භක උත්සවය 2023 නොවැම්බර් 2 වන දින කොළඹ විශ්වවිද්‍යාලයේ පරිගණක පාසලේ (UCSC) මහාචාර්ය වී. කේ. සමරනායක ශ්‍රවණාගාරයේදී පැවැත්වුණු අතර ප්‍රධාන ආරාධිතයා ලෙස ශ්‍රී ලංකාවේ නවසීලන්ත මහ කොමසාරිස් මයිකල් ඇපල්ටන් මහතා වෙනුවෙන් නියෝජ්‍ය මහ කොමසාරිස් ඇන්ඩෘ ට්‍රැවලර් මහතා මෙම අවස්ථාවට සහභාගී විය.

"පර්යේෂණ විශිෂ්ටත්වය සහ ඉන් ඔබ්බට" යන තේමාව යටතේ මෙවර සම්භාෂණය පැවැත්වුණු අතර, මෙම සමස්ත තේමාව සමඟ සමීප සම්බන්ධතා ඇතිකර ගනිමින් කැපී පෙනෙන පුද්ගලයෝ තිදෙනෙක් මුඛ්‍ය දේශන පැවැත්වූහ. ප්‍රථම මුඛ්‍ය දේශකයා වන ශ්‍රී ලංකා මහ බැංකු අධිපති ආචාර්ය පී නන්දලාල් වීරසිංහ මහතා තීරණාත්මක කාලීන මාතෘකාවක් වන උද්ධමනය සහ එය මහජන ජීවිතයට බලපාන ආකාරය පිළිබඳව කතා කළේය. ඔහු තම දේශනය ලෙස නම් කර තිබුණේ ''උද්ධමනය - අංක එකේ පොදු සතුරා'' ලෙසිනි. ඔහු සතු මුදල් ප්‍රතිපත්ති ක්ෂේත්‍රයේ සහ විදේශ සංචිත කළමණාකරන ක්ෂේත්‍රයේ පළපුරුද්ද සහ ප්‍රවීණත්වය මෙහි ලා මහෝපකාරී විය. දෙවන මුඛ්‍ය කථිකයා වූ ශ්‍රී ලංකාවේ ලෝක සෞඛ්‍ය සංවිධානයේ නියෝජිත ආචාර්‍ය අලකා සිංගේ දේශනය ''පර්යේෂණ විශිෂ්ටත්වය - සෞඛ්‍ය ප්‍රතිපත්ති සහ පර්යේෂණ සාක්ෂි අතර පරතරය පියවීම'' විය.සෞඛ්‍ය ක්ෂේත්‍රයේ පර්යේෂණ සහ ප්‍රතිපත්තිමය හිඩැස් අතර සම්බන්ධය විමර්ශනයේදී ඇය විසින් අග්නිදිග ආසියානු, අප්‍රිකානු සහ මධ්‍යධරණී කලාපවල දශක දෙකකට වැඩි කාලයක් සෞඛ්‍ය සහ සංවර්ධන ක්ෂේත්‍රවල නියැලීමෙන් ලත් අත්දැකීම් උපයෝගි කර ගන්නා ලදී. ඕස්ට්‍රේලියාවේ මෙල්බර්න් හි ලා ට්‍රෝබ් විශ්වවිද්‍යාලයේ දන්ත විශ්ලේෂණ සහ සංජානන පර්යේෂණ මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ මහාචාර්ය දම්මින්ද අලහකෝන් තෙවැනි මුඛ්‍ය දේශකයා විය. උසස් දන්ත විශ්ලේෂණ සහ කෘතිම බුද්ධිය (AI) පිළිබඳ විශේෂඥයෙකු වන මහාචාර්ය අලහකෝන්, ''අනාගත අන්තර්ශික්ෂණ පර්යේෂණ සවිබල ගැන්වීමේ දී කෘත්‍රිම බුද්ධියේ කාර්යභාරය'' නම් ඔහුගේ මුඛ්‍ය දේශනය තුළින් AI තාක්ෂණය ඒකාබද්ධ කිරීම තුළින් පර්යේෂණ සහ නව දැනුම ව්‍යාප්ත කළ හැකි තවත් මානයක් පෙන්වා දුන්නේය.

ඇමරිකා එක්සත් ජනපදයේ ස්ටැන්ෆර්ඩ් විශ්වවිද්‍යාලයේ මහාචාර්ය ජෝන් පී.ඒ. අයෝවානිඩිස් ප්‍රමුඛ විද්වත් කණ්ඩායමක් විසින් කරන ලද විශ්ලේෂණයක් මත පදනම්ව 2022 වසරේ ලොව හොඳම විද්‍යාඥයින් 2% අතරට තේරී පත් වූ කොළඹ විශ්වවිද්‍යාලයේ පර්යේෂකයන් අට දෙනෙකුගේ අමිල දායකත්වය ඇගයීමට ද මෙම උත්සවය අවස්ථාවක් විය. මීට අමතරව ARS 2023 හිදී පර්යේෂණ ක්ෂේත්‍රය කෙරෙහි කොළඹ විශ්වවිද්‍යාලයේ ආචාර්‍යවරුන්ගේ කැපවීම අගයමින් 2022 වසරේ පර්යේෂණ සඳහා සනාතන සම්මාන පිරිනැමීම සහ ප්‍රශංසා

සම්මාන පිරිනැමීම කැපී පෙනුණි. ARS 2023 සංවිධානය කරන ලද්දේ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය (මූලාසන) එච්.ඩී.ගේ කරුණාරත්න මහතාගේ (උපකුලපති, කොළඹ විශ්ව විද්‍යාලය) නායකත්වය සහ මගපෙන්වීම යටතේ මහාචාර්ය තරුෂා එන්. ගුණරත්න (සභාපති), ආචාර්ය කේ. ඩී. සඳරුවන් (සභාපති - ප්‍රචාරක සහ තොරතුරු තාක්ෂණ කමිටුව), මහාචාර්ය දර්ශනී බන්දුජිය (සභාපති - සමාරම්භක කමිටුව), ආචාර්ය සෙව්වන්දි රණසිංහ (කර්තෘ) - විවිධ පීඨ, ආයතන, මණ්ඩප, පාසල සහ පුස්තකාලය නියෝජනය කරන අනු කමිටු සාමාජිකයින්ගෙන් සැදුම් ලත් සම-කර්තෘ මණ්ඩලයක් ද මෙහි විය - යන මහත්ම මහත්මීන්ගෙන් සමන්විත කණ්ඩායමක් විසිනි. එස්.එම්. ශිෆාර් මහතා (සහකාර ලේඛකාධිකාරී - අධ්‍යයන සහ ප්‍රකාශන අංශය) සහ එම කාර්ය මණ්ඩලය, ආචාර්ය සචිනි අමරසේකර (විද්‍යා පීඨය - FOS media), ආචාර්ය හිරාන් ජයවීර සහ ලයාන් චතුරංග (ජාල මෙහෙයුම් මධ්‍යස්ථානය) සහ කොළඹ විශ්වවිද්‍යාලයේ පරිගණක පාසලේ (UCSC) අධ්‍යක්ෂ ආචාර්ය අජන්ත අතුකෝරළ මහතා සහ එම කාර්ය මණ්ඩලය විසින් මේ සඳහා අවශ්‍ය පරිපාලන, තොරතුරු තාක්ෂණ සහ සැපයුම් සපයන ලදී. විශ්වවිද්‍යාලයේ විවිධ මණ්ඩප, පීඨ, ආයතන, පාසල සහ පුස්තකාලය - සමස්තයක් ලෙස ආයතන දහනවයම සමස්ත සම්මන්ත්‍රණ තේමාවට සමපාත වන සේ ඔවුන්ගේම සුවිශේෂ තේමා, උප තේමා සහ ශික්ෂණමය කේන්ද්‍රීය අවධානයක් යටතේ වසර අවසානය දක්වා සිය සම්භාෂණ පැවැත්වීය.

තානාපති මයිකල් ඇපල්ටන්
ප්‍රධාන ආරාධිත
ශ්‍රී ලංකාවේ නවසීලන්ත මහ කොමසාරිස්





ආචාර්ය පී. නන්දලාල් වීරසිංහ
මුඛ්‍ය දේශක
අධිපති, ශ්‍රී ලංකා මහ බැංකුව (CBSL)



ආචාර්ය අලකා සිං
මුඛ්‍ය දේශක
ලෝක සෞඛ්‍ය සංවිධානයේ ශ්‍රී ලංකා නියෝජිත



මහාචාර්ය දම්මින්ද අලහකෝන්
මුඛ්‍ය දේශක
අධ්‍යක්ෂ, දත්ත විශ්ලේෂණ සහ සංජානන පර්යේෂණ මධ්‍යස්ථානය,
ලා ට්‍රෝබ් විශ්වවිද්‍යාලය.
ඔස්ට්‍රේලියාව

2022 වසර සඳහා වූ ඉහළම 2% විද්‍යාඥයින්ගේ ලැයිස්තුවට සම්මානිත මහාචාර්ය කාමිණී මෙන්ඩිස්, සම්මානිත මහාචාර්ය සරෝජ් ජයසිංහ, මහාචාර්ය සේනක රාජපක්ෂ, මහාචාර්ය නදීරා ඩී. කරුණාවීර, මහාචාර්ය ප්‍රියංග රණසිංහ, ආචාර්ය රනිල් ජයවර්ධන සහ ආචාර්ය මෙරාන් එදිරිවීර ඇතුළත් වෙති. එසේම, සම්මානිත මහාචාර්ය කාමිණී මෙන්ඩිස්, සම්මානිත මහාචාර්ය ඩබ්. ඩී රත්නසූරිය, සම්මානිත මහාචාර්ය සරෝජ් ජයසිංහ, මහාචාර්ය සේනක රාජපක්ෂ, සහ මහාචාර්ය නදීරා ඩී. කරුණාවීර යන මහත්ම මහත්මිහු පූර්ණ වෘත්තීය ජීවිතය තුළ ඉහළම 2% විද්‍යාඥයින්ගේ ලැයිස්තුවට ඇතුළත් වූහ.



උපහාර සම්මාන සමඟින්, තම විශිෂ්ට පර්යේෂණ කර්තව්‍යයන් තුළින් විශ්වවිද්‍යාල ප්‍රජාවට දායකත්වය ලබා දුන් අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් 32 දෙනෙකුට 2022. වසර සඳහා පර්යේෂණ විශිෂ්ටතා සඳහා වන සනාතන සම්මාන ද පිරිනැමිණි.

සනාතන සම්මාන - 2022

සාමාන්‍ය ප්‍රවර්ගය

ශාස්ත්‍ර පීඨය	ආචාර්ය ඩී.ඩී.පී.එම්. දුනුසිංහ
	ආචාර්ය වයි.ඒ. කරුණාරත්න
අධ්‍යාපන පීඨය	ආචාර්ය එච්.එම්.එල්.කුමාරි
නීති පීඨය	මහාචාර්ය එන් කමර්දීන්
කළමනාකරණ සහ මූල්‍ය පීඨය	මහාචාර්ය ඒ.එස්. අදිකාරම්
	මහාචාර්ය පී. කෛලාසපති
වෛද්‍ය පීඨය	මහාචාර්ය ප්‍රියංග රණසිංහ
	මහාචාර්ය රනිල් ජයවර්ධන
හෙද පීඨය	මහාචාර්ය එස්.එස්.පී. වර්ණකුලසූරිය
	ආචාර්ය ජී.ඒ.එස්.ප්‍රේමකුමාර
විද්‍යා පීඨය	මහාචාර්ය ඩී.යූ.ජේ.සොන්නාදර
	ආචාර්ය එම්.කේ. ජයනන්ද
තාක්ෂණ පීඨය	ආචාර්ය ඩබ්.කේ.එස්.එම්. අබේසේකර
	ආචාර්ය ජයනි ජේ වේවැල්වල
පුස්තකාලය	ආචාර්ය ඩී.සී.කුරුප්පු මිය
	සජීවනී ඩී සෝමරත්න මිය
ශ්‍රීපාලි මණ්ඩපය	ආචාර්ය ප්‍රදීප් වීරසිංහ
	මහාචාර්ය රන්ජන් හෙට්ටිආරච්චි
කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක පාසල	ආචාර්ය ඩී.ඒ.එස්. අතුකෝරල
දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය	මහාචාර්ය එම්.එස්.එම්. ෂිෆා
	ආචාර්ය කේ.පී.කේ.ආර්. කරුණාගොඩ මිය
ජාතික පුස්තකාල සහ විඥාපන සේවා ආයතනය	ආචාර්ය ඩී.එම්.සී.සී. ගුණතිලක
	ආචාර්ය එන්.පී. විදානපතිරණ
ජෛව රසායන විද්‍යා, අණුක ජීව විද්‍යා සහ ජෛව තාක්ෂණවේද ආයතනය	මහාචාර්ය ශිරෝමා හඳුන්නෙත්ති
	මහාචාර්ය ඕ.වී.ඩී.එස්.ජේ. වීරසේන

මුල් වෘත්තීය ප්‍රවර්ගය

ශාස්ත්‍ර පීඨය	අයි.ඩබ්.රත්නායක මිය
නීති පීඨය	ඩබ්.ආර්.සමරනායක මිය
කළමනාකරණ සහ මූල්‍ය පීඨය	ආචාර්ය එස්.ඩී.කේ. වන්නිනායක
වෛද්‍ය පීඨය	මහාචාර්ය දක්ෂිත වික්‍රමසිංහ
භෙද පීඨය	ආචාර්ය ජී කිසෝකාන්ත්
විද්‍යා පීඨය	ආචාර්ය ඒ.ඩී.ඩී.එස්. අමරසේකර
තාක්ෂණ පීඨය	එන්.එන්.තිලකරත්න මහතා
ශ්‍රීපාලි මණ්ඩපය	කුමේෂ් ප්‍රභාෂිනී මිය
ජාතික පුස්තකාල සහ විඥාපන සේවා ආයතනය	එල්.එම්.රිෆ්නාස් මයා
ජෛව රසායන විද්‍යා, අණුක ජීව විද්‍යා සහ ජෛව තාක්ෂණවේද ආයතනය	මහාචාර්ය සමීර සමරකෝන්

5. විභාග අංශය

විභාග ශාඛාවට අදාළ කාර්ය සාධනය

- පැරණි විභාග ලකුණු පොත් පරිලෝකනය සම්පූර්ණ කරන ලදී.
- පරිලෝකනය කරන ලද ලකුණු පොත පහසුවෙන් ලබා ගැනීම සඳහා විශේෂ සේවාදායකයක (server) ගබඩා කර ඇත.
- FGS සහ කළමනාකරණ සහ මූල්‍ය පීඨවල පශ්චාත් උපාධි වැඩසටහන් සඳහා ශිෂ්‍ය තොරතුරු පද්ධතියක් සංවර්ධනය කිරීම සඳහා සාකච්ඡා කෙරෙමින් පවතී.

06. ශිෂ්‍ය සහ සේවක කටයුතු අංශය

මූල්‍යාධාර

මහපොළ ශිෂ්‍යත්වය හා ශිෂ්‍යාධාර දීමනා යටතේ මූල්‍යමය ආධාර ශිෂ්‍යයන් සඳහා ලබා දුන් අතර, සියලුම පීඨ නියෝජනය වන පරිදි ඒ.ටී.එම්. යන්ත්‍ර මගින් මුදල් ලබාගැනීමේ පහසුවද සලසා තිබුණි.

අ.) මහපොළ ශිෂ්‍යත්ව

මෙහි මාසික කප්පාදුව (සියලුම ශිෂ්‍යයන් සඳහා වූ මාසික විශ්වවිද්‍යාල ආධාරය රු.2450 බැගිනි) නවක ශිෂ්‍යයන් හා ජ්‍යෙෂ්ඨ ශිෂ්‍යයන් සඳහා ප්‍රදානය කළ අතර 2023 වර්ෂයෙහි එහි තත්ත්වය පහත පරිදි වේ:

වගුව – 01 : මහපොළ ශිෂ්‍යත්වලාභීන් – 2023

(මාස සහ පීඨ අනුව වර්ගීකරණය කර ඇත.)

මාසය	ශිෂ්‍ය සංඛ්‍යාව	ශාස්ත්‍ර	කළ. හා මූල්‍ය	නීති	වෛද්‍ය	විද්‍යා	භෞත වේදය	හෙද	තාක්ෂණ	දේශීය වෛද්‍ය	එකතුව
ජනවාරි	4901	3,875,900	2,322,600	1,332,800	1,418,550	1,624,350	134,750	220,500	1,335,250	FIM මගින් ගෙවීම් කරන ලදී.	12,264,700
පෙබ.	4904	3,934,700	2,168,250	1,293,600	1,418,550	1,663,550	134,750	220,500	1,266,650		12,100,550
මාර්තු	4904	3,878,350	2,168,250	1,293,600	1,418,550	1,636,600	53,900	220,500	546,350		11,216,100
අප්‍රේල්	නිවාඩු මාසය										
මැයි	4737	4,699,100	2,168,250	1,291,150	1,418,550	1,906,100	53,900	220,500	934,250	FIM මගින් ගෙවන ලදී.	12,700,800
ජුනි	6139	1,538,600	2,168,250	1,291,150	1,418,550	1,051,050	53,900	213,150	950,600	247,450	8,932,700
ජූලි	4780	14,347,200	11,110,750	10,770,200	6,343,050	1,048,600	445,900	1,631,700	5,490,450	2,675,400	53,863,250
අගෝ.	මහපොළ භාරකාර අරමුදලෙන් ගෙවීම් සිදු නොවීය.										
සැප්.											
ඔක්.											
නොවැ.											
දෙසැ.	නිවාඩු මාසය										
එකතුව	**30,365**	**32,273,850**	**22,106,350**	**17,272,500**	**13,435,800**	**8,930,250**	**877,100**	**2,726,850**	**10,532,550**	**2,922,850**	**111,078,100**

සාමාන්‍යය හෝ කුසලතා පදනම් කරගෙන පිළිවෙලින් එක් ශිෂ්‍යයෙකු මාසිකව රු. 2600/- හෝ රු. 2550/- ලබාගත් අතර ඊට අමතරව මාසිකව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසම මගින්ද රු.2450/- මුදලක් ප්‍රදානය කරන ලදි. එම නිසා, ඉහත සඳහන් කළ කාලයේදී එක් ශිෂ්‍යයෙකු මාසිකව සාමාන්‍යය හෝ කුසලතා පදනම් කරගෙන සම්පූර්ණයෙන් රු. 5050/- හෝ රු. 5000/- මුදලක් පිළිවෙලින් ලබා ගත්තේය.

ආ.) ශිෂ්‍යාධාර

වර්ෂයෙහි ශිෂ්‍යාධාර වශයෙන් එක් ශිෂ්‍යයෙකු විසින් රු.4000/- මුදලක් ලබා ගැනිනි. 2023 වර්ෂයට අදාළ ශිෂ්‍යාධාර සම්බන්ධ සංඛ්‍යාලේඛන පහත දැක්වේ.

වගුව – 02 : ශිෂ්‍යාධාරලාභීන් – 2023 (මාස සහ පීඨ අනුව වර්ගීකරණය කර ඇත)

මාසය	ශිෂ්‍ය සංඛ්‍යා	ශාස්ත්‍ර	අධ්‍යාපන	නීති	කළ. හා මූල්‍ය	භෙද	විද්‍යා	තාක්ෂණ	භෞත වෛද්‍ය	වෛද්‍ය	දේශීය වෛද්‍ය	එකතුව
ජනවාරි	1411	2,752,000	16,000	-	3,816,000	260,000	1,976,000	3,624,000	76,000	ශිෂ්‍යත්වය ඩිසික් ගෙවනු ලැබේ.	FIM ඩිසික් ගෙවනු ලැබේ.	**12,520,000**
පෙබ.	1233	2,344,000	16,000	616,000	-	260,000	1,088,000	800,000	76,000			**5,200,000**
මාර්තු	1561	6,660,000	48,000	600,000	1,332,000	260,000	2,040,000	848,000	76,000			**11,864,000**
අප්‍රේල්	නිවාඩු මාසය											
මැයි	1463	2,076,000	8,000	596,000	1,280,000	136,000	972,000	748,000	76,000			**5,892,000**
ජූනි	1461	2,072,000	8,000	596,000	1,280,000	132,000	932,000	748,000	76,000			**5,844,000**
ජූලි	ජූලි මාසය තුළදී අවසන් කර නොමැති බැවින් ගෙවීම් සිදු කර නොමැත											**-**
අගෝ.	232	648,000	16,000	56,000	320,000	264,000	408,000	136,000	40,000			**1,888,000**
සැප්.	475	804,000	8,000	4,000	476,000	132,000	204,000	68,000	20,000		932,000	**2,648,000**
ඔක්.	481	604,000	8,000	4,000	188,000	132,000	204,000	68,000	20,000		940,000	**2,168,000**
නොවැ.	1572	1,980,000	8,000	608,000	1,340,000	140,000	740,000	692,000	20,000		776,000	**6,304,000**
දෙසැ.	නිවාඩු මාසය											
එකතුව		**19,940,000**	**136,000**	**3,080,000**	**10,032,000**	**1,716,000**	**8,564,000**	**7,732,000**	**480,000**		**2,648,000**	**54,328,000**

ශිෂ්‍ය සංගම්

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 115 සහ 116 වගන්තිවලට අනුව විශ්වවිද්‍යාල ශිෂ්‍ය සමිති සහ විශ්වවිද්‍යාල ශිෂ්‍ය සංගම් පිළිගැනීම පාලක සභාවෙහි එකඟතාව ඇතිව සිදු කළ යුතු ය. 2023 සමාලෝචිත වර්ෂය තුළ, විශ්වවිද්‍යාලය තුළ ලියාපදිංචි වී ඇති එවැනි ශිෂ්‍ය සංගම් පනස් තුනක් (53) ඇත.

ප්‍රථම උපාධි අපේක්ෂක සිසුන් සඳහා නේවාසිකාගාර පහසුකම් ලබා දීම

මේ වන විට කොළඹ විශ්ව විද්‍යාලයේ ස්ථිර නේවාසිකාගාර දහහතරක් (14) තාවකාලික පෞද්ගලික නිවාසයක් ඇත. පහත දක්වා ඇති අයුරින් සිසුන් සඳහා නේවාසික පහසුකම් පවතී.

වගුව – 03 : විශ්වවිද්‍යාල විද්‍යාර්ථීන් සඳහා නේවාසිකාගාර පහසුකම් – 2023

	නේවාසිකාගාරය	ශිෂ්‍ය සංඛ්‍යාව
01	බ්ලොම්ෆොන්ටේන් පිරිමි	388
02	බුලර්ස් කාන්තා	430
03	ද සේරම් 215 කාන්තා	232
04	ද සේරම් 220 කාන්තා (නව)	280
05	හැව්ලොක් කාන්තා	478
06	කිත්‍යාකර පිරිමි	250
07	කාලිංග මාවත කාන්තා (නව)	560
08	තෙලවල කාන්තා	400
09	තෙලවල පිරිමි	400
10	සිව චින්නතම්බි කාන්තා	40
11	හෙද නේවාසිකාගාරය පිරිමි	109
12	හෙද නේවාසිකාගාරය කාන්තා	240

13	තාක්ෂණ පිරිමි	400
14	තාක්ෂණ කාන්තා	400
15	භික්ෂු නේවාසිකාගාරය	20
	එකතුව	**4627**

වගුව – 04 : කුලියට ලබා ගත් ගොඩනැගිලිවල සිසුන් සඳහා නේවාසික පහසුකම් - 2023

නිවස / ශිෂ්‍ය සංඛ්‍යාව	
ඩැනිස්ටර් සිල්වා මාවත (භික්ෂු)	**20**
එකතුව	**20**

වගුව – 05 : ශිෂ්‍ය නිවාසවල වාර්ෂික කුලිය – 2023

නේවාසිකාගාරය	වාර්ෂික කුලිය (රු.)
71/3,71/4, ග්‍රීන් පාත්, කොළඹ 07. (භික්ෂු) 31.06.2023 දක්වා ගෙවීම් කර ඇත. (31.06.2023 දින භාර දෙන ලදී)	2,070,000/-
ඩැනිස්ටර් සිල්වා මාවත (භික්ෂු) 01.07.2023 සිට කුලියට ගැනිනි.	900,000/-
එකතුව	**2,970,000/-**

ශිෂ්‍යයන්ගේ නේවාසිකාගාරවල පරිභෝජන වියදම්

වගුව – 06 : සිසුන්ගේ නේවාසිකාගාර/නිවාසවල උපයෝගිතා පරිභෝජනය – 2023

නේවාසිකාගාරය	විදුලිය (රු.)	ජලය (රු.)	දුරකතන (රු.)	පුවත්පත් (රු.)
හැවිලොක් කාන්තා	2,553,766.68	2,233,849.38	13,478.81	35,820.00
බූලර්ස් කාන්තා	2,214,031.60	1,409,598.55	7,461.63	-
කාලිංග මාවත කාන්තා	3,973,882.13	1,666,417.83	7,752.79	-
ද සේරම් 220 කාන්තා (නව)	2,071,661.55	1,085,770,60	14,217.58	27,120.00
තෙලවල කාන්තා	2,765,236.71	5,284,646.38	14,778.98	-
තෙලවල පිරිමි			24,593.12	-
කිත්‍යාකර පිරිමි	5,356,922.42	2,076.958.90	15,377.00	30,030.00
සිව විත්තතම්බි කාන්තා	1,031,854.40	227,316.12	9,285.00	29,290.00
71/3,71/4, ග්‍රීන් පාත්, (භික්ෂු)	244,364.50	224,620.70	-	16,440.00
දෙමටගොඩ නේවාසිකාගාරය	101,655.80	83,092.62	-	-
එකතුව	**20,313,348.79**	**14,292,272.08**	**106,944.91**	**138,700.00**

වෛද්‍ය රක්ෂණ ක්‍රමය

2023 වසර සඳහා සෞඛ්‍ය සුබසාධන ක්‍රමය 01.01. 2023 දින සිට ක්‍රියාත්මක වන පරිදි මාස දොලහක කාලයක් සඳහා දීර්ඝ කරන ලදී . එහි රක්ෂණ ක්‍රම 03ක් (ක්‍රමය I, II සහ III) වශයෙන් හා තවත් බොහෝ ප්‍රතිලාභ සහිත විය. මෙම රක්ෂණ ක්‍රමයට සම්බන්ධ වූ සාමාජිකයන්ගෙන් පළමු ක්‍රමය යටතේ රු. 200 ද දෙවැනි ක්‍රමය යටතේ රු. 600 ක් ද තෙවැනි ක්‍රමය යටතේ රු. 900 ක් ද මාසිකව අයකර ගැනේ.

ප්‍රතිලාභ පහත පරිදිය:

	I වන සැලසුම	**II වන සැලසුම**	**III වන සැලසුම**
බාහිර	9,000.00	18,000.00	30,000.00
ශල්‍ය සහ රෝහල් ගාස්තු	90,000.00	180,000.00	225,000.00
ඇස් කණ්නාඩි	3,500.00	5,500.00	8,000.00

දිවා සුරැකුම් මධ්‍යස්ථානය / විද්‍යාල මන්දිරය

2006.05.18 දින කොළඹ විශ්වවිද්‍යාලයේ සේවකයින්ගේ වයස අවුරුදු 2 1/2 ත් 12ත් අතර දරුවන් සහ වයස අවුරුදු 3-12 බාහිර දරුවන් සඳහා විශ්වවිද්‍යාලය විසින් දිවා සුරැකුම් මධ්‍යස්ථානයක් ස්ථාපනය කෙරිණි. 2023 වසර තුළ දිවා සුරැකුම් මධ්‍යස්ථානයට දරුවන් 18 දෙනෙක් අලුතින් ඇතුලත් කරගෙන ඇත.

වර්ෂය තුළ දිවාසුරැකුම් මධ්‍යස්ථානයේ ළමුන් 34 දෙනෙකු සිටි අතර මධ්‍යස්ථානයේ කාර්ය මණ්ඩලය එක් පෙර පාසල් ගුරුවරියක, දිවා සුරැකුම් වැඩ සහායකයකු හා උපස්ථායකයකුගෙන් සමන්විත විය.

ශිෂ්‍යත්ව

2023 වසර තුළ ශිෂ්‍ය හා කාර්ය මණ්ඩල අංශය විසින් පහත ශිෂ්‍යත්ව සම්බන්ධව කටයුතු කරන ලදී.

1. නිව් සවුත් වේල්ස් ශිෂ්‍යත්ව පිළිබඳ කොළඹ විශ්වවිද්‍යාලයේ ආදි විද්‍යාර්ථී සංගමය (UCAANSW) කළමනාකරණ සහ මූල්‍ය, විද්‍යා, කලා, තාක්ෂණ සහ හෙද පීඨවල සිසුන් 09 දෙනෙකුට 2023 ජනවාරි සිට 2023 ඔක්තෝබර් දක්වා කාලය සඳහා එක් අයෙකුට මසකට රු. 5,000.00 බැගින් ගෙවන ලදී.

2. මිට්සුබිෂි කෝපරේෂන් ජාත්‍යන්තර ශිෂ්‍යත්වය
විවිප්‍රකෝ හි මහපෙන්වීම යටතේ 2022.09.01 සිට 2023.09.30 දක්වා කාලය සඳහා එක් සිසුවෙකුට රු.58,479.00 බැගින් කළමනාකරණ සහ මූල්‍ය පීඨයේ සිසුන් 15 දෙනෙකු සඳහා ගෙවීම් කරන ලදී.

3. මහාරාජා ශිෂ්‍යත්වය
කළමනාකරණ පීඨයෙන් තෝරාගත් එක් සිසුවෙකුට 2023 වර්ෂය තුළ මසකට රු.2,500.00 බැගින් ගෙවන ලදී.

4. පරිත්‍යාග ශිෂ්‍යත්වය
ශාස්ත්‍ර, කළමනාකරණ සහ තාක්ෂණ අංශයෙන් සිසුන් 4 දෙනෙකු තෝරාගෙන මසකට රු. 2,500.00 බැගින් ගෙවන ලදී.

5. Alliant Rigserv ශිෂ්‍යත්වය
තාක්ෂණ පීඨයෙන් සිසුන් 2 දෙනෙකු තෝරාගෙන එක් සිසුවෙකුට වර්ෂය තුළ මසකට රු. 7,500.00 බැගින් ගෙවන ලදී.

මීට අමතරව, 2023 මැයි මාසයේ සිට පහත සඳහන් කේවල ශිෂ්‍යත්ව ආරම්භ කරන ලදී.

6. **ලංකා ඔටෝමොබයිල් සංගම් ශිෂ්‍යත්ව අරමුදල :**
(පරිත්‍යාගශීලියා- ලංකා ඔටෝමොබයිල් සංගමය)
ශාස්ත්‍ර පීඨයේ තෝරාගත් සිසුන් 05 දෙනෙකුට 2023 මැයි සිට 2023 නොවැම්බර් දක්වා අයෙකුට මසකට රු.5,000.00 බැගින් ගෙවන ලදී.

7. **සුමිත් ආදිහෙට්ටි ශිෂ්‍යත්ව අරමුදල:**
(පරිත්‍යාගශීලියා- සුමිත් ආදිහෙට්ටි මහතා)
කළමනාකරණ සහ මූල්‍ය පීඨයේ සිසුවෙකුට 2023 මැයි සිට 2023 නොවැම්බර් දක්වා කාලය තුළ රු. 5,000.00 බැගින් ගෙවන ලදී.

8. **අනිල් විතාරණ ශිෂ්‍යත්ව අරමුදල :**
(පරිත්‍යාගශීලියා - සුමිත් ආදිහෙට්ටි මහතා)
කළමනාකරණ සහ මූල්‍ය පීඨයේ සිසුවෙකුට 2023 මැයි සිට 2023 නොවැම්බර් දක්වා කාලය තුළ රු. 5,000.00 බැගින් ගෙවන ලදී.

9. **බානගල ශිෂ්‍යත්ව අරමුදල :**
(පරිත්‍යාගශීලියා- බානගල මහතා)
කළමනාකරණ සහ මූල්‍ය පීඨයේ සිසුවෙකුට 2023 මැයි සිට 2023 නොවැම්බර් දක්වා කාලය තුළ රු. 5,000.00 බැගින් ගෙවන ලදී.

10. **ලක්ෂ්මන් කෝට්ටගේ ශිෂ්‍යත්ව අරමුදල :**
(පරිත්‍යාගශීලියා- ලක්ෂ්මන් කෝට්ටගේ මහතා)
විද්‍යා පීඨයේ සිසුවෙකුට 2023 මැයි සිට 2023 නොවැම්බර් දක්වා කාලය තුළ රු. 5,000.00 බැගින් ගෙවන ලදී.

11. **පී ඩී කුලතුංග ශිෂ්‍යත්ව අරමුදල :**
(පරිත්‍යාගශීලියා- පී ඩී කුලතුංග මහතා)
තාක්ෂණ පීඨයේ සිසුවෙකුට 2023 මැයි සිට 2023 නොවැම්බර් දක්වා කාලය තුළ රු. 5,000.00 බැගින් ගෙවන ලදී.

12. **ආචාර්ය පූජ්‍ය පරවාහැර චන්දරතන නාහිමියන්ගේ ශිෂ්‍යත්වය**
සියලුම පීඨ වලින් තෝරාගත් උපාධි අපේක්ෂකයින් 97 දෙනෙකුට (දෙවන වසර සිසුන් පමණි). 2023 මැයි සිට වසර තුනක කාලයක් සඳහා මසකට රු. 5000.00 බැගින් ගෙවනු ලැබේ.

13. **කොළඹ විශ්වවිද්‍යාලයේ ආදි විද්‍යාර්ථී සංගමයේ ශිෂ්‍යත්වය**
සියලුම පීඨවලින් තෝරාගත් පළමු වසරේ උපාධි අපේක්ෂකයින් 46 දෙනෙකුට වසරක කාලයක් සඳහා මසකට රු. 5000.00 බැගින් ගෙවනු ලැබේ.

14. **කොළඹ විශ්වවිද්‍යාලයේ උපාධිධාරී සංගමයේ ශිෂ්‍යත්වය.**
සියලුම පීඨවලින් තෝරාගත් පළමු වසරේ උපාධි අපේක්ෂකයින් 79 දෙනෙකුට පිරිනැමේ. අයෙකුට රු. 5000.00 බැගින් වූ වාරික 10 කි.

15. **කොළඹ විශ්වවිද්‍යාලයේ ආදි විද්‍යාර්ථී සංගමයේ ශිෂ්‍යත්වය.**
සියලුම පීඨ වලින් තෝරාගත් උපාධි අපේක්ෂකයින් 100ක් (1 වන වසර, 2 වන වසර, 3 වසර සිසුන්) සඳහා අයෙකුට රු. 12000.00 ක් බැගින් වාරික 3කින් ලබා දේ.

16. **අධ්‍යාපන වෘත්තිකයන්ගේ සහසුරුවම් හා ණයදෙන සමිතිය - EDCS**
අධ්‍යාපන වෘත්තිකයන්ගේ සහසුරුවම් හා ණයදෙන සමිතිය. (EDCS) : (EDCS විසින් පරිත්‍යාග කරන ලදී)

ඉහත සමිතියේ සාමාජිකත්වය දරන ගුරුවරුන්ගේ දරුවන් වන සිසුන්ට අදාළ වේ. විශ්වවිද්‍යාලය EDCS වෙත ප්‍රගති වාර්තා පමණක් යවා ඇති අතර අදාළ සිසුන් සඳහා EDCS විසින් ගෙවීම් සිදු කරන ලදී.

ලැප්ටොප් පරිගණක ණය

අමාත්‍යාංශය විසින් විශ්වවිද්‍යාල සිසුන්ට ලැප්ටොප් පරිගනක මිලදී ගැනීමට ලබාදුන් පොළී රහිත ණය පහසුකම (රු. 75,000/-) 2023 වසරේද සියලුම පීඨ සඳහා ලබා දුනි.

ආපන ශාලා

විශ්වවිද්‍යාලයෙහි ආපන ශාලා 17 ක් සහ කිරි අලෙවිහල් 04 ක් ඇත. ඉන් හයිලන්ඩ් කිරි අලවිහල සී/ස මිල්කෝ පෞද්. ආයතනයට අයත්වේ. විශ්වවිද්‍යාලය විසින් සී/ස මිල්කෝ පෞද්. ආයතනයෙන් මාසික කුලී වශයෙන් හා පරිභෝජනය කරන විදුලිය වෙනුවෙන් 01.09.2016 දින සිට මුදල් අය කර ගනී. සෑම ආපන ශාලාවකින්ම මාසික කුලිය ලෙස රු. 2000/- ක් හා විදුලි ගාස්තු ලෙස රු. 10,000/- ක් මාසිකව අයකර ගැනේ.

ඡායා පිටපත් සේවය

එක් එක් පීඨවල සහ ප්‍රධාන පුස්තකාලය ද ඇතුළත්ව ඡායා පිටපත් සේවා ස්ථාන 10 ක් පවතී. එක් එක් කොන්ත්‍රාත් කරුගෙන් මාසික කුලිය වශයන් රු.8000, විදුලි බලය වෙනුවෙන් රු. 10000 ක් සහ අතිරේක ඡායා පිටපත් යන්ත්‍රයක් සඳහා රු.1500 ක් වශයෙන් ගාස්තු අය කෙරේ.

වාර ප්‍රවේශ පත්‍ර

ප්‍රථම උපාධි අපෙක්ෂකයන් සඳහා සහන මිලට විශ්වවිද්‍යාලය විසින් දුම්රිය වාර ප්‍රවේශ පත්‍ර ලබා දෙයි.(නේවාසික පහසුකම් නොලැබූ ශිෂ්‍යයන්ට දුම්රිය වාරප්‍රවේශ පත්‍ර ලබා ගැනීමට විශ්වවිද්‍යාලය අවසර ලබා දෙයි.)

7. ප්‍රාග්ධන හා කාර්ය සැලසුම්

ප්‍රාග්ධන වැඩ සහ සැලසුම් කිරීමේ ශාඛාවේ ප්‍රධාන කාර්‍ය වන්නේ පරිශීලක දෙපාර්තමේන්තුවේ අවශ්‍යතා අනුව කොළඹ විශ්වවිද්‍යාලයේ ප්‍රාග්ධන ගොඩනැගිලි ව්‍යාපෘති සැලසුම් කිරීම, ප්‍රසම්පාදනය හා අධීක්ෂණය කිරීම ය. ප්‍රසම්පාදනයට පෙර සහ පසු ක්‍රියාකාරකම් සිදු කිරීම, ඉදිකිරීම් කටයුතු අධීක්ෂණය කිරීම, ව්‍යාපෘති ප්‍රලේඛන හා ගිවිසුම් සන්නිවේදන නඩත්තුව, සහතික කිරීම සහ අතුරු ගෙවීම් සහතික නිකුත් කිරීම, බිල්පත් නිරවුල් කිරීම, ආරවුල් විසඳීම සහ පරීක්ෂණ සම්බන්ධීකරණය කිරීම, ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම හා සාර්ථකව නිම කිරීම භාර ගැනීම මෙම කාර්යයන්ට අයත් වේ.

ප්‍රාග්ධන කාර්ය හා ක්‍රම සම්පාදන අංශය සමාලෝචිත වර්ෂය තුළ සම්බන්ධ වූ ප්‍රධාන ප්‍රාග්ධන ව්‍යාපෘති පහත පරිදි වර්ග කළ හැක.

I. 2017 වර්ෂයේදී ආරම්භ වී ඉදිරියට ක්‍රියාත්මක වෙමින් පවතින ගොඩනැගිලි සම්බන්ධ ව්‍යාපෘති
II. 2018 වර්ෂයේදී ආරම්භ වී ඉදිරියට ක්‍රියාත්මක වෙමින් පවතින ගොඩනැගිලි සම්බන්ධ ව්‍යාපෘති
III. 2019 වර්ෂයේදී ආරම්භ වී ඉදිරියට ක්‍රියාත්මක වෙමින් පවතින ගොඩනැගිලි සම්බන්ධ ව්‍යාපෘති
IV. කැබිනට් අනුමැතිය ලබා ගැනීමට අපේක්ෂිත නව ඉදිකිරීම් ව්‍යාපෘති
V. පුනරුත්ථාපන හා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘති

	ප්‍රජා සත්කාරය	▪ ප්‍රාදේශීය ප්‍රජාව සහ පාර්ශවකරුවන් ඉලක්ක කරගනිමින් UNDP අරමුදල් ව්‍යාපෘතිය යටතේ Lot 2- සාමාන්‍ය දැනුවත් කිරීම, දේශගුණය/කාලගුණ තොරතුරු සහ දේශගුණික සහ කාලගුණික සුහුරු කෘෂිකර්මය, දේශගුණික විපර්යාස අවම කිරීම සහ අනුවර්තනය පිළිබඳ පුහුණු වැඩසටහන් ආදිය පවත්වනු ලැබේ. ප්‍රාදේශීය ප්‍රජාවන් සහ පාර්ශවකරුවන් සඳහා පුහුණු වැඩසටහන් සංවිධානය කිරීම ඇතුළත් "Lot 2" නම් ව්‍යාපෘතියකට UNDP අරමුදල් සපයයි. මෙම වැඩසටහන් දේශගුණය සහ කාලගුණය, දේශගුණික විපර්යාස, සහ දේශගුණික විපර්යාස සමඟ කටයුතු කිරීමේ උපාය මාර්ග (අවම කිරීම සහ අනුවර්තනය වැනි) වැනි මාතෘකා කෙරෙහි

අරමුණ	ක්ෂේත්‍රය	දායකත්වය/ දායකත්වයන්
		අවධානය යොමු කරයි. මෙය පාරිසරික වශයෙන් තිරසාර හා දේශගුණික විපර්යාසවලට ඔරොත්තු දෙන ගොවිතැන් පිළිවෙත් ඇතුළත් "දේශගුණික- සුහුරු කෘෂිකර්මය" ද ආවරණය කරයි. http://lankajalani.org/gwp-core-activities/
	පරිපාලනය	▪ හරිත විශ්වවිද්‍යාලයක් කරා. ▪ https://cmb.ac.lk/path-towards-a-green-university/ https://fos.cmb.ac.lk/blog/carbon-footprint-faculty-science-university-colombo-year-2014/ ▪ https://www.pressreader.com/sri-lanka/sunday-times-sri-lanka/20200809/281522228437363
14 LIFE BELOW WATER	පර්යේෂණ	▪ පර්යේෂණ සන්නිවේදනය/ සමුද්‍ර පරිසර විද්‍යාඥ හොල්ගර් ජේම්ස් / උපාධි පාඨමාලා හරහා "මාළු සහ ධීවර කර්මාන්තය ආශ්‍රිතව ඕස්ට්‍රේලියානු වෙරළ වෘක්ෂලතා පරිසර පද්ධතියේ වටිනාකම" පිළිබඳ ආරාධිත දේශනයක් http://archive.cmb.ac.lk:8080/පර්යේෂණ/handle/70130/5526
	ඉගැන්වීම සහ ඉගෙනීම	විද්‍යා පීඨයේ සත්ව විද්‍යා හා පරිසර විද්‍යා අධ්‍යයන අංශයේ විෂය ප්‍රාමාණිකයන් , මාස්ටර්ස් සහ පශ්චාත් උපාධි අධ්‍යයන පාඨමාලා මගින් https://science.cmb.ac.lk/academic/postgraduate-programs/msc-pg-dip-programs/
	ප්‍රජා සත්කාරය	▪ UNDP අරමුදල් සහිත ව්‍යාපෘතියේ ලොට් අංක 1 යටතේ - වාරිමාර්ග හා ජල කළමනාකරණ පුහුණු සංරචක කිහිපයක් ශ්‍රී ලංකාවේ වියළි කලාපයේ වැව් ප්‍රපතන පාදක පරිසර පද්ධති සඳහා වෙන් කර ඇත. http://lankajalani.org/gwp-core-activities/ ▪ විද්‍යා පීඨයේ සත්ව විද්‍යා හා පරිසර විද්‍යා අධ්‍යයන අංශයේ කථිකාචාර්යවරු/ විෂය ප්‍රාමාණිකයෝ මීට සම්බන්ධව සිටිති. විද්‍යාපති / ඩිප්ලෝමා වැඩසටහන් හරහා ද ශිෂ්‍ය සංගම් සහ ආචාර්යවරුන් විසින් පාසල් සිසුන්, ප්‍රාදේශීය ප්‍රජාවන් සහ අත්‍යවශ්‍ය පරිසර පද්ධතිවල අදාළ පාර්ශවකරුවන් සඳහා අධ්‍යාපනික වැඩසටහන් රාශියක් පැවැත්වෙයි. https://science.cmb.ac.lk/academic/postgraduate-programs/msc-pg-dip-programs/ ▪ පරිසර අමාත්‍යාංශය යටතේ ඇති ජාතික කමිටුවල සාමාජිකයන්/ ශ්‍රී ලංකා ජීව විද්‍යා ආයතනයේ වාර්ෂික රැස්වීම්වලදී පර්යේෂණ සන්නිවේදනය හරහා/ ශිෂ්‍ය සංගම් සහ ආචාර්යවරුන් පාසල් සිසුන්, ප්‍රාදේශීය ප්‍රජාවන් සහ අත්‍යවශ්‍ය පරිසර පද්ධතිවල අදාළ පාර්ශවකරුවන් සඳහා අධ්‍යාපනික වැඩසටහන් රාශියක් පවත්වයි. https://science.cmb.ac.lk/cmm/research/ ▪ ආචාර්යවරුන්ගේ උපදේශන සහ ස්වේච්ඡා සේවය https://science.cmb.ac.lk/zoology/ ▪ ජපාන ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිතායතනයේ (JICA) ආධාර යටතේ ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධන සහයෝගීතාව සමඟ එක්ව කොළඹ මහනගර ප්‍රදේශයේ තෝරාගත් ප්‍රදේශවල ජල අපවහන සැලැස්ම සඳහා වූ ව්‍යාපෘතිය පිළිබඳ උපාය මාර්ගික පාරිසරික තක්සේරුව

අරමුණ	ක්ෂේත්‍රය	දායකත්වය/ දායකත්වයන්
		යටතේ කළුඔය සහ බොල්ගොඩ ද්‍රෝණියේ ජලයේ ගුණාත්මක බව නිරීක්ෂණය කෙරේ. එම පරිසර පද්ධති දෙකෙහි තත්ත්වය නිරීක්ෂණය කිරීම සඳහා ශාක හා සත්ත්ව සමීක්ෂණ පවත්වන ලදී https://science.cmb.ac.lk/cmm/පර්යේෂණ/
	පරිපාලනය	
	පර්යේෂණ, ඉගැන්වීම සහ ඉගෙනීම ප්‍රජා සත්කාරය	පහත උත්සව සත්ව විද්‍යා සහ පරිසර විද්‍යා අධ්‍යයන අංශයේ BEEZ ශිෂ්‍ය සංගමය විසින් සංවිධානය කරන ලදී. ඒ සියල්ලම සාමාන්‍ය ජනතාවට විවෘත විය. Webinar on Celebrating “Biodiversity” https://www.facebook.com/BEEZUOC/posts/2653606951542204 Program for 30th Anniversary of Bellanwila- Attidiya Bird Sanctuaryhttps: www.facebook.com/BEEZUOC/posts/2703429396559959 Nature’s lap: 1- Lecture on “Climate Change Impacts to the Mangrove Biodiversity and Possible Solutions to Mitigate the Impacts” – https://www.facebook.com/1619322324970677/posts/2756626897906875/- Nature’s lap:2- Lecture on “Tools for Sustainable Development”- https://www.facebook.com/1619322324970677/posts/2766389410263957/ https://fb.watch/2AajD9nzHV/ Nature’s lap 3- Lecture on “From Hanuman to Humboldt”- https://www.facebook.com/1619322324970677/posts/2776976569205241/ https://www.facebook.com/1619322324970677/posts/2780315172204714/ https://fb.watch/2AamHiwZBO/ Nature’s lap Special- Our පර්යේෂණers at the Department of Zoology and Environment Sciences of විද්‍යා පීඨය, University of Colombo came up with another brand-new introduction of a bird species in Sri Lanka. https://www.facebook.com/1619322324970677/posts/2827194820850082/ https://www.facebook.com/1619322324970677/posts/2837526343150263/ https://fb.watch/2AasPxlMV1/ Workshop: Wildlife Videography- as a pre-session for the Nature Videography competition organized in celebration of the 100th Anniversary of the විද්‍යා පීඨය, University of Colombo https://www.facebook.com/1619322324970677/posts/2836716489897915/ https://www.facebook.com/1619322324970677/posts/2837365979832966/
	ඉගැන්වීම සහ ඉගෙනීම	• ප.උ. අධ්‍යයන පීඨය ශ්‍රී ලංකා පරිපාලන සේවාවන්හි නිලධාරීන් ඉලක්ක කර ගනිමින් රාජ්‍ය පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය සහ කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව පිරිනමයි.

අරමුණ	ක්ෂේත්‍රය	දායකත්වය/ දායකත්වයන්
	ප්‍රජා සත්කාරය	▪ දේශීය, කලාපීය හෝ ජාතික රජයට නිශ්චිත විශේෂඥ උපදෙස් ලබා දීම (උදා: ප්‍රතිපත්ති මාර්ගෝපදේශය හරහා, කමිටුවලට සහභාගී වීම, සාක්ෂි දීම) ▪ සභාපති, මූල්‍ය ප්‍රතිපත්ති උපදේශක කමිටුව, මහ බැංකුව, පෞද්ගලික දේශීය විශ්වවිද්‍යාල සඳහා ශාස්ත්‍රීය උපදේශනය, ජාතික කාර්මික ප්‍රතිපත්ති සංවර්ධනය සඳහා කණ්ඩායම් නායක, කාර්මික හා ආර්ථික ප්‍රතිපත්ති පර්යේෂණ මධ්‍යස්ථානයේ (CERIPA) සම-නිර්මාතෘ සහ හිටපු අධ්‍යක්ෂ, කොළඹ විශ්වවිද්‍යාලයේ විශ්වවිද්‍යාල-කර්මාන්ත කුටියෙහි සම-නිර්මාතෘ සහ හිටපු අධ්‍යක්ෂ ▪ ප්‍රතිපත්තිමය තීරණ ගැනීමේදී සහාය ලබා දෙන ජාතික විද්වත් කමිටුවල විශ්වවිද්‍යාලයට නියෝජනය කරමින් සේවය කරන සාමාජිකයෝ සිටිති. සබැඳිය: https://www.res.cmb.ac.lk/zoology/erandathie-lokupitiya/ ▪ වෛද්‍ය අධ්‍යාපන හා රෝහල් කමිටුව, ආයුර්වේද වෛද්‍ය සභාව, ආයුර්වේද සූත්‍ර කමිටුව, Covid 19 වසංගතයට එරෙහිව සටන් කිරීම ග්‍රාමීය හා ආයුර්වේද සංවර්ධන සහ මහජන සෞඛ්‍ය ප්‍රවර්ධනය සඳහා දේශීය වෛද්‍ය ක්‍රමයේ ජාතික කමිටුව, ආයුර්වේද සහ යුනානි සඳහා අත්‍යවශ්‍ය ඖෂධ ලැයිස්තුව, ආයුර්වේද හා යුනානි WHO ක්‍රියාකාරී කණ්ඩායම් සම්මත පාරිභාෂිතය, සාම්ප්‍රදායික වෛද්‍ය විද්‍යාව සහ පර්යේෂණ සංවර්ධනය, මිනමාටා සහ බාසල් සම්මුති නියාමන කමිටුව ▪ වෛද්‍ය පීඨයේ කාර්යයන්: ශ්‍රී ලංකාව සඳහා ආහාර පදනම් කරගත් ආහාර මාර්ගෝපදේශ සංවර්ධනය සඳහා පීඨ කාර්ය මණ්ඩලය දායක වී ඇත. සෞඛ්‍ය අමාත්‍යාංශයේ ආහාර උපදේශන කමිටුවේ ආහාර ලේබල් කිරීමේ අනු කමිටුව, පෝෂණ හා දේශීය වෛද්‍ය පෝෂණ ජෛව රසායන විද්‍යාඥ සහ ශ්‍රී ලංකා සෞඛ්‍ය අමාත්‍යාංශයේ පෝෂණ සන්නිවේදනය පිළිබඳ අනුකමිටුව ▪ රජයේ දෙපාර්තමේන්තු සමග සහයෝගයෙන් ප්‍රතිපත්ති කේන්ද්‍ර කරගත් පර්යේෂණ සිදු කිරීම ▪ ළමයින් සුරැකීමේ ව්‍යාපෘතිය / දරුවන්ට එරෙහි මාර්ගගත හිංසනය පිළිබඳ දකුණු ආසියාවේ පළමු අධ්‍යයනය, ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක විද්‍යාලය විසින් යෝජනා කරන ලද ජාතික ආරක්ෂාව සහ උපාය මාර්ගික අධ්‍යයන පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය සඳහා විෂයමාලා මොඩියුල සංවර්ධනය කිරීම ප.උ. අධ්‍යයන පීඨය විසින් භාර ගන්නා ලදී. ජාතික අවශ්‍යතාවයකට දායක වන ප.උ. අධ්‍යයන පීඨය, අනෙකුත් රාජ්‍ය ආයතන සමඟ සහයෝගයෙන් පවත්වනු ලබන SLQF/ දැනට ක්‍රියාත්මක වන ප්‍රතිපත්ති කේන්ද්‍ර කරගත් ආචාර්ය උපාධි පර්යේෂණ කටයුතුවලට සමගාමීව පාඨමාලා මොඩියුල සංවර්ධනය කිරීමට දායක වන විෂය විශේෂඥයින් සමඟ NDC සඳහා සහය දැක්වීමට කටයුතු කළේය. https://sparc.cmb.ac.lk/?page_id=406 ▪ විද්‍යා පීඨය: පිළිබඳ ලේඛනයක් ස්ථාපිත කිරීම, ගුණාත්මක සත්කාර වැඩිදියුණු කිරීමේ වැඩසටහන් පිළිබඳ පර්යේෂණ. COVID-19ට එරෙහි සටන: මතුවන සහ නැවත නැවත මතුවන ආසාදන පිළිබඳ සම්මන්ත්‍රණයේ "අනාගත වසංගත වැළැක්වීම: ග්‍රහලෝක මට්ටමෙහි සෞඛ්‍ය ප්‍රතිචාරයක් ගවේෂණය කිරීම" පිළිබඳ ඉදිරිපත් කිරීම. SLMA සංවත්සරය. ජාත්‍යන්තර වෛද්‍ය සම්මේලනයෙහි 133 වැනි සංවත්සරය. 2020 ජූලි 22 සිට 24 දක්වා. කොළඹ (සූම්). 2020 ලෝක ප්‍රජා විද්‍යා දිනයේ "COVID-19, සමාජ-

අරමුණ	ක්ෂේත්‍රය	දායකත්වය/ දායකත්වයන්
		ආර්ථික අනාරක්ෂිතතා සහ සෞඛ්‍යය'' පිළිබඳ ඉදිරිපත් කිරීම: Covid-19ට තිරිංග දැමීම. කොළඹ විශ්වවිද්‍යාලයේ ප්‍රජා විද්‍යා අධ්‍යයනාංශය.
17 PARTNERSHIPS FOR THE GOALS	**පර්යේෂණ ඉගැන්වීම සහ ඉගෙනීම**	• පෝෂණය සඳහා කෘෂිකර්මය සහ ආහාර පද්ධති පිළිබඳ ගෝලීය මණ්ඩලය විසින් සිදු කළ "අනාගත ආහාර පද්ධති: මිනිසුන් අපගේ ග්‍රහලෝකය සහ සමෘද්ධිය සඳහා, " පිළිබඳ ප්‍රකාශනය සම සමාලෝචනය කරන ලදී. https://foresight.glopan.org/ ▪ ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් දකුණු ආසියාවේ කාන්තා ලිංගික සෞඛ්‍ය අයිතීන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ ප්‍රශස්ථ භාවිතයන් වර්ධනය කිරීම පිළිබඳ කලාපීය රැස්වීම්වලට පීඨ සාමාජිකයෝ සහභාගී වෙති. සංස්කරණය කළේ රුබිනා සොහේල් සහ නරේන්ද්‍ර මල්හෝත්‍රා, ශ්‍රී ලංකාවේ තත්ව විශ්ලේෂණය පිළිබඳ පරිච්ඡේදය - මහාචාර්ය අතුල කළුආරච්චි සහ ආචාර්ය යූ.ඩී.පී.රත්නසිරි ▪ විද්‍යාව සහ ප්‍රතිපත්ති ප්‍රවර්ධනය සඳහා ජාත්‍යන්තර ජාලයට දායක වීම- මෙම කාල සීමාව තුළ AuthorAID විසින් සංවිධානය කරන ලද මාර්ගගත පර්යේෂණ පුහුණු වැඩසටහන් (MOOCS) දෙකක ආගන්තුකයන් සඳහා පහසුකම් සපයන්නා ලෙස කටයුතු කළේය. AuthorAID හි භාරකරු - උපදේශක සැලසුම් කණ්ඩායමේ සාමාජික - උපදේශකත්වය පිළිබඳ ජාත්‍යන්තර නියමු අධ්‍යයනයක් පවත්වන ලදී. සම-සමාලෝචනය කරන ලද ජාත්‍යන්තර සඟරාවල ප්‍රකාශයට පත් කිරීම සඳහා පර්යේෂණ පත්‍රිකා ලිවීමට දේශීය පර්යේෂකයින්ට සහාය වීම සඳහා ලේඛන සමාජ සංවර්ධනය කරන ලදී. අනෙකුත් උසස් අධ්‍යාපන ආයතනවලද ලේඛන සමාජ පිහිටුවා ඇත. OWSD හි සාමාජික - තරුණ කාන්තා විද්‍යාඥයින් ප්‍රවර්ධනය කිරීම සඳහා පර්යේෂණවල ජයග්‍රහණ ප්‍රදර්ශනය කිරීමට ආරාධිත විද්‍යාඥයෙකු බවට පත් විය - OWSD විසින් වීඩියෝවක් සකස් කරන ලදී. https://blog.inasp.info/writing-clubs-medical-research-communication-sri-lanka , https://www.eventbrite.co.uk/e/authoraid-webinar-wellbeing-in-academia-tickets-188183892087 https://www.youtube.com/watch?v=9SBwJMwH4Ls
	පරිපාලනය	▪ **ජාත්‍යන්තර සහයෝගිතා සහ පර්යේෂණ හරහා තිරසාර සංවර්ධන ඉලක්ක සඳහා දායක වීමේ හවුල්කාරිත්වය, සංසන්දනාත්මක ප්‍රවේශයන් සමාලෝචනය කිරීම සහ තිරසර සංවර්ධන ඉලක්ක (SDGs)** වලට මුහුණ දීම සඳහා **ජාත්‍යන්තර ප්‍රශස්ත භාවිතයන් ප්‍රවර්ධනය කිරීම** විශ්වවිද්‍යාලය බොහෝ ජාත්‍යන්තර සහයෝගිතාවල නිරත ව සිටී. **https://cmb.ac.lk/colombo-un75-dialogue/** **https://www.facebook.com/earthmates1/posts/231346191933148**

මූල්‍යමය සමාලෝචනය

2024 අගෝස්තු 13

විගණකාධිපති වෙත

මූල්‍යමය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණ නියෝජනය

94, කුමාරතුංග මුනිදාස මාවත, කොළඹ 03 ලිපිනයේ පිහිටි කොළඹ විශ්වවිද්‍යාලයේ 2023-12-31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන විගණනයට සහ 2023- 01-01 දින සිට 2023-12-31 දක්වා කාලයට අදාළව ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශන, අදාළ සියලු අංශවලින්, මූල්‍ය තත්ත්වය, මෙහෙයුම්වල ප්‍රතිඵල සහ මුදල් ප්‍රවාහයන් ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සාධාරණ ලෙස ඉදිරිපත් කර ඇත්ද යන්න පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීම සඳහා අපි මෙම ලිපිය සපයන්නෙමු. ශ්‍රී ලංකාවේ රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව මූල්‍ය ප්‍රකාශනවල මූල්‍ය තත්ත්වය, මෙහෙයුම්වල ප්‍රතිඵල සහ මුදල් ප්‍රවාහයන් පිළිබඳ සාධාරණ ඉදිරිපත් කිරීමකට අප වගකිව යුතු බව අපි තහවුරු කරමු.

මෙම ලිපියේ සමහර නිරූපණයන් සැලකියයුතු කරුණු වලට සීමා වේ. පවතින තත්වය යටතේ, මෙහි තොරතුරු මත යැපෙන සාධාරණ පුද්ගලයෙකුගේ විනිශ්චය වෙනස් කිරීමට හෝ මඟ හැරීම මගින් බලපෑම් කිරීමට ඉඩ ඇති ගිණුම් තොරතුරු මඟ හැරීමක් හෝ වැරදි ලෙස අර්ථ දැක්වීමක් සිදුවුවහොත් එම අයිතමයන්හි ප්‍රමාණය නොසලකා ඒවා සැලකිය යුතු කරුණු ලෙස ගනන් ගැනේ.

විගණනයේදී ඔබට ඉදිරිපත් කරන ලද පහත දැක්වෙන නිරූපණයන් (විගණකාධිපති වාර්තාවේ දිනය අනුව) අපගේ දැනුම සහ විශ්වාසය අනුව උපරිම ලෙස අපි තහවුරු කරමු.

1. ඉහත සඳහන් මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව සාධාරණ ලෙස ඉදිරිපත් කර ඇති අතර පෙර වර්ෂයට අනුකූලව සකස් කර ඇත.

2. අප විසින් විගණකාධිපති වෙත පහත සඳහන් සියල්ල සපයා ඇත:
අ.) විගණකාධිපති විසින් ඉල්ලා සිටින ලද මූල්‍ය සටහන් හා වෙනත් තොරතුරු
ආ.) අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් හා අධ්‍යක්ෂ කමිටු රැස්වීම් වාර්තා සහ මෙතෙක් වාර්තා සකසනු නොලැබූ මෑතකාලීන රැස්වීම්වල සාරාංශ

3. මූල්‍ය හෝ වෙනත් වාර්තාකරණ පිළිවෙත් වලට අනුකූල නොවීම හෝ අඩුපාඩු පිළිබඳව නියාමන ආයතනවලින් කිසිදු සන්නිවේදනයක් ලැබී නොමැත.

4. මූල්‍ය ප්‍රකාශනවල අධස්ත ගිණුම් වාර්තා වල නිසි ලෙස සටහන් වී නොමැති ද්‍රව්‍යමය ගනුදෙනු නොමැත.

5. පහත සඳහන් අන්දමේ කිසිවක් සිදුව නැත:
අ.) කළමනාකරණය හෝ අභ්‍යන්තර පාලනයෙහි සැලකිය යුතු භූමිකාවක් සහිත සේවකයින් සම්බන්ධ වංචාවක්
ආ.) මූල්‍ය ප්‍රකාශන කෙරෙහි සැලකියයුතු බලපෑමක් ඇති කළ හැකි වෙනත් වංචාවක්

6. වත්කම් හා වගකීම්වල ධාරක වටිනාකමට හෝ වර්ගීකරණයට සැලකියයුතු තරම් බලපාන සැලසුම් හෝ අභිප්‍රායන් විශ්වවිද්‍යාලයට නොමැත.

7. ආයතනය සහ පාලක සභාවෙහි ඕනෑම සාමාජිකයෙකු අතර ඇති සියලුම ගිවිසුම් කොළඹ විශ්වවිද්‍යාලයේ ගනුදෙනු පිළිබඳ ඍජු හෝ වක්‍ර උනන්දුවක් නොදක්වයි.

8. පහත සඳහන් කරුණු මූල්‍ය ප්‍රකාශනවල නිසි ලෙස සටහන් කර හෝ අනාවරණය කර ඇත:

අ.) ගාස්තු ලෙස ලද ආදායම්, මිලදී ගැනීම්, ණය, මාරුවීම්, කල්බදු විධිවිධාන සහ ඇපකර ඇතුළුව අදාළ පාර්ශවීය ගනුදෙනු සහ අදාළ පාර්ශවයන්ගෙන් ලැබිය යුතු හෝ ගෙවිය යුතු මුදල්.

ආ.) විශ්වවිද්‍යාලය අවිනිශ්චිත වගකීමක් වන ලිඛිත හෝ වාචික ඇපකර

9. පහත සඳහන් අන්දමේ කිසිවක් සිදුව නැත:

අ.) මූල්‍ය ප්‍රකාශනවල අවිනිශ්චිතතාවයක් ලෙස හෙළිදරව් කිරීම සඳහා සලකා බැලිය යුතු නීති හෝ රෙගුලාසි උල්ලංඝනය කිරීම් හෝ විය හැකි උල්ලංඝනයන්.

ආ.) අපගේ නීතිඥයා අපට උපදෙස් දී ඇති ප්‍රකාශ නොකළ හිමිකම් හෝ ලැබීමට ඉඩ ඇති හිමිකම් මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය වීමක්

ඇ.) උපචිත හෝ අනාවරණය කිරීමට අවශ්‍ය වන වගකීම් හෝ ලාභ හෝ අලාභ අවිනිශ්චිතතාවයන්

ඈ.) විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්මෙහි හැකියාව පිළිබඳ සැලකිය යුතු සැකයක් ඇතිවිය හැකි සිදුවීම් හෝ කොන්දේසි වලට අදාළ සැලකියයුතු අවිනිශ්චිතතාවයක්

10. අනුකූල නොවීමකදී මූල්‍ය ප්‍රකාශන කෙරෙහි සැලකියයුතු බලපෑමක් ඇති කළ හැකි කොන්ත්‍රාත් ගිවිසුම්වල සියලු අංශවලට ආයතනය අනුකූල වී ඇත.

11. නිෂ්පාදන පෙළ හෝ වෙනත් සැලසුම් හෝ අභිප්‍රායන් අත්හැරීමට හෝ කිසියම් අතිරික්ත හෝ යල් පැන ගිය තොග ඇති වන අන්දමෙහි කිසිදු සැලසුමක් අප සතුව නොමැති අතර, ශුද්ධ සාක්ෂාත් කරගත හැකි අගයට වඩා වැඩි ප්‍රමාණයකින් බඩු තොග ප්‍රකාශ කර නොමැත.

12. විශ්වවිද්‍යාලයට සියළුම වත්කම් සඳහා සතුටුදායක හිමිකම් ඇති අතර මූල්‍ය ප්‍රකාශන 2.2.1 (ආ.) සටහනෙහි දක්වා ඇති පරිදි හැර විශ්වවිද්‍යාලයේ වත්කම් සඳහා වගකීම් හෝ බැඳීම් නොමැත.

13. අපගේ කිසිදු මුදල් හා ආයෝජන ගිණුම් සමඟ විධිමත් හෝ අවිධිමත් වන්දි ශේෂ විධිවිධාන නොමැත.

14. ප්‍රාග්ධන කොටස් නැවත මිලදී ගැනීමේ විකල්පයන් සහ ගිවිසුම් සහ විකල්පයන් සඳහා වෙන් කර ඇති ප්‍රාග්ධන සංචිත සහ වෙනත් අවශ්‍යතා පිළිබඳව අප විසින් මූල්‍ය ප්‍රකාශනවල නිසි ලෙස වාර්තා කර හෝ හෙළිදරව් කර ඇත.

අපගේ උපරිම දැනුම සහ විශ්වාසය අනුව, ශේෂ පත්‍රයේ දිනට පසුව මෙම ලිපියේ දැක්වෙන දිනය තෙක් ඉහත සඳහන් මූල්‍ය ප්‍රකාශයේ ගැලපීම් හෝ අනාවරණය කිරීම් අවශ්‍ය වන කිසිදු සිදුවීමක් සිදුවී නොමැත.

Senior Prof H D Karunaratne
Vice-Chancellor

J T L Dharmasena
Bursar

K.C.S. Perera
Registrar

On behalf of the Council

Nandika Buddhipala

Kusal de Silva

කොළඹ විශ්වවිද්‍යාලය
2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා
මූල්‍ය කාර්ය දර්ශන ප්‍රකාශය

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා	සටහන	2023 (රු.)	2022 (රු.)
ආදායම්			
පුනරාවර්තන			
විනිමය නොවන ගනුදෙනු වලින් ලැබෙන ආදායම් - පුනරාවර්තන			
පුනරාවර්තන වියදම් සඳහා රජයේ ප්‍රදාන		*5,524,000,000*	*4,865,000,000*
ශිෂ්‍යාධාර සහ ශිෂ්‍යත්ව		*75,884,000*	*56,285,500*
වෙනත් ප්‍රදාන	*1*	*326,016,913*	*225,446,936*
අභ්‍යන්තර ආදායම්	*2*	*160,736,624*	*62,160,598*
විනිමය නොවන ගනුදෙනු වලින් ලැබෙන මුළු ආදායම් - පුනරාවර්තන		**6,086,637,537**	**5,208,893,034**
ආදායම්			
විනිමය ගනුදෙනු වලින් ලැබෙන ආදායම් - පුනරාවර්තන			
අභ්‍යන්තර ආදායම්	*3*	*3,116,379,475*	*2,791,758,271*
විනිමය ගනුදෙනු වලින් ලැබෙන මුළු ආදායම් - පුනරාවර්තන		**3,116,379,475**	**2,791,758,271**
මුළු ආදායම් - පුනරාවර්තන		**9,203,017,012**	**8,000,651,305**
ප්‍රාග්ධනය			
විනිමය නොවන ගනුදෙනු වලින් ලැබෙන ආදායම් -ප්‍රාග්ධන			
ප්‍රාග්ධන ප්‍රදාන		*487,371,474*	*2,850,616,299*
ප්‍රාග්ධන ප්‍රදාන - අභ්‍යන්තර අරමුදල්		*392,065,203*	*378,328,462*
ත්‍යාග සහ පරිත්‍යාග		*113,596,143*	*18,172,605*
විනිමය නොවන ගනුදෙනු වලින් ලැබෙන මුළු ආදායම් -ප්‍රාග්ධන		**993,032,821**	**3,247,117,366**
මුළු ආදායම් - ප්‍රාග්ධන		**993,032,821**	**3,247,117,366**
මුළු ආදායම		**10,196,049,833**	**11,247,768,671**
වියදම්			
පුනරාවර්තන			

පෞද්. වැටුප් සහ වේතන	*4*	*5,330,643,337*	*4,954,168,381*
වෙනත් පුනරාවර්තන වියදම්	*4*	*1,855,165,552*	*1,193,881,508*
ශිෂ්‍යාධාර සහ ශිෂ්‍යත්ව වියදම්	*4*	*75,884,000*	*56,285,500*
ප්‍රතිසංස්කරණ පුනරාවර්තන වියදම්	*4*	*3,513,505*	*24,342,039*
නිර්වාචිත ප්‍රතිලාභ වගකීම	*15*	*348,486,858*	*131,742,466*
අලාභ	*5*	*12,139,330*	*3,674,458*
AHEAD ව්‍යාපෘතිය	*6*	*317,221,771*	*192,952,376*
මුළු පුනරාවර්තන වියදම් (ප්‍රාග්ධන නොවන ස්වභාවය)		**7,943,054,354**	**6,557,046,727**
ප්‍රාග්ධන			
ක්ෂය	*12*	*1,265,381,073*	*1,356,341,319*
ක්‍රමක්ෂය	*11*	*9,712,300*	*4,110,246*
මුළු ප්‍රාග්ධන වියදම්		**1,275,093,373**	**1,360,451,565**
මුළු වියදම්		**9,218,147,727**	**7,917,498,292**
කාල සීමාව සඳහා අතිරික්තය/(හිඟය)		**977,902,106**	**3,330,270,379**
කාල සීමාව සඳහා පුනරාවර්තන අතිරික්තය/(හිඟය)		*1,259,962,658*	*1,443,604,578*
කාල සීමාව සඳහා ප්‍රාග්ධන අතිරික්තය/(හිඟය)		*(282,060,552)*	*1,886,665,801*
කාල සීමාව සඳහා අතිරික්තය/(හිඟය)		**977,902,106**	**3,330,270,379**

2023 දෙසැම්බර් 31 දිනට


මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

2023 දෙසැම්බර් 31 දිනට	සටහන	2023 (රු.)	2022 (රු.)
වත්කම්			
ජංගම වත්කම්			
මූල්‍ය හා මූල්‍ය පර්යාය	*7*	*501,837,979*	*219,749,925*
අත්තිකාරම් සහ ලැබියයුතු	*8*	*1,226,104,515*	*1,087,520,624*
කාර්ය මණ්ඩලය සඳහා ණය සහ අත්තිකාරම්	*9*	*43,099,528*	*46,893,643*
ආයෝජන	*10*	*477,257,100*	*173,595,583*
බඩු තොග හා කොටස්		*107,249,384*	*90,331,955*
මුළු ජංගම වත්කම්		**2,355,548,507**	**1,618,091,730**
ජංගම නොවන වත්කම්			
අත්තිකාරම් සහ ලැබියයුතු	*8*	*30,476,129*	*76,890,570*
කාර්ය මණ්ඩලය සඳහා ණය සහ අත්තිකාරම්	*9*	*131,854,502*	*104,340,304*
ආයෝජන	*10*	*3,494,450,534*	*2,871,486,472*
අස්පෘශ්‍ය වත්කම්	*11*	*29,828,066*	*11,061,373*
දේපළ, පිරියත හා උපකරණ	*12*	*54,982,286,100*	*52,195,823,728*
කෙරෙමින් පවතින වැඩ	*13*	*1,250,236,712*	*854,808,670*
මුළු ජංගම නොවන වත්කම්		**59,919,132,043**	**56,114,411,117**
මුළු වත්කම්		**62,274,680,550**	**57,732,502,848**
බැරකම්			
ජංගම බැරකම්			
ගෙවිය යුතු	*14*	*552,755,867*	*496,323,723*
මුළු ජංගම බැරකම්		**552,755,867**	**496,323,723**
ජංගම නොවන බැරකම්			
ගෙවිය යුතු	*14*	*-*	*77,095,353*
විශ්‍රාමික ප්‍රතිලාභ වගකීම	*15*	*1,936,521,861*	*1,568,587,320*
මුළු ජංගම නොවන බැරකම්		**1,936,521,861**	**1,645,682,673**
මුළු බැරකම්		**2,489,277,728**	**2,142,006,396**
විලම්බිත ආදායම		*1,874,518,231*	*1,568,486,837*
ශුද්ධ වත්කම්		**57,910,884,591**	**54,022,009,614**
කොටස්/ශුද්ධ වත්කම්			
සංචිත අරමුදල්			
පුනරාවර්තන සංචිත අතිරික්ත/(හිඟ)		*38,198,784,918*	*(1,914,184,964)*
ප්‍රාග්ධන සංචිත අතිරික්ත/(හිඟ)		*17,423,767,120*	*17,312,625,425*
වත්කම් ප්‍රත්‍යාගණන සංචිත		*-*	*36,622,756,070*
මුළු සංචිත අරමුදල්		**55,622,552,038**	**52,021,196,532**
සංචිත සහ සීමිත අරමුදල්			
නාමකළ අරමුදල්	*16*	*2,018,847,107*	*1,786,691,437*
පරිත්‍යාග අරමුදල්		*269,485,447*	*214,121,645*
මුළු සංචිත සහ සීමිත අරමුදල්		**2,288,332,554**	**2,000,813,082**
මුළුකොටස් / ශුද්ධ වත්කම්		**57,910,884,591**	**54,022,009,614**


Prepared by :.....
D.W.Hettige
Asisitant Bursar

Certified by :.....
J.T.L.Dharmasena
Bursar


මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම සඳහා කොළඹ විශ්වවිද්‍යාලයේ පාලක සාමාජිකයින් වගකිව යුතුය. මෙම මූල්‍ය ප්‍රකාශන පාලක සභාව විසින් අනුමත කරන ලද අතර ඒ වෙනුවෙන් අත්සන් කරන ලදී.



Senior Professor H.D. Karunaratne
Vice Chancellor



Kusal De Silva
Council Member



Nandika Buddhipala
Council Member

කොළඹ විශ්වවිද්‍යාලය

කොටස් / ශුද්ධ වත්කම් වෙනස්වීම් ප්‍රකාශය

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

(රු.)

	ප්‍රාග්ධන අතිරික්ත/ හිඟ	සංචිත සහ සීමිත අරමුදල්	වත්කම් ප්‍රත්‍යාගණන සංචිත	පුනරාවර්තන සමුච්චිත අතිරික්ත / (හිඟ	එකතුව
2022 ජනවාරි 01 වන දිනට ශේෂය	**15,425,959,622**	**1,935,467,353**	**36,622,756,070**	**(2,737,269,481)**	**51,246,913,564**
කාල සීමාව සඳහා අතිරික්ත / (හිඟ)	*1,886,665,801*			*1,443,604,578*	*3,330,270,379*
මාරු කිරීම්	-		-	*(646,528,203)*	*(646,528,203)*
ප්‍රතිස්ථාපිත ක්ෂයවීම්	-			*166,503,123*	*166,503,123*
අරමුදලවල ශුද්ධ සංචලන		*(75,149,250)*		-	*(75,149,250)*
ලෝගු කුලියට ගැනීම් ගාස්තු අරමුදලට මාරුකිරීම		*152,450*		*(152,450)*	-
කොන්ත්‍රාත්තු කඩකිරීම් අරමුදලට මාරුකිරීම		*52,330,580*		*(52,330,580)*	-
පොලී ආදායමට මාරු කිරීම -UCDF අරමුදල		*30,213,148*		*(30,213,148)*	-
පොලී ආදායමට මාරු කිරීම - සීමිත අරමුදල්		*57,798,801*		*(57,798,801)*	-
2022 දෙසැම්බර් 31 වනවිට ශේෂය	**17,312,625,425**	**2,000,813,082**	**36,622,756,070**	**(1,914,184,963)**	**54,022,009,614**
කාල සීමාව සඳහා අතිරික්ත / (හිඟ)	*(282,060,552)*	-	-	*1,259,962,658*	*977,902,106*
IIM මාරු කිරීම්	*393,202,247*	*6,312,471*	*3,248,443,009*	*(290,212,969)*	*3,357,744,758*
මාරු කිරීම්	-	-	*(39,871,199,078)*	*39,871,199,078*	-
ප්‍රතිස්ථාපිත ක්ෂයවීම්	-		-	*70,334,949*	*70,334,949*

පුනරාවර්තන සමුච්චිත ශුද්ධ වලන අතිරික්තය / හිඟය	-	*499,856,201*	-	*(499,856,201)*	-
ලෝගු කුලියට ගැනීම් ගාස්තු අරමුදලට මාරුකිරීම	-	*798,300*	-	*(798,300)*	-
කොන්ත්‍රාත්තු කඩකිරීම් අරමුදලට මාරුකිරීම	-	*161,914,751*	-	*(161,914,751)*	-
පොලී ආදායමට මාරු කිරීම -UCDF අරමුදල	-	*32,408,612*	-	*(32,408,612)*	-
පොලී ආදායමට මාරු කිරීම - සීමිත අරමුදල්	-	*103,335,971*	-	*(103,335,971)*	-
සෘජු ලැබීම් සහ අරමුදල් මාරු කිරීම්		*330,304,474*		-	*330,304,474*
ගෙවීම් සහ අරමුදල් මාරු කිරීම්	-	*(847,411,309)*	-	-	*(847,411,309)*
2023 දෙසැම්බර් 31 දිනට ශේෂය	**17,423,767,120**	**2,288,332,554**	**-**	**38,198,784,918**	**57,910,884,591**

කොළඹ විශ්වවිද්‍යාලය

මූල්‍ය සංසරණ ප්‍රකාශය

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා2023

2023 දෙසැම්බර් **31** දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා	**2023** (රු.)	**2022** (රු.)
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් උත්පන්න මූල්‍ය ප්‍රවාහ		
සාමාන්‍ය ක්‍රියාකාරකම්වලින් අතිරික්ත/ හිඟ	*1,259,962,658*	*1,443,604,578*
ගැලපුම්		
විශ්‍රාම ප්‍රතිලාභ වගකීම සඳහා ප්‍රතිපාදන	*348,486,858*	*131,742,466*
පොලී ආදායම	*(719,198,144)*	*(443,887,255)*
උපලබ්ධි නොවූ විදේශ මුදල් ලාභ	*7,585,110*	*(31,598,323)*
බදු පොලිය	*373,190*	*625,990*
ණය ක්ෂය කිරීම	*1,331,877*	-
වත්කම් බැහැර කිරීම මත පාඩු	*3,104,007*	*3,467,490*
කාරක ප්‍රාග්ධන වෙනස්වීම්වලට පෙර මෙහෙයුම් අතිරික්තය	*901,645,556*	*1,103,954,946*
කාරක ප්‍රාග්ධන වෙනස්වීම්		
ගබඩා සහ භාණ්ඩ තොගවල (වැඩිවීම)/ අඩුවීම	*(16,917,429)*	*(15,126,894)*
වෙනත් ලැබිය යුතු ලැබීම්වල (වැඩිවීම)/ අඩුවීම	*(146,886,038)*	*(164,543,912)*
අත්තිකාරම්වල (වැඩිවීම)/ අඩුවීම	*54,716,588*	*80,517,452*
විලම්බිත ආදායම වැඩිවීම/ (අඩුවීම)	*306,031,394*	*(296,257,190)*
ආපසු ගෙවියයුතු තැන්පතු වැඩිවීම/ (අඩුවීම)		-
ගෙවිය යුතු මුදල් වැඩිවීම/ (අඩුවීම)	*(20,663,209)*	*152,033,759*
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් උත්පන්න මුදල් ප්‍රවාහ	*1,077,926,862*	*860,578,162*
පාරිතෝෂික ගෙවීම්	*(193,712,155)*	*(86,185,604)*
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් උත්පන්න ශුද්ධ මුදල් ප්‍රවාහ	*884,214,707*	*774,392,558*
ආයෝජන ක්‍රියාකාරකම් වෙතින් උත්පන්න මුදල් ප්‍රවාහ		
ස්ථාවර වත්කම් අත්පත්කර ගැනීම්	*(259,581,625)*	*(384,301,187)*
කෙරෙමින් පවතින වැඩ	*(323,930,464)*	*(410,877,924)*
ආයෝජන වැඩිවීම්	*(638,859,432)*	*(69,148,966)*
ස්ථාවර වත්කම් බැහැර කිරීමෙන් ශේෂය	*735,454*	*1,246,539*
ආයෝජන වෙතින් පොලී	*496,167,593*	*179,535,385*
රැස්කිරීම් අත්තිකාරම්	*(2,240,126)*	*(26,876,125)*
අභ්‍යන්තර අරමුදලේ ශුද්ධ වැඩිවීම	*(570,378,866)*	*(520,577,020)*
බදුකුලී ගෙවීම්	*(2,611,812)*	*(2,611,812)*
ආයෝජන ක්‍රියාකාරකම් වෙතින් උත්පන්න ශුද්ධ මුදල් ප්‍රවාහ	*(1,300,699,277)*	*(1,233,611,110)*
මූල්‍ය ක්‍රියාකාරකම් වෙතින් උත්පන්න මුදල් ප්‍රවාහ		
ප්‍රාග්ධන වියදම් සඳහා රජයේ ප්‍රදාන	*540,466,505*	*126,500,000*
ප්‍රාග්ධන වියදම් සඳහා විවිප්‍රකො ප්‍රදාන	*86,155,241*	*100,000,000*
ප්‍රාග්ධන වියදම් සඳහා *AHEAD* ප්‍රදාන	*71,950,876*	-

ආයෝජන අඩුවීම්	-	*323,759,265*
මූල්‍ය ක්‍රියාකාරකම් වෙතින් උත්පන්න ශුද්ධ මුදල් ප්‍රවාහ	*698,572,623*	*550,259,265*
වර්ෂය තුළ මූල්‍ය සහ මූල්‍ය පර්යායයෙහි ශුද්ධ වෙනස්කම්	*282,088,053*	*91,040,713*
කාල පරිච්ඡේදය ආරම්භයේදී මූල්‍ය හා මූල්‍ය පර්යාය	*219,749,925*	*128,709,212*
කාල පරිච්ඡේදය අවසානයේදී මූල්‍ය හා මූල්‍ය පර්යාය	*501,837,979*	*219,749,925*
මූල්‍ය හා මූල්‍ය පර්යායයන්හි ශුද්ධ වැඩිවීම/ අඩුවීම	**282,088,054**	**91,040,713**

කොළඹ විශ්වවිද්‍යාලය – ගිණුම්කරණ ප්‍රතිපත්ති

1. ආයතනික තොරතුරු

1.1 නෛතික හා ප්‍රභවාත්මක ස්වරූපය

කොළඹ විශ්වවිද්‍යාලය 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනතින් ස්ථාපිත කර ඇත. එහි ප්‍රධාන පරිපාලනය කොළඹ 3, කුමාරතුංග මුණිදාස මාවතෙහි අංක 94 යන ලිපිනයෙහි පිහිටි විද්‍යාල මන්දිරයෙහි සිදු වෙයි.

විශ්වවිද්‍යාලය පීඨ 10 කින් සමන්විත වේ. එක් එක් පීඨ පහත සඳහන් ස්ථාන වල පිහිටා ඇත:

1. ශාස්ත්‍ර පීඨය - රීඩ් මාවත, කොළඹ 07
2. අධ්‍යාපන පීඨය – බෞද්ධාලෝක මාවත, කොළඹ 07
3. නීති පීඨය - රීඩ් මාවත, කොළඹ 07
4. කළමනාකරණ හා මුල්‍ය පීඨය - බෞද්ධාලෝක මාවත, කොළඹ 07
5. විද්‍යා පීඨය – කුමාරතුංග මුනිදාස මාවත, කොළඹ 03
6. උපාධි අධ්‍යයන පීඨය – 35/30, මහාචාර්ය ස්ටැන්ලි විජේසුන්දර මාවත, කොළඹ 07
7. වෛද්‍ය පීඨය - අංක 25, කිංසි පාර, කොළඹ 08
8. භෙද පීඨය – ශ්‍රී ජයවර්ධනපුර, තලපත්පිටිය, නුගේගොඩ
9. තාක්ෂණ පීඨය - මාහේන්වත්ත, පිටිපන, හෝමාගම
10. දේශීය වෛද්‍ය පීඨය - රාජගිරිය

ශ්‍රී පාලී මණ්ඩපය 1996 දී බටහිර මණ්ඩපය ලෙස ආරම්භ කරන ලදී. පසුව එහි නම ශ්‍රී පාලී මණ්ඩපය ලෙස වෙනස් කරන ලද අතර 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත යටතේ 1998 දී විශ්වවිද්‍යාලයට අනුබද්ධ කරන ලදී . ශ්‍රී පාලී මණ්ඩපය හොරණ, වැවල පිහිටා ඇත.

ඊට අමතරව මූල්‍යමය වශයෙන් ස්වාධීන වන පහත සඳහන් අනුබද්ධ ආයතන හය ද විශ්වවිද්‍යාලය සතුව ඇත.

1. කෘෂි තාක්ෂණ සහ ග්‍රාමීය විද්‍යා ආයතනය (IARS) – වැලිගත්ත නව නගරය, හම්බන්තොට.
2. ජෛව රසායන විද්‍යා, අණුක ජීවවිද්‍යා සහ ජීවතාක්ෂණවේද ආයතනය (IBMBB) – අංක 90, කුමාරතුංග මුනිදාස මාවත, කොළඹ 03.
3. ජාතික පුස්තකාල සහ විඥාපන සේවා ආයතනය (NILIS) - බෞද්ධාලෝක මාවත, කොළඹ 7.
4. මානව සම්පත් අභිවර්ධන ආයතනය (IHRA) - නො: 275, බෞද්ධාලෝක මාවත, කොළඹ 7.
5. වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය (PGIM) - 160, මහාචාර්ය නන්දදාස කෝදාගොඩ මාවත, කොළඹ 07.
6. දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය (PG-IIM) - 5 වන මහල, ආයුර්වේද ශික්ෂණ රෝහල, කොටා පාර, බොරැල්ල.

2007 අංක 7 දරණ සමාගම් පනතේ පළමු උපලේඛනයට අනුකූලව සීමිත වගකීම් සමාගමක් (ඇපකාර) ලෙස කොළඹ විද්‍යා හා තාක්ෂණ කුටිය ස්ථාපිත විය.

2023 පෙබරවාරි 13 බදාදා දිනැති අංක 2319/22 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයට අනුව, 2023 මාර්තු 1 වන දිනට දේශීය වෛද්‍ය පීඨයේ ආයතනය නිල වශයෙන් විශ්වවිද්‍යාලයීය පීඨයක් බවට පත් විය. 2023 පෙබරවාරි 28 දිනට විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශය අනුව, දේශීය වෛද්‍ය ආයතනයේ ගිණුම් වලට ඒකාබද්ධ කරන ලදී.

1.2 **ප්‍රධාන ක්‍රියාකාරකම් සහ මෙහෙයුම් ස්වභාවය**

අ.) සිසුන් ඇතුළත් කර ගැනීම සහ අනුමත කරන ලද ඉගෙනුම් අංශයකින් උපදෙස් ලබා දීම

ආ.) විවිධ ඉගෙනුම් අංශයන්හි ප්‍රවීණතාවය ලබා ඇති පුද්ගලයින් පිළිබඳ තහවුරු කර ගැනීම සඳහා විභාග පැවැත්වීම

ඇ.) ගුරුවරුන්, සිසුන් සහ විද්වතුන් හුවමාරු කර ගැනීමෙන් හෝ වෙනත් ආකාරයකින්, විශ්වවිද්‍යාලයට සමාන හෝ සැලකිය යුතු ලෙස සමාන අරමුණු ඇති ශ්‍රී ලංකාවේ හෝ විදේශයන්හි වෙනත් විශ්ව විද්‍යාල හෝ ආයතන සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම;

ඈ.) පශ්චාත් උපාධි පාඨමාලා සැපයීම සහ මේ සඳහා ශ්‍රී ලංකාවේ හෝ විදේශයන්හි වෙනත් විශ්ව විද්‍යාල හෝ බලධාරීන් සමඟ විශ්වවිද්‍යාලය විසින් තීරණය කරනු ලබන අරමුණු සඳහා සහයෝගයෙන් කටයුතු කිරීම;

ඉ.) විශ්වවිද්‍යාලයේ හෝ පිළිගත් ආයතනයක අනුමත අධ්‍යයන පාඨමාලා හැදෑරූ සහ අතුරු ව්‍යවස්ථා මගින් නියම කර ඇති විශ්ව විද්‍යාලයේ විභාග සමත් වූ පුද්ගලයින්ට සහ උපාධි, ඩිප්ලෝමා සහ වෙනත් අධ්‍යයන සාමාර්ථයන් ලබා දීම

ඊ.) සම ක්‍රියාකාරකමක් ලෙස පර්යේෂණයන්හි නියැලීම සහ දැනුම ප්‍රචාරණය

.

දැක්ම

සමාජයේ අභිවෘද්ධිය උදෙසා මානව හැකියාවන් සුපෝෂණය කිරීම සඳහා අධ්‍යාපනය, පර්යේෂණ හා සිය පාර්ශ්වකරුවන්ගේ සහභාගිත්වය යන අංශයන්ගෙන් ගෝලීයව විශිෂ්ට මධ්‍යස්ථානයක් වීම.

මෙහෙවර

දැනුම සොයා ගැනීම සහ බෙදා හැරීම; නවෝත්පාදන වැඩි දියුණු කිරීම; කර්මාන්තය හා ප්‍රජාව සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම තුළින් විශ්වවිද්‍යාලය පුරා සහ ඉන් ඔබ්බට පුළුල් විමර්ශන සංස්කෘතියක් ප්‍රවර්ධනය කිරීම

1.3. අඛණ්ඩ පැවැත්ම

විශ්වවිද්‍යාලය සිය අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ස්වයං ඇගයීමක යෙදී ඇති අතර දෘශ්‍ය අනාගතයේදී සිය අඛණ්ඩ පැවැත්ම නොපිරිහෙලා පවත්වා ගැනීමට ඇති හැකියාව පිළිබඳ සෑහීමකට පත්වේ. එසේම සිය අඛණ්ඩ පැවැත්ම පිළිබඳ සුවිශේෂී සැක මතුකළහැකි ද්‍රව්‍යමය අස්ථිරතාවයක් පිළිබඳ සනාතන සභාව දැනුම්වත් නොවේ. එබැවින් කොළඹ විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන අඛණ්ඩ පැවැත්ම පිළිබඳ මූලධර්මය මත පදනම්ව සකසා ඇත.

1.4 ගිණුම් කාල පරිච්ඡේදය

විශ්වවිද්‍යාලයේ ගිණුම් කාලපරිච්ඡේදය 2023 ජනවාරි 01 වනදා සිට දෙසැම්බර් 31 වනදා දක්වා වේ.

භාවිතා කර ඇති සියලු මූල්‍ය ප්‍රතිපත්ති පසුගිය වසරෙහිදී භාවිත මූල්‍ය ප්‍රතිපත්ති හා සැසඳෙන අතර අවශ්‍ය තන්හිදී සන්සන්දනය සඳහා අවශ්‍ය අගයන් මෙම වසරෙහි ඉදිරිපත් කිරීම හා සැසඳීමේදී එකී වෙනස් වීම් හා අනුකූලවීම් සඳහා ගළපා ඇත.

1.5 මූල්‍ය ප්‍රකාශන සැකසීමේ පදනම

1.5.1 අනුකූලතාවය පිළිබඳ ප්‍රකාශනය

කොළඹ විශ්වවිද්‍යාලයීය මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනය විසින් නිකුත් කළ රාජ්‍ය ගිණුම් ප්‍රතිපත්තිවලට අනුකූල වන ලෙස පිළියෙල කර ඇත.

මෙම මූල්‍ය ප්‍රකාශන මුල්‍ය කාර්යදර්ශන ප්‍රකාශය, මූල්‍ය තත්ව ප්‍රකාශය, මූල්‍ය සංසරණ ප්‍රකාශනය, කොටස් / ශුද්ධ වත්කම් වෙනස්වීම් ප්‍රකාශය සහ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සටහන්වලින් සමන්විත වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අදාළ වන ප්‍රධාන ගිණුම්කරණ ප්‍රතිපත්ති පහත දක්වා ඇත. වෙනත් ආකාරයකින් ප්‍රකාශ නොකරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කර ඇති සියලුම කාල පරිච්ඡේදයන් සඳහා මෙම ප්‍රතිපත්ති නිරන්තරයෙන් අදාළ වේ

විශ්වවිද්‍යාලයීය ශිෂ්‍ය සංගම්වල සහ කොළඹ විද්‍යා සහ තාක්ෂණ කවුළුවේ මූල්‍ය ප්‍රකාශයන් මෙම මූල්‍ය ප්‍රකාශයන් තුළ අඩංගුකර නොමැත.

1.5.2 මිනුම් පදනම

අදාළ සටහන් යටතේ සාධාරණ වටිනාකම සම්බන්ධයෙන් සුදුසු අනාවරණය කිරීම් සිදු කරනු ලැබුවහොත් හැර, උපචිත පදනම මත සහ ඓතිහාසික පිරිවැය පදනම යටතේ මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇත.

1.5.3. තුලනාත්මක තොරතුරු

වර්තමාන කාලපරිච්ඡේදයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අවබෝධය වැඩි දියුණු කිරීම සහ තුලනාත්මක බව වැඩි දියුණු කිරීම සඳහා මූල්‍ය ප්‍රකාශනවල වාර්තා වී ඇති සියලු මුදල් සඳහා පෙර කාල පරිච්ඡේදයට සාපේක්ෂව ප්‍රමාණාත්මක, ආඛ්‍යානමය හා විස්තරාත්මක තොරතුරු ඇතුළු තුලනාත්මක තොරතුරු මින් අනාවරණය වේ.අවශ්‍ය තැන්හි සංසන්දනාත්මක සංඛ්‍යා වත්මන් වර්ෂය ඉදිරිපත් කිරීමට අනුරූප වන පරිදි නැවත සකස් කර ඇත.

1.5.4. මූල්‍ය ප්‍රකාශනවල වගකීම සහ අනුමැතිය

මූල්‍ය ප්‍රකාශන කෙරෙහි ඔවුන්ගේ වගකීම පිළිගත් කොළඹ විශ්වවිද්‍යාලයීය පාලක සභාව විසින් 2024.02.14 දින පැවති පාලක සභා රැස්වීමේදී මෙම මූල්‍ය ප්‍රකාශන අනුමත කරන ලදී.

1.5.5. ද්‍රව්‍යවාදය සහ සමූහනය

සමාන අයිතම සහිත ද්‍රව්‍ය එක්ව වර්ගීකරණය කර ඇති අතර නොසැලකිය යුතු තරම් කුඩා අසමානතා ඇති අවස්ථාවල හැර ස්වභාවයෙන් හෝ කාර්ය වශයෙන් අසමාන අයිතම වෙන්වෙන්ව දක්වා ඇත.

1.5.6. අනුලම්බගත කිරීම

ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම් ප්‍රතිපත්තිවලින් ඉල්ලා සිටින විට හෝ අවසර දෙන අවස්ථාවල හැර වෙනත් කිසිම ටක වත්කම් හා බැරකම්, අය සහ වැය අනුලම්බගත කර නැත.

1.5.7. කෘත්‍යාත්මක සහ ව්‍යාවහාරික මුදල් ඒකකය

කොළඹ විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන වල අයිතම විශ්වවිද්‍යාලය ක්‍රියාත්මක වූ ප්‍රාථමික ආර්ථික පසුබිම මත(කෘත්‍යාත්මක මුදල් ඒකකය) ගණනය කර ඇත. මෙම මූල්‍ය ප්‍රකාශන සකස්කර ඉදිරිපත් කර ඇත්තේ විශ්වවිද්‍යාලයේ කෘත්‍යාත්මක සහ ව්‍යවහාරික මුදල් ඒකකය වන **"ශ්‍රී ලංකා රුපියල්"** (රු.) වලිනි.

1.5.8. විදේශ මුදල් ගනුදෙනු

සියලුම විදේශ මුදල් ගනුදෙනු පිළිබඳ වාර්තා කරන මුදල් වර්ගය ගනුදෙනු සිදු කරන අවස්ථාවේ පැවති විනිමය අනුපාතවලට අනුව ශ්‍රී ලංකා රුපියල් බවට පරිවර්තනය කෙරෙයි.

වර්ෂය තුළ එම ගනුදෙනු පියවීමෙන් සහ මූල්‍ය වත්කම්වලින් ලැබෙන විදේශ විනිමය ලාභ/අලාභ ආදායම් ප්‍රකාශයේ හඳුනාගෙන ඇත.

1.5.9. වැටයීම

ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන් මගින් අවසර දී ඇති පරිදි වෙනත් ආකාරයකින් දක්වා ඇත් නම් මිස, මූල්‍ය ප්‍රකාශනවල ප්‍රමාණය ආසන්නතම රුපියලට වටයා ඇත.

1.6. සුවිශේෂ ගිණුම්කරණ ඇස්තමේන්තු සහ විනිශ්චයන්

ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සහ ඉදිරිපත් කිරීමේදී, කළමණාකරණය විසින් ගිණුම්කරණ ප්‍රතිපත්ති උපයෝගි කර ගැනීමෙහි සහ වාර්තා කරන ලද වත්කම්, බැරකම්, ආදායම සහ වියදම් සඳහා බලපාන විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පනවලට එළඹීම අවශ්‍ය වේ. තථ්‍ය ප්‍රතිඵල මෙම ඇස්තමේන්තු හා භාවිතා කරන විනිශ්චයන්ගෙන් වෙනස් විය හැකිය.

මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගෙන ඇති ප්‍රමාණයන්ට වඩාත්ම වැදගත් බලපෑමක් ඇති කරන, ගිණුම්කරණ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේදී සැලකිය යුතු ඇස්තමේන්තු, අවිනිශ්චිතතාව සහ තීරණාත්මක විනිශ්චයන් පිළිබඳ තොරතුරු පහත පරිදි වේ:

අ) නිර්වාචිත ප්‍රතිලාභ සැලැස්ම

සේවකයින්ගේ විශ්‍රාම ප්‍රතිලාභ සැලසුමේ පිරිවැය තීරණය කරනු ලබන්නේ ප්‍රක්ෂේපිත ඒකක හර (PUC) ක්‍රමයෙනි. එවැනි ක්‍රමයකට පොලී අනුපාතය, වැටුප් වැඩිවීමේ අනුපාතය සහ විශ්‍රාම යන වයස පිළිබඳ උපකල්පන භාවිතා කිරීම ඇතුළත් වේ. සැලැස්මේ දිගුකාලීන ස්වභාවය නිසා එවැනි ඇස්තමේන්තු සැලකිය යුතු අවිනිශ්චිතතාවයකට යටත් වේ.

ආ). ගිණුම්කරණ ඇස්තමේන්තු සහ විනිශ්චයන්හි වෙනස්කම්

ගිණුම්කරණ ඇස්තමේන්තු වල යම් වෙනසක් සහ විවේචනාත්මක විනිශ්චයන් මූල්‍ය ප්‍රකාශනවල අදාළ සටහන් වල අනාවරණය වේ.

1.7. අවිනිශ්චිත වත්කම් හා බැරකම්

අවිනිශ්චිත වත්කම් සහ බැරකම් ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිත (SLPSAS) අංක 8 ට අනුකූලව ගිණුම්ගත කර ඇත. ඒ අනුව, අවිනිශ්චිත වගකීමක් යනු වැඩසටහනේ පාලනයෙන් බැහැර වන අනාගත අවිනිශ්චිත සිදුවීම් එකක් හෝ කිහිපයක් සිදුවීම හෝ සිදු නොවීම නිසා හෝ පියවීම සඳහා සම්පත් පිටතට ගලායාමක් අවශ්‍ය වනු ඇතැයි සිතිය නොහැකි හඳුනා නොගත් වර්තමාන වගකීමක් පැවතීම හේතුවෙන් ජනිත වගකීමකි.

අතිශය කලාතුරකින් අවස්ථාවක විශ්වාසදායක ලෙස මැනිය නොහැකි වගකීමක් පවතින අවස්ථාවලදීද අවිනිශ්චිත වගකීමක් පැන නගී. අවිනිශ්චිතභාවය අවිනිශ්චිත වගකීමක් හඳුනා නොගන්නා නමුත් මූල්‍ය ප්‍රකාශනයේ එහි පැවැත්ම හෙළිදරව් කරයි.

අවිනිශ්චිත වත්කමක් යනු විශ්ව විද්‍යාල පාලනයෙන් බැහැර අවිනිශ්චිත අනාගත සිදුවීම් එකක් හෝ කිහිපයක් සිදුවීම හෝ සිදු නොවීම මගින් එහි පැවැත්ම තහවුරු වන අතීත සිදුවීම් වලින් පැන නගින වත්කමකි. විශ්ව විද්‍යාලය අවිනිශ්චිත වත්කම් හඳුනා නොගන්නා නමුත් ආර්ථික ප්‍රතිලාභ ගලා ඒමට ඉඩ තිබුණද ප්‍රායෝගිකව නිශ්චිත නොවන අවස්ථාවන්හිදී එහි පැවැත්ම හෙළිදරව් කරයි.

1.8. ප්‍රකාශන දිනයෙන් පසු සිදු වූ සිදුවීම්

ප්‍රකාශන දිනයෙන් පසු සිදුවූ සියලු සැලකිය යුතු අවස්ථා සැලකිල්ලට භාජනය කර ඇති අතර මූල්‍ය ප්‍රකාශනයන්හි අවශ්‍ය තන්හිදී සුදුසු ගැළපීම් හා එළිදරව් කිරීම් සිදු කර ඇත.

2. සුවිශේෂ ගිණුම්කරණ ප්‍රතිපත්ති සාරාංශය

2.1. මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

2.1.1. ආදායම් හඳුනා ගැනීම – භාණ්ඩාගාර සහ වෙනත් දීමනා

පුනරාවර්තන වියදම් සඳහා රජයේ ප්‍රදාන, පර්යේෂණ ප්‍රදාන සහ ව්‍යාපෘතිවල ආදායම, වත්කම් සහ පරිත්‍යාග අත්පත් කර ගැනීම සඳහා ලැබෙන ප්‍රදාන ඒවා ලැබෙන විට ආදායම ලෙස හඳුනාගෙන ඇති අතර අනෙකුත් ආදායම් උපචිත පදනම මත හඳුනාගෙන ඇත.

රජයේ ප්‍රදාන සඳහා ගිණුම්කරණය

භාණ්ඩාගාරයෙන් සහ අනෙකුත් ආයතනවලින් ලැබුණු ප්‍රදාන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන්ට (SLIPSAS 11) අනුකූලව (විනිමය නොවන ගනුදෙනුවලින් ලැබෙන ආදායම (බදු සහ මාරුකිරීම්)) වාර්තා කර ගිණුම්ගත කර ඇත.

(i) පුනරාවර්තන ප්‍රදාන

පුනරාවර්තන ප්‍රදාන මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය තුළ විනිමය නොවන ගනුදෙනුවලින් ලැබෙන ආදායම ලෙස හඳුනාගෙන මුදල් පදනම මත පිළිගැනේ.ඊට අමතරව, PPE පුනරුත්ථාපනය සඳහා ලැබුණු සහ වැය කරන ලද ප්‍රදාන සහ පර්යේෂණ සහ මානව ප්‍රාග්ධන සංවර්ධනය ද මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේදී පුනරාවර්තන ප්‍රදාන ලෙස හඳුනා ගැනේ.

(ii) ප්‍රාග්ධන ප්‍රදාන සහ පරිත්‍යාග

ආදායමට අනුව දේපළ, පිරියත සහ උපකරණ මිලදී ගැනීම සඳහා භාණ්ඩාගාරයෙන් සහ අනෙකුත් ණය දෙන ආයතනවලින් ලැබෙන ප්‍රාග්ධන ප්‍රදාන සහ පරිත්‍යාග ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිතීන්ට (SLPSAS 11) අනුව විනිමය නොවන ගනුදෙනු (බදු සහ මාරු කිරීම්) ලෙස මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කර ඇත. පරිත්‍යාග වශයෙන් ලැබුණු වත්කම්වල සාධාරණ වටිනාකම ලැබුණු වර්ෂයේ ආදායම ලෙස ගණන් බලා ඇත.

2.1.2. අභ්‍යන්තර උත්පන්න ආදායම

ආදායම් හඳුනාගැනීම - අභ්‍යන්තර උත්පන්න ආදායම, මූල්‍ය ආදායම, පුරස්කාර යනාදිය.

I ගාස්තු අය කරන පාඨමාලා වලින් ලැබෙන ආදායම

ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිතීන්ට (SLPSAS 10) අනුව විනිමය ගනුදෙනු වලින් ලැබෙන ආදායම අනුව පාඨමාලා ගාස්තු, විභාග ගාස්තු, වැඩමුළු ගාස්තු, ලියාපදිංචි ගාස්තු සහ අනෙකුත් ක්‍රියාකාරකම්වල ආදායම වැනි ගාස්තු අය කරන පාඨමාලා වලින් ලැබෙන ආදායම පාඨමාලාවේ සහ උපාධි වැඩසටහනෙහි කාලසීමාව තුළ උපචිත පදනම මත හඳුනා ගැනේ. සම්පූර්ණ කරන ලද ක්‍රමයේ ප්‍රතිශතය අනුව පාඨමාලා ගාස්තු හඳුනාගෙන ඇත.

II. බාහිර පර්යේෂණ/ව්‍යාපෘති වලින් ලැබෙන ආදායම

වර්ෂය තුළ පර්යේෂණ/ව්‍යාපෘති ක්‍රියාකාරකම් සඳහා දරන ලද වියදම් මත පදනම්ව බාහිර පර්යේෂණ/ව්‍යාපෘතිවලින් උපයන ආදායම හඳුනා ගන්නා ලදී. භාවිතයට නොගත් ඉතිරි වියදම් විලම්බිත ආදායමක් ලෙස ගණන් ගනු ලැබේ.

iii. මූල්‍ය ආදායම

ඵලදායී පොලී අනුපාත ක්‍රමය භාවිතා කරමින් පොලී ආදායම උපචිත පදනම මත හඳුනා ගැනේ.

iv. පුරස්කාර ආදායම

පුරස්කාර ආදායම උපචිත පදනම මත හඳුනා ගන්නා ලදී.

v. දේපල, පිරියත සහ උපකරණ විකිණීමෙන් ලැබෙන ලාභ / පාඩු

දේපල, පිරියත සහ උපකරණ බැහැර කිරීම මත ශුද්ධ ලාභ සහ අලාභ, නිශ්චිත අදාළ විකුණුම් වියදම් සඳහා බැහැර කරන ලද භාණ්ඩයේ ධාරක වටිනාකම, බැහැර කිරීමෙන් ලැබෙන ආදායමෙන් අඩු කිරීමෙන් පසු මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය තුළ හඳුනා ගැනේ. කිසියම් ප්‍රත්‍යාගණන වත්කමක් සම්බන්ධයෙන්, ප්‍රත්‍යාගණන සංචිත ගිණුමේ ඉතිරිව ඇති ඕනෑම ශේෂයක් මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය වෙත මාරු කරනු ලැබේ.

vi. වෙනත් ආදායම්

ඉහත කාණ්ඩ යටතේ නිශ්චිතව දක්වා නොමැති වෙනත් ආදායම් උපචිත පදනම මත හඳුනා ගැනේ.

vii. සීමිත ප්‍රදාන වලින් ලැබෙන ආදායම

අරමුදල් ලැබීමේ කොන්දේසි සේවාවක කාර්ය සාධනයකට හෝ වෙනත් ක්‍රියාවලියකට සම්බන්ධ වන අවස්ථාවක ගිවිසුම්, කොන්ත්‍රාත්තු හෝ වෙනත් අවබෝධයක් මත පදනම්ව සීමිත ප්‍රදාන සපයනු ලබයි. විශ්වවිද්‍යාලය විසින් සම්පාදනය කර ඇති කොන්දේසි වලට අනුකූල වීම සහ අපේක්ෂිත වගකීම් ඉටු කිරීම හරහා දායකත්වය උපයා ගනී. ප්‍රදාන ලැබෙන බවට සාධාරණ සහතිකයක් ලැබෙන තෙක් සහ එය ලැබීම සඳහා නියම කර ඇති කොන්දේසිවලට අනුකූල වන තෙක් සහ වන්දි ගෙවීමට අපේක්ෂා කරන අදාළ වියදම් දැරීමට සහ අය කර ගන්නා තෙක්, මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ ආදායම හඳුනාගනු නොලැබේ. මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය අරමුදල් ලැබීමෙන් දායකත්වයට අනුයුක්ත කර ඇති කොන්දේසි සපුරා ඇති බවට හෝ ඉටු කිරීමට නියමිත බවට තීරණාත්මක සාක්ෂි සපයන්නේ නැත. කොන්දේසි සපුරාලන තුරු, දායකත්වය සීමිත අරමුදල්වල කොටසක් ලෙස සැලකේ.

කිසියම් සීමිත ප්‍රදානයක් ලැබීමෙන් පසු, ප්‍රදානය මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ පිළිගනු ලැබේ. ඉන්පසුව, ක්‍රමානුකූල පදනමක් මත, එම **කාලය තුළ එකඟ වූ "සීමා කළ" ක්‍රියාකාරකම්** සඳහා වියදම් කර ඇති මුදලට සමාන මුදලක් ආදායමට ගනු ලැබේ. උපයෝජනය නොකළ අරමුදල් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ එලෙසම ඉදිරියට ගෙන යනු ලැබේ.

2.1.3 වියදම් හඳුනා ගැනීම

අ.) විශ්වවිද්‍යාලයේ සියළුම ක්‍රියාකාරකම් සිදුකිරීමේ වියදම් උපචිත පදනම මත හඳුනාගෙන ඇති අතර ඒවා සිදු වූ කාල සීමාව තුළ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයට ඇතුළත් කෙරේ.

ආ.) උපාධි අපේක්ෂක අධ්‍යාපනය සඳහා වන සියළුම වියදම් රජයේ පුනරාවර්තන ප්‍රදානයට ඇතුළත් කර ඇත.

ඇ.) සිසුන්ගේ ඉගෙනුම් ධාරිතාව ඉදිරියට ගෙනයාම හෝ වැඩි කිරීම සඳහා ස්ථීර ස්වභාවයක් ඇති වත්කම් අත්පත් කර ගැනීම හෝ වැඩිදියුණු කිරීම සඳහා කරන ලද සියලු වියදම් ප්‍රාග්ධන වියදම් ලෙස සලකනු ලැබේ.

ඈ.) විස්තීරණ ආදායම් ප්‍රකාශයේ වියදම් හඳුනාගෙන ඇත්තේ විශ්වවිද්‍යාලය පවත්වාගෙන යාමේ පිරිවැය අතර සෘජු සම්බන්ධතාවයේ පදනම මත වන අතර ප්‍රාග්ධන වත්කම් කාර්යක්ෂමව පවත්වා ගෙන යාමේ වියදම වර්ෂය සඳහා අතිරික්තය / හිඟය ගණනය කිරීමේදී ආදායම ලෙස සැලකේ.

2.1.3.1. ව්‍යාපෘති වියදම්

විශ්වවිද්‍යාලයේ ව්‍යාපෘති හා අනෙකුත් ක්‍රියාකාරකම් සිදුකිරීමේ වියදම් ඔවුන් විසින් දරනු ලබන කාල පරිච්ඡේදය තුළ විස්තීර්ණ ආදායම් ප්‍රකාශයකින් හඳුනාගෙන ඇති අතර ව්‍යාපෘති වියදම් හඳුනා ගැනීමේ පදනම ප්‍රධාන වශයෙන් ව්‍යාපෘතියේ ස්ථාන, ව්‍යාපෘතියට වෙන් කර ඇති කාර්ය මණ්ඩලය සහ ව්‍යාපෘති යෝජනාවට අනුව ව්‍යාපෘතියේ කටයුතු ප්‍රක්ෂේපණය කර ඇත.

පිරිවැය සහ නිශ්චිත ආදායම් අයිතම ඉපැයීම අතර සෘජු සම්බන්ධතාවයේ පදනම මත මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ පිරිවැය හඳුනාගනු ලැබුවේය

2.1.3.2. මෙහෙයුම් වියදම්

විශ්වවිද්‍යාලය පවත්වාගෙන යාමේ දී සහ ප්‍රාග්ධන වත්කම් කාර්යක්ෂමව පවත්වාගෙන යාමේ දී දරන ලද සියලු වියදම්, වර්ෂය සඳහා අතිරික්තය ගණනය කිරීමේදී ලැබෙන ආදායමට එරෙහිව අයකරනු ලැබේ.

විභාග, සම්මන්ත්‍රණ සහ පාඨමාලා සඳහා වන වියදම් මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේදී උපචිත පදනම මත හඳුනා ගැනේ.

2.1.3.3. මූල්‍ය වියදම

මුදල් වියදම් ගෙවනු ලබන විට හෝ වගකීම් ඇති කරන විට උපචිත පදනම මත හඳුනා ගැනේ.

2.1.3.4. ගාස්තු අයකිරීමේ පාඨමාලා, බාහිර පර්යේෂකයන්/ ව්‍යාපෘති සම්බන්ධ වියදම්.

විශ්වවිද්‍යාලයේ සියලුම ක්‍රියාකාරකම් සිදුකිරීමේ වියදම් උපචිත පදනම මත හඳුනාගෙන ඒවා දරන කාල සීමාව තුළ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයෙහි ඇතුළත් කෙරේ.

3. මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

3.1. ජංගම වත්කම්

මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ වර්ගීකරණය කර ඇති ජංගම වත්කම් යනු මූල්‍ය තත්ත්වය ප්‍රකාශ කිරීමෙන් පසු වසරක් ඇතුළත අයකර ගනු ලබන ඒවා වේ.

3.1.1. මූල්‍ය හා මූල්‍ය පයිය

අතැති මුදල්, බැංකු ශේෂයන් සහ මාස තුනක මුල් කල්පිරීමක් සහිත සහ කෙටි කාලීන තැන්පතු මූල්‍ය හා මූල්‍ය පර්යායන්ට ඇතුළත් වේ.

3.1.2. බඩු තොග සහ කොටස්

පිරිවැය හා ශුද්ධ උපලබ්ධි වටිනාකම අතර වඩා අඩු අගය මත බඩු තොග පෙන්වාදී ඇත. සමස්ත වශයෙන් පිරිවැය පෙර පිවිසි පෙර නිකුත් පදනමක් මත ගණනය කරනු ලබන අතර එහිදී අදාළ තොග අත්පත් කර ගැනීමටත්, ඒවා පවත්නා තත්ත්වයට පත්කරලීමට හා පවත්නා ස්ථානයට ගෙන ඒමටත් වැයවූ වියදම ඊට ඇතුළත් වෙයි.

විශ්වවිද්‍යාලයෙහි බඩු තොගවලට ලිපිද්‍රව්‍ය, රසායනික, පරිභෝජන ද්‍රව්‍යය හා නඩත්තු අයිතම ඇතුළත් වෙයි.

3.2. ජංගම නොවන වත්කම්

3.2.1. අස්පෘශ්‍ය වත්කම්

අත්පත් කරගත් පරිගණක මෘදුකාංග බලපත්‍ර ප්‍රාග්ධනීකරණය කරනු ලබන්නේ අත්පත් කර ගැනීමට සහ භාවිතයට ගෙන ඒමට දරන පිරිවැයේ පදනම මත ය.

පරිගණක මෘදුකාංග වැඩසටහන් නඩත්තු කිරීම හා සම්බන්ධ පිරිවැය වියදමක් ලෙස හඳුනා ගැනේ. පහත සඳහන් නිර්ණායක සපුරා ඇති විට විශ්වවිද්‍යාලය විසින් පාලනය කරනු ලබන හඳුනාගත හැකි සහ අද්විතීය මෘදුකාංග නිෂ්පාදන නිෂ්පාදනය සමඟ සෘජුවම සම්බන්ධ වන පිරිවැය අස්පෘශ්‍ය වත්කම් ලෙස හඳුනා ගැනේ:

(i) මෘදුකාංග නිෂ්පාදනය සම්පූර්ණ කිරීමට තාක්ෂණික වශයෙන් ශක්‍යතාවක් වන අතර එමඟින් එය භාවිතය සඳහා ලබා ගත හැකි වන අතර කළමනාකරණයට මෘදුකාංග නිෂ්පාදනය භාවිතය සඳහා සම්පූර්ණ කිරීම

(ii) මෘදුකාංග නිෂ්පාදනය භාවිතා කිරීමේ හැකියාව;

(iii) මෘදුකාංග නිෂ්පාදනය අනාගත ආර්ථික ප්‍රතිලාභ උත්පාදනය කරන ආකාරය නිරූපණය කිරීමේ හැකියාව;

(iv) සංවර්ධනය සම්පූර්ණ කිරීමට සහ මෘදුකාංග නිෂ්පාදනය භාවිතා කිරීමට ප්‍රමාණවත් තාක්ෂණික, මූල්‍ය සහ වෙනත් සම්පත් තිබීම; හා

(v) මෘදුකාංග නිෂ්පාදනයේ සංවර්ධන කාලය තුළ එයට ආරෝපණය කළ හැකි වියදම් විශ්වාසදායක ලෙස මැනිය හැකිවීම

මෘදුකාංග සංවර්ධන සේවක පිරිවැය සහ අදාළ පොදු කාර්යයන්හි සුදුසු කොටසක් මෘදුකාංග නිෂ්පාදනයේ කොටසක් ලෙස ප්‍රාග්ධනීකරණය කර ඇති සෘජුවම ආරෝපණය කළ හැකි පිරිවැය අතර ඇතුළත් වේ.

මෘදුකාංග සංවර්ධනයට අදාළ පිරිවැය මෘදුකාංගය භාවිතයට සුදානම් වන තෙක් කෙරෙමින් පවතින ප්‍රාග්ධන කාර්යයන් ලෙස ඉදිරියට ගෙනයනු ලැබේ.

3.2.2. දේපල, පිරියත සහ උපකරණ

භූමි, ගොඩනැගිලි, විද්‍යාගාර හා ඉගැන්වීම් උපකරණ, තිරවුරු සහ සවිකුරු, පුස්තකාල පොත් හා වාර සහරා, මෝටර් වාහන, උපාධි ලෝගු, සහ රජයේ ප්‍රදාන, පර්යේෂණ ප්‍රදාන, අභ්‍යන්තරිකව ජනිත අරමුදල් සහ පරිත්‍යාග මඟින් ලබා ගත් වෙනත් වත්කම්

තාක්ෂණ පීඨය පිහිටුවීම සඳහා රජය විසින් ලබාදුන් භෝමාගම, පිටිපන, මාහේනවත්ත පිහිටි ඉඩමේ අයිතිය ලබා ගැනීමට විශ්වවිද්‍යාලය නාගරික සංවර්ධන අධිකාරියට රු.මි. 781ක් ගෙවියයුතුය. අධ්‍යාපන අමාත්‍යාංශය මෙම මුදල ගෙවීමට පසුගිය වසරේදී එකඟ වී ඇත.

හඳුනාගැනීමේ සහ මැනීමේ පදනම

දේපළ, පිරියත හා උපකරණ හඳුනාගෙන ඇත්තේ ආයතනය වෙත ඒවායෙන් යථා කාලයේදී බොහෝ කොට මූල්‍යමය වාසිදායි තත්ත්වයන් ගලා ඒමේ හැකියාවක් ඇත්නම් පමණක් හා එකී අයිතමයේ පිරිවැය විශ්වසනීය ලෙස ගිණිය හැකි නම් පමණි.

සියළුම දේපල, පිරියත සහ උපකරණ මුලින් පිරිවැය මත ප්‍රකාශ කර ඇති අතර පසුව අඩු වශයෙන් සමුච්චිත ක්ෂයවීම් සහ යම් හානියක් සිදුවුවහොත් එය මනිනු ලැබේ. අළුත්වැඩියා සහ නඩත්තු පිරිවැය විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ දී හඳුනාගෙන ඇත. සිදුවීම් හෝ තත්වයන්හි වෙනස්වීම් මඟින් දේපල, පැලෑටි සහ උපකරණවල ධාරක

වටිනාකම නැවත ලබා ගත නොහැකි බව පෙන්නුම් කරන විට ඒවා ධාරක භානි වටිනාකම සඳහා සමාලෝචනය කෙරේ.

i) සමාරම්භක හඳුනාගැනීම

උපකරණ සඳහා රු. එක් එක් අයිතමයකට රුපියල් 2,500කට අඩු පිරිවැයක් සහිත උපකරණ සාමාන්‍යයෙන් මිලදී ගත් වර්ෂයේදී ලියා හරිනු ලැබේ. අනෙකුත් සියලුම උපකරණ ස්වභාවයේ පදනම මත ප්‍රාග්ධනීකරණය කර ඇත. ස්පෘශ්‍ය සහ වසරකට වැඩි ආයු කාලයක් සහිත උපකරණ ප්‍රාග්ධනීකරණය කර ඇත.වත්කමක ආයුකාලයේ තීරකය එහි වර්ගීකරන 8ක් මත තෝරා ගැනෙන අතර එය වසර 4 සිට 20 දක්වා දිවෙයි.

ii) පවතින දේපල, පිරියත සහ උපකරණ සඳහා පසුකාලීන වියදම්

පහත දැක්වෙන ගනයන්ට අයත් නොවන විටදී යම් ස්පෘශ්‍ය වත්කම් මත සිදුකරන ලද වියදම් එකී වියදම සිදුකරන ලද කාලපරිවර්ජේදය තුළ මූල්‍ය ක්‍රියාකාරිත්වය පිළිබඳ ප්‍රකාශයෙහි ඇතුළත්කර දක්වා ඇති අතර එහිදී එය ප්‍රාග්ධනිත කර අදාල පදනම් මත පිහිටා ක්ෂය ගණනයට ලක් කර ඇත.

අ.) ස්ථාවර වත්කම්වල වෙළඳපොළ වටිනාකම සැලකියයුතු තරම් ඉහළ යන ලද අවස්ථාවන්හි
ආ.) වත්කම් පරාසයේ වැඩි විමකදී
ඇ.) ප්‍රතිදානයෙහි තත්ත්වයේ තිරසාර වර්ධනයක් හෝ ක්‍රියාකාරී පිරිවැයෙහි අඩු වීමක්
ඈ.) අලුත්වැඩියාවෙන් හා නඩත්තුවෙන් ස්ථිරවන ප්‍රමාණයටද වඩා සැලකිය යුතු අන්දමේ වත්කම් ආයු වර්ධනයක්

iii) ප්‍රත්‍යාගණන ආකෘතිය

- මූලික හඳුනාගැනීමෙන් පසුව, විශ්වවිද්‍යාලය එම පිරිවැය ප්‍රත්‍යාගණන ආකෘතිය සඳහා වන SLPSAS 7 හි අවශ්‍යතාවයට අනුකූලව, එනම් පිරිවැය හැර සමුච්චිත ක්ෂයවීම් සහ සමුච්චිත භානි පදනමකට අනුකූලව සියලු දේපල, පිරියත සහ උපකරණ මැනීමේ පිරිවැය ආකෘතිය තෝරා ගනී.

- කෙසේ වෙතත්, ඵලදායී ජීවකාලය සමාලෝචනය කිරීමේදී මතුවන තාක්ෂණික ගැටළු හේතුවෙන් ශූන්‍ය ශුද්ධ පොත් අගයකින් වාර්තා වන පුස්තකාල පොත් සහ වාර සඟරාවල **ඉතිරි ඵලදායී ජීවකාලය සමාලෝචනය නොකෙරෙයි.** පොතෙහි අන්තර්ගතය යල් පැන ගිය විට භාවිතය අඩු විය හැක. එබැවින්, පොත්වල ඵලදායී ජීවකාලය පිළිබඳ විශ්වසනීය තක්සේරුවක් ලබා ගැනීමට අපහසුය.

- SLPSAS 7 අනුව භාණ්ඩ සමීක්ෂණයේදී බැහැර කිරීමට නිර්දේශ කරනු ලැබ ඇති වත්කම්වල ඵලදායී ජීවකාලය සමාලෝචනය නොකෙරේ.

iv) වෙනත් ආයතනවලට අයත් ගොඩනැගිලි

ජෛව රසායන විද්‍යා අණුක ජීව විද්‍යා හා ජෛව තාක්ෂණවේදය ආයතනයේ ගොඩනැගිලි, කොළඹ විශ්වවිද්‍යාලයේ පරිගණක පාසල, ජාතික පුස්තකාල සහ විඥාපන සේවා ආයතනය විශ්වවිද්‍යාල භූමියේ පිහිටා ඇති නමුදු දේපල, පිරියත සහ උපකරණවලට ඇතුළත් කර නැත.

(V) ක්ෂයවීම්

මූල්‍ය ක්‍රියාකාරිත්වය පිළිබඳ ප්‍රකාශයේ දේපල, පිරියත හා උපකරණ සඳහා ඒවා භාවිතය සඳහා ගන්නා ලද දිනයේ පටන් ඒවායේ ඇස්තමේන්තුගත ඵලදායී ජීවිත කාලය මත සරල මාර්ග ක්‍රමය යටතේ ගණනය කර ක්ෂය හඳුනා ගෙන ඇත. ඉඩම් සඳහා ක්ෂය ගණනයක් කර නොමැත. ඇස්තමේන්තුගත ඵලදායී ජීව කාලයන් මෙසේය.

වත්කම් ප්‍රවර්ගය	ඵලදායී ජීව කාලය අවු.
ගොඩනැගිලි	20
ගෘහභාණ්ඩ සහ උපකරණ	10
විද්‍යාගාර හා ඉගැන්වීම් උපකරණ	5
සවිකුරු සහ තිරවුරු	10
පුස්තකාල පොත්, වාර සඟරා හා ලෝගු	5
මෝටර් වාහන	5
මෘදුකාංග පැකේජ	5
ක්‍රීඩා භාණ්ඩ	4

භාවිත කළ කාලය මත පදනම්ව, මිලදී ගත් දිනයේ සිට සහ බැහැර කරන දිනය දක්වා ක්ෂයවීම් ලබා දෙනු ඇත.

(vi) කල්බදු - මූල්‍ය කල්බදු

විශ්වවිද්‍යාලයේ නිමිකමට අදාළ සැලකියයුතු සියලුම අවදානම් සහ ප්‍රතිලාභ කල්බදු යන්නෙන් මෙහිදී අදහස් වේ. මූලික හඳුනා ගැනීම මත දේපල, පිරියත හා උපකරණ ඒවායේ සාධාරණ මිල හෝ අවම කල්බදු මිල යන දෙකෙන් අවම මිලට ගණනය කරනු ලබයි.මූලික හඳුනාගැනීමෙන් පසු එම වත්කමට අදාළ ගිණුම් ප්‍රතිපත්තිය මත එම වත්කම ගණනය කරනු ලැබේ.

මූල්‍ය කල්බදු යටතේ එන අවම ගෙවීම් මූල්‍ය වියදම් සහ උපචිත වගකීම් අතර බෙදීයයි. කල්බදු කාලය තුළ වගකීමේ ශේෂය සඳහා ස්ථාවර පොලී වාරික අනුපාතයක් පවත්වා ගතහැකි පරිදි මූල්‍ය වියදම කාල වකවානු අතර බෙදනු ලැබේ

වර්ෂය තුළ විශ්වවිද්‍යාලය විසින් රු. 2,611,812 කල්බදු ලෙස ගෙවන ලදී.

මෙහෙයුම් කුලී

මෙහෙයුම් කල්බදු යනු මූල්‍ය කල්බදු හැර අනෙකුත් කල්බදු වේ. බදු වාරිකය උපචිත පදනම මත මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ වියදමක් ලෙස පිළිගනු ලැබේ.

(vii) පරිශ්‍ර නඩත්තුව

විශ්වවිද්‍යාලය සතුව වරින්වර සමාලෝචනයට ලක්වන නඩත්තු සැලසුමක් පවතින අතර දැනට සිදු වෙමින් පවතින නඩත්තු කටයුතු සිදුවන්නේ ඒ අනුවය. නඩත්තු වියදම් ආදායම් හා වියදම් ගිණුමට යොමුකෙරේ.

(viii) පුස්තකාල පොත්

පුස්තකාල පොත්වල මිල වසර පහක කාලයක් තුළ සරල රේඛා පදනම මත කපා හැර ඇති අතර සම්පූර්ණයෙන්ම ක්ෂය වූ පොත් නැවත ප්‍රකාශ කිරීමට කටයුතු කර නොතිබුණි.

3.2.3. කෙරෙමින් පවතින වැඩ

කෙරෙමින් පවතින වැඩවල ප්‍රගතිය හානි හැර පිරිවැය මත ප්‍රකාශ කර ඇත. මේවා ප්‍රාග්ධනීකරණය සඳහා බලාපොරොත්තු වන දේපල, පිරියත සහ උපකරණ ඉදිකිරීම සඳහා සෘජුවම දරනු ලබන ප්‍රාග්ධන ස්වභාවයක වියදම් වේ. කෙරෙමින් පවතින ප්‍රාග්ධන කාර්යයන් භාවිත කළ හැකි තත්වයට පත්වූ විට දේපල, පිරියත සහ උපකරණවල අදාළ වත්කම් කාණ්ඩයට මාරු කරනු ලැබේ. එනම් එය විශ්වවිද්‍යාලය විසින් අපේක්ෂිත පරිදි ක්‍රියාත්මක වීමට උචිත පිහිටීමක සහ අනෙකුත් තත්වයන් යටතේ පවතින විටදීය. ස්ථාවර වත්කම් වලට එකතු කිරීමේ කොටසක් තුළ මූල්‍ය පිරිවැය ප්‍රාග්ධනීකරණය වී නොමැත.

3.3. ජංගම බැරකම්

ශේෂ පත්‍රයෙහි වර්ගීකරණය කරන ලද ජංගම බැරකම් ශේෂ පත්‍ර දිනෙන් පසු වසරක් ඇතුළත පියවා ගනු ලබන වත්කම් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන සැකසීමේදී සියලුම ගම්‍ය වත්කම් සැලකිල්ලට ගෙන ඇත.

අ) ණයගැතියන් සහ උපචිත වියදම්

ණයගැතියන් සහ වියදම් ගණනය කිරීම සාධාරණ වටිනාකම මත සිදුකරනු ලබන අතර ඵලදායී පොලී අනුපාතය මත ක්‍රමක්ෂය පිරිවැය ගණනය කරනු ලැබීණි.

ආ) විලම්බිත ආදායම

මාස කිහිපයක කාල සීමාවක් පුරා ක්‍රියාත්මක වන පාඨමාලා හා අධ්‍යයන වැඩසටහන්වලට අදාළ ඉන්වොයිසි පාඨමාලාව මුලදී අයකරගත්විට විලම්බිත ආදායම් ජනනය වේ. විලම්බිත ආදායම පාඨමාලාව ක්‍රියාත්මක වූ ප්‍රමාණය දක්වා විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ හඳුනාගැනෙන අතර ආදායම හඳුනා ගන්නා තෙක් ඉතිරිව ඇති කාල සීමාව සඳහා ආරෝපණය කළ යුතු ශේෂය මූල්‍ය තත්ත්ව පිළිබඳ ප්‍රකාශනයේ වගකීමක් ලෙස හඳුනා ගැනේ.

3.4. ජංගම නොවන බැරකම්

අ)සේවක ප්‍රතිලාභ - විශ්‍රාම ප්‍රතිලාභ වගකීම් සේවක නිර්වාචිත

ප්‍රතිලාභ සැලැස්ම- පාරිතෝෂිකය

නිර්වාචිත ප්‍රතිලාභ සැලැස්ම යනු නිර්වචනය කරන ලද දායක සැලැස්මක් හැර පශ්චාත් රැකියා ප්‍රතිලාභ සැලැස්මකි. ස්වාධීන ආයුගණකඥවරයකු විසින් ප්‍රක්ෂේපිත ඒකක ණය (PUC) ක්‍රමය භාවිතා කරමින් නිර්වාචිත ප්‍රතිලාභ ගණනය කරනු ලබයි. නිර්වාචිත ප්‍රතිලාභ වගකීම්වල වර්තමාන වටිනාකම තීරණය කරනු ලබන්නේ ඇස්තමේන්තුගත අනාගත මුදල් ගලා ඒම වට්ටම් කිරීමෙනි. ප්‍රතිලාභ ගෙවනු ලබන මුදලින් නියම කර ඇති පොලී අනුපාත භාවිතා

කරමින් සහ අදාළ වගකීම්වල නියමයන්ට ආඝන්න වශයෙන් පරිණතභාවයට කොන්දේසි ඇත. නිර්වාචිත ප්‍රතිලාභ බැඳීම්වල වර්තමාන වටිනාකම රඳා පවතින්නේ වට්ටම් අනුපාතය, අනාගත වැටුප් වර්ධක සහ මරණ අනුපාත පිළිබඳ උපකල්පන ගණනාවක් භාවිතා කරමින් ක්‍රියාකාරී පදනමක් මත තීරණය වන සාධක ගණනාවක් මත ය. මෙම සැලසුම් වල දිගුකාලීන ස්වභාවය නිසා, එවැනි ඇස්තමේන්තු සැලකිය යුතු අවිනිශ්චිතතාවයකට පත්වේ.

සෑම උපකල්පනයක්ම වාර්තා කරන දිනයකදී සමාලෝචනය කෙරේ. ඒ අනුව, සේවක ප්‍රතිලාභ වගකීම පදනම් වී ඇත්තේ 2023 දෙසැම්බර් 31 දින වන විට ආයුගණක තක්සේරුව මත ය. පාරිතෝෂිකය සඳහා වන විශ්ව විද්‍යාල ගිණුම්කරණ ප්‍රතිපත්තිය නම්, විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ දී ඒවා සම්පූර්ණයෙන්ම සිදුවන කාල පරිච්ඡේදය තුළ ක්‍රියාකාරී වාසි සහ අලාභ හඳුනා ගැනීමයි.

ආ) නිර්වාචිත ප්‍රතිලාභ සැලසුම් – සේවක අර්ථසාධක අරමුදල සහ සේවක භාරකාර අරමුදල

අදාළ ප්‍රඥප්ති හා රෙගුලාසි වලට අනුකූලව සේවක අර්ථසාධක අරමුදල් දායකත්වය සහ සේවක භාර අරමුදල් දායකත්වය සඳහා සේවකයෝ සුදුසුකම් ලබති. මෙය මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ වියදමක් ලෙස හඳුනාගෙන ඇත. සේවකයින්ගේ දළ වැටුප් වලින් 7%, 8% සහ 3% ප්‍රමාණයන්ගෙන් පිළිවෙලින් විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල, විශ්ව විද්‍යාල විශ්‍රාම වැටුප් අරමුදල සහ සේවක භාර අරමුදල සඳහා විශ්වවිද්‍යාලය දායක වේ. විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලට සේවකයෝ ද 10% ක දායකත්වයක් ලබා දෙති. කෙසේ වෙතත් වැඩිදුර මුදල් ගෙවීමට නීත්‍යානුකූල හෝ සාධනීය බැඳීමක් නොමැත. මෙම බැඳීම රැකියා ප්‍රතිලාභ පිළිබඳ SLPSA 19 අර්ථ දක්වා ඇති දායකත්ව සැලැස්මේ විෂය පථයට අයත් වේ. මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය තුළ අදාළ සේවාව සපයන බැවින් දායක සැලැස්ම නිර්වචනය කිරීමට දායක වීමේ වගකීම හඳුනාගෙන ඇත.

3.5. සංචිත සහ සීමිත අරමුදල්

අරමුදල්, ප්‍රදාන සහ සංචිත ලැබීම් සහ භාවිතය සඳහා ගිණුම්කරණය

10. අදාළ පාර්ශ්ව හෙළිදරව් කිරීම්

(i) උපකුලපති, මණ්ඩපාධිපති සහ පීඨාධිපතිවරු විශ්වවිද්‍යාල පාලක සභාවෙහි සාමාජිකයෝ වෙති.2022 වර්ෂය තුළ එම සාමාජිකයින්ට ගෙවන ලද වේතනය සහ අනෙකුත් ආදායම රු.*101,649,439.55* කි.

(i) විශ්වවිද්‍යාලයේ කළමනාකරණය භාර ප්‍රමුඛ පුද්ගලයන් වන ලේඛකාධිකාරී, මූල්‍යාධිකාරී, පුස්තකාලයාධිපති යන අයට 2023 වර්ෂය තුළ විශ්වවිද්‍යාලයෙන් වේතනය සහ අනෙකුත් ආදායම ලෙස රුපියල් *15,062,875.40* ක් ගෙවා ඇත.

(ii) අනෙකුත් සහා සාමාජිකයින්ට රැස්වීම් සඳහා වාර දීමනා ලෙස රු.*690,000.00* ක් ගෙවා ඇත.

11. අසම්භාව්‍ය බැරකම් සහ වත්කම්

11.1 අසම්භාව්‍ය බැරකම්

(i) විශ්වවිද්‍යාලයට පක්ෂව සහ විපක්ෂව පවතින නඩුවල තත්වය මෙසේය.

අංක	නඩුව පිළිබඳ විස්තර	කොළඹ විශ්වවිද්‍යාලය වෙනුවෙන් පෙනී සිටින නීතිඥවරයා	නිශ්චිත වන්දි මුදලක් ඉල්ලා සිටින නඩු	නිශ්චිත වන්දි මුදලක් ඉල්ලා නොසිටින නඩු
01	DMR 2299/2021 වික්‍රමගේ නවීන් ශ්‍රී වික්‍රමගේ මහතා	පෞද්ගලික නීතිඥවරයෙකි	මි. 03	
02	DMR 02091/2016 ඩී.ටී.ආර්. වික්‍රමරත්න - ශිෂ්‍ය, කොා.වි.වි.	නීතිපති දෙපාර්තමේන්තුව	මි. 600	
03	M 3257/21, හොරණ දිසා අධිකරණය සජිතා ලක්මාලි මිය	පෞද්ගලික නීතිඥවරයෙකි	මි. 500	
04	SC (FRA) 381/2021 ආචාර්ය බී එම් ඩබ් යූ සී බී ජයසුන්දර	පෞද්ගලික නීතිඥවරයෙකි	මි. 05	
05	SC/SPL/LA/413/2019 එස්. කාංජනා මිය	නීතිපති දෙපාර්තමේන්තුව		නිශ්චිත වන්දියක් සඳහන් කර නැත. එහෙත්, වන්දි ගෙවීමේදී කොා.වි.වි. හි අවසන් වරට ලබාගත් වැටුප සහ සේවා කාලය සලකා බලනු ලැබේ.

11.2 අසම්භාව්‍ය වත්කම්

2023-12-31 දිනට බැඳුම්කර උල්ලංඝනය කරන්නන්ගෙන් රුපියල් 140,769,642.51 අයකර ගත යුතුව තිබේ. කෙසේ වෙතත්, මෙම මුදල් අයකර ගැනීම සඳහා අඛණ්ඩ පසු විපරම් සිදු කෙරේ. වර්ෂය තුළ විශ්වවිද්‍යාලය විසින් රුපියල් 141,201,237.77ක් අයකරගෙන ඇත.

ශුද්ධ ලේඛනගත අගය ශූන්‍ය ලෙස වාර්තා වූ රුපියල් 453,269,619.66 ක් වටිනා පුස්තකාල පොත් SLPSAS 7 අනුව ඉතිරිව ඇති ඵලදායී ජීවකාලය සඳහා සංශෝධනය කර නොමැත.

12. ඉඩම් සහ ගොඩනැගිලි හිමිකාරත්වය ලබා ගත යුතු ඉඩම් සහ ගොඩනැගිලි

විශ්වවිද්‍යාලය පහත ස්ථානවල ක්‍රියාත්මක වුවද, 2023 දෙසැම්බර් 31 වන විට, පහත ලැයිස්තුගත කර ඇති ඉඩම් එයට අයත් නොවේ. කෙසේ වෙතත්, මේවායේ හිමිකාරිත්වය ලබා ගැනීමට පියවර ගෙන ඇති අතර, එහි ප්‍රගතිය පහතින් දක්වා ඇත.

12.1 තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය

ඉඩම	ඉඩම් ප්‍රමාණය			ප්‍රගතිය
	අක්කර	රූඩ්	පර්චස්	
හැව්ලොක් කාන්තා නේවාසිකාගාරය	0	3	6.4	මූලික සැලැස්ම සහ "O" රූප සටහන ඉතිරිව ඇත. මිනින්දෝරු දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කළ යුතුය.
කිත්‍යාකර නේවාසිකාගාරය	0	2	19.6	දිවුරුම් ප්‍රකාශය ඉදිරිපත් කිරීමට විශ්වවිද්‍යාලයට වසර 1.5ක් පොරොත්තු වීමට සිදුවේ.
කාර්ය මණ්ඩල නිල නිවාස - හරිශ්චන්ද්‍ර මාවත	0	1	5.2	මූලික සැලැස්ම සහ "O" රූප සටහන ඉතිරිව ඇත. මිනින්දෝරු දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කළ යුතුය.
ශාස්ත්‍ර, නීති, කළමනාකරණ සහ මූල්‍ය, ප. උපාධි අධ්‍යයන, අධ්‍යාපන පීඨ, ව්‍යායාම ශාලාව, ප්‍රධාන පුස්තකාලය, IHRA	26	3	37.2	ග්‍රහලෝකාගාර පරිශ්‍රය පිළිබඳ ගැටළුව
සුජාතා ජයවර්ධන කාන්තා නේවාසිකාගාරය	0	2	11.7	තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් O සටහන සහ මූලික සැලැස්ම සඳහා ඉල්ලීම් ලිපියක් එවන ලදී.
කාලිංග මාවත කාන්තා නේවාසිකාගාරය	-	2	29.16	එම ඉඩම විශ්වවිද්‍යාලයට පැවරීමට 2023.09.11 දින අමාත්‍ය මණ්ඩල තීරණය ලබා දී ඇත. මෙම ඉඩම විශ්වවිද්‍යාලයට පැවරීමේ ක්‍රියාවලිය කඩිනම් කරන ලෙස විශ්වවිද්‍යාලය විසින් 2023.10.16 දින UDA වෙත ලිපියක් යවා ඇත.
දේශීය වෛද්‍ය පීඨය, අංක 330 නේවාසිකාගාර ඉඩම,	-	-	50	

12.2 කතරගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය

ඉඩම	ඉඩම් ප්‍රමාණය			ප්‍රගතිය
	අක්කර	රූඩ්	පර්චස්	
කතරගම ග්‍රාමීය සෞඛ්‍ය පර්යේෂණ මධ්‍යස්ථාන ඉඩම	3	1	1.57	ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ ඉල්ලීම පරිදි කතරගම ප්‍රාදේශීය ලේකම් 2023 දෙසැම්බර් 20 වැනි දින වත්මන් උපයෝගිතා වාර්තාව යවා ඇත.

12.3 හෝමාගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය

ඉඩම	ඉඩම් ප්‍රමාණය			ප්‍රගතිය
	අක්කර	රූඩ්	පර්චස්	
තාක්ෂණ පීඨය, හෝමාගම	17	2	37.74	2022.04.04 දින විවිප්‍රකො වෙතින් අරමුදල් ඉල්ලා ඇත

12.4 කෝට්ටේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය

ඉඩම	ඉඩම් ප්‍රමාණය			ප්‍රගතිය
	අක්කර	රූඩ්	පර්චස්	
මොරගස්මුල්ල බාලිකා නේවාසිකාගාර ඉඩම, දේශීය වෛද්‍ය පීඨය	-	-	150	ඔප්පුවේ පිටපතක් ලබා ගැනීමේ කාර්යය කෙරෙමින් පවතී.

12.5 දේශීය වෛද්‍ය පීඨය මගින් පරිහරණය කෙරෙන නේවාසිකාගාර පරිශ්‍රය

දේශීය වෛද්‍ය පීඨය විසින් භාවිතා කරන නේවාසිකාගාර පරිශ්‍රය දේපල, පිරියත සහ උපකරණ ලෙස ගණුන් ගෙන නොමැත. හෙක්ටයාර් 0.1765 ක භූමි ප්‍රමාණයක වාරිමාර්ග දෙපාර්තමේන්තුවට අයත් ගොඩනැගිල්ලක එය පිහිටා ඇති බැවිනි. ඉඩම සහ ගොඩනැගිල්ල යන දෙකෙහිම අයිතිය විශ්වවිද්‍යාලයට පවරා නොමැති බැවින් ඒවා විශ්වවිද්‍යාල වත්කම්වලට ඇතුළත් කර නොමැත.

12.6 ඉඩම්, ගොඩනැගිලි සහ වෙනත් වත්කම්- හෙද පීඨය

හෙද පීඨයේ ඉඩම, ගොඩනැගිලි සහ අනෙකුත් වත්කම් සෞඛ්‍ය අමාත්‍යාංශයට අයත් ගොඩනැගිල්ලක පිහිටා ඇති බැවින් දේපළ, පිරියත සහ උපකරණ ලෙස ගිණුම්ගත කර නොමැත. මෙම වත්කම්වල අයිතිය විශ්වවිද්‍යාලයට පවරා නැති නිසා මේවා වත්කම්වලට ඇතුළත් කරනු නොලැබිණි. තවද, වත්කම් කොළඹ විශ්වවිද්‍යාලයට පැවරීම සඳහා සමීක්ෂණ මණ්ඩලය දැනට ක්‍රියාත්මක වෙමින් පවතී.

13. විශ්වවිද්‍යාලයේ පේටන්ට් බලපත්‍ර ක්‍රියාවලිය සහ එහි ආදායම

නවෝත්පාදනය විශ්වවිද්‍යාලයෙහි කේන්ද්‍රීය මෙහෙවර වේ. මෙයට සමගාමීව විශ්වවිද්‍යාලය පහත පේටන්ට් බලපත්‍ර ලබාගෙන ඇත. වර්ෂය තුළ විශ්වවිද්‍යාලය Food and Nature Pvt Ltd විසින් සිදු කළ "VERNOLAC" සහ "SATINY" නිෂ්පාදනවලින් පුරස්කාර ආදායම ලෙස රුපියල් 206,683.59 ක් උපයා ගත්තේය. මෙම මුදල විශ්වවිද්‍යාල බුද්ධිමය දේපළ (IP) ප්‍රතිපත්තිය මත පදනම්ව (40% ක් - 30% ක් පරිපාලන ආයතනයට සහ 10% ක් විශ්වවිද්‍යාලයට) ගණනය කරන ලදී. මෙම ආදායම විශ්වවිද්‍යාලයේ බුද්ධිමය වත්කම් වාණිජකරණයෙන් ජනනය වන අගය පිළිබිඹු කරයි.

නිෂ්පාදනය	මේද සෛල ප්‍රති ප්‍රවර්ධක සහ ප්‍රති ස්ථූලතා ක්‍රියාකාරකම් සඳහා පැපොල් කොළ යුෂ	විද්‍යුත් යාන්ත්‍රික සංවේදිතා ගැලපුම සහිත ස්ථාවර පලිහ මත පදනම් වූ ක්ෂේත්‍ර මිනුම් උපාංගය	ගැබ්ගෙල ධාරක වක්‍ර ඩැහි අඩුව
පේටන්ට් අංකය	20970	21849	13699
ගොනු කළ දිනය	6/2/2020	5/7/2021	15/09/2022
රජයේ ගැසට්පත් දිනය	10/06/2022	15/09/2023	13/01/2023
අධ්‍යයන අංශය	සත්ව විද්‍යා හා පරිසර විද්‍යා අධ්‍යයන අංශය , විද්‍යා පීඨය	භෞතික විද්‍යා අධ්‍යයන අංශය, විද්‍යා පීඨය	ප්‍රසව හා නාරිවේද අධ්‍යයන අංශය, වෛද්‍ය පීඨය

14. 2023 පෙබරවාරි 28 දිනට දේශීය වෛද්‍ය ආයතනයේ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශය

2023 පෙබරවාරි 28 දිනට දේශීය වෛද්‍ය ආයතනයේ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශය විශ්වවිද්‍යාලයේ පීඨයක් බවට පත් වූ 2023 මාර්තු 1 දින සිට විශ්වවිද්‍යාලයේ ගිණුම්වලට ඇතුළත් කරන ලදී. 2023-02-28 දිනට ආයතනයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශය පහත දක්වා ඇත.

වත්කම්	2023
	රු.
ජංගම වත්කම්	
මූල්‍ය සහ මූල්‍ය පයිාය	9,101,123
ලැබිය යුතු	19,951,593
තොග ලේඛන	4,325,035
පෙරගෙවුම්	432,041
	33,809,792
ජංගම නොවන වත්කම්	
ආයෝජන	22,901,183
යටිතල පහසුකම්, පිරියත සහ උපකරණ	108,288,112
ඉඩම් සහ ගොඩනැගිලි	3,384,464,308
පොත්, වාර සඟරා සහ ක්‍රීඩා භාණ්ඩ	5,979,655

කෙරෙමින් පවතින වැඩ	42,203,446
	3,563,836,704
මුළු වත්කම්	**3,597,646,496**
කොටස් සහ බැරකම්	
ජංගම බැරකම්	
ගෙවිය යුතු මුදල්	8,663,176
විලම්බිත ආදායම	115,000
උපචිත වියදම්	11,259,968
	20,038,144
ජංගම නොවන බැරකම්	
පාරිතෝෂික ප්‍රතිපාදන	219,603,201
	219,603,201
කොටස්	
ප්‍රාග්ධන ප්‍රදානය - වියදම් කළ	-
ප්‍රාග්ධන දීමනාව - වියදම් නොකළ	460,508
අතිරික්ත/හිඟ ප්‍රාග්ධන ප්‍රදානය	(1,758,504)
ප්‍රාග්ධන ප්‍රදාන - උත්පන්න අරමුදල	59,175
පොදු සංචිතය	104,228,102
ප්‍රත්‍යාගණන සංචිතය	3,248,443,006
සමුච්චිත අරමුදල	6,572,864
	3,358,005,151
මුළු කොටස් සහ බැරකම්	**3,597,646,496**

15. පරිත්‍යාග අරමුදල

2023 දී විශ්වවිද්‍යාලය විසින් දීර්ඝ කාලයක් අක්‍රියව පැවති දායාද අරමුදල් 52කින් රු. 33,566,735.01 ක් මාරු කර විශ්වවිද්‍යාල පරිත්‍යාග අරමුදල නිර්මාණය කරන ලදී. මෙම අරමුදල උපාධි අපේක්ෂකයින් සඳහා අධ්‍යයන විශිෂ්ටතා සම්මාන ලබා දීම සඳහා යොදා ගෙන ඇත.

16. ප්‍රාග්ධන බැඳීම්

ප්‍රදානය කරන ලද කොන්ත්‍රාත්තු සඳහා 2023 දෙසැම්බර් 31 වැනි දිනට ප්‍රාග්ධන බැඳීම් සහ ඇණවුම් ස්ථාන පහත පරිදි වේ.

	කොන්ත්‍රාත්තුව	පිරිනමන ලද මුදල (VAT හැර)	සිදු කරන ලද කාර්යය සඳහා අවසන් නොවූ ගෙවීම්	සිදු කරන ලද කාර්යය සඳහා අවසන් නොවූ ගෙවීම් (VAT සහිත)	ඉතිරි වැඩ
1	නව කලා රහහලේ (NAT) වායු සමීකරණ පද්ධතිය අලුත්වැඩියා කිරීම	9,568,400.00	ගෙවිය යුතු රඳවා ගැනීම් ශේෂය රු. 239,210.00 + VAT	239,210.00	නැත
2	විද්‍යා පීඨය සඳහා පවතින ලංවිම උපපොළ නැවත ස්ථානගත කිරීම	8,288,720.00	ගෙවිය යුතු රඳවා ගැනීම් ශේෂය රු. 244,517.24 + VAT	244,517.24	නැත
3	ශිෂ්‍ය සේවා මධ්‍යස්ථාන ගොඩනැගිලි සංකීර්ණය සැලසුම් කිරීම සහ ඉදිකිරීම	381,495,103.39	ගෙවිය යුතු ඉතිරි මුදල රු. 53,940,837.76 + VAT	53,940,837.76	ශ්‍රවණාගාරයේ ඉදිකිරීම් සිදුවෙමින් පවතී.
			ගෙවිය යුතු රඳවා ගැනීම් ශේෂය රු. 9,576,123.56 + VAT	9,576,123.56	
4	ශාස්ත්‍ර පීඨ ගොඩනැගිල්ලේ පැරණි අංශයේ වහල ප්‍රතිසංස්කරණය කිරීම	17,262,245.00	ගෙවිය යුතු රඳවා ගැනීම් ශේෂය රු. 431,556.13	431,556.13	නැත
5	කොළඹ විශ්වවිද්‍යාලයේ විද්‍යා පීඨයේ තොරතුරු සහ ඉගෙනුම් මධ්‍යස්ථානය සැලසුම් කිරීම සහ ඉදිකිරීම	516,543,463.13	කොන්ත්‍රාත්කරුවිසින් අඩු කරන ලද ගෙවීම් මත පදනම්ව රු. 22,661,923.12 +V AT ඉල්ලා ඇත. මෙම ගෙවීම පිළිබඳ DAB තීරණය පොරොත්තුවෙන් සිටී.	22,661,923.12	නැත
6	කොළඹ විශ්වවිද්‍යාලයේ සංඛ්‍යාලේඛන අ.අ. සඳහා මහල් හයක	364,715,134.31	ගෙවිය යුතු ඉතිරි මුදල රු. 23,757,345.79	23,757,345.79	ELV කාර්‍ය වල ශේෂ විවලනය

	ගොඩනැගිල්ලක් සැලසුම් කිරීම සහ ඉදිකිරීම		+ VAT ගෙවිය යුතු රඳවා ගැනීම් ශේෂය රු. 9,117,878.36 + VAT	9,117,878.36	සම්පූර්ණ කළ යුතුය.
7	වෛද්‍ය පීඨයේ පූර්ව සායනික දෙපාර්තමේන්තුව සඳහා යෝජිත 17 මහල් ගොඩනැගිල්ලේ ශේෂ වැඩවල ඉදිකිරීම් සහ නිම කිරීම සහ දෝෂ නිවැරදි කිරීම	4,707,563,953.46	උපදේශනය ඇතුළුව සිදු කළ යුතු ඉතිරි ගෙවීම රු. 917,134,996.31 + VAT (රඳවා ගැනීමේ මුදල් සමඟ)	917,134,996.31	නිවැරදි කළ යුතු අඩුපාඩු
8	උපකාරක කලාපය සැලසුම් කිරීම සහ ඉදිකිරීම	520,120,959.00	ගෙවිය යුතු රඳවා ගැනීමේ මුදල් දළ වශයෙන් රු. මි. 150	150,000,000.00	භූමි අලංකරණය, ප්‍රවේශ මාර්ග ඉදිකිරීම සහ මලාපවහන පවිත්‍ර කිරීමේ සැලැස්මේ විවිධ වැඩ කටයුතු ඉතිරිව පවතී
9	ශ්‍රී පාලි පරිපාලන ගොඩනැගිල්ල ඉදිකිරීම	128,656,255.00	ගෙවිය යුතු මිල උච්චාවචයනය රු. 5,211,351.61 + VAT	5,211,351.61	නැත
10	තාක්ෂණ පීඨයේ අභ්‍යන්තර මාර්ගය සඳහා බෝක්කු සහ කාණු ඉදිකිරීම	13,142,635.00	ගෙවිය යුතු රඳවා ගැනීම් ශේෂය රු. 328,565.88	328,565.88	නැත
				1,192,644,305.76	

16.1 ස්ථාවර තැන්පතු පිළිබඳ බැඳීම

විලම්බිත ආදායම සඳහා වෙන් කිරීම්	-	රු.මි. *1,824*
වෛද්‍ය රක්ෂණ සඳහා වෙන් කිරීම්	-	රු.මි. *320*
පරිත්‍යාග අරමුදල සඳහා වෙන් කිරීම්	-	රු.මි. *244*
බැඳීම් කඩ කිරීම් සඳහා වෙන් කිරීම්	-	රු.මි. *167*
කැපවූ වියදම් සඳහා වෙන් කිරීම්	-	රු.මි. *1,777*

2024 අනුමත ප්‍රසම්පාදන සැලැස්මට අනුව, භාණ්ඩ මිලදී ගැනීම, සේවා සැපයීම සහ අනෙකුත් ඉදිකිරීම් කටයුතු සඳහා සංවර්ධන ගිණුම් වලින් මිලියන *1,777*ක් වැය වේ.

17. අයවැය ප්‍රකාශය සහ තථ්‍ය මුදල් ප්‍රමාණ

කොළඹ විශ්වවිද්‍යාලය සඳහා වන අයවැය 2023 ජනවාරි 1 සිට 2023 දෙසැම්බර් 31 දක්වා කාලය සඳහා සකස් කර ඇති අතර පාලක සභාව විසින් අනුමත කර ඇත. කෙසේ වෙතත්, සංශෝධිත අයවැය පාලක සභාව වෙත නිර්දේශ කිරීම සඳහා 2024 ජනවාරි 3 වන දින පැවති මුදල් කාරක සභාව වෙත නැවත ඉදිරිපත් කරන ලදී.

2023.12.31 න් අවසන් වූ වර්ෂය සඳහා අයවැය විචලනය

	තථ්‍ය	සංශෝධිත අයවැය **2023**	විචලතාව
වැටුප් සහ චේතන - අධ්‍යයන			
වැටුප් සහ චේතන	1,587,992,269	1,588,000,000	(7,731)
වී.වී. අරමුදල	316,147,829	316,500,000	(352,171)
විශ්‍රාම වැටුප	192,064,632	192,066,000	(1,368)
සේ.අර්. අරමුදල	101,641,471	101,750,000	(108,529)
වැඩ බැලීමේ දීමනා	710,794	725,000	(14,206)
අතිකාල	69,371,120	69,375,000	(3,880)
නිවාඩු දීමනා	404,440	410,000	(5,560)
අධ්‍යයන දීමනා	1,341,090,140	1,341,100,000	(9,860)
සමකරණ දීමනා	172,870	175,000	(2,130)
බාහිර කථිකාචාර්ය දීමනා	25,652,620	25,700,000	(47,380)
ජීවන වියදම් දීමනා	203,760,954	203,800,000	(39,046)
වෙනත් දීමනා	5,260,402	5,270,000	(9,598)
පර්යේෂණ දීමනා	305,165,960	305,200,000	(34,040)
20% දීමනා	307,815,366	307,900,000	(84,634)
M C A 35% දීමනාව	232,779,450	232,800,000	(20,550)
5000 මාසික දීමනාව	130,577,416	130,600,000	(22,584)
ඝන්නිවේදන දීමනාව	2,034,356	2,050,000	(15,644)
ප්‍රවාහන දීමනාව	7,630,000	7,650,000	(20,000)
ඉන්ධන දීමනාව	8,005,178	8,010,000	(4,823)
ස්ථීර නොවන වැටුප්	916,999	950,000	(33,001)
මුළු සේවක පාරිශ්‍රමික	**4,839,194,267**	**4,840,031,000**	**(836,733)**
ප්‍රවාහනය			
දේශීය	1,409,402	1,450,000	(40,598)

විදේශීය	1,031,050	1,050,000	(18,950)
එකතුව	**2,440,452**	**2,500,000**	**(59,548)**

සැපයුම් සහ අවශ්‍යතා			
ලිපි ද්‍රව්‍ය සහ කාර්යාලීය අවශ්‍යතා	53,764,900	53,800,000	(35,100)
ඉන්ධන සහ ලිහිසි ද්‍රව්‍ය	33,803,647	33,850,000	(46,353)
නිල ඇඳුම්	6,243,599	6,245,000	(1,401)
යාන්ත්‍රික සහ විදුලි භාණ්ඩ	1,576,862	1,580,000	(3,138)
රසායනික ද්‍රව්‍ය සහ පරිභෝජ්‍ය	11,869,562	11,900,000	(30,438)
වෛද්‍ය සැපයුම්	3,271,681	3,275,000	(3,319)
වෙනත්	11,899,457	12,000,000	(100,543)
එකතුව	**122,429,707**	**122,650,000**	**(220,293)**

වත්කම් නඩත්තුව			
වාහන	16,939,136	17,000,000	(60,864)
පිරියන, යන්ත්‍ර සහ උපකරණ	34,289,386	34,350,000	(60,614)
ගොඩනැගිලි සහ සැකිලි	40,812,492	40,900,000	(87,508)
ගෘහභාණ්ඩ	156,324	200,000	(43,676)
වෙනත්	7,083,880	7,100,000	(16,120)
එකතුව	**99,281,218**	**99,550,000**	**(268,783)**

කොන්ත්‍රාත් සේවා			
ප්‍රවාහනය	13,189,899	13,200,000	(10,101)
විදුලි සංදේශන	69,825,741	69,850,000	(24,259)
තැපැල් ගාස්තු	2,139,668	2,150,000	(10,332)
විදුලිය	349,588,127	349,650,000	(61,873)
ආරක්ෂක සේවා	156,089,486	156,100,000	(10,514)
ජලය	58,691,163	58,700,000	(8,837)
පවිත්‍රතා සේවා	150,236,431	150,300,000	(63,569)
වාරික සහ බදු කුලී	11,137,240	11,200,000	(62,760)
පළාත් පාලන ආයතන සඳහා බදු	4,392,116	4,400,000	(7,884)
මුද්‍රණය සහ ප්‍රචාරණය	16,198,107	16,200,000	(1,893)
වෙනත්	1,438,709	1,500,000	(61,291)
එකතුව	**832,926,685**	**833,250,000**	**(323,315)**

වෙනත් සේවා			
විශ්වවිද්‍යාල ආචාර්යවරුන් සඳහා ප්‍රවාහන දීමනා	162,910	165,000	(2,090)

විශේෂ සේවා පාලක සභාව හා කමිටු	2,986,045	2,990,000	(3,955)
විශේෂ සේවා- වෘත්තීය සහ වෙනත්	10,511,955	10,550,000	(38,045)
වැඩමුළු, සම්මන්ත්‍රණ හා රැස්වීම්	739,627	750,000	(10,373)
ශාස්ත්‍රීය පර්යේෂණ	3,012,321	3,025,000	(12,679)
දේශීය පුහුණු සේවා (කාර්ය මණ්ඩල සංවර්ධන)	1,198,451	1,200,000	(1,549)
පශ්චාත් උපාධි පර්යේෂණ සහ ශිෂ්‍යත්ව	30,963	31,000	(37)
ශිෂ්‍යයන් සහ ඉගෙනීමේ ගුණාත්මක සංවර්ධනය සඳහා පාඨමාලා ද්‍රව්‍ය	1,649,234	1,650,000	(766)
කර්මාන්ත සීමාවාසික පුහුණුව, ප්‍රායෝගික හා වෘත්තීය මාර්ගෝපදේශ	2,498,503	2,500,000	(1,497)
ශිෂ්‍ය සංවර්ධන පියවර සහ ප්‍රජා සම්බන්ධතා	10,862,408	10,900,000	(37,592)
විශ්වවිද්‍යාල ක්‍රීඩා කටයුතු	4,733,137	4,750,000	(16,863)
ශිෂ්‍ය සුබ සාධන, සේවක සුබ සාධන, ශිෂ්‍ය සභා සහ සමාජ සංහිඳියා	3,609,580	3,650,000	(40,420)
නිවාඩු බලපත්‍ර	14,226,999	14,250,000	(23,001)
සංග්‍රහ වියදම	12,590,109	12,600,000	(9,891)
බැංකු ගාස්තු	159,975	160,000	(25)
ත්‍යාග සහ වන්දි පරිත්‍යාග	852,500	900,000	(47,500)
දායකත්ව සහ සාමාජික ගාස්තු	2,707,276	2,720,000	(12,724)
උපාධි ප්‍රදානෝත්සවය	7,020,781	7,050,000	(29,219)
විභාග වියදම	50,455,810	50,500,000	(44,190)
ව්‍යාජ්ති පාඨමාලා / පශ්චාත් උපාධි පාඨමාලා සඳහා වියදම්	-		-
වෙනත්	9,389,594	9,400,000	(10,406)
නේවාසිකාගාර ශිෂ්‍යාධාර	1,828,000	1,850,000	(22,000)
දේපල ණය සඳහා පොලී සහනාධාර	3,669,267	3,700,000	(30,733)
බදු පොලිය	373,190	375,000	(1,810)
එකතුව	**145,268,633**	**145,666,000**	**(397,367)**
මුළු වෙනත් පුනරාවර්තන වියදම	**1,202,346,695**	**1,203,616,000**	**(1,269,305)**
එකතුව	**6,041,540,962**	**6,043,647,000**	**(2,106,038)**

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. HED/B/OUC/2023/FA/01

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2024 අගෝස්තු 21 දින

Internal Auditor
22/08/2024

උපකුලපති,
කොළඹ විශ්වවිද්‍යාලය

කොළඹ විශ්වවිද්‍යාලයේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

සහතික කරන ලද ගිණුම් සහ යටෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

ඩබ්ලිව්.එම්.පී.ඒ.ෆොන්සේකා
නියෝජ්‍ය විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

පිටපත් :-

01. ලේකම් - අධ්‍යාපන අමාත්‍යාංශය
02. ලේකම් - මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය
03. සභාපති - විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. HED/B/UOC/2023/FA/01 ඔබේ අංකය உமது இல. Your No.

දිනය திகதி Date 2024 අගෝස්තු 21 දින

උපකුලපති,
කොළඹ විශ්වවිද්‍යාලය.

කොළඹ විශ්වවිද්‍යාලයේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

කොළඹ විශ්වවිද්‍යාලයේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107(5) උප වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව
இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.
No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන විශ්වවිද්‍යාලයේ 2023 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මාගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ විගණනයට අදාළව, මාගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

විශ්වවිද්‍යාලයේ 2023 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, විශ්වවිද්‍යාලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය විශ්වවිද්‍යාලය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

විශ්වවිද්‍යාලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, විශ්වවිද්‍යාලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

2.1.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා විශ්වවිද්‍යාලය පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට විශ්වවිද්‍යාලය සම්බන්ධ වී ඇති යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව යම් සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාළ ලිඛිත නීතියකට හෝ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධිවිධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

	නීති රීති / විධානයට යොමුව	නිරීක්ෂණය
(අ)	1994 අප්‍රේල් 20 දිනැති අංක 30/94 දරන රාජ්‍ය ගිණුම් වක්‍රලේඛය හා 2019 ජූලි 25 දිනැති අංක SC&PMU/Grant/19 දරන විදේශ සම්පත් දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය	විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ අනුදැනුම හා එකඟතාවය ලබා ගැනීමකින් තොරව සමාලෝචිත වර්ෂයේදී විදේශ ප්‍රදාන රු.339,691,267 ක් විශ්වවිද්‍යාලය වෙත සෘජුව ලබා ගැනීමට කටයුතු කර තිබුණි.
(ආ)	2020 ඔක්තෝබර් 26 දිනැති කළමනාකරණ සේවා වක්‍රලේඛ අංක 02/2020 හි 02 (v) වන ඡේදය	කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් තනතුරු වලට ලබා දී තිබුණු වැටුප් කේතවල වැටුප් ප්‍රමාණයන් ඉක්මවා විශ්වවිද්‍යාලය විසින් තීරණය කරන ලද වැටුප් ලෙස අනුමත තනතුරු 02 ක නිලධාරීන් 03 දෙනෙකු වෙත 2020 සිට 2023 දෙසැම්බර් 31 දක්වා රු.19,577,232 ක් ගෙවා තිබුණි.
(ඇ)	විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා වූ ආයතන සංග්‍රහයේ V වැනි පරිච්ඡේදයේ 7 ඡේදය	බැඳුම්කර ගිවිසුම් කඩකළ ආචාර්යවරුන් 35 දෙනෙකුගෙන් අයවිය යුතු රු. 159,907,138 ක් වර්ෂ 01 සිට 34 දක්වා කාලපරිච්ඡේදයක් ගත වී තිබුණද අයකර ගෙන නොතිබුණි.
(ඇ)	2023 ජනවාරි 18 දිනැති අංක BD/HRD/126/214/19/2023 දරන භාණ්ඩාගාර ලේකම් විසින් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් ඇමතූ වක්‍රලේඛ ලිපියේ 5 වන ඡේදය	බැඳුම්කර කඩකරන ලද ආචාර්යවරුන්ගෙන් සමාලෝචිත වර්ෂය තුළ දී අයකරගෙන තිබූ රු.135,987,614 ක් රාජ්‍ය ආදායමට බැර කර නොතිබුණි.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව විශ්වවිද්‍යාලයේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර විශ්වවිද්‍යාලයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව,

2.3 වෙනත් නිරීක්ෂණ

(අ) නීත්‍යානුකූල අනුමැතියකින් තොරව විශ්වවිද්‍යාලයේ විද්‍යා පීඨයේ කාර්යමණ්ඩලය යොදාගෙන ඇපයෙන් සීමිත සමාගමක් 2013 වර්ෂයේදී පිහිටුවා තිබුණු අතර ඉන් වසර 5 කට පසු විශ්වවිද්‍යාලය සමඟ අවබෝධතා ගිවිසුමක් අත්සන් කර තිබුණි. එම ගිවිසුම අනුව සමාගමේ විගණිත මූල්‍ය ප්‍රකාශන වාර්ෂිකව විශ්වවිද්‍යාලයේ පාලක සභාව වෙත ඉදිරිපත් කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් සමාගමේ එකදු මූල්‍ය ප්‍රකාශනයක්වත් පාලක සභාවට ඉදිරිපත් කර නොතිබුණි. සමාගම උපයන ආදායමින් විශ්වවිද්‍යාලයට ලබාදිය යුතු දායකත්වය පිළිබඳ අවබෝධතා ගිවිසුමෙහි සඳහන් කර නොතිබුණු අතර ඉකුත් වර්ෂ 9ක කාලපරිච්ඡේදය තුළ රු.1,885,690ක් පමණක් ලබා දී තිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී කිසිදු පුරස්කාර ආදායමක් විශ්වවිද්‍යාලයට ලබා දී නොතිබුණි. තවද, විශ්වවිද්‍යාලයේ බුද්ධිමය දේපල ප්‍රතිපත්තිය අනුව සමාගමේ නව නිපැයුම්, පේටන්ට් ඇතුළු බුද්ධිමය දේපල විශ්වවිද්‍යාලයේ බුද්ධිමය දේපල කළඹ තුළට ඇතුළත් කර ඒවායේ ආරක්ෂාව තහවුරු කර ගැනීමේ ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි.

(ආ) 2018 සිට 2020 දක්වා වර්ෂ තුළ අධ්‍යයන කාර්යමණ්ඩලය සඳහා ලබා දී තිබුණු රු.8,194,808 ක් වූ පර්යේෂණ 13 ක් අවසන් කිරීමට නියමිත දින ඉක්මවා අවුරුදු 1 ½ සිට අවුරුදු 4 ½ දක්වා කාලයක් ගත වී තිබුණ ද සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් අවසන් කර නොතිබුණි. තවද 2018 සිට 2020 කාලපරිච්ඡේදය තුළදී වටිනාකම රු. 8,821,000 ක් වූ පර්යේෂණ 17 ක් විවිධ හේතු මත අතහැර දැමීම හා අවලංගු කිරීම් සිදුකර තිබුණි.

(ඇ) කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කර නොමැති තනතුරු 07 ක් සඳහා මාස 2 සිට අවුරුදු 08 දක්වා කාල පරාසයක කොන්ත්‍රාත් හා කාර්යපැවරුම් පදනම මත නිලධාරීන් 15 දෙනෙකු බඳවාගෙන 2020 වර්ෂයේ සිට 2023 දෙසැම්බර් මාසය දක්වා වූ කාලපරිච්ඡේදය තුළ රු.34,909,399 ක් වැටුප් හා දීමනා ලෙස ගෙවා තිබුණි.

(ඇ) වටිනාකම රු. 25,518,200,000 ක් වූ ඉඩම් 8ක හා තක්සේරු කර නොතිබුණු ඉඩම් 4ක නීත්‍යානුකූල හිමිකම සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් පවරා ගෙන නොතිබුණි.

(ඉ) විශ්වවිද්‍යාල පරිශ්‍රයෙහි පවත්වාගෙන යන පොත්හලෙන් තක්සේරු කුළිය අය නොකිරීම හේතුවෙන් 2009 සිට 2023 අගෝස්තු දක්වා කාලපරිච්ඡේදය වෙනුවෙන් රු.2,830,892 ක කුලියක් අඩුවෙන් අයකර තිබුණි. එමෙන්ම, රාජ්‍ය බැංකු 02 ක ATM යන්ත්‍ර පහසුකම් සඳහා වෙන්කර ඇති භූමිය වෙනුවෙන් 2022 ඔක්තෝබර් සිට 2023 අගෝස්තු දක්වා අය විය යුතු රු.1,947,000 ක් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අය කරගෙන නොතිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වර්ෂ 01 සිට වර්ෂ 04 දක්වා පැරණි එකතුව රු.17,164,573 ක් වූ ලැබිය යුතු ශේෂ සමාලෝචිත වර්ෂයේදී ද අයකරගෙන නොතිබුණි.

(උ) වර්ෂ 03 සිට වර්ෂ 04 දක්වා පැරණි එකතුව රු. 5,331,904 ක් වූ ගෙවිය යුතු ශේෂයන් සමාලෝචිත වර්ෂයේදී ද නිරවුල් කර නොතිබුණි.

(ඌ) එකතුව රු.117,946,258 ක් වූ අරමුදල් (Designated Funds) 44 ක් සමාලෝචිත වර්ෂය තුළදී අදාළ අරමුණුගත කාර්යයන් වෙනුවෙන් උපයෝජනය කර නොතිබුණි.

(එ) අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කර නොමැති සුබසාධන වැඩසටහන් වෙනුවෙන් සිදුකරන වෙන් කිරීම් නතර කළ යුතු වුවද, අනුමැතියකින් තොරව සේවක සුබසාධන ක්‍රමයක් ලෙස ක්‍රියාත්මක කර තිබූ සේවක වෛද්‍ය රක්ෂණ ක්‍රමය වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුළදී රු.36,762,318 ක් විශ්වවිද්‍යාලය විසින් වැය කර තිබුණි.

ඩබ්ලිව්.පී.සි. වික්‍රමරත්න,
විගණකාධිපති.

2024.09.05

විගණකාධිපති,
ජාතික විගණන කාර්යාලය.

කොළඹ විශ්වවිද්‍යාලයේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

කොළඹ විශ්වවිද්‍යාලයේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107(5) උපවගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන විශ්වවිද්‍යාලයේ 2023 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මාගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ විගණනයට අදාළව, මාගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබාගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

විශ්වවිද්‍යාලයේ 2023 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තවදුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින්යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, විශ්වවිද්‍යාලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය විශ්වවිද්‍යාලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

විශ්වවිද්‍යාලය මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, විශ්වවිද්‍යාලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබෙද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙණු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2 වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

2.1.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා විශ්වවිද්‍යාලය පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) *(iii)* වගන්තියේ සඳහන් අශ්‍යතාවය අනුව විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 *(1) (*ඈ) (*iv)* වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඈ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට විශ්වවිද්‍යාලය සම්බන්ධ වී ඇති යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, පහත සඳහන් නිරීක්ෂණය හැර යම් අදාළ ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධිවිධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

	නීති රීති/ විධානයට යොමුව	**නිරීක්ෂණය**	**වර්ථමාන තත්ත්වය**
(අ)	1944 අප්‍රේල් 20 දිනැති අංක 30/94 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය හා 2019 ජූලි 25 දිනැති අංක SC&PMU/Grant/19 දරන විදේශ සම්පත් දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය.	විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ අනුදැනුම හා එකඟතාවය ලබාගැනීමතින් තොරව සමාලෝචිත වර්ෂයේදී විදේශ ප්‍රදාන රු.339,691,267 ක් විශ්වවිද්‍යාලය වෙත සෘජුව ලබාගැනීමට කටයුතු කර තිබුණි.	මෙම මුදල් ප්‍රදානයන් නොවන අතර විශ්වවිද්‍යාලයේ ව්‍යාපෘති/ පර්යේෂණ සඳහා ලැබුණු මුදල් වේ. පාදක කරගත් ලිපිය ඇමුණුම 2.2.2 (අ) මගින් ඉදිරිපත් කර ඇත.
(ආ)	2020 ඔක්තෝබර් 26 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 02/2020 හි 02 (v) වන ඡේදය	කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් තනතුරු වලට ලබා දී තිබුණු වැටුප් කේතවල වැටුප් ප්‍රමාණයන් ඉක්මවා විශ්වවිද්‍යාලය විසින් තීරණය කරන	මීට අදාළ පිළිතුර ඇමුණුම 2.2.2 (ආ) යටතේ ඉදිරිපත් කර ඇත.

		ලද වැටුප් ලෙස අනුමත තනතුරු 02 ක නිලධාරීන් 03 දෙනෙකු වෙත 2020 සිට 2023 දෙසැම්බර් 31 දක්වා රු. 19,577,232 ක් ගෙවා තිබුණි.	
(ඇ)	විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා වූ ආයතන සංග්‍රහයේ V වැනි පරිච්ඡේදයේ 7 ඡේදය.	බැඳුම්කර ගිවිසුම් කඩකළ ආචාර්යවරුන් 35 දෙනෙකුගෙන් අයවිය යුතු රු.159,907,138 ක් වර්ෂ 01 සිට 34 දක්වා කාලපරිච්ඡේදයක් ගත වී තිබුණද අයකරගෙන නොතිබුණි.	මීට අදාළ පිළිතුර ඇමුණුම 2.2.2. (ඇ) මගින් ඉදිරිපත් කර ඇත.
(ඈ)	2023 ජනවාරි 18 දිනැති අංක BD/HRD/126/214/19/2023 දරන භාණ්ඩාගාර ලේකම් විසින් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් ඇමතූ චක්‍රලේඛ ලිපියේ 5 වන ඡේදය.	බැඳුම්කර කඩකරන ලද ආචාර්යවරුන්ගෙන් සමාලෝචිත වර්ෂය තුළදී අයකරගෙන තිබූ රු.135,987,614 ක් රාජ්‍ය ආදායමට බැර කර නොතිබුණි.	බැඳුම්කර කඩකරන්නන්ගෙන් ලැබෙන අරමුදල් වෙනත් කාර්යයන් සඳහා යොදා නොගත යුතු බව ප්‍රකාශ කලද, විශ්වවිද්‍යාලීය ප්‍රතිපාදන කොමිෂන් සභාවේ මූල්‍ය චක්‍රලේඛ 05/2023 මඟින් බැඳුම්කර උල්ලංඝනය කිරීමේ අරමුදලෙන් ඇතැම් ගෙවීම් සඳහා අවසර දෙයි. මෙම චක්‍රලේඛයේ සඳහන් වන්නේ 2024/04/03 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ තීරණයි. මෙම මූල්‍ය චක්‍රලේඛය මත පදනම්ව, බැඳුම්කර උල්ලංඝන අරමුදල අවසර ලත් අරමුණු සඳහා සුදුසු පරිදි භාවිතා කර ඇති අතර, භාණ්ඩාගාරයට මාරු කර නොමැත. එමගින් අනාගත අවසර ලත් වියදම් සඳහා ඉඩ සැලසේ. [ඇමුණුම 2.2.2 (ඈ)]

2.2.3	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව විශ්වවිද්‍යාලයේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.		
2.2.4	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර විශ්වවිද්‍යාලයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.		
2.3	**වෙනත් නිරීක්ෂණ** ----------		
(අ)	නීත්‍යානුකූල අනුමැතියකින් තොරව විශ්වවිද්‍යාලයේ විද්‍යා පීඨයේ කාර්යමණ්ඩලය යොදාගෙන ඇපයෙන් සීමිත සමාගමක් 2013 වර්ෂයේදී පිහිටුවා තිබුණු අතර ඉන් වසර 5කට පසු විශ්වවිද්‍යාලය සමග අවබෝධතා ගිවිසුමක් අත්සන් කර තිබුණි. එම ගිවිසුම අනුව සමාගමේ විගණිත මූල්‍ය ප්‍රකාශන වාර්ෂිකව විශ්වවිද්‍යාලයේ පාලක සභාව වෙත ඉදිරිපත් කළ යුතු වූවද, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් සමාගමේ එකදු මූල්‍ය ප්‍රකාශනයක්වත් පාලක සභාවට ඉදිරිපත් කර නොතිබුණි. සමාගම උපයන ආදායමින් විශ්වවිද්‍යාලයට ලබාදිය යුතු දායකත්වය පිළිබඳ අවබෝධතා ගිවිසුමෙහි සඳහන් කර නොතිබුණු අතර ඉකුත් වර්ෂ 9ක කාලපරිච්ඡේදය තුළ රු.1,885,690ක් පමණක් ලබා දී තිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී කිසිදු පුරස්කාර ආදායමක් විශ්වවිද්‍යාලයට ලබා දී නොතිබුණි. තවද, විශ්වවිද්‍යාලයේ බුද්ධිමය දේපල ප්‍රතිපත්තිය අනුව සමාගමේ නව නිපැයුම්, පේටන්ට් ඇතුළු බුද්ධිමය දේපල කළඹ තුළට ඇතුළත් කර ඒවායේ ආරක්ෂාව තහවුරු කරගැනීමේ ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි.	මේ සඳහා පිළිතුරු ඇමුණුම 2.3(අ) මගින් ඉදිරිපත් කර ඇත.
(ආ)	2018 සිට 2020 දක්වා වර්ෂ තුළ අධ්‍යයන කාර්‍යමණ්ඩලය සඳහා ලබා දී තිබුණු රු.8,194,808 ක් වූ පර්යේෂණ 13 ක් අවසන් කිරීමට නියමිත දින ඉක්මවා අවුරුදු 1 $^{1}/_{2}$ සිට අවුරුදු 4 $^{1}/_{2}$ දක්වා කාලයක් ගත වී තිබුණ ද	2018 සිට 2020 දක්වා අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා ප්‍රතිපාදන ලබා දී තිබූ පර්යේෂණ වලින් අවසන් වාර්තා ලබා නොදී තිබූ පර්යේෂණ 13 න්, පර්යේෂණ 3 ක් සඳහා අවසන් වාර්තා ලබාදීම සඳහා පර්යේෂණ කාල

	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් අවසන් කර නොතිබුණි. තවද 2018 සිට 2020 කාලපරිච්ඡේදය තුළදී වටිනාකම රු.8,821,000 ක් වූ පර්යේෂණ 17 ක් විවිධ හේතු මත අතහැර දැමීම හා අවලංගු කිරීම සිදුකර තිබුණි.	සීමාව දීර්ඝ කර ඇති අතර පර්යේෂණ 2 ක අවසන් වාර්තා ලබාදී ඇත. එසේම පර්යේෂණ 8 ක් සඳහා අවසන් වාර්තා ලබාදීමට අදාල අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් වෙත සිහිකැඳවීම් සිදු කර ඇත.[ඇමුණුම අංක 2.3 (ආ) (i)]. විවිධ හේතු මත අත්හැර දැමීම හා අවලංගු කිරීම් සිදුකර තිබූ පර්යේෂණ පිළිබඳ විස්තර මේ සමග සපයා ඇත. [ඇමුණුම අංක 2.3 (ආ)(ii) සහ 2.3 (ආ)(iii)]
(ඇ)	කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කර නොමැති තනතුරු 07ක් සඳහා මාස 02 සිට අවුරුදු 08 දක්වා කාල පරාසයක කොන්ත්‍රාත් හා කාර්යපැවරුම් පදනම මත නිලධාරීන් 15 දෙනෙකු බඳවාගෙන 2020 වර්ෂයේ සිට 2023 දෙසැම්බර් මාසය දක්වා වූ කාලපරිච්ඡේදය තුළ රු.34,909,399 ක් වැටුප් හා දීමනා ලෙස ගෙවා තිබුණි.	මේ සඳහා පිළිතුරු ඇමුණුම 2.3(ඇ) මගින් ඉදිරිපත් කර ඇත.
(ඈ)	වටිනාකම රු.25,518,200,000 ක් වූ ඉඩම් 08ක තක්සේරු කර නොතිබුණු ඉඩම් 4ක නීත්‍යානුකූල හිමිකම සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් පවරාගෙන නොතිබුණි.	මේ සඳහා පිළිතුරු ඇමුණුම 2.3(ඈ) මගින් ඉදිරිපත් කර ඇත.
(ඉ)	විශ්වවිද්‍යාල පරිශ්‍රයෙහි පවත්වාගෙන යන පොත්හලෙන් තක්සේරු කුළිය අය නොකිරීම හේතුවෙන් 2009 සිට 2023 අගෝස්තු දක්වා කාලපරිච්ඡේදය වෙනුවෙන් රු.2,830,892 ක කුලියක් අඩුවෙන් අයකර තිබුණි. එමෙන්ම, රාජ්‍ය බැංකු 02ක ATM යන්ත්‍ර පහසුකම් සඳහා වෙන් කර ඇති භූමිය වෙනුවෙන් 2022 ඔක්තෝබර් සිට 2023 අගෝස්තු දක්වා අය විය යුතු රු.1,947,000 ක් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අය කරගෙන නොතිබුණි.	මේ සඳහා පිළිතුරු ඇමුණුම 2.3(ඉ) මගින් ඉදිරිපත් කර ඇත.
(ඊ)	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වර්ෂ 01 සිට වර්ෂ 04 දක්වා පැරණි එකතුව රු. 17,164,573 ක් වූ ලැබිය යුතු ශේෂ සමාලෝචිත වර්ෂයේදී ද අයකරගෙන නොතිබුණි.	මේ සඳහා පිළිතුර ඇමුණුම 2.3 (ඊ)මගින් ඉදිරිපත් කොට ඇත.
(උ)	වර්ෂ 03 සිට වර්ෂ 04 දක්වා පැරණි එකතුව රු. 5,331,904 ක් වූ ගෙවිය යුතු ශේෂයන් සමාලෝචිත වර්ෂයේදී ද නිරවුල් කර නොතිබුණි.	මේ සඳහා පිළිතුර ඇමුණුම 2.3 (උ) මගින් ඉදිරිපත් කොට ඇත.
(ඌ)	එකතුව රු. 117,946,258 ක් වූ අරමුදල් (Designated Funds) 44ක් සමාලෝචිත වර්ෂය තුළදී අදාළ අරමුණුගත කාර්යයන් වෙනුවෙන් උපයෝජනය කර නොතිබුණි.	විශ්වවිද්‍යාලයේ විවිධ අරමුණු සඳහා පිහිට වූ විවිධ ලෙජර් ගිණුම් පැවතියද එක් අරමුදලක් පමණක් ඇත.

		2023 වර්ෂයේදී පුනරාවර්තන වියදම් සඳහා රු. මිලියන 441 ක් හා ප්‍රාග්ධන වියදම් සඳහා රු. මිලියන 392 ක් වියදම් කර ඇත.
(එ)	අමාත්‍යමණ්ඩලය විසින් අනුමත කර නොමැති සුභසාධන වැඩසටහන් වෙනුවෙන් සිදුකරන වෙන් කිරීම් නතර කළ යුතු වුවද, අනුමැතියකින් තොරව සේවක සුභසාධන ක්‍රමයක් ලෙස ක්‍රියාත්මක කර තිබූ සේවක වෛද්‍ය රක්ෂණ ක්‍රමය වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුළදී රු. 36,762,318 ක් විශ්වවිද්‍යාලය විසින් වැය කර තිබුණි.	කොළඹ විශ්වවිද්‍යාලයේ සියලුම සේවක හවතුන් සඳහා දැනට ක්‍රියාත්මක කෙරෙන වෛද්‍ය ක්‍රමය විශ්වවිද්‍යාල සේවකයින්ගේ සුභසාධනය සඳහා පවත්වාගෙන යනු ලබන සුභසාධන වෛද්‍ය ක්‍රමයක් බව පළමුවෙන් කාරුණිකව දන්වමි. 2008 වර්ෂයේදී 403 වැනි විශ්වවිද්‍යාල පාලක සභා කමිටුවෙහි අනුමැතිය ඇතිව (අමුණා ඇත) ආරම්භවූ මෙම සුභසාධන වෛද්‍ය ක්‍රමය අරමුදල් අධීක්ෂණ ඒකකයෙන් ලැබෙන ප්‍රතිපාදන මගින් මේ දක්වා ක්‍රියාත්මක වෙමින් පවතී. මෙම සුභසාධන වෛද්‍ය ක්‍රමය වසරක් පාසා යාවත්කාලීන කරන අතර ඒ සඳහා කැමැත්තක් දක්වන සියලු සේවක හවතුන්ට හට මෙයට ලියාපදිංචි විය හැක. මෙහිදී අවශ්‍ය වන තීරණ ගැනීම සඳහා වෛද්‍ය සුභසාධන කමිටුව (වෛද්‍ය පීඨයේ පීඨාධිපති ඇතුලුව නීති හා කළමනාකරණ මූල්‍ය පීඨවල පීඨාධිපතිවරුන්, ලේඛකාධිකාරී, මූල්‍යාධිකාරී, ප්‍රධාන වෛද්‍ය නිලධාරී සහ ශිෂ්‍ය හා සේවක කටයුතු අංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී) අවශ්‍ය අවස්ථාවන්හි රැස් වන අතර ඒ අනුව අදාළ වර්ෂය සඳහා ලියාපදිංචි වන සේවක හවතුන්ගේ අයකරගැනීම් සාකච්ඡා කරනු ලබන අතර එහිදී ගනු ලබන තීරණ පාලක සභාවට යොමුකර අනුමත කරගනු ලබයි. ඒ අනුව 2023 වර්ෂය සඳහා මාසික වාරික මුදල ලෙස රු.200/- , රු.600/- හා රු. 900/- ක් ලියාපදිංචි සේවක මහත්ම මහත්මින්ගේ වැටුපෙන් සුභසාධන වෛද්‍ය ක්‍රමය සඳහා පහත පරිදි අයකරගන්නා ලදි. – [ඇමුණුම 2.3 (එ)]

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය එච්. ඩී. කරුණාරත්න
උපකුලපති